**323 වන කාණ්ඩය - 16 වන කලාපය**
**தொகுதி 323 - இல. 16**
**Volume 323 - No. 16**

**2025 දෙසැම්බර් 18වන බ්‍රහස්පතින්දා**
**2025 டிசம்பர் 18, வியாழக்கிழமை**
**Thursday, 18th December, 2025**


# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

පාර්ලිමේන්තුව කැඳවීම [තීරුව 2947]

කථානායකතුමාගේ සහතිකය [තීරුව 2948]

වරප්‍රසාද: ගරු චතුරංග අබේසිංහ මහතා විසින් 2025.10.24 දින මතු කරන ලද වරප්‍රසාද සම්බන්ධ කරුණු [තීරුව 2948]

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: සාමාජිකයන් නම් කිරීම [තීරුව 2948]

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම [තීරුව 2953]

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වාර්තාව** [තීරුව 2953]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 2954]

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා** [තීරුව 2958]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

2023-2025 දක්වා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල ණය ප්‍රසාරණය [තීරුව 2959]

**සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති පියවර:**

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2961]

**අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී [තීරුව 2964]

**විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී [තීරුව 2964]

**කල් තැබීමේ යෝජනාව:**

අයහපත් කාලගුණය හේතුවෙන් ඇති වූ ව්‍යසනයෙන් පසු රටේ වත්මන් තත්ත්වය [තීරු 2966-3100]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

பாராளுமன்றத்தைக் கூட்டல் [ப: 2947]

சபாநாயகரது சான்றுரை [ப: 2948]

சிறப்புரிமை: 2025.10.24ஆம் திகதி மாண்புமிகு சதுரங்க அபேசிங்ஹவால் எழுப்பப்பட்ட சிறப்புரிமை பற்றிய விடயம் [ப: 2948]

அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: உறுப்பினர்கள் நியமனம் [ப: 2948]

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு: உறுப்பினர் நியமனம் [ப: 2953]

**அரசியலமைப்புப் பேரவையின் அறிக்கை** [ப: 2953]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 2954]

**அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கைகள்** [ப: 2958]

**தனி அறிவித்தல் மூல வினா:**

உரிமம் பெற்ற வணிக வங்கிகள் மற்றும் வங்கி அல்லாத நிதி நிறுவனங்களால் 2023-2025 வரை கடன் வழங்கல் அதிகரிப்பு [ப: 2959]

**சுற்றுலாக் கைத்தொழிலை மேம்படுத்துவதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள்:**

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரினது கூற்று [ப: 2961]

**நீதித்துறை (திருத்தம்) சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2964]

**நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2964]

**ஒத்திவைப்புப் பிரேரணை:**

சீரற்ற காலநிலை காரணமாக ஏற்பட்ட அனர்த்தத்துக்குப் பின்னரான நாட்டின் தற்போதைய நிலைமை [ப: 2966-3100]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Summoning of Parliament [Col. 2947]

Speaker's Certificate [Col. 2948]

Privilege: Matters of Privilege Raised by Hon. Chathuranga Abeysinghe on 24.10.2025 [Col. 2948]

Ministerial Consultative Committees: Nomination of Members [Col. 2948]

Ministerial Consultative Committee on Trade, Commerce, Food Security and Co-operative Development: Nomination of Member [Col. 2953]

REPORT OF THE CONSTITUTIONAL COUNCIL [Col. 2953]

AUDITOR-GENERAL'S REPORT [Col. 2954]

REPORTS OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES [Col. 2958]

QUESTION BY PRIVATE NOTICE:

Expansion of Credit Issued by Licensed Commercial Banks and Non-Banking Financial Institutions from 2023-2025 [Col. 2959]

MEASURES TAKEN FOR PROMOTION OF TOURISM INDUSTRY:

Statement by Minister of Foreign Affairs, Foreign Employment and Tourism [Col. 2961]

JUDICATURE (AMENDMENT) BILL:

Read the First time [Col. 2964]

POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL:

Read the First time [Col. 2964]

ADJOURNMENT MOTION:

Current Situation of the Country after the Disaster Caused Due to Inclement Weather [Cols.2966-3100]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 දෙසැම්බර් 18වන බ්‍රහස්පතින්දා***
*2025 டிசம்பர் 18, வியாழக்கிழமை*
*Thursday, 18th December, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තුව කැඳවීම
### பாராளுமன்றத்தைக் கூட்டல்
### SUMMONING OF PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 16 ප්‍රකාරව, ගරු අග්‍රාමාත්‍යතුමියගේ ඉල්ලීම පරිදි පාර්ලිමේන්තුවේ රැස්වීමක් කැඳවීමේ ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවනු ලැබීම.

***අනතුරුව පහත සඳහන් ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවන ලදී:***

*அதன்பிறகு, பாராளுமன்றச் செயலாளர் நாயகம் பின்வரும் வர்த்தமானி அறிவித்தலை வாசித்தார்:*

*Whereupon the Secretary-General of Parliament read the following Gazette Notification:*

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය**

**අති විශෙෂ**

අංක 2466/33 - 2025 දෙසැම්බර් මස 12 වැනි සිකුරාදා - 2025.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

**I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය**

**රජයේ නිවේදන**

**කථානායකවරයාගේ නිවේදනය**

2025 දෙසැම්බර් මස 18 වැනි බ්‍රහස්පතින්දා පූර්ව භාග 9.30 ට
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ රැස්වීමක් කැඳවීම

ගරු අග්‍රාමාත්‍යතුමියගේ ඉල්ලීම පරිදි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල 16 ස්ථාවර නියෝගය ප්‍රකාරව 2025 දෙසැම්බර් මස 18 වැනි බ්‍රහස්පතින්දා පූර්ව භාග 9.30 ට රැස්වන ලෙස පාර්ලිමේන්තුව මා විසින් කැඳවන ලද බව පාර්ලිමේන්තුවේ කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න වන මම මෙයින් දැනුම් දෙමි.

වෛද්‍ය ජගත් වික්‍රමරත්න,
කථානායක.

2025 දෙසැම්බර් මස 12 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙේ.

EOG 12 - 0096



## II

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

## A

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2025 දෙසැම්බර් මස 05වන දින "විසර්ජන" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## B

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2025 දෙසැම්බර් 17වන දින පහත සඳහන් පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

- සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන);
- ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන); සහ
- ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන)

## III

### වරප්‍රසාද: ගරු චතුරංග අබේසිංහ මහතා විසින් 2025.10.24 දින මතු කරන ලද වරප්‍රසාද සම්බන්ධ කරුණු
### சிறப்புரிமை: 2025.10.24ஆம் திகதி மாண்புமிகு சதுரங்க அபேசிங்ஹவால் எழுப்பப்பட்ட சிறப்புரிமை பற்றிய விடயம்
### PRIVILEGE: MATTERS OF PRIVILEGE RAISED BY HON. CHATHURANGA ABEYSINGHE ON 24.10.2025

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චතුරංග අබේසිංහ මහතා විසින් 2025 ඔක්තෝබර් 24වන දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකි ය.

## IV

### අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: සාමාජිකයන් නම් කිරීම
### அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: உறுப்பினர்கள் நியமனம்
### MINISTERIAL CONSULTATIVE COMMITTEES: NOMINATION OF MEMBERS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 හි විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2025 නොවැම්බර් 19 දින සහ 2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා සහ

[ගරු ගරු කථානායකතුමා]

තේරීම් කාරක සභාවේ අනුමතිය ප්‍රකාරව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරයේ සේවය කිරීම සඳහා, පහත සඳහන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවලට නම් කරන ලද සාමාජික මන්ත්‍රීවරයන්ගේ නාම ලේඛන භාෂාත්‍රයෙන්ම මම **සභාගත*** කරමි.

***සභාමේසය මත තබන ලද නාම ලේඛනය:***
**சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப்பட்டியல்:*
** List of names tabled:*

**1. ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු චතුරංග අබේසිංහ මහතා
ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු එස්.එම්. මරික්කාර් මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
ගරු කේ. ඉලංකුමාරන් මහතා
ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
ගරු තනුර දිසානායක මහතා
ගරු සුජීව දිසානායක මහතා
ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා
ගරු ධනුෂ්ක රංගනාත් මහතා
ගරු සුනිල් රත්නසිරි මහතා
ගරු ජගත් විතාන මහතා
ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
ගරු දේවානන්ද සුරවීර මහතා
ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
ගරු දිනේෂ් හේමන්ත මහතා
ගරු මුහම්මද් ෆයිසාල් මහතා
ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

**2. වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු රත්න ගමගේ මහතා
ගරු සුගත් තිලකරත්න මහතා
ගරු නලින් හේවගේ මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු රොෂාන් අක්මීමන මහතා
ගරු අබුබකර් අතම්බාවා මහතා
ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා
ගරු කේ. ඉලංකුමාරන් මහතා
ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
ගරු තිලංක යූ. ගමගේ මහතා
ගරු රුවන්තිලක ජයකොඩි මහතා
ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා
ගරු කන්දසාමි ප්‍රභු මහතා
ගරු පද්මසිරි බණ්ඩාර මහතා
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
ගරු සුනිල් බියන්විල මහතා
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා
ගරු අතුල වෙළඳගොඩ මහතා
ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

**3. නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා
ගරු නීතිඥ සුනිල් වටගල මහතා
ගරු අර්කම් ඉල්යාස් මහතා
ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා
ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
ගරු එස්.එම්. මරික්කාර් මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
ගරු රුවන්තිලක ජයකොඩි මහතා
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
ගරු චන්දන තෙන්නකෝන් මහතා
ගරු ධර්මප්‍රිය දිසානායක මහතා
ගරු නිමල් පලිහේන මහතා
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
ගරු ජගත් මනුවර්ණ මහතා
ගරු ධනුෂ්ක රංගනාත් මහතා
ගරු දීප්ති වාසලගේ මහත්මිය
ගරු ආර්.ජී. විජේරත්න මහතා
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
ගරු ෆස්මින් ෂරීෆ් මහතා
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

**1. போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ
மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க
மாண்புமிகு மனோ கணேசன்
மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்
மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா
மாண்புமிகு எஸ்.எம். மரிக்கார்
மாண்புமிகு முஜிபுர் ரஹுமான்
மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்
மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி
மாண்புமிகு கே. இளங்குமரன்
மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே
மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்
மாண்புமிகு சுகத் வசந்த த சில்வா
மாண்புமிகு தனுர திசாநாயக்க
மாண்புமிகு சுஜீவ திசாநாயக்க
மாண்புமிகு சுசந்த குமார நவரத்ன
மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ
மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க
மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல
மாண்புமிகு தனுஷ்க ரங்கநாத்
மாண்புமிகு சுனில் ரத்னசிறி
மாண்புமிகு ஜகத் விதான
மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர
மாண்புமிகு தேவானந்த சுரவீர
மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன
மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர
மாண்புமிகு தினேஷ் ஹேமந்த
மாண்புமிகு முஹம்மட் பைசல்
மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்

**2. துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு ரத்ன கமகே
மாண்புமிகு சுகத் திலகரத்ன
மாண்புமிகு நலின் ஹேவகே
மாண்புமிகு றிஸாட் பதியுதீன்
மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க
மாண்புமிகு இம்ரான் மஹ்ரூப்
மாண்புமிகு சமிந்த விஜேசிறி
மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்
மாண்புமிகு ரொஷான் அக்மீமன
மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா
மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம
மாண்புமிகு கே. இளங்குமரன்
மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை
மாண்புமிகு திலங்க யூ. கமகே
மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி
மாண்புமிகு எம். ஏ. எம். தாஹிர்
மாண்புமிகு கந்தசாமி பிரபு
மாண்புமிகு பத்மசிறி பண்டார
மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா
மாண்புமிகு சுனில் பியன்வில
மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ
மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க
மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன
மாண்புமிகு அதுல வெலந்தகொட
மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி
மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர
கௌரவ சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்
மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்

**3. வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன
மாண்புமிகு சட்டத்தரணி சுனில் வடகல
மாண்புமிகு அர்கம் இல்யாஸ்
மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்
மாண்புமிகு கே. காதர் மஸ்தான்
மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்
மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்
மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி
மாண்புமிகு எஸ்.எம். மரிக்கார்
மாண்புமிகு முஜிபுர் ரஹுமான்
மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்
மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி
மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி
மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி
மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன
மாண்புமிகு சந்தன தென்னக்கோன்
மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க
மாண்புமிகு நிமல் பலிஹேன
மாண்புமிகு ரவீந்திர பண்டார
மாண்புமிகு ஜகத் மனுவர்ண
மாண்புமிகு தனுஷ்க ரங்கநாத்
மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே
மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன
மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ
மாண்புமிகு அசித நிரோஷண எகொட விதான
மாண்புமிகு பஸ்மின் ஷரீப்
மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ

**1. Ministerial Consultative Committee on Transport, Highways and Urban Development**

The Hon. Chathuranga Abeysinghe
The Hon. Dinindu Saman Hennayake
The Hon. Mano Ganesan
The Hon. G.G. Ponnambalam
The Hon. K. Sujith Sanjaya Perera
The Hon. S.M. Marikkar
The Hon. Mujibur Rahuman
The Hon. Kaveenthiran Kodeeswaran
The Hon. Manjula Suraweera Arachchi
The Hon. K. Ilankumaran
The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law
The Hon. Mayilvaganam Jegatheeswaran
The Hon. Sugath Wasantha de Silva
The Hon. Thanura Dissanayake
The Hon. Sujeewa Dissanayake
The Hon. Susantha Kumara Nawarathna
The Hon. (Dr.) Sandaruwan Madarasinghe
The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga
The Hon. (Dr.) Nandana Millagala
The Hon. Danushka Ranganath
The Hon. Sunil Rathnasiri
The Hon. Jagath Vithana
The Hon. (Dr.) Nishantha Samaraweera
The Hon. Dewananda Suraweera
The Hon. (Dr.) Janaka Senarathna
The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law
The Hon. Dinesh Hemantha
The Hon. Muhammad Faizal
The Hon. M. Nizam Kariapper, PC

**2. Ministerial Consultative Committee on Ports and Civil Aviation**

The Hon. Rathna Gamage
TheHon. Sugath Thilakaratne
The Hon. Nalin Hewage
The Hon. Rishad Bathiudeen
The Hon. Chamara Sampath Dasanayake
The Hon. Imran Maharoof
The Hon. Chaminda Wijesiri
The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam
The Hon. Roshan Akmeemana
The Hon. Aboobucker Athambawa
The Hon. U.P. Abeywickrama, Attorney-at-Law
The Hon. K. Ilankumaran
The Hon. M.S. Uthumalebbe
The Hon. Thilanka U. Gamage
The Hon. Ruwanthilaka Jayakody
The Hon. M.A.M. Thahir
The Hon. Kanthasamy Prabu
The Hon. Padmasiri Bandara
The Hon. (Dr.) S. Sri Bavanandarajah
The Hon. Sunil Biyanwila
The Hon. (Dr.) Sandaruwan Madarasinghe
The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga
The Hon. Priyantha Wijerathna, Attorney-at-Law
The Hon. Athula Welandagoda
The Hon. Champika Hettiarachchi
The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law
The Hon. Bhagya Sri Herath, Attorney-at-Law
The Hon. M.S. Abthul Wazeeth

**3. Ministerial Consultative Committee on Housing, Construction and Water Supply**

The Hon. R.M. Jayawardhana
The Hon. Sunil Watagala, Attorney-at-Law
The Hon. Arkam Ilyas

[ගරු ගරු කථානායකතුමා]

The Hon. (Dr.) M.L.A.M. Hizbullah
The Hon. K. Kader Masthan
The Hon. Amirthanathan Adaikkalanathan
The Hon. G.G. Ponnambalam
The Hon. Lakshman Nipuna Arachchi
The Hon. S.M. Marikkar
The Hon. Mujibur Rahuman
The Hon. Kathiravelu Shanmugam Kugathasan
The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani
The Hon. Ruwanthilaka Jayakody
The Hon. Rajeevan Jeyachandramoorthy
The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law
The Hon. Chandana Thennakoon
The Hon. Dharmapriya Dissanayake
The Hon. Nimal Palihena
The Hon. Ravindra Bandara
The Hon. Jagath Manuwarna
The Hon. Danushka Ranganath
The Hon. (Mrs.) Deepthi Wasalage
The Hon. R.G. Wijerathna
The Hon. Darmapriya Wijesinghe
The Hon. Asitha Niroshana Egoda Vithana
The Hon. Fasmin Sharif
The Hon. Shantha Pathma Kumara Subasingha

## V

## වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම

### வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு: உறுப்பினர் நியமனம்

### MINISTERIAL CONSULTATIVE COMMITTEE ON TRADE, COMMERCE, FOOD SECURITY AND CO-OPERATIVE DEVELOPMENT: NOMINATION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112හි විධිවිධාන සහ 2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වාර්තාව

### அரசியலமைப்புப் பேரவையின் அறிக்கை

### REPORT OF THE CONSTITUTIONAL COUNCIL

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41උ(1) ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පස්වැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව

### கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

### AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XXI කොටස;
- 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XXIII කොටස;
- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXVIII කොටස;
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXIX කොටස; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXIV හා XXXV කොටස්, තෙවැනි කාණ්ඩයේ XXIII හා XXIV කොටස් සහ නවවැනි කාණ්ඩයේ XXI හා XXII කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## II

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXV කොටස; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXVII, XXVIII, XXIX, XXX, XXXI හා XXXII කොටස්, සිව්වැනි කාණ්ඩයේ XIV, XV, XVI, XVII හා XVIII කොටස්, පස්වැනි කාණ්ඩයේ IV, V, VI, හා VII කොටස් සහ හයවැනි කාණ්ඩයේ XVIII, XIX, XX, XXI, XXII, XXIII හා XXIV කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
Hon. Speaker, I present Supplementary Estimate No.01 of 2026 and the document referred to under Sections 16(4) (a), (b), (c) and (d) of the Public Financial Management Act, No. 44 of 2024.

I move that this Supplementary Estimate and the document be referred to the Committee on Public Finance.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the -

(i) Annual Reports of the National Institute of Education for the years 2022 and 2023; and

(ii) Annual Report of the State Printing Corporation forthe year 2023.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the Report on the submission of observations and steps taken in terms of the Standing Order No. 119(4) of Parliament with regard to the matters mentioned on the Sri Lanka Customs in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Hon. Speaker, I present the -

(i) Regulations made by the then Minister of Transport, Highways, Ports and Civil Aviation under Section 237 read with Section 151 of the Motor Traffic Act (Chapter 203) and published in Gazette Extraordinary No. 2452/40 of 04th September, 2025; and

(ii) Regulations made by the then Minister of Transport, Highways, Ports and Civil Aviation under Sections 141, 143, 144, 157A, 168 and 190 read with Section 237 of the Motor Traffic Act (Chapter 203) and published in Gazette Extraordinary No. 2455/29 of 25th September, 2025.

I move that these Regulations be referred to the Ministerial Consultative Committee on Transport, Highways and Urban Development.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, நான் பின்வரும் ஒழுங்குவிதிகளைச் சமர்ப்பிக்கின்றேன்.

(i) 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க, கடற்றொழில் மற்றும் நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தின் 61ஆம் பிரிவின்கீழ், அப்போதைய கடற்றொழில் அமைச்சரி னால் ஆக்கப்பட்டு, 2024 பெப்ருவரி 15ஆம் திகதிய 2371/35ஆம் இலக்க அதிவிசேட வர்த்தமானப் பத்திரிகையில் பிரசுரிக்கப்பட்ட ஒழுங்குவிதிகள்; மற்றும்

(ii) 1990ஆம் ஆண்டின் 23ஆம் இலக்க, கடற் றொழிலாளர் ஓய்வூதிய, சமூகப் பாதுகாப்பு நலன்புரித் திட்டச் சட்டத்தின் 29ஆம் பிரிவின்கீழ், கடற் றொழில் நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரி னால் ஆக்கப்பட்டு, 2025 மார்ச் 19ஆம் திகதிய 2428/13ஆம் இலக்க, அதிவிசேட வர்த்தமானப் பத்திரிகையில் பிரசுரிக்கப் பட்ட ஒழுங்குவிதிகள்

இவ்வொழுங்குவிதிகள் கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மென நான் பிரேரிக்கின்றேன்.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, (129 අධිකාරය වූ) සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනතේ 66 වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් 2025 දෙසැම්බර් 12 දින සාදන ලද නියෝගය මම ඉදිරිපත් කරමි.

මෙම නියෝගය කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා
## அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கைகள்
## REPORTS OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පස්වැනි වාර්තාව -ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සම්බන්ධයෙන් වූ වාර්තාව- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පිටපත් සමඟ මම ඉදිරිපත් කරමි.

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හයවැනි වාර්තාව වූ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය පිළිබඳ වාර්තාව, හත්වැනි වාර්තාව වූ මහපොළ භාරකාර අරමුදල පිළිබඳ වාර්තාව, අටවැනි වාර්තාව වූ සිවිල් ගුවන් සේවා අධිකාරිය පිළිබඳ වාර්තාව, නවවැනි වාර්තාව වූ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පිළිබඳ වාර්තාව, දසවැනි වාර්තාව ලෙස ලංකා විදුලිබල මණ්ඩලය, එල්ටීඑල් හෝල්ඩින්ග්ස් සමාගම සහ එහි පරිපාලිත සමාගම් සම්බන්ධ වාර්තාව සහ එකොළොස්වැනි වාර්තාව ලෙස ලංකා සතොස ලිමිටඩ් පිළිබඳ වාර්තාවත් සභාවේ විශේෂ අවසරය ඇතිව සිංහල භාෂාවෙන් පමණක් මම ඉදිරිපත් කරන අතර, ඉංග්‍රීසි සහ දෙමළ භාෂා පිටපත් හැකි ඉක්මණින් ඉදිරිපත් කිරීමට ද කටයුතු කරමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

# පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩී.වී. චානක මහතා.- *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
ගරු කථානායකතුමනි, ගාල්ල, වංචාවල, මීගොඩ, උස්වත්ත යන ලිපිනයෙහි පදිංචි ජේ.කේ. ඉමදූව විතාන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු කථානායකතුමනි, නුගේගොඩ, තලපත්පිටිය, කනත්ත පාර, අංක 89 යන ලිපිනයෙහි පදිංචි සිතුම් චතුරංග කුඩාගොඩ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## 2023-2025 දක්වා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල ණය ප්‍රසාරණය
### உரிமம் பெற்ற வணிக வங்கிகள் மற்றும் வங்கி அல்லாத நிதி நிறுவனங்களால் 2023-2025 வரை கடன் வழங்கல் அதிகரிப்பு
### EXPANSION OF CREDIT ISSUED BY LICENSED COMMERCIAL BANKS AND NON-BANKING FINANCIAL INSTITUTIONS FROM 2023-2025

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය පරිදි ස්ථාවර නියෝග 27(2) යටතේ මා මෙම ප්‍රශ්නය අහන්නේ, වාණිජ බැංකු - licensed commercial banks - සහ බැංකු නොවන මූල්‍ය ආයතන - non-banking financial institutions - හරහා සිදු වූ පෞද්ගලික අංශ ණය ප්‍රසාරණයේ සැලකිය යුතු වර්ධනය සහ ප්‍රධාන පාරිභෝගික ණය කාණ්ඩ පිළිබඳ පැහැදිලි, වෙන් වූ දත්ත නොමැතිකම සම්බන්ධවයි.

මහ බැංකුවේ ප්‍රකාශන අනුව, 2024දී licensed commercial banks මඟින් පෞද්ගලික අංශයේ ණය රුපියල් බිලියන 789.6කින් වැඩි වී ඇති අතර, non-banking financial institutions මඟින් රුපියල් බිලියන 277කට අධික වන ලෙස ණය ප්‍රසාරණය සිදු කර ඇත. There is credit creation that has taken place in these areas, adding to the existing loan capacity. එහෙත් රන් පවුම් ණය, වාහන ලීසිං සහ ක්‍රෙඩිට් කාඩ් ආශ්‍රිත ණය පිළිබඳ විස්තරාත්මක, වෙන් වූ දත්ත ප්‍රසිද්ධියේ නිකුත් කර නොමැත. Sir, I must say that this Question is relevant to the matters I raised on 03rd December in Parliament.

මෙම ණය කාණ්ඩ සෘජුවම පවුල් ණය බර, පාරිභෝගික වියදම් රටාවන් මුළුමනින්ම මූල්‍ය ස්ථායීභාවයට බලපාන බැවින් පද්ධතිමය අවදානම් සහ ප්‍රතිපත්ති බලපෑම් ඇගැයීමට සම්පූර්ණ, පැහැදිලි දත්ත පාර්ලිමේන්තුවට නිකුත් කිරීම අත්‍යවශ්‍ය වේ.

ඒ අනුව, මම පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු බලාපොරොත්තු වෙමි.

1. 2023, 2024 සහ 2025 සඳහා වාණිජ බැංකු මඟින් සිදු කරන ලද පෞද්ගලික අංශ ණය ප්‍රසාරණය කීයද? ඒ සඳහා වාර්ෂික වර්ධනය රුපියල් සහ ප්‍රතිශත ලෙස මොනවාද?
2. එම අවුරුදු තුනේදී බැංකු නොවන මූල්‍ය අංශය - මූල්‍ය සමාගම් සහ ලීසිං සමාගම් - මඟින් ලබා දුන් මුළු ණය ප්‍රමාණය කීයද?
3. 2023, 2024 සහ 2025 සඳහා බැංකු සහ non-banking financial institutions මඟින් ලබා දුන් රන් පවුම්/ රන් ආශ්‍රිත ණය මුළු වටිනාකම කීයද? එය කාලය අනුව කෙසේ වර්ධනය වී තිබේද?
4. 2023, 2024 සහ 2025 සඳහා වාහන ලීසිං සහ hire purchase ණයවල මුළු වටිනාකම කීයද? හැකි නම්, ඒවා බැංකු සහ non-banking financial institutions ලෙස වෙන්ව දක්වන්න.
5. 2023, 2024 සහ 2025 සඳහා ක්‍රෙඩිට් කාඩ් outstanding balances සහ කාඩ් ආශ්‍රිත ණයවල මුළු වටිනාකම කීයද?

   ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයේ අන්තර්ගතය වන්නේ මේකයි. Hire purchase, ලීසිං, ක්‍රෙඩිට් කාඩ් සහ pawning තුළින් තමයි රුපියල් බිලියන 243කට ණය ප්‍රසාරණය වැඩි වෙලා තිබෙන්නේ. එම නිසා තමයි මෙය සංවර්ධනයට බලපාන්නේ කොහොමද කියන ප්‍රශ්නය මා අහන්නේ.
6. ඉහත කාණ්ඩ තුන වන රන් පවුම්, වාහන ලීසිං සහ ක්‍රෙඩිට් කාඩ් සඳහා 2023-2024 සහ 2024-2025 අතර වාර්ෂික වර්ධනය රුපියල්වලින් සහ ප්‍රතිශත ලෙස මොනවාද?
7. මෙම ණය කාණ්ඩ සඳහා non-performing loan අනුපාත, impairment මට්ටම් සහ provisioning අවශ්‍යතා 2023, 2024 සහ 2025 සඳහා මොනවාද?
8. 2025දී පෞද්ගලික අංශ ණය වර්ධනයට රන් පවුම්, වාහන ලීසිං සහ ක්‍රෙඩිට් කාඩ් මඟින් ඇති කළ එකතු වුණු දායකත්වය රුපියල්වලින් සහ ප්‍රතිශතයක් ලෙස කීයද?
9. මෙම කාණ්ඩ තුනේ ණය ගුණාත්මකභාවය බිඳ වැටීම් හෝ නව අවදානම් - emerging risks - මහ බැංකුව හඳුනාගෙන ඇත්ද? එසේ නම්, ඒ සඳහා ගත් නියාමන හෝ අධීක්ෂණ පියවර මොනවාද?
10. රජය හෝ මහ බැංකුව විසින් පාර්ලිමේන්තුවේ අධීක්ෂණය සහ පැහැදිලිභාවය සඳහා සම්මත හා සවිස්තරාත්මක වෙන් වූ ණය දත්ත කට්ටලයක් - standardized disaggregated dataset එකක් - නිකුත් කිරීමට සැලසුම් කර ඇත්ද?

ස්තූතියි, ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමට මම කල් ඉල්ලා සිටිනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මට එක ප්‍රශ්නයක් අහන්න,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන.

2025.06.04 දින ගරු දිලිත් ජයවීර මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය ගරු විජිත හේරත් මහතා.

## සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති පියවර: විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## சுற்றுலாக் கைத்தொழிலை மேம்படுத்துவதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள்: வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரினது கூற்று
## MEASURES TAKEN FOR PROMOTION OF TOURISM INDUSTRY: STATEMENT BY MINISTER OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
ගරු කථානායකතුමනි, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. විෂයන් කීපයක් පැවතීම අභියෝගයක් නොව, එය අපගේ ජාතික අරමුණු ඉටු කර ගැනීම සඳහා ගොඩනඟා ගත් උපාය මාර්ගික සමෝදානගත ශක්තියකි. මෙමඟින් ප්‍රතිපත්ති සම්පාදනයේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ඇති වන බාධක ඉවත් කර වේගවත් හා ඒකාබද්ධ ප්‍රවේශයක් ලබා ගැනීමට හැකි වී ඇත. පසුගිය මාස කීපය තුළ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ප්‍රවර්ධන කාර්යාංශය සමඟ උපාය මාර්ගික සැසිවාර ගණනාවක් තබා ඇති අතර, හෝටල් හිමියන්ගේ සංගමය, සංචාරක මෙහෙයවන්නන්ගේ සංගමය වැනි පාර්ශ්වකරුවන් සමඟ කඩිනම් කාර්ය සාධක බලකා හමු පවත්වා ඔවුන්ගේ ප්‍රායෝගික අදහස් සෘජුවම අපගේ ප්‍රතිපත්ති සම්පාදනයට එක් කරගෙන ඇත. මෙම ඒකාබද්ධ යන්ත්‍රණය යටතේ විදේශ තානාපති කාර්යාල හරහා සංචාරක ප්‍රවර්ධනයට සෘජු නියෝග ලබා දීමටත් සංචාරක ක්ෂේත්‍රයට අවශ්‍ය පුහුණු ශ්‍රමිකයන් ගොඩ නැඟීමටත් හැකි වී ඇත. කාලය අපතේ නොයවා වේගයෙන් තීන්දු ගැනීමට මෙය මහඟු පිටුවහලකි.

2. සංචාරක සංවර්ධන බද්ද මඟින් උපයා ඇති ආදායම පහත පරිදි වේ.

   - 2024 වර්ෂය සඳහා රුපියල් 2,582,085,320.00කි.
   - 2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා මාස 9ක කාලය තුළ අපි ආදායම උපයා ගෙන තිබෙනවා, රුපියල් 2,929,705,378.70ක්. අපි මේ අවුරුද්දේ - මේ මාස නවයේ - පසුගිය අවුරුද්දට වඩා ආදායම වැඩිකරගෙන තිබෙනවා.

3. ශ්‍රී ලංකාව මේ වනවිට සංචාරක කර්මාන්තයක් ලෙස සන්නාමගත වී ඇති බැවින්, එය විධිමත් ක්‍රමයකින් සංශෝධනය කළ යුතු බවට හඳුනාගෙන ඇත. ඒ අනුව සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූලිකත්වයෙන් සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ අනෙකුත් ආයතන සඳහා ද භාවිත කළ හැකි පරිදි පොදු ජාතික සන්නාමයක් - nation branding - හඳුන්වා දීමට කටයුතු ආරම්භ කර තිබේ. මෙමඟින් වෙනත් ක්ෂේත්‍ර මඟින් සන්නාම හඳුනා ගැනීම වෙනුවට ලංකාව එක් සන්නාමයකට ගොනු කිරීමට බලාපොරොත්තු වේ. ඊට අදාළ ආයෝජන ඉදිරියේදී සිදු කරනු ඇති බව දැනුම් දෙමු.

4. 2024 ජනවාරි සිට දෙසැම්බර් කාලය සඳහා -ඒ කියන්නේ මුළු අවුරුද්ද සඳහා -ඇමෙරිකානු ඩොලර් 181.15කි. (2024දී සංචාරක කර්මාන්තයෙන් උපයා ඇති මුළු ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක් වේ.)

   2025 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ අපි ඩොලර් මිලියන 2,900 ගණනක ආදායමක් උපයලා තිබෙනවා. අපි හිතනවා, දෙසැම්බර් මාසයේ ආදායමත් එක්ක මේක ඩොලර් බිලියන තුනකට ආසන්න අගයකට ගේන්න පුළුවන් වෙයි කියලා. ඉතින්, අපි අපේ ආදායම වැඩිකරගෙන තිබෙනවා.

5. පැමිණි රට අනුව දළ වියදම් තක්සේරුව.

   එක්සත් රාජධානිය - සාමාන්‍ය දෛනික ආදායම ඩොලර් 154.82 - 263.28 අතර.

   මේ පරාසය තුළ තමයි දෛනික ආදායම ලැබෙන්නේ.

   ජර්මනිය - ඩොලර් 142.27 - 222.82 අතර දෛනික ආදායමක්.

   රුසියාව - ඩොලර් 163.84 - 201.95 අතර දෛනික ආදායමක්.

   චීනය - ඩොලර් 155.17 - 190.55 අතර දෛනික ආදායමක්.

   ඉන්දියාව - ඩොලර් 154.60 - 176.49 පරාසය තුළ දෛනික ආදායමක්.

   ඒ ආකාරයට අපි ගණනය කරලා තිබෙනවා. ඒවා වෙළෙඳ පොළ විශ්ලේෂණය මත පදනම්ව කරපු ගණනය කිරීම්.

6. ගරු කථානායකතුමනි, මෙම නිර්ණායකයට අනුව අඩු වියදම් සංචාරකයන් විවිධාකාර වේ. අඩු වියදම් සංචාරකයන් ලෙස එන තරුණයා අනාගතයේදී හොඳ රැකියාවක් ලබා තම පවුල සමඟ වැඩිපුර වියදම් කරන සංචාරකයකු ලෙස නැවත පැමිණිය හැකිය. ඔවුන් අප රට පිළිබඳ නොමිලේ ප්‍රචාරණය කරන්නන් ලෙස කටයුතු කරයි. තවද, අඩු වියදම් සංචාරකයන් වියදම් කරන මුදල්

homestay, කුඩා කඩ, කුඩා ආපනශාලා හරහා විශාල සමාගම්වලට නොව, එම ප්‍රදේශයේ ජනතාව අතට පත්වන බැවින් එය ප්‍රාදේශීය සංවර්ධනයට රුකුලක් වේ.

තවද, දේශයේ සැබෑ අත්දැකීම් විඳ ගැනීමේ අරමුණින් ඇතැම් ඉහළ මට්ටමේ සංචාරකයන් පොදු ප්‍රවාහන සේවා හා දේශීය ආහාර භාවිත කරන අතර ඔවුන් විසින් මහ දෙපස සිටින දේශීය සුළු වෙළෙන්දන්ගෙන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා ද වැඩි මුදලක් වැය කරනු ලබයි. එමඟින් කිසිදු අතරමැදියකුගෙන් තොරව එම මුදල් සෘජුවම ප්‍රජාව අතට පත්වන බැවින්, එය ප්‍රාදේශීය ප්‍රජා සංවර්ධනය සඳහා මහඟු පිටුවහලක් වනු ඇත.

7. මේ වනවිට තිබෙන මුළු කාමර සංඛ්‍යාව ගත්තොත්, එය 90,000ක් පමණ දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව ඉල්ලුමට සාපේක්ෂව අය කරනු ලබන දෛනික කාමර ගාස්තුවල අඩුවක් පවතින බව අපි පිළිගන්නවා. තවද, සංචාරකයෙකු යනු කාමරයට විශාල මුදලක් ගෙවා කාමරයට වී සිටින්නෙකු නොව වෙනත් ක්‍රියාකාරකම් සඳහා පැමිණෙන්නෙකි. ඔහු කාමරය සඳහා අඩු මුදලක් වියදම් කර අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා වැඩි මුදලක් වියදම් කරයි.

8. මේ සඳහා අංක 2450/27 දරන 2025.08.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන කටයුතු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33වන ව්‍යවස්ථාවේ බලතල ප්‍රකාරව ගරු ජනාධිපතිතුමා විසින් ජනාධිපති කාර්යසාධක බලකාය ස්ථාපිත කරන ලදී. එහි පළමු සැසිය 2025 සැප්තැම්බර් 02වැනි දින පවත්වන ලද අතර, දෙවැනි සැසිය 2025.10.14 දින පවත්වන ලදී. එහි අවසන් රැස්වීම ඊයේ දින පවත්වන ලදී. අපි ජනාධිපති විශේෂ කාර්ය සාධක බලකාය පත් කරලා සියලු ආයතන සහ අමාත්‍යාංශ ඒකාබද්ධව සංචාරක කර්මාන්තයේ දියුණුව සඳහා කටයුතු කරමින් සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ගරු අමාත්‍යතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, පිළිතුර ලබා දීම සම්බන්ධව. ගරු අමාත්‍යතුමනි, මෙම ප්‍රශ්න කිහිපයේ අරමුණ වුණේ ප්‍රශ්නයෙන් ප්‍රශ්නයට පිළිතුරු ලබා ගැනීම මෙන්ම මේ කාරණයටත් පිළිතුරු ලබා ගැනීමයි. සංචාරක කර්මාන්තය හා බැඳුණු විශාලම ප්‍රශ්නය මෙයයි. අපි සංචාරක කර්මාන්තයෙන් උපයන ධනය, ලංකාවේ වියදම් කරන මුදලට සාපේක්ෂව වැඩි යැයි හැඟී යන පරිසරයක් මතු වෙලා තිබෙනවා. ඔබතුමා පිළිගත් පරිදිම පාස්කු ඉරුදින ප්‍රහාරයට කලින් සංචාරකයෙකු විසින් හෝටල් කාමරයක් ලබා ගැනීමේදී තිබුණු දළ වටිනාකම එදාට සාපේක්ෂව අද තිබෙන්නේ සියයට 20කට වඩා අඩු ප්‍රමාණයකයි.

ගරු අමාත්‍යතුමනි, කොළඹ තරු පහේ හෝටල්වල දෛනික ගාස්තුව ඔබතුමා දන්නවා ඇති කියා මා විශ්වාස කරනවා. එම ගාස්තුව අය කිරීම තුළින් අපේ රටට ශුද්ධ පාඩුවක් වනවාය කියන ගැටලුව තමයි මෙයින් පැන නැඟෙන්නේ. නමුත්, ඔබතුමාට අපි ස්තුතිවන්ත වනවා. මොකද, ඔබතුමා පිළිගත් පරිදි සංචාරක කර්මාන්තය මත අය කරන TDL එක මඟින් විශාල ධනයක් රැස් කරගෙන තිබෙනවා. අපේ අවංක යෝජනාව මේකයි. සංචාරක ගමනාන්තයක් හැටියට අනෙකුත් සියලු තරගකාරී ගමනාන්ත අතර හොඳ සන්නාමයක් - better brand එකක් - බවට අපේ රට පත් කිරීම තුළින් පමණයි අපේ රටට ධනයක් එක් කළ හැකි සංචාරකයන් අපට ආකර්ෂණය කර ගත හැකි වන්නේ. ගරු අමාත්‍යතුමනි, ඒක තමයි අපේ හැඟීම. අපි යෝජනා කරන්නේ, ඔබතුමා උපයා ගත් බදු ආදායම භාවිත කරලා, හොඳ සන්නාමකරණයකට ගිහිල්ලා, හොඳ campaign එකක් මඟින් අපේ රට වන ශ්‍රී ලංකාව brand කරලා ලෝකය අතරට යා යුතුයි කියන එකයි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, එතුමාගේ හැඟීමට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා. අපි nation branding ආරම්භ කිරීම සඳහා මූලික ප්‍රසම්පාදන කටයුතු දැන් ආරම්භ කර තිබෙනවා. සංචාරක කර්මාන්තය දියුණු කරන්න nation branding අත්‍යවශ්‍යයි කියලා අපි පිළිගන්නවා. ඒ සඳහා අදාළ සියලු පාර්ශ්ව එක්ක සාකච්ඡා පවත්වමින් සිටිනවා. ඇත්තෙන්ම එම කටයුත්ත සඳහා විශාල මුදලක් වැය වනවා. ඒ මුදල වෙන් කර, ඉදිරියේදී අපි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් නියමානුකූලව ඒ කටයුත්ත ආරම්භ කරනවා.

බොහොම ස්තුතියි.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත
### நீதித்துறை (திருத்தம்) சட்டமூலம்
### JUDICATURE (AMENDMENT) BILL

"1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***

***2026 ජනවාරි 06වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 சனவரி 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration; to be read a Second time upon Tuesday, 06th January, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

### විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත
### நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்
### POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL

"(218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***

***2026 ජනවාරි 06වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 சனவரி 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப் பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration; to be read a Second time upon Tuesday, 06th January, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 10.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(1)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2025 දෙසැම්බර් 19 සිකුරාදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු අතර, එදින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

## අයහපත් කාලගුණය හේතුවෙන් ඇති වූ ව්‍යසනයෙන් පසු රටේ වත්මන් තත්ත්වය
## சீரற்ற காலநிலை காரணமாக ஏற்பட்ட அனர்த்தத்துக்குப் பின்னரான நாட்டின் தற்போதைய நிலைமை
## CURRENT SITUATION OF THE COUNTRY AFTER THE DISASTER CAUSED DUE TO INCLEMENT WEATHER

[පූ.භා.10.01]

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"පසුගිය දිනවල ඇති වූ 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ අධික වැසි තත්ත්වයත් සමඟ දිවයින පුරා දිස්ත්‍රික්ක 22ක ඇති වූ ගංවතුර සහ නාය යාම් හේතුවෙන් විශාල පිරිසකට දිවි අහිමි වූ අතර, බිලියන ගණනක දේපළ හානියට පත් විය.

මෙවැනි අති බිහිසුණු ස්වාභාවික ආපදා තත්ත්වයකදී අසල්වැසි ඉන්දියානු රජය ඇතුළු කලාපීය රටවල් බොහොමයක් මෙන්ම ලොව පුරා විවිධ රටවල් ගලවා ගැනීමේ කටයුතු මෙන්ම ක්ෂණික මානුෂීය ආධාර ලබා දෙමින් ශ්‍රී ලංකාවට සහාය දැක්වීය. එසේම, රජය මෙන්ම විවිධ සංවිධාන, පුද්ගලයින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙමින් ජනතාවට සහන සැලසීමට එක් විය.

දැන් අප සියලුදෙනා එක්ව සිදු කළ යුතු වන්නේ ආපදා තත්ත්වයෙන් මිදීමේ මීළඟ අදියරයන් ජය ගනිමින්, ජන ජීවිත යථා තත්ත්වයට පත් කිරීමත්, මින් ඉදිරියට මෙවැනි අවාසනාවන්ත තත්ත්වයන්ගෙන් ජීවිත හානි ඇති නොවීමට ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමත්ය. විද්‍යාත්මක කරුණු මත පදනම් වූ ප්‍රතිපත්තිමය තීරණ කරා සාමූහිකව මෙන්ම කඩිනමින් එළඹීමට කාලය පැමිණ තිබේ. ආපදා අවම භූමි නේවාසික කටයුතු සඳහා යොදා ගැනීමටත්, වගාවන් ඇතුළු සියලු ආර්ථික කටයුතුවලින් ස්වාභාවික ආපදාවලට තුඩු දෙන තත්ත්වයන් ඇති නොවීමටත් අවශ්‍ය පියවර අප ගත යුතුව තිබේ.

මේ ව්‍යසනය හේතුවෙන් ආපදාවට පත් පුද්ගලයින්ගේ ජන ජීවිත යථාවත් කිරීමටත්, අනාගත තත්ත්වයන්ට මුහුණ දීම පිණිස නිසි සැලසුමකට අනුව කටයුතු කිරීමටත් රට පෙළ ගැස්වීමට අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු කථානායකතුමනි, අපි දන්නවා, "දිට්වා" සුළි කුණාටුවත් සමඟ මුළු රටේම ඛේදවාචකයක් ඇති වුණු බව. ඒ ඛේදවාචකයෙන් පසු රට යළි ගොඩනැඟීම පිණිස රටේ ඉන්න සෑම පුරවැසියෙකුම වාගේ එකතු වෙලා දැවැන්ත මෙහෙයුමක් කරමින් සිටිනවා. ඒ අනුව දින 18ක්, 19ක් ගත වන විට බිඳ වැටුණු රට යළි ස්ථාවර කිරීමේ මූලික පියවර අපි ගනිමින් තිබෙනවා.

විශේෂයෙන්ම ගත්තොත්, මේ ආපදා තත්ත්වය ඇතුළේ ගරු ජනාධිපතිතුමා එතුමාගේ පැත්තෙන් කරන්න පුළුවන් උපරිම කැප කිරීම් කරපු බව අපේ හෘදය සාක්ෂිය දන්නවා. අපට මඟ පෙන්වමින්, නායකත්වය දෙමින්, මේ උවදුරෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම වාගේම ඔවුන්ගේ ජීවිතවලට සහ දේපළවලට සිදු වූ හානි සම්බන්ධයෙන් අදාළ කටයුතු සියල්ල එතුමා සැලසුම් සහගතව කරමින් සිටිනවා. ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමිය ඇතුළු කැබිනට් මණ්ඩලය විශේෂ තීන්දු - තීරණ ගනිමින් මේ ව්‍යසනයෙන් පීඩාවට පත් ජනතාව ඉන් මුදා ගැනීමට අදාළ සැලසුම් සහගත ක්‍රියාමාර්ගවල යෙදුණා.

ඒ වාගේම අපි දන්නවා, මේ වනකොට මේ රට නැවත ගොඩනැඟීම වෙනුවෙන් සහභාගි වෙන්න පුළුවන් හැමදෙනාම සහභාගි වුණු බව. මේ අවස්ථාවේදී අපි සිහිපත් කරන්න ඕනෑ, සියලු සම්බන්ධීකරණ මාධ්‍ය බිඳ වැටී තිබියදී, සියලු රාජ්‍ය ආයතනවලට සමීප වෙන්න සහ ඊට සම්බන්ධ

වෙන්න තිබෙන සියලු මාර්ග අහිමි වෙලා තිබියදී, රජයේ නිලධාරින් ලෙසත්, තනි තනි පුද්ගලයන් ලෙසත් කරන්න පුළුවන් උපරිම දේ කරමින්, බිම් මට්ටමින් කටයුතු කරන ග්‍රාම නිලධාරි මහත්මයා දක්වාම, නැවත සියලු රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කර ගැනීම ඉතා කෙටි කාලයකින් කර ගන්න පුළුවන් වුණු බව. විශේෂයෙන්ම මම ඒ සම්බන්ධයෙන් ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා.

මේ ව්‍යසනයෙන් වැඩියෙන්ම පීඩාවට පත් වෙච්ච දිස්ත්‍රික්ක අතුරින් එකක් තමයි, නුවරඑළිය දිස්ත්‍රික්කය. මේ ව්‍යසනය නිසා අපට යන්න පාරක් නැති වුණා; රෝහල් ටික කඩාගෙන වැටුණා; සුරක්ෂා මධ්‍යස්ථාන විශාල වශයෙන් පිහිටුවා ගන්න සිද්ධ වුණා; කඳු පිටින් නාය ගියා. මෙන්න මේ හදිසි තත්ත්වය තුළ පවා විශාල ශ්‍රම මෙහෙයුම් ආරම්භ කළා. අපි දන්නවා, කළුතරින් විශාල ශ්‍රම මෙහෙයුමක් ආරම්භ කළ බව. තමන්ගේ අතට හසු වෙච්ච හාල් කිලෝව, පොල් ගෙඩිය, වතුර බෝතලය සහ මේ ව්‍යසනයෙන් ජනතාව ගොඩගන්න අවශ්‍ය machine පවා එකතු කරගෙන දැවැන්ත පිරිසක් අපේ මේ ප්‍රදේශවලට ආවා. ඒ අතරේ විශේෂයෙන්ම දිසාපතිතුමිය, නියෝජ්‍ය පොලිස්පතිතුමා, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරු, ත්‍රිවිධ හමුදාව ඇතුළු රාජ්‍ය ආයතනවල නිලධාරින් සියල්ල මී මැසි කැලක් වාගේ එකට එකතු වෙලා මේ මෙහෙයුමට දායක වුණා. විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමස්ත රාජ්‍ය සේවකයින්ට මගේ හද පිරි ප්‍රණාමය මේ අවස්ථාවේදී පළ කරන්න කැමතියි, මෙවන් ව්‍යසනයකදී වහාම එකතු වෙලා පීඩාවට පත් වෙච්ච ජනතාව යථා තත්ත්වයට පත් කරන්න තමන්ගේ ජීවිත කැප කරමින් කටයුතු කිරීම සම්බන්ධයෙන්.

මේ ව්‍යසනයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ RDA, PRDA, වතු පාරවල්, ග්‍රාමීය පාරවල් ඇතුළු ප්‍රාදේශීය සභා මාර්ග විශාල ප්‍රමාණයක් නාය ගියා. කියන්න සතුටුයි, මේ වෙනකොට ඒ නිලධාරි මණ්ඩලවල සියලුදෙනා කැප කිරීම් කරමින්, දිවා රෑ නොබලා වැඩ කරමින් සමස්ත පාරවලින් සියයට 85කට වඩා වැඩි ප්‍රමාණයක් යථා තත්ත්වයට පත් කර තිබෙනවා; ප්‍රවාහන පහසුකම් ලබා දීලා තිබෙනවා. ඒ වෙනුවෙන් මම අපේ ප්‍රවාහන ඇමති බිමල් රත්නායක මැතිතුමාට විශේෂ ප්‍රශංසාවක් පළ කරන්න ඕනෑ. මොකද, එතුමා අවස්ථාව ලද පළමුවෙනි මොහොතේදීම අප සමඟ දුරකථනවලින් සම්බන්ධ වෙමින්, දවසට Zoom සාකච්ඡා තුන හතරක් පවත්වමින් ඒ පාරවල් ටික යථා තත්ත්වයට පත් කරන්න අදාළ උපදෙස් ටික ලබා දෙමින්, ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ අනුව පාරවල් ටික විවෘත කර තිබෙනවා. එතැනදී අපි බැලුවේ නැහැ, ඒවා RDA එකට අදාළ පාරවල්ද, PRDA එකට අදාළ පාරවල්ද, වතු පාරවල්ද, ග්‍රාමීය පාරවල්ද, ප්‍රාදේශීය සභා පාරවල්ද කියලා. රාජ්‍ය ආයතනත් සම්බන්ධ කරගෙන අපට දෙන්න පුළුවන් උපකරණ, යන්ත්‍ර සූත්‍ර, පිරිස් බලය ලබා දෙමින් පාරවල් ටික විවෘත කර තිබෙනවා. ප්‍රධාන පාරවල් 15ක විතර ප්‍රමාණයක් අපිට යථා තත්ත්වයට පත් කිරීමට තිබෙනවා. ඒ පාරවල් යථා තත්ත්වයට පත් කිරීම සරල වැඩක් නොවෙයි. ඒ සඳහා අපට විශේෂ උදවු අවශ්‍ය වෙලා තිබෙනවා. මේ සතිය ඇතුළත ඒ වෙනුවෙනුත් කරන්න පුළුවන් උපරිම දේ කිරීමට අපි කැප වෙලා වැඩ කරමින් ඉන්නවා. RDA, PRDA ඇතුළු ඒ මාර්ග පද්ධතිය පිළිසකර කරන ඉංජිනේරුවන් ඇතුළු සියලු දෙනාට අපි ඒ වෙනුවෙන් ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ඒ වාගේම මේ වෙනකොට අපි නුවරඑළිය දිස්ත්‍රික්කයේ රෝහල්වලින් සියයට 95ක් යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා. අපට යථා තත්ත්වයට පත් කරන්න තිබෙන්නේ තව රෝහල් 4යි. මේ සතිය ඇතුළත අපට ඒ රෝහල් 4ත් යථා තත්ත්වයට පත් කර ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, මේ වෙනකොට මූලික අවශ්‍යතාවක් වුණු පානීය ජල අවශ්‍යතාවෙන් සියයට 80ක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාවට දෙන්න පුළුවන්කම ලැබිලා තිබෙන බව. අපි ඒකේදීත් Water Board එක සතු ද එහෙම නැත්නම් ප්‍රජා ජල යෝජනා ක්‍රමයට අයිති ද, WASSIP එකට අයිති ද කියන භේදයකින් තොරව ඒකාබද්ධ මෙහෙයුමක් කරමින් පානීය ජල ප්‍රශ්නය විසඳමින් තිබෙනවා.

අපි දන්නවා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ විදුලි සම්බන්ධතාව සම්පූර්ණයෙන්ම බිඳ වැටිලා තිබුණාය කියන කාරණය. අද උදේ වනකොට සියයට 99ක් විදුලි සම්බන්ධතාව ලබා දීලා තිබෙන බව අපි දන්නවා. විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් transformers 1,045න්, 6ක් විතරයි අපට නැවත හදන්න තිබෙන්නේ. නමුත්, අද දවසේ ඒ වැඩ නවත්වා තිබෙනවා. මොකද, මේ ඛේදවාචකයෙන් වැඩිම පීඩාවට පත් වෙච්ච ආසනය බවට පත් වෙලා තිබුණු වලපනේට මේ වෙලාව වනවිටත් වහිනවා.

ගරු කථානායකතුමනි, විදුලිබල මණ්ඩලයේ සේවකයෝ පැය විසිහතරේම මහන්සි වෙලා කටයුතු කරමින් කොන්දේසි විරහිතව කැප කිරීමක් කළා. ඔවුන්ට අපේ ආචාරය පළ කරන්න ඕනෑ. මේ මොහොතේදී පවා ඔවුන් ජීවිත අවදානම් නොතකා කඳු නාය යන ස්ථානවල වැඩ කරමින් ඉන්නවා, ජනතාවට ආලෝකය ලබා දීම සඳහා. ඔවුන් විසින් සිදු කරන කාර්ය භාරය අතිවිශිෂ්ටයි.

ඒ වාගේම අපි දන්නවා, මේ සියලු කාරණා සම්බන්ධයෙන් ගත්තොත්, අපට ගොඩනැඟීම් සහ සියලු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සම්බන්ධ වෙන්න, නිර්දේශ දෙන්න තිබෙන එකම ආයතනය NBRO එක බව. මේ වෙනකොට පේරාදෙණියේ ඉන්න අපේ මහාචාර්යතුමා -professor- එහි ඉන්න ශිෂ්‍යයනුත්, රටේ අනිකුත් දිස්ත්‍රික්කවල සිටින භූ විද්‍යාඥයනුත්, ස්වේච්ඡා සංවිධානත් සම්බන්ධ කර ගනිමින් දැවැන්ත මෙහෙයුමක යෙදිලා ඉන්නවා. අපි දන්නවා, NBRO එකට මේ වෙනකොට නුවරඑළිය දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැමිණිලි 1,003ක් ඇවිල්ලා තිබෙන බව. මේ පැමිණිලි 1,003 පිරිසක් විදියට ගත්තොත්, 10,000කට වැඩි පිරිසක්; ඒක එවැනි පවුල් ප්‍රමාණයක් අතර තිබෙන ගැටලුවක්. ඔවුන් විසින් යුහුසුලුව, ඉතාම කාර්යක්ෂමව කාල වේලා බලන්නේ නැතුව උපරිමයෙන් වැඩ කරලා දැනට පරීක්ෂණ 188ක් කරලා තිබෙනවා. මේ පරීක්ෂණ 188 ඇතුළේ ගෙවල් 947ක වැඩ කටයුතු නිමා කරලා තිබෙනවා; ඒ පිළිබඳව reports දීලා තිබෙනවා. ඒක දැවැන්ත කාර්ය භාරයක්. පාරවල් ටික වාගේම දුරකථන මාර්ග අර්බුදයට පත් වෙලා තිබියදී, ප්‍රවාහන අපහසුකම් මැද්දේ වුණත් ඔවුන් උපරිම කැප කිරීමක් කරමින් විශාල කාර්ය භාරයක් කරලා තිබෙනවා. එතකොට ඔවුන්ට පරීක්ෂාවට ලක් කරන්න තිබුණා, පාරවල් 36ක්. ඒ පාරවල් 36න්, 26කට මේ වෙනකොට NBRO එකෙන් reports දීලා තිබෙනවා. ඒක ඔවුන් විසින් සිදු කළ දැවැන්ත වැඩක්. ඒ වාගේම පාසල් 43ක් ආපදාවට ලක්වෙලා තිබෙන බවට වාර්තා ලැබී තිබුණා. ඉන් පාසල් 22ක වැඩ කටයුතු මේ වනකොට නිමා කරලා තිබෙනවා.

මේ වනකොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිබෙන පාසල් 551න්, 503ක් විවෘත කරලා, මේ ආපදා තත්ත්වය ඉතා හොඳින් කළමනාකරණය කරමින් දරුවන්ට පාසල් පද්ධතිය තුළ අධ්‍යාපන කටයුතු ටික කරගන්න අවස්ථාව සකස් කර දීලා තිබෙන බව අපි දන්නවා. මොකද, අධ්‍යාපනය තමයි මූලික වෙන්නේ. ඒ නිසා ඊට අදාළ වටපිටාව අපි සම්පාදනය කර දීලා තිබෙනවා. මධ්‍යම පළාත තුළ තිබෙන පාසල් 1,501න්, 1,392ක් මේ වනකොට යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා.

මේ ව්‍යසනය අපට සොබා දහමෙන් එල්ල කරපු දැවැන්ත ප්‍රහාරයක් බව අපි කියන්න කැමතියි. ඒ නිසා මේ ප්‍රහාරය සම්බන්ධයෙන් මනා අවබෝධයකින් තමයි අපි වැඩ කරන්න

[ගරු මංජුල සුරවීර ආරච්චි මහතා]

ඕනෑ. අපි දන්නවා, සිදුවීම් සිදු වන්නේ කොක් හඬලා සිනාසෙන්නටවත්, ඉකිගසා හඬන්නටවත් නොව පාඩම් ඉගෙන ගැනීමට කියලා. ඒ වාගේම අපි දන්නවා, ඉතිහාසයේදී කරපු කාර්ය භාරය, වැඩ කොටස මොකක්ද කියලා. ඒ නිසා අපි ආණ්ඩුවක් විධියට ඉතිහාසයට දොස් කියනවා වෙනුවට දැන් හොඳට පාඩම් ඉගෙනගෙන තිබෙනවා, නැවත මෙවන් විපතක් ඇති වුණොත් ජනතාව ආරක්ෂා කරගන්නේ කොහොමද, ඉදිරි සැලසුම් සකස් කරගන්නේ කොහොමද කියන එක පිළිබඳව. අපි ඒ සඳහා හොඳ වැඩ පිළිවෙළක් යටතේ කටයුතු කරනවා. ඒ වාගේම මේ විපතෙන් පීඩාවට පත් වූ ජනතාවගේ ජීවිත ඉතාම කෙටි කාලයක් තුළ නැවත යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය සියලු කාර්ය භාරය අපි ආණ්ඩුවක් විධියට අනිවාර්යයෙන්ම ඉටු කරන බව ප්‍රකාශ කරමින්, මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධවත් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

යෝජනාව ස්ථිර කිරීම, ගරු සුනිල් බියන්විල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[පූ.භා.10.13]

**ගරු සුනිල් බියන්විල මහතා**
(மாண்புமிகு சுனில் பியன்வில)
(The Hon. Sunil Biyanwila)

ගරු කථානායකතුමනි, ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව ස්ථිර කරමින්, මේ අවස්ථාවේදී මෙවැනි යෝජනාවක් ගෙන ඒම සම්බන්ධව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ආපදාව සම්බන්ධයෙන් පසුගිය කාලය පුරාම අපේ රටේ ජනතාව විවිධ අදහස් හුවමාරු කරමින් හිටපු බව අපි දන්නවා. මේ ආපදාවේ ප්‍රමාණය කොච්චරද කියලා කිව්වොත්, කලා වැවේ ජල කඳ වාගේ පහළොස් ගුණයක වර්ෂාවක් කලා වැවේ පහළ කොටසට පතිත වුණා. එවැනි තත්ත්වයක් තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන් වැව් පද්ධතිය ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් සිදු කළ කටයුත්ත වෙනුවෙන් ඔවුන්ට අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ. අපි කවුරුත් දන්නවා, අපේ රට කෘෂිකාර්මික රටක්. අපේ රටේ වැව් ආරක්ෂා කිරීම අතිශය වැදගත්. විශේෂයෙන්ම මෙවැනි මොහොතක ඒ කටයුත්ත හරියට කළමනාකරණය කරමින්, ඒ කාර්ය භාරය ඉෂ්ට කිරීම ඉතාම වැදගත් වෙනවා.

අපි කවුරුත් දන්නවා, අපේ රටේ පැවැති දේශපාලන සංස්කෘතිය පසුගිය කාලයේ අපි වෙනස් කළ බව. ඒ වාගේම තමයි මේ ව්‍යසනකාරී තත්ත්වය තුළ අපි අලුත් සංස්කෘතියක් ගෙනාවා. මොකක්ද ඒ සංස්කෘතිය? අපි කවුරුත් දන්නවා, ඉතිහාසයේ අන් කවරදාටත් වඩා විශේෂයෙන්ම දේශපාලන අධිකාරිය, රාජ්‍ය නිලධාරින්, ජනතාව -අපි හැමෝම- එකතු වෙලා එක කණ්ඩායමක් හැටියට, එක පොකුරක් හැටියට මේ තත්ත්වය වෙනස් කරන්න පොර බඳපු බව. අපිට ඒ සඳහා උදාහරණ ගෙනහැර දක්වන්න පුළුවන්. මම නියෝජනය කරන්නේ මාතලේ දිස්ත්‍රික්කය. මෙම ආපදා තත්ත්වයට මුහුණ දුන් ජනතාවට ආධාර ලැබෙන වෙලාවේ, මාතලේ මහ දිසාපතිතුමා මුට්ට කරගහලා, මේ වෙලාවේ රට වෙනුවෙන් ඔහුගේ කාර්ය භාරය ඉෂ්ට කරනවා. ඒ වාගේම තමයි අපේ දිස්ත්‍රික්කය ගත්තොත්, ප්‍රාදේශීය ලේකම්වරියන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන් තමන්ගේ රක්ෂාව ගැන හිතන්නේ නැතුව, ඊට එහා ගිය කාර්ය භාරයක් ඉෂ්ට කරනවා. ඔවුන් භාණ්ඩ බානවා, භාණ්ඩ පටවනවා. ඒ වාගේම ඉතාම අමාරු කටයුත්තක් වන මිනී ගොඩගන්නත් ඔවුන් මැදිහත් වෙනවා. අපි කවදාවත් ඉතිහාසයේ එහෙම දේවල් දැක නැහැ. හැබැයි, අපි ආණ්ඩුවක් හැටියට සමත් වුණා, අර දේශපාලන සංස්කෘතිය වෙනස් කළා වාගේම, අලුත් සංස්කෘතියක් හදන්න; රටට ඕනෑ කරන සංස්කෘතියක් හදන්න මේ වෙලාව පාවිච්චි කර ගන්න. මේ වෙලාවේ අලුත් සංස්කෘතියක් හදමින් දේශපාලන අධිකාරිය, රාජ්‍ය යන්ත්‍රණය සහ ජනතාව -අපි හැමෝම- එකතු වෙලා ඉතාම කෙටි කාලයක් ඇතුළත රට යථා තත්ත්වයට ගෙනෙන්න සමත් වුණා. සියයට 100ක්ම නැති වුණත්, ජන ජීවිතයට හානියක් නොවී පවත්වා ගෙන යන්න අපි සමත් වුණා. ඒ විතරක් නොවෙයි, අපි දන්නවා, හැම දාමත් මේ වාගේ තත්ත්වයක් ඇති වුණාම බඩු මිල ශීඝ්‍රයෙන් ඉහළ යනවා. හැබැයි, අපි සමත් වුණා, ඒ තත්ත්වය පාලනය කරගෙන ස්ථාවර මිලක් පවත්වා ගෙන යන්න. එය අපි ලැබූ විශාල ජයග්‍රහණයක් ලෙස අප සලකනවා.

අපි කවුරුත් දන්නවා, මේ ව්‍යසනය නිසා ජීවිත විශාල ප්‍රමාණයක් අහිමි වුණා; දේපළ විශාල ප්‍රමාණයක් අහිමි වුණා. හැබැයි, එසේ ජීවිත අහිමි වුණු අයගේ පවුල්වල අයටත්, දේපළ අහිමි වුණු අයටත් උපරිම සාධාරණය ඉෂ්ට කරන්න අපි සමත් වුණා. පසුගිය කාලවලදී මේ වාගේ ආපදා තත්ත්වයන් ඇති වුණාම ගත් ක්‍රියාමාර්ග ගැන අපි දන්නවා. ආපදා නිවේදන නිකුත් කළාට පසුව ඒ තැන්වලින් ජනතාව අයින් කිරීමට වෙන් කර තිබුණේ රුපියල් ලක්ෂ 16ක මුදලක්. හැබැයි, ඒ අය ඒ තැන්වලින් අයින් වුණේ නැහැ. මොකද, ලක්ෂ 16කට ඒගොල්ලන්ගේ ජීවිත ගොඩනඟා ගන්න බැහැ. හැබැයි, අපි මේ කාරණය ගැන අවධානය යොමු කර විශාල මුදලක් ඔවුන් වෙනුවෙන් වෙන් කර තිබෙනවා. ඇයි? නැවත එවැනි තත්ත්වයකට මුහුණ දෙන්න අපේ රටේ ජනතාවට ඉඩ තබන්න බැහැ. ඒ නිසා මේ තත්ත්වය හරියට අවබෝධ කරගනිමින් අපි නියම තීන්දු අරගෙන තිබෙනවා.

අපි කවුරුත් දන්නවා, මේ වෙලාවේ විශේෂයෙන්ම ආණ්ඩුවක් හැටියට අපේ භාවිතාව තුළ ලෝකයට කොයි විධියේ පණිවුඩයක් දුන්නාද කියන කාරණය. අපිට එහෙම කරන්න පුළුවන් වුණේ ඇයි? අපි දන්නවා, පසුගිය කාලවල මෙවැනි ආපදා සිදුවුණු අවස්ථාවලදී, විශේෂයෙන්ම සුනාමි ව්‍යසනය ඇති වුණු වෙලාවේ අපි පක්ෂයක් හැටියට මැදිහත් වුණු විධිය. එවකට අපේ ආණ්ඩුවක් තිබුණේ නැහැ. හැබැයි, අපි ඒ වෙලාවේ මොකක්ද කළේ? අපිට පැවරුණු කාර්ය භාරය අපි ස්වේච්ඡාවෙන් සිදු කළා. කෝච්චි පාරවල් හැදුවා, ජනතාවට උදවු කළා. අපි විවිධ දේවල් කළා. ඒ අත්දැකීම අපට තිබුණා. ඒ අත්දැකීම අනුව අපි මේ වෙලාවේ ආණ්ඩුවක් හැටියට සමත් වුණා, රටේ ජනතාවට, රටට ඉක්මනින් සහන අත් කරදෙන්න.

අපි දන්නවා, මේ වෙලාවේ අපේ රටේ ගොවීන්ගේ ගොවි බිම් විශාල ප්‍රමාණයක් හානියට පත් වී තිබෙන බව. අපි ඒවා පිළිසකර පත් කර දීමට මැදිහත් වුණා. විශේෂයෙන්ම යුද හමුදාවේ පිරිස්, ඒ වාගේම අපේ පක්ෂ බලවේගය - අපි - සියලු දෙනා එකතු වෙලා මහ කන්නයේදී වැඩි බිම් ප්‍රමාණයක් වගා කරන්න, වී ඉහින්න, අස්වද්දන්න හැකි වන පරිදි එම කුඹුරු ඉඩම් අද වනවිට පිළිසකර කරමින් තිබෙනවා. අපේ සහන කණ්ඩායම්, හමුදාවේ භට කණ්ඩායම්, වෙනත් ස්වේච්ඡා කණ්ඩායම් ඒ ගොවි බිම්වලට යොමු කරලා තිබෙනවා. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා, සියයට 90ට වැඩි ගොවි බිම් ප්‍රමාණයක් ඉතාම වේගයෙන් සකස් කර දෙන්න, මේ මහ කන්නයේ වගා කිරීම සඳහා. අපි ඒකට වේගයෙන් මැදිහත් වෙමින් ඉන්නවා. ඒ වාගේම මෙවැනි තත්ත්වයක් තුළ වුණත් අපි සමත් වුණා, ඉතාම කෙටි කාලයකින් විදුලිය ලබා දෙන්න; ජලය ලබා දෙන්න. ඒ වාගේම අපි 16 වැනිදා පාසල් පටන් ගන්න ඕනෑ කරන වටපිටාව හැදුවා. සමහර පාසල් පටන් ගන්න තියා හිතන්නවත් බැරි තත්ත්වයක් තිබුණේ. හැබැයි, අපි මැදිහත් වෙලා ඉතාම කෙටි කාලයක් ඇතුළත, 16 වැනිදා පාසල් පටන් ගැනීම සඳහා විශාල කාර්ය භාරයක් කළා. ඒ අනුව වැඩි පාසල් ප්‍රමාණයක් පටන් ගන්න අපට පුළුවන්කම ලැබුණා.

ඒ වාගේම ඉතිහාසයත් එක්ක සාපේක්ෂව බැලුවාම -අපි හැම දෙයක්ම බලන්නේ සාපේක්ෂව- ඉතිහාසයේ මේ වාගේ තත්ත්වයකදී ක්‍රියා කරනකොට කොපමණ වංචා සිද්ධ වුණාද කියලා. බඩු භාණ්ඩ බෙදා හරිද්දී, ආධාර බෙදා හරිද්දී, ජනතාවට යම් දේවල් බෙදා හරිද්දී කොයි තරම් අකටයුතුකම් සිද්ධ වුණාද? හැබැයි, අපි සමත් වුණා එවැනි තත්ත්වයක් ඇති නොවන තැනට කටයුතු කරන්න. මෙන්න මේ අකටයුත්ත සිද්ධ වුණාය, මෙන්න මේ දූෂණය සිද්ධ වුණාය කියලා අපට කිසිම චෝදනාවක් එල්ල වෙන්නේ නැහැ; විවේචනයක් එල්ල වෙන්නේ නැහැ. ඇයි එහෙම වුණේ? අපි සමත් වුණා පක්ෂයක් හැටියට, ආණ්ඩුවක් හැටියට, රාජ්‍ය නිලධාරින්, ජනතාව, ඒ වාගේම දේශපාලන අධිකාරිය හැටියට එක පොකුරක් වාගේ සහෝදරත්වයෙන් මේ වැඩේට මැදිහත් වෙන්න. අන්න ඒ තුළ සියල්ල හරි විවෘතයි; කාටත් විනිවිද පෙනෙනවා. ඒ නිසා අපි සමත් වුණා වංචාවෙන්, හොරකමෙන්, දූෂණයෙන් තොරව මේ වැඩේ කරගෙන යන්න.

ඒ වාගේම තවත් සංස්කෘතියක් අපි හැදුවා. ප්‍රාදේශීය ලේකම්වරුන්ට අපි රුපියල් මිලියන 50ක් වියදම් කිරීමේ බලය දුන්නා. ග්‍රාම නිලධාරිවරුන්ට රුපියල් 50,000ක් වියදම් කිරීමේ බලය දුන්නා. අන්න එවැනි තත්ත්වයක් නිර්මාණය කරලා, ජනතාව, නිලධාරින් සහ දේශපාලන අධිකාරිය අතර විශ්වාසය අපි ගොඩනැඟුවා. අපට එහෙම කරන්න පුළුවන් වුණේ අත්දැකීම් එක්ක, ඇත්ත වුවමනාවෙන් අපි මේ කාර්යයට මැදිහත් වුණු නිසා. ඒ තුළ අපට පුළුවන් වුණා, ලෝකය අප දිහා බලන විධිය වෙනස් කරන්න. ලෝකයේ හැම රටක්ම අප කෙරෙහි විශ්වාසය තැබුවා. විශ්වාසය තබලා, ඉන්දියාව ඇතුළු ලෝකයේ රටවල් විශාල ප්‍රමාණයක් අපට උදව් කරන්න වේගයෙන් මැදිහත් වුණා. ඒ වාගේම ලෝකය පුරා ජනතාව මේ තත්ත්වයෙන් ගොඩ ඒමට ලංකාවට උදව් කරන්න විශාල වශයෙන් මැදිහත් වුණා. ඇයි එහෙම මැදිහත් වුණේ? විශ්වාසයක් හැදිලා තිබෙනවා, මෙන්න මේ ආණ්ඩුව නියම විධයට ඒවාට මැදිහත් වෙනවාය කියලා.

ඒ වාගේම ජාතික වශයෙන් හැම ජන කොට්ඨාසයක්ම මේ කාර්යයට සම්බන්ධ කර ගන්න අපට පුළුවන් වුණා. විශේෂයෙන්ම විපක්ෂයේ බොහෝදෙනා, බිම් මට්ටමේ ඉන්න බොහෝදෙනා දේශපාලන භේදයකින් තොරව අප සමඟ එකතු වුණා. එකතු වෙලා, අපි කරන මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා සහාය වුණා. එහෙම එකතු වුණේ ඇයි? ඔවුන් පැහැදිලිව දැක්කා, වංචාවෙන්, දූෂණයෙන්, හොරකමෙන් තොර පැහැදිලි වැඩ පිළිවෙළක් බිමේ ක්‍රියාත්මක වෙනවාය කියලා. ඒ වැඩ පිළිවෙළ තමයි මේ වෙලාවේ රට ඉල්ලන වැඩ පිළිවෙළ, රටේ පුරවැසියෝ හැටියට අපත් ඒ වැඩ පිළිවෙළට මැදිහත් වෙන්න ඕනෑය කියන අර්ථයෙන් ඒ අය මැදිහත් වෙනවා. ඒ අනුව මෙවැනි තත්ත්වයකින් පසුව ඉතාම වේගයෙන් යථා තත්ත්වයට පත්වුණු එකම රට ලංකාවය කියන පණිවුඩය ලෝකයට දෙන්න, ඉතිහාසගත වෙන්න අපට හැකි වෙයි කියලා අපි කල්පනා කරනවා. ඒ සඳහා සහයෝගය දෙන සියලුදෙනා නැවත නැවතත් මතක් කරමින්, මා නිහඬ වෙනවා.

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

Next, the Hon. Gayantha Karunathilleke. You have 28 minutes.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

Okay. The Hon. Leader of the Opposition. You have 28 minutes.

[පූ.භා.10.23]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**

(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, පළමුවෙන්ම "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් සියලුම දෙනා වෙනුවෙන්; විශේෂයෙන්ම ජීවිත අහිමි වුණු ඒ වාගේම නෑදෑ හිතවතුන් අහිමි වුණු, දූදරුවන්, දෙමව්පියන් අහිමි වුණු සහ ඒ මහා ව්‍යසනය තුළ අවතැන් වුණු ඒ සියලු දෙනා වෙනුවෙන් අපේ කනගාටුව, බලවත් ශෝකය සහ සාතිශය සංවේගය මේ අවස්ථාවේ පළ කරන්න කැමැතියි.

ඒ වාගේම, ආපදාවට, ව්‍යසනයට ලක් වුණු ජනතාව බේරා ගන්න, මුදා ගන්න අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කළ ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රය ඇතුළු ආරක්ෂක අංශවලට සහ රාජ්‍ය තන්ත්‍රයේ හැම ක්ෂේත්‍රයකටමත්; බිම් මට්ටමේ සියලුදෙනාට, සෞඛ්‍ය ක්ෂේත්‍රය ඇතුළු සමස්ත රාජ්‍ය සේවයට, ඒ වාගේම ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වුණු කණ්ඩායම්, පරිත්‍යාගශීලීව පෞද්ගලිකව ඉදිරිපත් වුණු කණ්ඩායම් සහ පුද්ගලයන් සියලු දෙනාටමත් අපේ ස්තුතිය සහ ප්‍රණාමය පුද කර සිටිනවා. ඒ සියලු දෙනා මේ රටේ මිනිසුන්ගේ ජීවිත බේරා ගත් රටේ විරුවන් හැටියටයි අපි හඳුන්වන්නේ.

ඒ වාගේම මේ අමාරු අවස්ථාවේ අපේ රටට දේශීය වශයෙනුත්, විදේශීය වශයෙනුත් ආධාර උපකාර කරපු පුද්ගලයන්, රටවල්, සංවිධාන තිබෙනවා. ඒ සැම සියලු දෙනාටම අපේ ගෞරවය සහ ප්‍රණාමය පුද කරනවා. නැවත නැවතත් ඉල්ලා සිටිනවා, අපේ රටේ මේ විපතට පත් වූ ජනතාවට වැඩි වැඩියෙන් උදව් කරන්න, තව තවත් සහයෝගය ලබා දෙන්න කියලා.

"දිට්වා" සුළි කුණාටුව ගැන කථා කරනකොට විශේෂයෙන්ම ආපදා ක්ෂේත්‍රය තුළ අපි කොටස් කිහිපයකට වෙන් කරලා මේක අවබෝධ කර ගන්නට ඕනෑ. ආපදාවට පෙර, ආපදාව තුළ, ආපදාවට පසු එයත් සමඟ ක්‍රියාත්මක වෙන අධීක්ෂණ සහ ඇගැයීම් ක්‍රියාවලියක් -pre-disaster, disaster, post-disaster, monitoring and evaluation- තිබෙනවා. මෙන්න මේ අංශ පැත්තෙන් අපි මේ ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳව සාකච්ඡා කරන්නට ඕනෑ. මම කැමැතියි, මේ සම්බන්ධයෙන් යෝජනා ගණනාවක් ඉදිරිපත් කරන්න. සමහර කෙනෙක් කියන්න පුළුවන් මේවා චෝදනා කියලා. නමුත් මම යෝජනාවක් කරනවා, මේ අවස්ථාවේ අපි ඉදිරිපත් කරන කරුණු කාරණා ධනාත්මකව බාර ගන්න කියලා. ඒ මොකද, නිවැරදි ගමනක් යා යුතුව තිබෙන මේ මොහොතේ අප අඩු පාඩුකම්, ඌනතාවන්, විෂමතාවන් නිවැරදි කර ගන්නට ඕනෑ.

ඇත්ත වශයෙන්ම අපේ රටේ ආපදා කළමනාකරණ යන්ත්‍රණය අතිදුර්වලයි. මේ අතිදුර්වල ආපදා කළමනාකරණ යන්ත්‍රණය වෙනස් කොට අලුත් යන්ත්‍රණයක් සකස් කරන්න අනිවාර්යයෙන්ම කටයුතු කරන්නට ඕනෑ. ඒ යන්ත්‍රණය ශක්තිමත් කිරීම උදෙසා 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත වෙනස් කරලා ශක්තිමත් මධ්‍ය යන්ත්‍රණයක් තුළින් ආයතන බිහි කරලා, බිම් මට්ටමට විහිදී යන කාර්යක්ෂම යන්ත්‍රණයක් -efficient machinery එකක්- අත්‍යවශ්‍යයි. අද වන විට ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය කටයුතු කරන්නේ සම්බන්ධීකාරක ආයතනයක් - coordinating body එකක් - හැටියටයි. ඒක කිසිසේත් ප්‍රමාණවත් නැහැ. ආපදාවට සෘජුව මුහුණ දෙන්න පුළුවන්, head-on ඒ challenge එක භාර ගන්න පුළුවන් ශක්තිමත් ආයතනවලින් සමන්විත ආපදා

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කළමනාකරණ ව්‍යුහයක් නිර්මාණය වෙන්නට ඕනෑ. ඒ සඳහා වෙනමම කැබිනට් අමාත්‍යාංශයක් අනිවාර්යයෙන්ම ස්ථාපනය විය යුතුයි කියන එක අපි තරයේ විශ්වාස කරනවා. ආපදා කළමනාකරණ ක්‍රියාවලිය එක එක කැබිනට් අමාත්‍යාංශවල එල්ලා තබනවා වෙනුවට ඒ විෂයටම බලපාන ආකාරයෙන් කැබිනට් අමාත්‍යාංශයක් නිර්මාණය කිරීම වාගේම රටේ තිබෙන අමාත්‍යාංශවලින් ප්‍රමුඛතම අමාත්‍යාංශයක් බවට ගොඩනැඟීම අප සිදු කළ යුතුයි.

විශේෂයෙන්ම නවීන තාක්ෂණයෙන්, නවීන උපකරණවලින් ඒ යන්ත්‍රණය ශක්තිමත් කරන්නට ඕනෑ. ඒ නිර්මාණය වන ආයතනවල ශක්තිසම්පන්නභාවය අපි තහවුරු කරන්නට ඕනෑ; උපරිම භෞතික සම්පත්, මානව සම්පත් ලබා දෙන්න කටයුතු කරන්නට ඕනෑ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - NBRO-, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය -GSMB-, ඒ වාගේම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වැනි ආයතන අපි තවදුරටත් ශක්තිමත් කරන්නට ඕනෑ. Doppler Radar system එක යෝජනා වුණේ සුනාමියෙන් පසුවයි. අදටත් සම්පූර්ණ Doppler Radar system එකක් අපේ රටට නැහැ. ගොන්ගල කන්දේ Doppler radar system එකක් හදන්නට දරපු උත්සාහය ව්‍යර්ථ වුණා. හරි නම් Doppler Radar systems දෙකක් පුත්තලමේත්, පොතුවිල්වලත් ස්ථාපනය වෙන්නට ඕනෑ. අද JICA ආධාර යටතේ මුල් ගල් තියලා ඒ ක්‍රියාවලිය පුත්තලමෙන් ආරම්භ වෙලා තිබෙනවා. අපි සඳහන් කරනවා, JICA එකටම කථා කරලා ඒකට සමාන්තරව පුත්තලමේ Doppler Radar system එකක් ක්‍රියාත්මක කරන්න ඕනෑ බව. අපි ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ Rapid Deployment Force එකක් හදන්න ඕනෑ.

දැන් බලන්න, අපේ සහෝදර රට වන ඉන්දියාව දිහා. ඒ රටේ තිබෙනවා, NDRF - National Disaster Response Force - එකක්. "දිට්වා" සුළි කුණාටුව ඉන්දියාව පැත්තට යනකොටත්, NDRF එක අපේ රටට ඇවිල්ලා විශාල සහයෝගයක් ලබා දුන්නා. මොකක්ද මේ NDRF එකෙන් කරන්නේ? Disaster mitigation, providing resources, relief and rehabilitation; ආපදා අවම කිරීම, සම්පත් ලබා දීම, සහන ලබා දීම සහ පුනරුත්ථාපන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමයි.

අපේ රටේ රැකියා විරහිත උපාධිධාරීන් 35,000ක් ඉන්නවා. ඒ අයගෙන් යම් පිරිසකට විශේෂිත වූ විෂයානුබද්ධ පුහුණුව ලබා දීලා, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය තුළ මේ Rapid Deployment Force එක ශක්තිමත්ව මධ්‍යගත කිරීමත්, විමධ්‍යගත කිරීමත් තුළින් ග්‍රාමීය මට්ටමෙන්, ප්‍රාදේශීය මට්ටමෙන්, බිම් මට්ටමෙන් වෙනමම යන්ත්‍රණයක් සකස් කිරීම අත්‍යවශ්‍යයි කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම දත්ත පැත්තෙන් ද ලොකු අඩු පාඩුවක් තිබෙනවා. දත්ත ඒක රාශි කිරීම - collating data, දත්ත විශ්ලේෂණය කිරීම, ඒ දත්ත කේන්ද්‍රීයව විශේෂයෙන්ම සිතියම්ගත කිරීම, අවදානම් සහිත බල ප්‍රදේශ සිතියම්ගත කිරීම - mapping of vulnerable areas - යනාදි කරුණු කාරණා තුළ බරපතළ අඩු පාඩු රැසක් තිබෙනවා. විශේෂයෙන්ම මේ අවස්ථාවේ අපි යෝජනා කරනවා, අපේ රටේ නැවත වරක් අලුතින්ම ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයක් - Household Income and Expenditure Survey එකක් - කරන්න ඕනෑ කියලා. අපි බලන්න ඕනෑ, මේ විනාශය තුළ දරිද්‍රතා රේඛාවට එල්ල වී තිබෙන බලපෑම, රටේ දළ දේශීය නිෂ්පාදිතයට එල්ල වී තිබෙන බලපෑම මොකක්ද කියලා. ඒ කරුණු කාරණා විද්‍යාත්මකව ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරන්නට ඕනෑ. ඒ වාගේම ආපදාවට ලක් වූ ජනතාවට ලබා දිය යුතු සහන ටික විධිමත්ව, ඉක්මනින්ම ලබා දීම සඳහාත් කටයුතු කරන්නට ඕනෑ.

හෙට දිනයේ සම්මත කර ගන්නට බලාපොරොත්තු වන රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවට අපේ පූර්ණ සහයෝගය ලැබෙනවා. හැබැයි, ඒ ඇස්තමේන්තුව අනුමත කර ගන්නවා වාගේම පොරොන්දු වුණු සියල්ල, විශේෂයෙන්ම 08/2025 චක්‍රලේඛය තුළින් පුද්ගලයින්ට දෙන ආධාර ටික, දරුවන්ට දෙන ආධාර ටික, පවුල්වලට දෙන ආධාර ටික, ඉඩම් ආධාර ටික, නිවාස ආධාර ටික ඇතුළු සියල්ල කඩිනමින් ලබා දෙන්න විධිමත්, ශක්තිමත් සහ වේගවත් ක්‍රමවේදයක්, යන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. විශේෂයෙන්ම විපක්ෂය හැටියට අපි අවබෝධයෙන් යුතුව බලා සිටිනවා, 08/2025 චක්‍රලේඛයේ විධිවිධාන ඉතාම පිරිසිදුව, වගකීමෙන්, වගවීමෙන් සහ විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය දෙස. මම විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ, එය නිර්දේශපාලනීකරණයට ලක් වුණු ක්‍රමවේදයක් තුළ ඉදිරියට යන්නට ඕනෑ බව, විනිවිදභාවය රකින්නට ඕනෑ බව, වගවීම, වගකීම රකින්නට ඕනෑ බව.

දැන් මා සතුව තිබෙනවා විශේෂයෙන්ම ගෙවල් පිරිසිදු කර ගන්නට ලබා දෙන රුපියල් 25,000 application එක, බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට එම රුපියල් 25,000 අනුමත කර ගැනීම සඳහා අදාළ වන චක්‍රලේඛය. මම මේ කථා කරන්නේ, බදුල්ල දිස්ත්‍රික්කය ගැනයි. එහි තිබෙනවා, ආපදා සහන නිලධාරිගේ නිර්දේශය; ඒක ප්‍රශ්නයක් නැහැ, ග්‍රාම නිලධාරිගේ නිර්දේශය; ඒකත් ප්‍රශ්නයක් නැහැ, ආර්ථික සංවර්ධන නිලධාරිවරයාගේ නිර්දේශය; ඒකත් ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඊට පස්සේ තිබෙනවා ප්‍රජා සංවර්ධන සභාවේ සභාපතිගේ නිර්දේශය. මොකක්ද මේ කියන ප්‍රජා සංවර්ධන සභාව? ඒක ජනතා විමුක්ති පෙරමුණේ සමිතියක්; නම් කරලා යවපු සමිතියක්. එතකොට, ප්‍රජා සංවර්ධන සභාවේ සභාපතිගේ නිර්දේශය ඕනෑද, රුපියල් 25,000 ගන්න, රුපියල් 50,000 ගන්න, රුපියල් ලක්ෂ 25 ගන්න, රුපියල් ලක්ෂ 50 ගන්න? මම ඒ ලේඛනය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

මේ තිබෙන්නේ, බදුල්ල දිස්ත්‍රික්කය සඳහා වන අයදුම් පත්‍රය. නිවසක තහඩුවක් ගැලවිලා ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කියලා පොරොන්දු වුණා. ඒකටත් අවශ්‍ය වෙනවාද, ප්‍රජා සංවර්ධන සභාවේ සභාපතිවරයාගේ නිර්දේශය? මේක බොහොම කනගාටුදායකයි. ඒකයි අප කියන්නේ, මෙම ක්‍රියාවලිය නිර්දේශපාලනීකරණයට ලක් වෙන්න ඕනෑ කියලා. කරුණාකර මේ විපතත් එක්ක දේශපාලනය කරන්න සූදානම් වෙන්න එපා කියන කාරණය මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

අවදානම් ප්‍රදේශවල නැවත පදිංචි කරවීම කියන කාරණය ගනිමු. අවදානම් තිබෙනවා කියලා NBRO එක ඒ ජනතාව යවනවා කඳවුරුවලට. ඊට පස්සේ කියනවා දැන් ආපහු හිටපු තැනටම යන්න, කඳවුරු ඉවත් කර ගන්නවා කියලා. මට ඒකට උදාහරණ වශයෙන් කරුණු කියන්න පුළුවන්. මාතලේ දිස්ත්‍රික්කයේ උඩුගම කන්ද නාය ගියාම ඒ ප්‍රදේශයේ ජනතාව ඇවිල්ලා හිටියේ අලකොළමඩ කනිෂ්ඨ විද්‍යාලයේ. ඒක දැඩි අවදානම් ප්‍රදේශයක්. දැන් ඒ ජනතාව ආපහු යවනවා. අපි පිළිගන්නවා පාසල් පද්ධතිය විවෘත කරන්නට ඕනෑ කියලා. ඒ ගැන විවාදයක් නැහැ. හැබැයි, මේ අවතැන් වූ අයට විකල්ප කඳවුරක් වෙනත් ස්ථානයක ස්ථාපනය කරන්නට ඕනෑ. NBRO සහතිකය පාවිච්චි කරනවා, ඒ මිනිස්සු කඳවුරට යවන්න. ඊට පස්සේ පාසල විවෘත කරන්න තිබෙනවා කියලා NBRO එක

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අවදානම් කියලා ප්‍රකාශ කරපු ප්‍රදේශයටම ආපහු ඒ මිනිස්සු යවනවා නැවත පදිංචි කරන්න. මාතලේ දිස්ත්‍රික්කයේ අලහුමලේ කන්ද බල ප්‍රදේශයේත් මේ ප්‍රශ්නය වෙලා තිබෙනවා. තවත් උදාහරණ ඕනෑ තරම් මට කියන්න පුළුවන්. ඒ නිසා මෙන්න මේ අඩුපාඩුවත් නිවැරදි කර ගන්න කියලා මම රජයෙන් ඉල්ලීමක් කරනවා.

මිනිසා විසින්ම නිර්මාණය කරපු මහා ඛේදවාචක තිබෙනවා. ඒ තුළින් බරපතළ නාය යෑම්, කඳු කඩා වැටීම් වැනි බරපතළ තත්ත්ව නිර්මාණය වෙලා තිබෙනවා. දොඩම්ගස්ලන්ද ඉකිරිවත්ත බල ප්‍රදේශයේ මොකක්ද වෙලා තිබෙන්නේ? ඉකිරිවත්ත ප්‍රදේශයේ ගොම්මුන්නාව කඳු පද්ධතියේ වෙනම ම ගල් කොරි ක්‍රියාත්මක කරනවා. මීට වසර ගණනාවකට පෙර ජනතාව උද්ඝෝෂණය කළා, මේ ගල් කොරි ටික ඉවත් කරන්න කියලා. අද ඒ මුළු බල ප්‍රදේශයම නාය ගිහිල්ලා තිබෙනවා. ගමේ ජනතාව පාරට බැහැලා මේ ගල් කොරිවලට විරුද්ධව කථා කරනකොට ඒ ගොල්ලන් අධිකරණයට ගෙනිහිල්ලා අදටත් ඒ නඩුව යනවා. මම ඒ සියලු විස්තර මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

දොඩම්ගස්ලන්ද ප්‍රදේශයේ ඉකිරිවත්ත බල ප්‍රදේශයේ සිදු වෙන පතල් කැනීම් වාගේම, ගල් කොරි නිසා ඇති වෙන හානිය ගැන සොයා බලා, අධිකරණයට ගෙනිච්ච ඒ මිනිස්සු ටික කරුණාකරලා නිදහස් කරලා දාන්න. ඒ අය උද්ඝෝෂණය කළේ මනුෂ්‍යයා විසින්ම නිර්මාණය කරපු ඒ ආපදාවට, පරිසර හානියට විරුද්ධවයි කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ඒ වාගේම විශේෂ බලකායක් මධ්‍යගතව සහ විමධ්‍යගතව ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. විධිමත් පුහුණුවක් ලබා දෙන්නට ඕනෑ ඒ කණ්ඩායමට. මේ ව්‍යසනයෙන් පාඩම් ඉගෙන ගන්නට ඕනෑ. අපේ රට national disaster management පිළිබඳ හොඳ හැකියාවක් තිබෙන, හොඳ පුහුණු කණ්ඩායම් සිටින regional centre එකක් බවට පත් වන ආකාරයට අපි මේ ඛේදවාචකය තුළින් පාඩම් ඉගෙන ගෙන අලුත් ගමනක් යන්නට ඕනෑ.

අපි ආපදාවට ලක් වුණු වින්දිතයන්ගේ - victimsලාගේ - අයිතිය ආරක්ෂා කරන්නට ඕනෑ. මේ ආපදාවේ වින්දිතයන්ගේ අයිතීන් - rights of the disaster victims - ආරක්ෂා කරන්නට අපි කටයුතු කරන්නට ඕනෑ. ඒ වාගේම දරුවන්ගේ, ළදරුවන්ගේ, මවුවරුන්ගේ, කාන්තාවන්ගේ, තරුණ පරපුරේ, ආබාධිත ප්‍රජාවගේ, වැඩිහිටි ප්‍රජාවගේ, සමස්ත ප්‍රජාවගේ, ජීවත් වීමේ අයිතිය - right to life - වෙනුවෙන් අපි කටයුතු කරන්නට ඕනෑ. අපි සමගි ජන බලවේගය විධියට වෙනම නීති කණ්ඩායමක් ස්ථාපනය කරනවා, ආපදාවට ලක්වුණු වින්දිතයන්ගේ සියලු අයිතීන් සාක්ෂාත් කිරීම උදෙසා. ජීවිත හානි, නිවාස හානි, දේපළ හානි, ආදායම් මාර්ගවලට සිදුවුණු බලපෑම්,- අධ්‍යාපන අයිතිය, සෞඛ්‍ය අයිතිය, ජීවනෝපාය අයිතිය යන හැම අයිතියක්ම ලබා දීම සඳහා ඒ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වෙනම නීති කණ්ඩායමක් යොදවන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම මේ ආපදාව නිසා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් ඇතුළු කෘෂිකර්ම ක්ෂේත්‍රය, අනෙකුත් ජීවනෝපාය මාර්ග, ධීවර කර්මාන්තය, මේ හැමෝම, බරපතළ අභියෝග රැසකට මුහුණ දෙනවා. අද කර්මාන්තශාලා විනාශ වෙලා; ආදායම් මාර්ග විනාශ වෙලා. සමහර අයට business registration එක තිබෙනවා. සමහර අයට ප්‍රාදේශීය ලේකම් යටතේ වන ලියා පදිංචිය තිබෙනවා. හැබැයි, pavement එකේ ස්වයං රැකියාව කරන පුංචි මනුස්සයන්ට ලියා පදිංචිය නැහැ. ඒ අයගේ ජනජීවිතයත් ආරක්ෂා කරන්නට ඕනෑ.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට මෙතෙක් කල් පොරොන්දු වුණු සහන ටික ලබා දීලා නැහැ. ඒ සඳහා පරාටේ නීතිය අත්හිටුවීම පමණක් මදි. දඩ පොලිය කපා හැරීම, ප්‍රාග්ධනයෙන් කොටසක් කපා හැරීම යනාදි වශයෙන් වූ සහන ටික ලබා දෙන්නට ඕනෑ. කෘෂි කර්මාන්තයේ නියැළෙන ගොවි ජනතාවට අහිමි වුණු දේ නැවත ලබා දෙන්නට කටයුතු කරන්නට ඕනෑ. ගොවිතැන ශක්තිමත් කිරීම තුළින් අපට ආහාර සුරක්ෂිතතාව තහවුරු කරන්නට හැකියාව ලැබෙනවා.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි, ඉන්දියාවේ ප්‍රාන්තයක් වන ඔඩිෂා ප්‍රාන්තය 1999දී super cyclone එකකට මුහුණ දීලා ජීවිත 10,000ක් අහිමි වුණු බව. ලක්ෂ 180කට ඒක බලපෑවා. එතෙක් කල් ඒ අයට තිබුණේ සහන කේන්ද්‍රීය ආපදා කළමනාකරණයක්. නමුත් ඉන් පසුව ඒ අය ආපදා අවම කිරීමේ වැඩ පිළිවෙළකට ගිහිල්ලා - zero human casualties programme එකකට ගිහිල්ලා - සිදු වුණු දේ බලන්න. ඒ නිසා 2013දී Cyclone Phailin ආවාම ලක්ෂ 10ක ජනතාවක් බේරාගත්තා. 2019දී Cyclone Fani නමැති සුළි කුණාටුව ආවාම තවත් ලක්ෂ 12ක් බේරාගත්තා. අපට තිබෙනවා, ඔඩිෂා ප්‍රාන්තයෙන් පාඩම් රැසක් ඉගෙන ගන්න. ඒ තුළින් අපි නව ආපදා කළමනාකරණ යාන්ත්‍රණයකට යොමු විය යුතුයි කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ.

ඒ වාගේම අපි අහන්නට කැමැතියි, නොවැම්බර් මාසයේ 11වැනි දා ඉඳලා 26වැනි දා දක්වා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව - අපේ රටේ එක වාගේම විදේශීය ආයතනත් - නොයෙකුත් අවස්ථාවලදී මේ නිර්මාණය වෙන සුළි කුණාටුව පිළිබඳව, ඒ අවපීඩන තත්ත්වය, ඒ අවපාත තත්ත්වය පිළිබඳව ක්‍රම ක්‍රමයෙන් -ක්‍රමිකව- බොහොම හොඳ පැහැදිලි කිරීමක් කළා. අපි අහන්න ඕනෑ ප්‍රශ්නයක් තමයි, මේ වාගේ අවදානමක් ගැන කථා කරද්දි අපේ රටේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය සක්‍රිය වුණේ නැත්තේ ඇයි, ඒක ක්‍රියාත්මක වුණේ නැත්තේ ඇයි කියන එක. ඒක බරපතළ ප්‍රශ්නයක්. අද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට ඕනෑ ආකාරයට interview එකක් දී ගන්න බැහැ. They are virtually under house arrest or office arrest; ඒ අය කාර්යාලයට සීමා කරලා තිබෙනවා. කාගෙන්වත් අහන්නේ නැතුව ඒ අයට interview එකක් දෙන්න බැහැ. මේ තොරතුරු, කරුණු-කාරණා හංගන්න හොඳ නැහැ. හරි ගියා නම් හරි කියන්න ඕනෑ, වැරදුණා නම් වැරදියි කියන්නට ඕනෑ. වැරදි හදාගෙන ඉදිරියට යන්නට ඕනෑ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ කටවල් වහලා හරියන්නේ නැහැ, මේ ප්‍රශ්නය ගැන සත්‍ය අවබෝධ කරගන්න.

ඒ එක්කම, මේ අවස්ථාවේ පශ්චාත් සුළි කුණාටු පිළිබඳව විශේෂ කාරණාවක් කියන්න මම කැමැතියි. විශේෂයෙන්ම අපේ සමගි ජන බලවේගයේ පරිසර කේන්ද්‍රය භාරව කටයුතු කරන ජාතික සංවිධායක දිලුම් අලගියවන්න මැතිතුමාගේ මූලිකත්වයෙන් අපි වැදගත් තොරතුරක් හොයා ගත්තා. ඕස්ට්‍රේලියාවේ Monash University එක 2000-2019 අතරේ study එකක් කරලා තිබෙනවා. ඒක, රටවල් නවයක් පාදක කරගත් සුළි කුණාටු 217ක් පිළිබඳ study එකක්. සමස්ත මරණ ලක්ෂ 150ක් ඳපිළිබ විශ්ලේෂණයක්. එහෙම කරලා ඒ අය පැහැදිලි නිගමනයකට ඇවිල්ලා තිබෙනවා. ඒ study එකෙන් කියනවා, සුළි කුණාටුව තුළින් වන ජීවිත හානියට වැඩිය, සුළි කුණාටුවෙන් පසුව නිර්මාණය වෙන තත්ත්වය බරපතළයි කියලා. සුළි කුණාටුවෙන් පසුව පළමුවැනි සති හතර තුළ ජීවිත හානි වැඩියෙන් සිද්ධ වෙනවා කියලා ඒ අය කියලා තිබෙනවා, විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බිඳ වැටීම නිසා. Monash University එකේ කරපු ඒ study එක පදනම් කරගෙන තමයි සමගි ජන බලවේගයේ අපේ ගරු මන්ත්‍රීවරුන්, සංවිධායකවරුන්

---

** පුස්තකාලයේ තබා ඇත.*
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඇතුළු බිම් මට්ටමේ නායකයන් සියලු දෙනා එකතු වෙලා, සමගි ජන සන්ධානයේ සියලුදෙනා එකතු වෙලා විපතට පත් වුණු බලප්‍රදේශවල සෞඛ්‍ය තත්ත්වය ඉහළ නංවන්නට, රෝහල් පද්ධතියේ සේවාව ගුණාත්මකභාවයෙන් ඉහළට ගෙන එන්නට කටයුතු කරන්නේ. සුළි කුණාටුව තුළින් සිදුවන ජීවිත හානිවලට වඩා පශ්චාත් සුළි කුණාටු සමයේ සිදුවන ජීවිත හානි වඩාත් වැඩියි කියන විද්‍යාත්මක දත්ත කේන්ද්‍රීය study එකක් තමයි ඔවුන් කරලා තිබෙන්නේ. British Medical Journal එකේත් ඒක publish කරලා තිබෙනවා. ඒක පදනම් කරගෙන තමයි අපේ "හුස්ම" වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ කියන එකත් මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමාත් වෛද්‍යවරයකු හැටියට මම මේ කියන්න යන කාරණාව ගැන හොඳට දන්නවා ඇති. මම මේ කථා කරන්නේ, PTSD - Post-traumatic Stress Disorder - පශ්චාත් කම්පන ආතති අක්‍රමය ගැන. සුළි කුණාටුවට මුහුණ දුන් ලක්ෂ සංඛ්‍යාත අපේ රටේ ජනතාව ලොකු බලපෑමකට ලක් වෙලා තිබෙනවා. ඒ බලපෑම ඒ අයගේ මානසික තත්ත්වයටත් විවිධාකාරයෙන් බලපාලා තිබෙනවා. ඒක නිසා සෞඛ්‍ය අංශය විශේෂිත වූ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ, Post-traumatic Stress Disorder තත්ත්වයට. ආපදාවට මුහුණ දුන් දස ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ පශ්චාත් කම්පන ආතතියට විසඳුම් සපයන්නට යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම යෝග්‍යයි කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

ඒ වාගේම මම රජයෙන් මේ කාරණය අහන්න කැමැතියි. ගරු කථානායකතුමනි, මෙම ව්‍යසනය තුළ රජය IMF එකෙන් Rapid Financing Instrument එකක් හරහා ඇමෙරිකන් ඩොලර් මිලියන 200ක් ඉල්ලුවා. අපට ආරංචි වන විධියට 15වැනි දා එම meeting එක තියලා, එහිදී ඇමෙරිකන් ඩොලර් මිලියන 200 ලබා දෙනවාය කියන කාරණාව තමයි අපට පැහැදිලි වුණේ. විශේෂයෙන්ම IMF එකේ දේශීය ප්‍රධානී එවන් පපාජෝර්ජියෝ හමුවූ අවස්ථාවේදීත් එතුමා අපට එය ප්‍රකාශ කළා. සමාවෙන්න, අපට එතුමා හමු වුණේ නැහැ. ඒක මම නිවැරදි කරන්නට ඕනෑ. එතුමා මාධ්‍යවලට කළ ප්‍රකාශවලින් අපි අවබෝධ කර ගත්තා, 15වැනි දා වනකොට ඇමෙරිකන් ඩොලර් මිලියන 200ක් අනුමත වනවා කියලා. අද වනකොට මොකක්ද තත්ත්වය කියන එක අපි රජයෙන් දැන ගන්න කැමැතියි. අපට දැන ගන්නට තිබෙන ආකාරයට එම ඩොලර් මිලියන 200 ලබා දීම සඳහා IMF එකේ meeting එක තියලාත් නැහැ. අපේ 150.5 million වන SDR quota එකෙන් සියයට 26ක් අපි රටක් හැටියට ඉල්ලා තිබෙනවා. එහි වර්තමාන තත්ත්වය පිළිබඳව කරුණාකරලා අපව දැනුවත් කරන්න කියලා මම රජයෙන් ඉල්ලීමක් කරනවා.

ඊළඟට, වහාම IMF එකත් එක්ක කථා කරලා, මේ පවතින IMF ගිවිසුම වෙනස් කරන්නට කටයුතු කරන්න කියලා අපි රජයට යෝජනා කරනවා. මේ පවතින තත්ත්වය තුළ 2028 ඉඳලා වසරකට ඩොලර් බිලියන 4.5 ගණනේ අපට රටක් හැටියට විදේශ ණය ගෙවන්න පුළුවන්ද? සුළි කුණාටුවට පෙරත් තිබුණේ බොහොම අමාරු තත්ත්වයක්. අද ඊට වැඩිය බරපතළයි. එම නිසා, මේ ව්‍යසනකාරි තත්ත්වය නිසාවත් කරුණාකරලා කොන්ද කෙළින් තබාගෙන IMF එකත් එක්ක කථා කරන්න කියලා අපි රජයට යෝජනා කරනවා. එහෙම කථා කරලා, IMF රාමුව තුළ පසු ගිය රජය එකඟ වුණු IMF ගිවිසුම වෙනස් කරන්න කටයුතු කරන්නය කියලා මම මේ අවස්ථාවේ යෝජනා කරනවා.

අපට අහන්නට ලැබුණා, මෙම ව්‍යසනයෙන් ආපදාවට ලක් වුණු ජනතාව වෙනුවෙන් World Bank එක ඇමෙරිකානු ඩොලර් මිලියන 120ක් එම ප්‍රදේශ වෙනුවෙන් වෙන් කළා කියලා. හැබැයි, ඒවා World Bank එක අලුතෙන් ලබා දෙන මුදල් නොවන බව මම මතක් කරන්න කැමැතියි. ඒවා repurpose funds. ඒ කියන්නේ, පවතින ව්‍යාපෘතිවලින් ලබා දෙන මුදල්. එම ව්‍යාපෘතිය නතර කරලා සහනවලට ලබා ගන්න මුදල්. එහෙම දෙයක් කරන කොට World Bank එක ක්‍රියාත්මක කරන පරිසර සංරක්ෂණ ව්‍යාපෘතියකුත් තිබෙන බව මම මතක් කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම අපි දැනගන්නට ඕනෑ, පරිසරය ආරක්ෂා කළොත් ආපදා දුලබ වන බව. එතකොට අපි World Bank එකට කියන්නට ඕනෑ repurpose funds ලබා දෙන්න කියලා නොවෙයි. ඔව්, කෙටි කාලීනව repurpose කළාට කමක් නැහැ. හැබැයි, ඒ funds repurpose කරන කොට අලුත් අරමුදලුත් - funds - අපේ රටට ලබා දෙන්නට ඕනෑ. US Dollars 120 million ලබා දෙනවා නම් දැනට කෙරෙන ව්‍යාපෘතිවලින් ඒ ඩොලර් මිලියන 120 අරගෙන වැඩක් නැහැ. වැඩිපුර මුදල් ප්‍රමාණයක් අලුතෙන්ම අපි ලබා ගන්නට ඕනෑ. ඒ උදෙසා IMF එක එක්ක, World Bank එක එක්ක, ජාත්‍යන්තරය එක්ක කරන්න තිබෙන සාකච්ඡාවලදී අපේ සහයෝගය අපි ලබා දෙන්නම්.

අපි යෝජනා කරනවා, ජාත්‍යන්තර ආධාර සමුළුවක් පවත්වන්නට කියා. ඒ ගැන දින ගණනාවක් කට කැඩෙනකල් කිව්වා. තවමත් ඒ පිළිබඳ කථාවක් නැහැ. අනිවාර්යයෙන්ම මේ ව්‍යසනය කේන්ද්‍ර කරගෙන අපි ජාත්‍යන්තර ආධාර සමුළුවක් - international donor conference එකක් - පවත්වන්නට ඕනෑ. යුද්ධය අවසන් වුණායින් පසුවත් ඒ දේ කරන්න තිබුණා. නමුත්, කිසිම කෙනෙක් ඒක කළේ නැහැ. අද දවසේත් මේ මහා ඛේදවාචකය මුල් කරගෙන අනිවාර්යයෙන්ම එය කළ යුතුයි කියා අපි යෝජනා කරනවා. ජාත්‍යන්තරයේත්, ලෝකයාගේත් අනුකම්පාව අපේ රටට ලැබී තිබෙන මොහොතක මේ ජාත්‍යන්තර ආධාර සමුළුව ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යමයි කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over now.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒ වාගේම, නැවතත් වරක් මම මේ කාරණය මතක් කරන්න ඕනෑ. ඇමෙරිකා එක්සත් ජනපදයෙන් අපට සියයට 20ක reciprocal tax එකක් ගහලා තිබෙනවා. මේ රටට මේ සුළි කුණාටුව තුළින් සිදු වුණු ව්‍යසනය පෙන්වා දී, අඩුම ගණනේ මේ reciprocal tax එක සියයට 20න් තවත් පහළ දමා ගන්නට ඇමෙරිකා එක්සත් ජනපදයේ ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිතුමා එක්ක සාකච්ඡා ආරම්භ කරන්නය කියා මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

අවසාන වශයෙන් අපේ ගරු කථානායකතුමාට මම කියනවා, මේ ව්‍යසනය තුළ අපේ රට ශක්තිමත් වෙන්නට ඕනෑ, අපේ රට කාර්යක්ෂම වෙන්නට ඕනෑ, අපේ රටේ නිවැරදි ක්‍රියාදාමයක් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ බව. මේ ව්‍යසනය තුළ නැවත වරක් අපේ රටේ බාල බෙහෙත් ජාවාරමට, බාල ඖෂධ මාෆියාවට රජ වන්නට ඉඩ තබන්න බැහැ. අපට ආරංචි වුණා, වමනය සහ ක්ලාන්තය පාලනය කිරීම සඳහා රෝගීන්ට ලබාදෙන එන්නතක් විෂ වීම තුළ, ඒවායේ ප්‍රමිතිය අඩුවීම තුළ IDH රෝහලේ රෝගීන් දෙදෙනෙකු ජීවිතක්ෂයට පත් වුණාය කියලා. එම සිදුවීම 15වැනි දා වාර්තා කර තිබෙනවා. මේ දේ සිදු වුණේ බාල ඖෂධ නිසාද, බාල එන්නත් නිසාද කියලා අපි දැනගන්න කැමැතියි. මේවාට වග කියන්නට ඕනෑ කවුද? සේනක බිබිලේ ප්‍රතිපත්තිය පැත්තකට විසි

කරලා ඖෂධ මාෆියාව තවදුරටත් අපේ රටේ සෞඛ්‍ය පද්ධතිය, ඖෂධ පද්ධතිය ගිලගෙන තිබෙනවාද කියන එක මම අහන්න කැමැතියි.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී, මේ ව්‍යසනකාරී තත්ත්වය තුළ අපි රටක් හැටියට ජාති, ආගම්, කුලමල, පන්ති, පක්ෂ භේදවලින් තොරව අපේ රට සෞභාග්‍ය සම්පන්න කරන්නට අපි එකට එක් වෙලා අත්වැල් බැඳ ගනිමු කියා යෝජනා කරනවා. එය කට වචනයට පමණක් සීමා කරන්නේ නැහැ. සමගි ජන බලවේගයේත්, සමගි ජන සන්ධානයේත් සියලුදෙනාම මේ රටේ විපතට පත් වූ ලක්ෂ සංඛ්‍යාත ජනතාවට ප්‍රායෝගිකව, බිම් මට්ටමෙන් ලබා දෙන්නට පුළුවන් උපරිම ශක්තිය ලබා දෙන්නට අත්වැල් බැඳගෙන එකමුතුව කටයුතු කරනවා කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. (Dr.) Prasanna Gunasena. You have 11 minutes.

[පූ.භා. 10.53]

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු කථානායකතුමනි, දිට්වා සුළි කුණාටුව මඟින් ආපදාවට ලක් වෙච්ච අමාත්‍යාංශ අතරින් වැඩියෙන්ම ආපදාවට ලක් වුණු අමාත්‍යාංශය නියෝජනය කරන ජනතා නියෝජිතයෙක් විධියටත්, මේ සුළි කුණාටුව මඟින් වැඩියෙන්ම ආපදාවට ලක් වුණු පළාත නියෝජනය කරන මධ්‍යම පළාතේ ජනතා නියෝජිතයකු විධියටත්, වැඩියෙන්ම ආපදාවට ලක් වුණු මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන ජනතා නියෝජිතයකු විධියටත් අදහස් දැක්වීමට සිදුවීම පිළිබඳව අද එක්තරා ආකාරයකට කනගාටුවට පත් වෙන ගමන්, අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

දිට්වා සුළි කුණාටුව මඟින් වැඩියෙන්ම ආපදාවට ලක් වුණු අමාත්‍යාංශය තමයි අපේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය. මේ අමාත්‍යාංශය යටතේ තිබෙන පාරවල්වලට තමයි වැඩියෙන්ම අලාභහානි සිද්ධ වෙලා තිබෙන්නේ. "ඒ" හා "බී" ශ්‍රේණියේ පාරවල් 572ක පමණ sections සම්පූර්ණයෙන්ම විනාශයට පත් වෙලා තිබෙනවා. ඒ සියල්ල යථා තත්ත්වයට පත් කළ යුතු තත්ත්වයක තිබෙනවා. දුර ප්‍රමාණය විධියට ගත්තොත් කිලෝමීටර් 1,450.64ක් ලංකාවේ මාර්ග පද්ධතියේ "ඒ" සහ "බී" මාර්ග මුළුමනින්ම මේ සුළි කුණාටුව හේතුවෙන් විනාශ වෙලා තිබෙනවා. ඒ කිලෝමීටර් 1,450න් කිලෝමීටර් 723ක්ම මධ්‍යම පළාතේ පාරවල්. මාර්ග පද්ධතිය අතින් ගත්තාම වැඩිම හානියක් සිද්ධ වෙලා තිබෙන්නේ මධ්‍යම පළාතට. මේ වෙනකොට අපි ඒ සඳහා සැලසුම් සකස් කරලා තිබෙනවා. අපි ඒවා ප්‍රතිනිර්මාණය කරන්නේ කෙසේද කියන එක සහ ඒවාට වැය වන දළ ඇස්තමේන්තු අගය කුමක්ද කියන එක ගැන අපි සැලසුම් සකස් කරලා තිබෙනවා. අලාභහානියට ලක් වුණු "ඒ" සහ "බී" සියලු මාර්ග ප්‍රතිසංස්කරණය වෙනුවෙන් අපට දළ වශයෙන් රුපියල් මිලියන 68,844ක් වැය වෙනවා. බිලියන නම් දළ වශයෙන් 69ක්. පළාත් වශයෙන් වෙන් වෙන්ව ගත්තොත් මධ්‍යම පළාතේ "ඒ" හා "බී" පාරවල් යථාවත් කිරීමට පමණක් එම බිලියන 69න් බිලියන 52ක්ම වැය වෙනවා. ඒකෙන් මහනුවර දිස්ත්‍රික්කයට රුපියල් බිලියන 32ක් වැය වනවා. එතකොට අපට දළ අවබෝධයක් ගන්න පුළුවන්, මේ damage එක කේන්ද්‍රගත වෙලා තිබෙන්නේ මොන පළාත්වලටද, මොන දිස්ත්‍රික්කවලටද කියලා. ඒ වාගේම පාලම්වලටත් විශාල අලාභ හානියක් වෙලා තිබෙනවා. ප්‍රධාන වශයෙන් පාලම් 40ක් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. ඒවා සම්පූර්ණයෙන් යථාවත් කළ යුතුයි. එයිනුත් 18ක් ප්‍රධාන පාලම්. ඒ පාලම් 18 පමණක් යාවත්කාලීන කරන්න, එහෙම නැත්නම් අලුතින් ඉදිකරන්න රුපියල් බිලියන 6කට වඩා වැය වනවා. ගරු කථානායකතුමනි, ඒ විධියට ගත්තාම මේ මාර්ග පද්ධතියට විතරක් වෙච්ච අලාභ හානිය දළ වශයෙන් ඇස්තමේන්තු කළොත් රුපියල් බිලියන 75ක් වනවා. ඒ අනුව අපි වෙන් කළ යුතු මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 75ක් ලෙස දළ වශයෙන් ඇස්තමේන්තුගත වෙලා තිබෙනවා.

අපි මෙච්චර කාලයක් පාරවල් හැදුවේ කොහොමද? කන්ද කපනවා, පාර හදනවා, කාපට් කරනවා. හැබැයි, soil protection පිළිබඳව, ඒ කියන්නේ උඩ පැත්තෙන් කන්ද කඩාගෙන ඒමක් ගැනවත්, පහළ පැත්තෙන් කඩාගෙන යෑමක් ගැනවත් අපි හිතුවේ නැහැ. ඒ දේවල්වලින් මාර්ග ආරක්ෂා කර ගැනීමට අපි යම් වැය කිරීමක් කළේත් නැහැ. නමුත්, අපි ඉදිරියේදී හදන සැලසුම්වලදී ඒකත් ඇතුළත් කරලා තමයි නිර්මාණය කළ යුත්තේ. ඒ damage improvement සහ safety structure development සඳහාත් වියදම් ඇතුළත්ව ගත්තොත්, දළ වශයෙන් රුපියල් බිලියන 115ක් පමණ වැය වනවා කියලා අපි හිතනවා. මේ damage එක සම්පූර්ණයෙන් recover කරලා, තිබුණාට වඩා හොඳින් ප්‍රතිනිර්මාණය කරලා මාර්ග පද්ධතිය යථාවත් කරන්න දළ වශයෙන් ගත්තොත් අපට රුපියල් බිලියන 190ක වාගේ මුදලක් වැය වනවා.

මහනුවර දිස්ත්‍රික්කය ගත්තොත්, "A" සහ "B" මාර්ග ඇතුළත්ව මාර්ග 102ක් අවහිර වෙලා තිබුණා. මේ වනකොට එයින් මාර්ග 98ක් ප්‍රවාහනය සඳහා විවෘත කරලා තිබෙනවා, මාර්ග 4යි තවමත් අවහිර වෙලා තිබෙන්නේ. මාතලේ දිස්ත්‍රික්කයේ මාර්ග 38ම විවෘත කරන්න හැකියාව ලැබිලා තිබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ මාර්ග 53න් 2ක් විවෘත කර ගැනීම සඳහා කටයුතු කරන්න තිබෙනවා.

ඊළඟට දෙපාර්තමේන්තු වශයෙන් ගත්තොත්, වැඩිම හානියකට ලක් වුණේ දුම්රිය දෙපාර්තමේන්තුව. දුම්රිය මාර්ග පද්ධතියෙන් තුනෙන් එකක පමණ තමයි අපට දුම්රිය ධාවනය කිරීමට හැකියාව තිබෙන්නේ. නාය යාම් සහ දුම්රිය මාර්ගවලට ගල් පෙරළීම් 91ක් විතර වාර්තා වුණා. විශාල වශයෙන් දුම්රිය මාර්ගයේ පාදම කඩාගෙන යෑම් 73ක් වාර්තා වුණා. බෝක්කු සහ පාලම් 38ක් සම්පූර්ණයෙන් විනාශ වුණා. ගස් කඩා වැටීම් නිසා දුම්රිය මාර්ග අවහිරවීම් 149ක් වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම දුම්රිය මාර්ගය සහ පාදම සුළු වශයෙන් විනාශ වූ ස්ථාන 177ක් තිබෙනවා. ඒ වාගේම දුම්රිය ස්ථානවලට හානිවීම් 27ක් වාර්තා වනවා. බලන - කඩුගන්නාව දුම්රිය මාර්ගය ගත්තොත්, main section එක සම්පූර්ණයෙන්ම හානි වෙලා තිබෙනවා, උඩ රේල් පාර විතරයි ඉතුරු වෙලා තිබෙන්නේ. ගම්පොල - නාවලපිටිය දුම්රිය මාර්ගයත් ඒ ආකාරයෙන්මයි. වත්තේගම-උකුවෙල දුම්රිය මාර්ගයත් ඒ ආකාරයෙන්මයි. කොටගල - අඹේවෙල දුම්රිය මාර්ගයත් ඒ ආකාරයෙන්මයි. ඒ කොටස් 4 වැඩි වියදමක් දරලා ප්‍රතිනිර්මාණය කරන්න අපට සිදු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, 2025.12.19 වනකොට අපි ත්‍රිකුණාමලය දුම්රිය මාර්ගය මුළුමනින්ම විවෘත කරනවා. ප්‍රීමා පිටි සහ ඉන්ධන දුම්රිය හරහා ප්‍රවාහනය කිරීමේ කටයුත්ත 19වැනි දා වනකොට අපි පටන් ගන්නවා. 20වැනි දා - අනිද්දා - වනකොට අපි බදුල්ලේ ඉඳලා අඹේවෙල දක්වා section එක open කරනවා. ඒක සංචාරක කර්මාන්තයටත් වැදගත් වනවා. ඒ කටයුත්ත අපි

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

පටන් ගන්නවා, 20වැනි දා වනකොට. උතුරු දුම්රිය මාර්ගය මේ වනකොට මහව දක්වා ක්‍රියාත්මකයි. 2026 ජනවාරි 01වැනි දා වනකොට අපි කන්කසන්තුරේ - KKS - දක්වා, ඒ කියන්නේ සම්පූර්ණ section එකේම දුම්රිය ධාවනය කරන්න පුළුවන් තත්ත්වයට හදනවා. පුත්තලම මාර්ගය ගත්තොත්, මේ වනකොට නාත්තණ්ඩිය දක්වා දුම්රිය ධාවනය වනවා. ඒ ප්‍රමාණය අපි හලාවත දක්වාම දීර්ඝ කරනවා, ජනවාරි 01වැනි දා වනකොට. ඒ වාගේම මඩකලපුව දුම්රිය මාර්ගය මුළුමනින්ම විවෘත කරනවා, ජනවාරි 01වැනි දා වනකොට. වත්තේගම - මාතලේ section එකක් තිබෙනවා. එතැන දුම්රියක් හිර වෙලා තිබෙනවා, මාර්ගය අවහිර වීම නිසා. අපි වත්තේගම දක්වා තාවකාලිකව පාර නිර්මාණය කරලා හිර වෙලා තිබෙන ඒ දුම්රිය එළියට අරගෙන ඒ කටයුතු කරන්න බලාපොරොත්තු වනවා, 2026.01.15වැනි දා වනකොට. 2026.02.01වැනි දා වනකොට අපි තලෛයිමන්නාරම දුම්රිය මාර්ගය සම්පූර්ණයෙන්ම විවෘත කරන්න බලාපොරොත්තු වනවා. මේ ආකාරයෙන් ඉදිරි සැලසුම් අපි නිර්මාණය කර තිබෙනවා.

මාර්ග පද්ධතිය ගත්තත් එහෙමයි, ගරු කථානායකතුමනි. ලංකාවේ හානියට පත් වෙච්ච සියලුම මාර්ග නැවත නිර්මාණය කරන්නේ කෙසේද, ඒ සඳහා වැය වන මුදල කොපමණද කියලා දින වකවානුත් එක්ක අපි සැලසුම් සකස් කරලායි තිබෙන්නේ. ඉදිරි කාලයේදී ඒ වැඩ කටයුතු ටික සාර්ථකව කර ගැනීමේ හැකියාව තිබෙනවා කියලා අපට ලොකු විශ්වාසයක් තිබෙනවා. මේ අලාභ හානි සිදුවෙච්ච දවසේ ඉඳලාම දේශපාලන වශයෙන් රටට දිය යුතු නායකත්වය අපි නිවැරදි ආකාරයෙන් දුන්නා කියන විශ්වාසයත් අප තුළ තිබෙනවා. අපි හිතනවා, ඒ විශ්වාසය ජනතාව තුළත් තිබෙනවා කියලා.

ගරු කථානායකතුමනි, මෙතැන වාඩිවෙලා ඉන්න අපේ සමහර මන්ත්‍රීවරුන්ගේ ගෙවල් සම්පූර්ණයෙන්ම වතුරෙන් යට වෙලායි තිබුණේ. ඔවුන්ගේ දරු පවුල් ඉන්නවාද, නැද්ද කියලාවත් දන්නේ නැහැ. මොකද, communication එක සම්පූර්ණයෙන් නතර වෙලායි තිබුණේ. හැබැයි ඔවුන් ඒ දින දෙක තුනේම ඒ ගැන හෙව්වේ නැහැ. තනිකරම මේ මෙහෙයුමේ නිරත වෙලායි හිටියේ. ඒක මම පෞද්ගලිකව අත්වින්දා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විතරක් නොවෙයි, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුනුත් එහෙමයි. කඳු නාය ගියාට පස්සේ ඒ ප්‍රදේශවල ඉන්න මිනිස්සුන්ව ඒ තැන්වලින් එළියට ගන්න ඔවුන් දිවා රෑ වෙහෙසුණා. හැබැයි, ඒ මිනිස්සු අරගෙන එළියට ඇවිත් බලනකොට තමන්ගේ ගෙදරත් නාය ගිහිල්ලා. ඒක දන්නේත් දවස් දෙක තුනකට පසුවයි. ඒ වාගේ මන්ත්‍රීවරුන් අපේ කණ්ඩායම්වල තවමත් ඉන්නවා.

අපට නොපෙනුණු සංවිධායක සහෝදරවරුනුත් ඉන්නවා. ඔවුන්ගේ දරු පවුල් තවමත් ඉන්නේ කඳවුරුවල. හැබැයි, ඒ වගකීම රජයට භාර දීලා තමන්ට පැවරෙන වගකීම වෙනුවෙන් කැප වන සහෝදර සහෝදරියන් අපමණ ප්‍රමාණයක් ඒ අතර ඉන්නවා. ඒ වාගේ දේශපාලන ව්‍යාපාරයක් එකතු වෙලායි මේ වැඩේ ගොඩ දැම්මේ. ඇත්තටම කිව්වොත්, දේශපාලනය තුළ අපට පුයර බබාලා නැහැ. දරාගැනීමේ හැකියාව අපට හොඳට හුරුයි. මේ ව්‍යසනයෙන් පසු පැන නැඟුණු තත්ත්වයට සාර්ථකව මුහුණ දීමට, නායකත්වය දීමට අපට හැකියාව ලැබුණේ ඒ දරාගැනීමේ හැකියාව අප තුළ තිබුණු නිසායි. වරක් දේශපාලන භීෂණයෙන් අපේ පක්ෂය අතුගාලා දමන්න උත්සාහ කළා. හැබැයි අපි නැඟිට්ටා. අපට නැඟිටින්න හැකියාව ලැබුණා. අනන්ත ප්‍රතික්ෂේප කිරීම් තිබුණා. මතවාදී පිළිකුල් කිරීම් තිබුණා. ඒ හමුවේත් අරමුණක් වෙනුවෙන් දශක ගණනාවක් තිස්සේ ඒකායන බලාපොරොත්තුවක් තබාගෙන ජයග්‍රහණය කරා මෙහෙයවපු ව්‍යාපාරයක් තිබෙන දේශපාලන පක්ෂයක් තමයි අපි. අපට ලොවෙත් දිනන්න බැහැ කියද්දීත් ලොවෙත් නැති වෙන්න දිනලා පෙන්වපු දේශපාලන ව්‍යාපාරයක් අපි. ඒ හැකියාව, ඒ අධිෂ්ඨානය, ඒ motivation එක අප තුළ තිබෙනවා. අමාරුම pitchesවල හොඳටම bat කරන්න පුළුවන් හැකියාව අපට තිබෙනවා. ඒක අපි කරලා පෙන්වා තිබෙනවා. ඉදිරියටත් අපි එය කරනවා. ඒ නිසා තමයි ජනතාව අප කෙරෙහි විශ්වාසය තබා තිබෙන්නේ. ඒ විශ්වාසය නිසා තමයි රාජ්‍ය යන්ත්‍රණයත් අපිත් එක්ක මුහු වෙලා තිබෙන්නේ. ඒ නිසායි කවදාවත් නැති විධියට මේ මෙහෙයුම තුළදී රාජ්‍ය යන්ත්‍රණය සක්‍රිය වෙලා තිබෙන්නේ. ඒ නිසායි විදේශ ආධාර ගලාගෙන එන්නේ. ඒ නිසායි ලංකාවේ ඉන්න පුරවැසියන් ආධාර දෙන්නේ.

රාජ්‍ය යන්ත්‍රණය ගත්තොත් පසුගිය කාලය පුරාවට එළියේ මතයක් හැදිලා තිබුණා, කළු කරපු රාජ්‍ය යන්ත්‍රණයක් අපට තිබෙන්නේ, රාජ්‍ය සේවය වැඩක් නැහැ කියලා. හැබැයි අපි දන්නවා, පසුගිය කාලය තුළ රාජ්‍ය යන්ත්‍රණය හැසිරුණේ කෙසේද, ඔවුන්ගේ දායකත්වය දුන්නේ කෙසේද කියලා. ඒ සම්බන්ධයෙන් පෞද්ගලිකවම අත්දැකීම් තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කය ගත්තොත්, දිසාපතිතුමා පැය 48කට පසුව පැය 2ක් තමයි නිදාගත්තේ. අතිරේක දිසාපතිවරුනුත් එහෙමයි. කාන්තා, පිරිමි කියලා වෙනසක් තිබුණේ නැහැ. ඔවුන්ට දරු පවුලක් තිබෙනවාද, මනුස්සයෙක් ඉන්නවාද කියලා දන්නේ නැහැ. ඔවුන් එක දිගට -දින තුන හතර- ඒ අදාළ ස්ථානවල රැඳී සිටිමින් තමන්ගේ රාජකාරියට එහා ගිය භාරධූර වගකීමක් ඉටු කළා. ඒ වාගේම තමයි ප්‍රාදේශීය ලේකම්වරුන්. බිම් මට්ටමේ ඉන්න ග්‍රාම නිලධාරිවරුනුත් එහෙමයි. බහුතරයක් නිලධාරින් කටයුතු කළේ එහෙමයි. සංවර්ධන නිලධාරිනුත් එහෙමයි. තමන්ගේ රාජකාරි වපසරියෙන් එහාට ගිහිල්ලා මේ ආපදා තත්ත්වයේදී ජාතිය වෙනුවෙන් තමන්ගේ වගකීම ඒ සියලුදෙනා ඉටු කළා. ඒ යන්ත්‍රණය කෙරෙහි දැන් ජනතාව විශ්වාසය තබා තිබෙනවා. ඒ රාජ්‍ය යන්ත්‍රණය මේ දේශපාලන අධිකාරිය කෙරෙහි විශ්වාසය තබා තිබෙනවා. ඒගොල්ලන් එක්ක අපි අවුරුද්දක් ගනුදෙනු කළා.

ඕනෑ තරම් හැලහැප්පීම් තිබෙන්න ඇති; arguments තිබෙන්න ඇති. හැබැයි, ඔවුන් අපව කියවා ගත්තා කියන විශ්වාසය අප තුළ තිබෙනවා. එදා අපව ප්‍රතික්ෂේප කරපු ජනතාවත් අද අපව කියවාගෙන තිබෙනවා. රාජ්‍ය යන්ත්‍රණයත් ඒ විධියට කියවාගෙන තිබෙනවා.

ඒ වාගේම ස්වේච්ඡාවෙන් මේ ආපදා කළමනාකරණයට එක් වෙච්ච බහුතර ජනතාවක් ඉන්නවා. ඒ වාගේම පැය 24න්, දවස් 10න් පාරවල් හදන්න, කෝච්චි පාරවල් හදන්න අපට බැහැ. අපි ඒවා හැදුවේ ඒ කැපවීම් එක්කයි; ඒ මිනිස්සුත් එක්කයි; ඒ රාජ්‍ය යන්ත්‍රණයත් එක්කයි. ඒ ඒකාබද්ධ වෙච්ච යන්ත්‍රණය තුළ අපි විශ්වාස කරනවා, මේ රට ගොඩදාන්න පුළුවන් කියා. ඒ දැඩි විශ්වාසය අපට තිබෙනවා. අවුරුද්දක් තුළ අප පිළිබිඹු කළ මේ අදූෂිතභාවය, අපේ ඒකායන අරමුණ බහුතරයක් දේශපාලනඥයන්, ඒ වාගේම බහුතරයක් රාජ්‍ය නිලධාරින්, ඒ වාගේම බහුතරයක් ජනතාව වැළඳ ගත්තා කියන විශ්වාසය අප තුළ තිබෙනවා. මේකත් එක්ක බද්ධ වෙලා තමයි මේ කෙටි කාලය තුළ මේ ආපදා තත්ත්වයෙන් එළියට එන්න අපට හැකියාව ලැබුණේ, ගරු කථානායකතුමනි.

අපි ඉදිරි සැලසුම් සකස් කරලා තිබෙන්නේ. ඒ සැලසුම් එක්ක අපි විශ්වාස කරනවා, ඉදිරි අවුරුද්ද, දෙක ඇතුළත අපට මේ වැඩේ ගොඩදාගන්න පුළුවන් කියලා. ගරු කථානායකතුමනි, ඒ වාගේම කවුරු හරි විශ්වාස කරන්න පුළුවන්, මේ ආපදා තත්ත්වය නිසා 2026 අවුරුද්ද, 2027 අවුරුද්ද සඳහා වන අපේ සැලසුම්

ඔක්කෝම පරක්කු වෙයි කියලා. හැබැයි, ඒ සැලසුම් කිසිවක් අපි අතපසු කරන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මම කියන්න කැමැතියි, අපි සැලසුම් කළ ආකාරයටම එම සංවර්ධන වැඩකටයුතු සාමාන්‍ය ආකාරයෙන් අපි ඉදිරියට අරගෙන යන බව. වැඩියෙන්ම ආපදාවට ලක් වෙච්ච මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩකටයුතු හෙට සිට අපි ආරම්භ කරනවා, ඒ සැලසුම්සහගත ආකාරයෙන්ම.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The Hon. Sivagnanam Shritharan. You have ten minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[மு.ப. 11.05]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நாட்டில் ஏற்பட்டிருக்கின்ற மிகப் பெரிய இடருக்குப் பின்னரான விளைவுகள் மக்களைப் பெருமளவில் பாதித்திருக்கின்றது.

நான் ஏற்கெனவே சொன்னதுபோல, இந்த நாடு இயற்கையைச் சரியான முறையில் பேணவில்லை. இயற்கை யைப் பாதுகாப்பதற்கான முன்னேற்பாடுகளை இந்நாட்டின் தலைவர்கள் கடந்த காலங்களில் மேற்கொள்ளாமையும் தற்போதைய அரசாங்கத்தால் சில முன்னேற்பாடான நடவடிக்கைகள் நடைபெறாமல் போனமையும் இந்தப் பேரிடருக்கான முக்கிய காரணங்களாக அமைந்திருக்கின்றன. குறிப்பாக, இந்த நாட்டில் பேரிடர் ஏற்படும்போது, மனித உயிர்களைக் காப்பாற்றுவதற்கும் அழிவுகளிலிருந்து மக்களைப் பாதுகாப்பதற்குமான பயிற்சி படைகளுக்கு இல்லை என்பதை இப்பேரிடர் மிகத் தெளிவாக உணர்த்தி இருக்கிறது. அமெரிக்காவின் படைகள், இந்தியாவின் படைகள் மற்றும் ஏனைய நாட்டுப் படைகள் வந்துதான் இந்த நாட்டிலிருக்கின்ற மக்களுடைய பாதுகாப்பை உறுதிப்படுத்த வேண்டி இருக்கின்றது என்ற புதியதோர் அத்தியாயம் இந்த நாட்டில் உருவாக்கப்பட்டு இருக்கின்றது. பொதுவாக ஒரு நாட்டின் இராணுவம், கடற்படை, விமானப்படை, பொலிஸ் என்பன ஓர் இடரின்போது எவ்வாறு செயற்பட வேண்டும் என்பதற்கான முழுமையான பயிற்சியைக் கொண்டிருக்கும். எமது நாட்டிலுள்ள படையினர் அனர்த்தத்தின்போது செயற்பட்டிருந்தாலும்கூட, அதற்குரிய திறன்கள் அவர்களுக்கு வழங்கப்படவில்லை என்பதைத்தான் கடந்த சில நாட்களில் இடம்பெற்ற செயற்பாடுகள் தெளிவுபடுத்தி இருக்கின்றன.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நாட்டின் தென் பகுதிகளில் அழிவுகள் ஏற்படும்போது கொடுக்கப்படுகின்ற முக்கியத்துவத்தைவிட, குறைந்தளவு முக்கியத்துவமே வடக்கு, கிழக்குப் பகுதிகளில் குறிப்பாக, அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை, யாழ்ப்பாணம், வவுனியா, மன்னார், முல்லைத்தீவு, கிளிநொச்சி ஆகிய மாவட்டங்களில் கொடுக்கப் படுகின்றது. அண்மையில் நான் நெடுந்தீவுக்குப் பயணம் செய்திருந்தேன். அங்குள்ள மக்கள் தங்களுக்கு ஏற்பட்டுள்ள அழிவுகளைச் சொல்லி கண்ணீர் விட்டார்கள். அவர்களுக்காக வழங்கப்படவிருந்த உதவித் தொகையைக்கூட நிறுத்தி விட்டதாக அவர்கள் சென்னார்கள். அவர்களுக்குத் தொலைத்தொடர்பு வசதியில்லை; போக்குவரத்து வசதி யில்லை. இப்பொழுதும்கூட, நெடுந்தீவுக்கான போக்குவரத்து வசதி சீரானதாக இல்லை. அந்த மக்களுக்கான தரைவழிப் போக்குவரத்துக்கான பாதைகள்கூட மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கின்றன. அதேபோன்று, எழுவைதீவு, நயினாதீவு, அனலைதீவு போன்ற இடங்களில் வாழுகின்ற மக்களும் பாரிய நெருக்கடிகளைச் சந்தித்திருக்கிறார்கள். இந்தப் பகுதிகளில் ஏற்பட்ட அனர்த்தங்களும் மிகுந்த முக்கியத்துவம் கொடுத்துப் பார்க்கப்பட வேண்டியவை.

மாண்புமிகு சனாதிபதி அவர்கள் உரையாற்றும்போது, அடிக்கடி ஜனநாயகம், பெருந்தன்மை, மக்களுக்கான செயற்பாடுகள் பற்றி சொல்வார். ஆனால், அவை மிகப் பெரிய கேள்விக்கு உள்ளாகி இருக்கின்றன. இன்று இந்த அரசாங்கத்தின் கட்சி சார்ந்தவர்களே - NPPஐச் சார்ந்தவர்களே - அராஜகம் பண்ணுகின்ற அளவுக்கு நாட்டின் நிலைமை மாறியிருக்கின்றது.

தூங்காமல் கண்விழித்துப் பணிசெய்கின்ற கிராம அலுவலர்களை NPPஇன் பாராளுமன்ற உறுப்பினர் தாக்குகிறார். அதேநேரம், பள்ளிக்குடா பகுதியில் இதே அரசின் ஆதரவாளர்கள் என்று சொல்லிக்கொள்கின்ற சிலர், அங்கிருக்கின்ற கிராம அலுவலர்களைத் தாக்க முற்படு கிறார்கள்; அவர்களை தகாத வார்த்தைகளால் ஏசுகிறார்கள். இவ்வாறான சம்பவங்கள் எல்லாம் நடைபெற்றுக் கொண்டுதான் இருக்கின்றன.

அண்மையில் அரசாங்கத்தால் வெளியிடப்பட்ட சுற்றறிக்கை ஒன்று தொடர்பில் நான் இந்த இடத்தில் கருத்துக்கூற விரும்புகின்றேன். 2025 ஒகஸ்ட் 22ஆம் திகதி சனாதிபதி செயலகத்தால் 'பிரஜாசக்தி' - வறுமை ஒழிப்புக்கான தேசிய இயக்கம் தொடர்பில் PS/DASA/Circular/07/2025 என்ற இலக்கமுடைய சுற்றறிக்கை வெளியிடப்பட்டது. 'பிரஜாசக்தி' - வறுமை ஒழிப்புக்கான தேசிய இயக்கமானது, இந்த நாட்டில் தேர்தல்மூலம் தெரிவுசெய்யப்பட்டுள்ள பாராளுமன்ற உறுப்பினர்களினதும் மாகாண சபை உறுப்பினர்களினதும் மாநகர சபை உறுப்பினர்களினதும் நகர சபை உறுப்பினர் களினதும் பிரதேச சபை உறுப்பினர்களினதும் செயற்பாடு களைக் கேள்விக்கு உட்படுத்தி இருக்கிறது; முடக்கி யிருக்கிறது. மக்களின் வறுமையை ஒழித்தல், அவர்களுக்குப் பொருத்தமான அபிவிருத்தி முன்மொழிவு களைச் செய்தல் என்பன இதன் பணிகள் என்று சொன்னால், ஏற்கெனவே மக்களால் தெரிவுசெய்யப்பட்டுள்ள பிரதேச சபை, நகர சபை, மாநகர சபை உறுப்பினர்களுக்கு என்ன பணி இருக்கிறது? ஏன் மாண்புமிகு சனாதிபதியால் வெளியிடப்பட்ட இந்தச் சுற்றறிக்கையில் பாராளுமன்ற உறுப்பினர்களுக்கு எந்தச் சந்தர்ப்பமும் வழங்கப்படவில்லை? சனாதிபதிக்கும் அமைச்சர்களுக்கும் அமைச்சின் செயலாளர்களுக்கும் அந்தந்தப் பிரதேச ஒருங்கிணைப்புக் குழுவின் தலைவர் களுக்கும்தான் அதிகாரம் வழங்கப்பட்டிருக்கிறது. அப்படி யென்றால், இந்த நாட்டில் மக்களால் தெரிவுசெய்யப்பட்ட

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

பாராளுமன்ற உறுப்பினர்களுக்கும் நகரபிதாக்களுக்கும் நகர சபைத் தவிசாளர்களுக்கும் என்ன பணி இருக்கிறது? அப்படியென்றால், நீங்கள் இந்தச் சபைகளைக் கலைத்து விடுங்கள்! இந்த நாட்டில் தேர்தல்மூலம் ஜனநாயக முறையில் உறுப்பினர்களைத் தெரிவுசெய்தலை இல்லாமலே செய்து விடலாம்.

கடந்த 60 ஆண்டுகளுக்கும் மேலாக ஆயுத வழியில் இருந்த ஓர் இயக்கத்தைச் சேர்ந்த நீங்கள், இவ்வளவு காலம் பொறுத்திருந்து, ஜனநாயக முறையில் தேர்தல்மூலம் தெரிவு செய்யப்பட்டவர்கள் என்று நாங்களே சொல்லிக் கொள்கின்றோம். நீங்கள் தேர்தல்மூலம் ஜனநாயக முறைப்படி தெரிவாகி வந்த பிற்பாடு, பாராளுமன்ற உறுப்பினர்களையும் மாநகர, நகர மற்றும் பிரதேச சபை உறுப்பினர்களையும் புறந்தள்ளி, மாகாண சபைகளையும் தள்ளிவைத்துவிட்டு, நீங்கள் நினைக்கின்றவர்களை சனாதிபதி நியமிக்கலாம் என்றால், இது என்ன ஜனநாயகம்? இது வெளிப்படையான அராஜகம்! இந்த நாட்டில் எங்களுடைய கண்ணுக்கு முன்னாலே பிரஜாசக்தியின் உறுப்பினர்கள் அராஜக நடவடிக்கைகளில் ஈடுபடுகின்றார்கள். நீங்கள் பிரதேச ஒருங்கிணைப்புக் குழுத் தலைவருக்கு அதிகாரத்தை வழங்குகின்றீர்கள். அவர் நினைக்கின்றவரை அந்தக் கிராம அலுவலர் பிரிவில் தலைவராக நியமிக்கலாம். இது எந்தச் சட்டத்தில் இருக்கிறது? இது எந்த அடிப்படையில் ஜனநாயகமாகும்? ஒரு வட்டாரத்துக்கு ஒன்று அல்லது இரண்டு அல்லது மூன்று கிராம அலுவலர்களை உள்ளடக்கியதாக மக்களால் தெரிவுசெய்யப்பட்ட வட்டார உறுப்பினர் ஒருவர் இருக்கிறார். ஆனால், அதே வட்டாரத்தில் மக்களால் நிராகரிக்கப்பட்ட ஒருவரை இந்தப் பிரஜாசக்திக்கான தலைவராக உங்களுடைய கட்சி நியமிக்கிறது. இது அரசாங்கமா, கட்சியா? இந்த நாட்டில் நடைபெறுவது உங்களுடைய அரசாங்கத்தின் ஜனநாயக நடைமுறையா அல்லது NPP கட்சியின் அராஜகமா என்பதை தயவுசெய்து முதலில் சொல்லுங்கள்! நீங்கள், நாட்டில் இருந்த முன்னைய ஆட்சியாளர்கள்மீது கல்லெறிந்தீர்கள்; அவர்கள் ஊழல்வாதிகள் என்றீர்கள்; அவர்கள் சரியாக ஆட்சி செய்யவில்லை என்றீர்கள். ஆனால், இப்பொழுது நீங்கள் என்ன செய்கிறீர்கள்? முன்னைய ஆட்சியாளர்கள் ஆயுத ரீதியாக எங்களுடைய மக்கள்மீது அராஜகம் செய்தார்கள்; இனப் படுகொலை செய்தார்கள். அதனையே மிக மெதுவாக, கண்ணுக்குத் தெரியாத வகையில், நூதனமான முறையில், சுற்றறிக்கைகள்மூலம் NPP செய்கிறது. இதன்மூலம் இந்த நாட்டில் இன்னுமொரு மிகப் பெரிய இனப் படுகொலையை - இனவழிப்பை - செய்வதற்கு முயற்சிக்கிறது.

கடந்த காலங்களிலிருந்த அராஜக அரசுகள் அல்லது சிங்களப் பேரினவாத அரசுகள்கூட, மக்களால் தெரிவு செய்யப்பட்ட பிரதிநிதிகளை இயங்கவிட்டன; அவர்களுக்கான சந்தர்ப்பத்தைக் கொடுத்தன; அவர்களுடைய கருத்துகளைக் கேட்டன. ஆனால், இந்த அரசில் அவர்கள் கருத்துத் தெரிவிப்பதற்குரிய சந்தர்ப்பம் முழுமையாக இல்லாமல் செய்யப்படுகின்றது. நீங்கள் மிகவும் வலிந்து இந்த நிலைமையை ஏற்படுத்துகின்றீர்கள். தயவுசெய்து, உங்களுடைய நடவடிக்கைகளை மாற்றுங்கள்! இந்த நாட்டில் வாழுகின்ற மக்கள் எல்லோரும் சுயமாக வாழ வேண்டும் என்ற புரிந்துணர்வு, நல்லெண்ணம் உங்களிடம் இருக்கின்ற தென்றால், ஏன் நீங்கள் இவ்வாறான வேலைகளைச் செய்ய வேண்டும்?

சனாதிபதி அலுவலகத்தால் வெளியிடப்பட்டுள்ள 'பிரஜாசக்தி' - வறுமை ஒழிப்புக்கான தேசிய இயக்கம் தொடர்பான சுற்றறிக்கையின் 4.2இல், சமூக அபிவிருத்திக் குழுவானது ஒரு தலைவர், ஒரு செயலாளர் மற்றும் 5 அலுவல்கள் ரீதியான பதவிவழி உறுப்பினர்களைக் கொண்டிருக்க வேண்டுமெனச் சொல்லப்பட்டு இருக்கின்றது. இதில் பொருளாதார அபிவிருத்தி உத்தியோகத்தர் இருக்கிறார், கிராம அலுவலர் இருக்கிறார், சமுர்த்தி உத்தியோகத்தர் இருக்கிறார், agrarian சம்பந்தமான உத்தியோகத்தர்களும் இருப்பார்கள். ஏன் இந்தக் குழுவில் பிரதேச சபையின் தவிசாளர் இருக்க முடியவில்லை? ஏன், பிரதேச சபையில் வட்டாரத்தைப் பிரதிநிதித்துவப் படுத்துகின்ற உறுப்பினர் இருக்க முடியவில்லை? அந்த வட்டாரத்தில் தேர்தலில் போட்டியிட்டுத் தோல்வியுற்றவரை நீங்கள் பிரஜாசக்தியின் தலைவராக்குகிறீர்கள். இது என்ன ஜனநாயகம்? இது எந்த நாட்டில் இருக்கின்ற நீதி? தயவுசெய்து சிந்தியுங்கள்! இது மிகப் பெரிய ஊழல்; வெளிப்படையான ஊழல்! நாங்கள் உங்களிடம் எதிர்பார்ப்பது, நீதியான அரசையும் நியாயமான அரசியல் நடவடிக்கைகளையும் கௌரவமான அரசியல் பாரம்பரியத்தையும்தான் என்பதை நான் உங்களுக்குத் திரும்பவும் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

பாரம்பரியமான, பரம்பரை ரீதியான அரசியல் ஒழுங்குகளிலிருந்து வேறுபட்டு, அடித்தள மக்களுக்குச் சேவை செய்துதான் நீங்கள் ஆட்சிக்கு வந்தீர்கள் என்று எல்லோரும் பேசிக் கொள்கிறார்கள்; நீங்களும் அதைத்தான் சொல்கின்றீர்கள். நாங்களும் அதனை வரவேற்கின்றோம். நீங்கள் ஆட்சிக்கு வந்தவுடன், கடந்த கால அரசுகள் செய்ததைப்போல, "நாங்களும் அராஜக முறையில்தான் செயற்படுவோம்" என்றால், நீங்கள் முன்வைத்த தேர்தல் விஞ்ஞாபனம் என்ன? தயவுசெய்து, இதனை மாற்றுங்கள்! மக்களுடைய பிரதிநிதிகளை மதியுங்கள்! சாதாரணமாக கிராம மக்கள் தங்களுடைய பிரதிநிதிகளைத் தெரிவுசெய்து இருக்கிறார்கள். அவர்கள் பெரும்பான்மையான சபைகளை அமைத்திருக்கிறார்கள். அந்தச் சபைகளுடைய அங்கீகாரங்களை நீங்கள் வழங்கத் தயாராக வேண்டும். அவற்றைப் புறந்தள்ளிவிட்டு, சனாதிபதி அதிகாரபூர்வமாக நியமிக்கின்ற ஒருவர் எடுக்கின்ற தீர்மானம் அல்லது அவருக்குக்கீழ் பிரதேச ஒருங்கிணைப்புக் குழுத் தலைவர் எடுக்கின்ற தீர்மானம்தான் இந்த நாட்டின் அபிவிருத்தி என்று நீங்கள் நினைத்தால், அது ஜனநாயகமாகாது; நீதியாகாது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நாங்கள் திரும்பவும் உங்களிடம் கேட்பது, உண்மையிலேயே நாட்டில் ஏற்பட்ட அனர்த்தத்திலிருந்து மீண்டு, நல்ல நிலையை உருவாக்குவதற்கு எல்லோருடைய ஒத்துழைப்பும் வேண்டுமென்றால், உலக நாடுகளிடம் உதவி கேட்கிறீர்கள் என்றால், ஜனநாயகமாகச் செயற்படுங்கள்; உண்மையைச் சொல்லுங்கள்; அதனூடாக நீதியை நிலைநாட்டுங்கள் என்றுதான். உங்களுடைய நல்லெண்ண செயற்பாடுகளை நாங்கள் விரைவில் எதிர்பார்க்கிறோம் எனக் கூறி விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Ms.) Krishnan Kalaichelvi. You have nine minutes.

[மு.ப. 11.16]

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சீரற்ற காலநிலை காரணமாக ஏற்பட்ட பேரழிவுக்குப் பிறகு நாட்டின் தற்போதைய நிலைமை தொடர்பாக இன்று சபை ஒத்திவைப்புப் பிரேரணை முன்வைக்கப்பட்டுள்ளது. 'தித்வா' சூறாவளி சென்ற மாதம் 27, 28ஆம் திகதிகளில் இந்த நாட்டைப் பெரிதும் பாதித்தது. பல உயிர்கள் காவு கொள்ளப்பட்டு இருந்தன. இந்த அனர்த்தத்தினால் உயிர் நீத்த அனைத்து உறவுகளுக்கும் எமது அஞ்சலியைச் செலுத்துவ துடன், இதனால் பாதிக்கப்பட்டவர்களுக்கு எனது அனுதாபங் களையும் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த நாட்டின் 22 மாவட்டங்களை இந்த சூறாவளி தாக்கியது. விசேடமாக நுவரெலியா, பதுளை, மாத்தளை, கேகாலை, கண்டி போன்ற மாவட்டங்களில் வாழும் மக்கள் இந்த அனர்த்தத்தினால் பாரிய அவல நிலைக்கு முகங்கொடுத்தார்கள். இந்தப் பிரதேசங்களை எடுத்துக் கொண்டால், அங்குள்ள வீதிகள் 200 வருடங்களுக்கும் மேல் பழைமைவாய்ந்தவையாகும். மலையகப் பிரதேசங்களில் வாழ்கின்ற மக்கள் இந்த இயற்கை அழிவினால் பாரியளவில் பாதிக்கப்பட்டுள்ளார்கள். அனர்த்தம் ஏற்பட்ட ஒவ்வொரு பிரதேசத்துக்கும் நாங்கள் சென்று பார்த்தபோது, அங்குள்ள மக்கள் தமது உயிர் பிரிந்து விடுமோ என்ற அச்சத்தில் வாழ்ந்துகொண்டு இருப்பதை அவதானிக்க முடிந்தது. வீடுகளில் சிறு வெடிப்பு ஏற்பட்டாலும் அந்த மக்கள் பயப்படுகின்றார்கள். அநேகமானோர் இன்னமும் பாதுகாப்பு நிலையங்களில் வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். இந்த இயற்கை அழிவானது உண்மையிலேயே இந்த நாட்டில் வாழும் அனைத்து மக்களுக்கும் ஒரு பாடம் புகட்டியுள்ளது. அதாவது, இயற்கைக்கு நாம் எதிராகச் செயற்படுவோ மேயானால், இயற்கை என்றாவது ஒருநாள் அதன் பிரதிபலனை எமக்குப் பெற்றுக்கொடுக்கும்.

நுவரெலியா மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் ஓர் உறுப்பினர் என்ற வகையில் நான் சில விடயங்களைக் குறிப்பிட வேண்டும். அந்த மாவட்டத்தில் பாரிய அழிவுக்குட்பட்ட பிரதேசங்களாக வலப்பனை, கொத்மலை, ஹங்குரான்கெத போன்ற பிரதேசங்கள் விளங்குகின்றன. இந்தப் பிரதேசங்களில் மலை மேடுகளிலுள்ள குடும்பங்கள் வீடுகளும் இல்லாது, வீதிகளும் இல்லாது, உயிர்களும் இல்லாது தத்தளித்துக்கொண்டு இருக்கின்றன. இந்தப் பேரழிவின் பிரதிபலனாக இன்று நுவரெலிய மாவட்டத் திலுள்ள பிரதேசங்களை, குடியிருப்புகளை ஒன்றுடனொன்று இணைக்க முடியாதளவுக்கு வீதிகள் அழிவுக்குள்ளாகி இருக்கின்றன. அங்குள்ளவர்களுக்குத் தேவையான சேவை களைச் செய்வதற்கு நான் சென்றிருந்தேன். விசேடமாக, மலையக மக்கள் செறிந்து வாழும் பிரதேசங்களுக்குச் சென்று அவர்களுடன் உரையாடினேன். அந்தப் பழைமைவாய்ந்த வீடுகளில் மக்கள் வசிப்பதற்குப் பயப்படுகிறார்கள். கட்டிட ஆய்வாளர்களை அழைத்துக்கொண்டு அந்தப் பிரதேசங்களைப் பரிசோதித்து, அந்த மக்களை அவ்விடங்களில் மீள்குடியேற்றம் செய்வதற்கு எமக்குக்கூட பயமாக இருக்கின்றது. முறையற்ற குடியிருப்புகள், முறையற்ற கட்டிடங்கள், முறையற்ற வீடமைப்புகள் போன்றவை இதற்குப் பிரதான காரணமாகும்.

நாங்கள் உண்மையிலேயே சந்தோசப்படுகின்றோம். இந்த நாட்டிலே இதற்கு முன்னரும் இயற்கை அழிவுகள் ஏற்பட்டுள்ளன. மழை காலங்களில் என்றால் அந்த மக்களை வேறு இடத்தில் தங்க வைத்துவிட்டு, வெயில் காலங்களில் மீண்டும் அதே இடத்தில் குடியமர்த்துவதை வரலாறு முழுவதும் நாம் காண்கிறோம். இன்று இந்த 'தித்வா' சூறாவளியால் முழு நாடுமே பாதிக்கப்பட்டுள்ளது. மலையகப் பிரதேசங்களிலுள்ள பாதிக்கப்பட்ட மக்களைச் சென்று சந்தித்து, இந்த சந்தர்ப்பத்தைப் பயன்படுத்தி அங்கு வாழும் மக்களை எதிர்காலத்தில் உரிய பாதுகாப்பான ஓர் இடத்தில் குடியமர்த்துவதற்கான சகல வேலைத்திட்டங்களையும் மாண்புமிகு சனாதிபதி அவர்கள் முன்னெடுத்துள்ளார்; அதற்கு உறுதியளித்துள்ளார் என்பதை நான் இவ்விடத்தில் கூறிவைக்க விரும்புகின்றேன்.

ஒவ்வொரு காலகட்டத்திலும் ஏற்படுகின்ற இயற்கை அனர்த்தங்களின்போதும் ஒவ்வொருவரும் தனியாகச் செயற்பட்டு மக்களுக்கு உதவினார்கள் என்பது உங்களுக்குத் தெரியும். ஆனால், இன்று ஏற்பட்ட இயற்கைப் பேரனர்த்தத்தின்போது, இந்த நாட்டின் புதிய அரசாங்கமும் அதிமேதகு சனாதிபதி முதல் பிரதம அமைச்சர், அமைச்சர்கள், பிரதி அமைச்சர்கள், பாராளுமன்ற உறுப்பினர்கள், பிரதேச சபை மற்றும் நகர சபை உறுப்பினர்கள், அரச ஊழியர்கள், மாவட்டச் செயலாளர்கள், பிரதேச செயலாளர்கள், கிராம உத்தியோகத்தர்கள், அபிவிருத்தி அதிகாரிகள் மற்றும் பாதிப்புக்குள்ளாகாத மக்கள், முப்படையினர், பொலிஸார் என சகலரும் ஒன்றிணைந்து இந்த அனர்த்தத்திலிருந்து மக்களை மீட்டெடுப்பதற்கான சகல முயற்சிகளையும் முன்னெடுத்தனர். அது மட்டுமல்ல, சிவில் அமைப்புகள் மற்றும் ஏனைய அமைப்புகளும் இதற்கு ஒத்துழைத்தன. அனர்த்தம் ஏற்பட்டு 22 நாட்களில் இந்த நாட்டை சாதாரண நிலைக்குக் கொண்டுவர முடிந்ததற்குக் காரணம், அனைவரும் ஒன்றிணைந்து செயற்பட்டமையாகும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாட்டில் இதற்கு முன்னர் இயற்கை அனர்த்தம் ஏற்பட்டபோது, பல நாடுகளிலிருந்தும் நிதியுதவி கிடைக்கப் பெற்றது; அந்நாடுகளால் எமக்கு உதவிக்கரம் நீட்டப்பட்டது. ஆனால், அவை மக்களுக்குச் சென்றடைந்ததா? என்ற கேள்வி எமது மத்தியில் இன்றும் இருக்கின்றது.

ஆனால், இந்த 'தித்வா' சூறாவளியின் பின்பு, மக்களின் வாழ்வை இயல்பு நிலைக்குக் கொண்டுவருவதற்கு உலக நாடுகள் முன்வந்திருக்கின்றன. இந்த அரசாங்கம் பொய் சொல்லாது; மக்களின் பணத்தை வீணடிக்காது; சூறையாடாது என்ற ஒரு நம்பிக்கையின் பேரில் - இந்த அரசாங்கத்தையும் சனாதிபதியையும் நம்பி - அந்நாடுகள் உதவிசெய்து கொண்டிருக்கின்றன; பல அமைப்புக்கள் உதவி செய்துகொண்டிருக்கின்றன; வர்த்தகர்கள் உதவிசெய்து கொண்டிருக்கின்றார்கள். வெளிநாடுகளில் வாழும் இலங்கை யர்கள் இதற்காக மிகவும் கஷ்டத்தோடு செயற்பட்டுக்கொண்டு இருக்கின்றார்கள். விசேடமாக, இந்தச் சபையில் ஒரு விடயத்தைக் கூற வேண்டும். இந்த இயற்கை அழிவில் பாதிக்கப்பட்ட மக்களின் வாழ்க்கையை இயல்பு நிலைக்குக் கொண்டுவருவதற்காக வறுமைக்கோட்டின்கீழ் - அடி மட்டத்தில் - வாழும் தோட்டத்தொழிலாளர்கள் - மஸ்கெலியா வில் உள்ள ஹபுகஸ்தென்னத் தோட்டத்தொழிலாளர்கள் - தமது ஒருநாள் சம்பளத்தை இந்த நாட்டின் சனாதிபதி அவர்களை நம்பி வழங்கியுள்ளார்கள். இது வரலாற்றில் முதன்முறையாகும். *[இடையீடு]* அதேபோல், இயற்கை அழிவில் பாதிக்கப்பட்ட மக்களின் வாழ்வை இயல்பு நிலைக்குக் கொண்டுவருவதற்குச் சகல தோட்டத் தொழிலாளர்

[ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය]

களும் தமது ஒருநாள் சம்பளத்தை இந்த அரசாங்கத்தை, சனாதிபதியை நம்பி வழங்க முன்வந்துள்ளார்கள். அதற்காக, மலையக தோட்டத் தொழிலாளர்களுக்கு இந்தச் சபையில் எனது மனமார்ந்த நன்றியையும் கௌரவத்தையும் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.26]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම මේ පාර්ලිමේන්තුවට ආපු වෙලාවේ මටයි, රෝහිත අබේගුණවර්ධනටයි නමක් පට බැන්දා, වල් පැළ දෙකක් පාර්ලිමේන්තුවට ආවා කියලා. කමක් නැහැ. අද ඇඹිලිපිටිය පැත්තේ NPP ගංජා පැළත් මේක අස්සේ තිබෙනවා. වල් පැළ අස්සේ ගංජා පැළ ආපු එක ගැනත් මම මේ වෙලාවේ කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දිනවල ආපදාවට පත්වූවන්ට සහන සැලසීම සඳහා ආණ්ඩුව රුපියල් බිලියන 500ක් වෙන් කර ගන්න යනවා. මා හිතන විධියට, මේ රටේ ඇති වුණු දරුණුම ආපදාව තමයි පසුගිය දිනවල ඇති වුණු ආපදාව. අදත් බදුල්ලට වහිනවා. මම පාන්දර 3.00ට ආවේ. තවමත් බදුල්ලට වහිනවා. මේ වෙලාවේදී මම කියන්න ඕනෑ, ආණ්ඩුවට දැන් තිබෙන්නේ පොරොන්දු වුණු අලුත් වැඩ කරන්න නොව, මේ කරන්න තිබෙන වැඩ ටික කිරීම බව. ප්‍රේමදාස මහත්මයා උදාගම් ව්‍යාපාරය යටතේ මුලින්ම හදපු ගම්මානයක් තමයි වියලුව ආසනයේ තිබෙන "වාසනාගම". ප්‍රේමදාස මහත්මයා උදාගම් ව්‍යාපාරය යටතේ හදපු වාසනාගමට දැන් යන්න බැහැ. ගල්, පස් කඳු වැටිලා ඒ පාර වැහිලා. අන්න ඒවා ශුද්ධ කරලා පාරවල් හදන්න තමයි දැන් තිබෙන්නේ.

විනාශ වුණු උමා ඇළ අමුණ ගොවි සංවිධාන විසින් තාවකාලිකව වැලි කොට්ට ගහලා හැදුවා. ඊයේ සමන්ත විද්‍යාරත්න මහත්මයා ගිහිල්ලා එහි දියවර නිකුත් කළා; පිරිත් පැන් දැම්මා. ඒක බොහොම හොඳයි. ආණ්ඩුව පිරිත් පැන් දාලා පටන් ගත්තු පළවෙනි වැඩේ ඔය. ආණ්ඩුව ආගම සිහි කරලා වැඩක් පටන් ගත්තු එක ගැන මම සතුටු වෙනවා. මොකද, පසුගිය අවුරුද්ද තුළ ආගමක් පැත්තකටවත් ගන්නේ නැතුව, ගණන් ගන්නේ නැතුව තමයි මේ ආණ්ඩුව වැඩ කළේ. හින්දු වේවා, ඉස්ලාම් වේවා, බෞද්ධ වේවා ඒ මොන ආගමක්වත් සිහපත් කරන්නේ නැතුව තමයි කටයුතු කළේ. අඩුම වශයෙන් ප්‍රාදේශීය සභාවකවත් ආගම සිහිපත් කළේ නැහැ. ගස් ගල්වලටත් වඳින වෙලාවේ මේ ආණ්ඩුව මොකක් හරි ආගමක් සිහිපත් කිරීම ගැන මම සතුටු වෙනවා. ඊයේ පිරිත් පැන් දමලා නැවත වැඩ පටන් ගත්තා, මස්තබාල්දූව යන්න කියලා. මේ ආණ්ඩුවට එහෙමවත් හිතුණු එක ගැන මම සතුටු වෙනවා.

ඊළඟට, අද වන විට බදුල්ල දිස්ත්‍රික්කයේ පවතින තත්ත්වය ගැන කථා කරන්න මම කැමැතියි. බදුල්ල දිස්ත්‍රික්කයෙන් භාගෙට භාගයක් මේ ආපදාවට ලක් වෙලා තිබෙනවා. එහි පාරවල් විනාශයි; ගෙවල් විනාශයි. මෙතැන ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමාත් ඉන්න නිසා මම කියන්න ඕනෑ, හග්ගල මල්වත්ත ගාව පාර ගැන. අද ඒ පාර විවෘත කරලා තිබෙනවා. බස් එක නවත්තලා බැහැලා යනවා. හැබැයි බස් එකේ ගමන තවම අවදානම්. ඒ වාගේම තමයි ලුණුගල 19 කණුව ළඟ. බස් එකෙන් බැහැලා මිනිස්සු එහා පැත්තට ගිහිල්ලා යනවා. එතැනත් පාර අවදානම්. එහෙම බලන කොට, ඔබතුමන්ලාට ලොකු වැඩ කොටසක් කරන්න ඉතිරි වෙලා තිබෙනවා. රුපියල් බිලියන 500ක නොවෙයි, රුපියල් බිලියන 1,000ක, 2,000ක පාඩු සිදු වෙලා තිබෙනවා. ඒවා නැවත හදන්න ඕනෑ. ඒ ගැනත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න ඕනෑ.

අපි මේ දේවල් දිහා ද්වේෂයෙන් බලන්නේ නැහැ. ජනාධිපතිතුමා පසුගිය දවසක මේ ආපදා ගැන කථා කරන්න බදුල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ආපු වෙලාවේ, බදුල්ල දිස්ත්‍රික්කයෙන් විපක්ෂය නියෝජනය කරමින් සහභාගි වුණේ මම විතරයි. හැබැයි, ජනාධිපතිතුමා දන්නේ නැහැ, එම රැස්වීමට විපක්ෂයේ මන්ත්‍රී කෙනෙක් ඇවිත් පිටුපසින් වාඩි වෙලා හිටියා කියලා. කවුරුවත් ජනාධිපතිතුමාට ඒ ගැන දැනුම් දීලාවත් නැහැ. රැස්වීම ඉවර වෙලා තමයි ජනාධිපතිතුමා මට කථා කරලා, "ආ! ඔයාත් හිටියාද, මේ රැස්වීමේ?" කියලා ඇහුවේ. ඕක තමයි අලුත්ම තත්ත්වය. අපට කියනවා, උදව් කරන්න එන්න කියලා. අපි ගියාට ශත පනහකටවත් ගණන් ගන්නේ නැති තත්ත්වයකට පත් කරලා තිබෙනවා. හැබැයි, ඒක ජනාධිපතිතුමාගේ වැරැද්දක් නොවෙයි. මොකද, සමහර කුහක දේශපාලනඥයෝ අඩුම වශයෙන් ජනාධිපතිතුමාට දැනුම් දීලාවත් නැහැ, "විපක්ෂයේ මිනිහෙකුත් අපේ මේ රැස්වීමට ඇවිල්ලා ඉන්නවා" කියලා. ඒකත් මම මේ වෙලාවේදී කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රන්වල මහත්මයා ගැනත් කියන්න ඕනෑ. මේ ආපදා අස්සේම රන්වල මහත්මයාත් ආපදා දෙකක් කරගත්තා. එතුමා ඔය පුටුවේ ඉන්න කොට ආපදාවක් කරගෙන අයින් වුණා. ඒක එකක්. ඊට පසුව ගිහිල්ලා තවත් ආපදාවක් කර ගත්තා. රන්වල මහත්මයාට කියලා බැලුම් පුම්බන්න ඕනෑ නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මූණ මිරිකුවොත් අරක්කු භාගයක් ගන්න පුළුවන්. බොන මිනිහාගේ මූණෙන් හොඳට පෙනෙනවා, මෙයා බොනවාද නොබොනවාද කියලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

බැලුම් පුම්බන්න ඕනෑ නැහැ. එයා කොහොමත් බොනවා; බඩු දාන කෙනෙක් තමයි. එයාගේ මුහුණ දැක්කාම පෙනෙනවා. ඒ ගැනත් මේ වෙලාවේදී කියන්න ඕනෑ. හැබැයි, රන්වලට එක නීතියක්, තවත් කෙනෙකුට තවත් නීතියක් වෙන්න බැහැ, මේ රටේ. නීතිය කාටත් පොදුයි; නීතිය කාටත් සමානයි. හැබැයි, ඒක රන්වලට එකක්, තව කාටවත් තව එකක් වෙන්න බැහැ. ඒකත් මේ වෙලාවේදී කියන්න ඕනෑ.

ඊළඟට, මම මේ වෙලාවේ කියන්න ඕනෑ මේ ආපදා තත්ත්වය හමුවේ හමුදාව විශාල වැඩ කොටසක් කළ බව. හැබැයි, හමුදාවේ මහ ලොක්කෝ පුටුවල ඉඳිමින් වැලි කොට්ට ගහන හමුදා නිලධාරින්ගේ දවසක වැටුප කපනවා.

ඒ මිනිසුන්ගේ දවසක වැටුප කපන එක නොවෙයි, ඒ මිනිසුන්ට මාසයක වැටුප දෙන්න ඕනෑ, ඒ මිනිසුන් කරපු සේවයට. ඒ මිනිස්සු ඉස්කෝලවල, ප්‍රජාශාලාවල ඉඳගෙන තමයි වැඩ කරන්නේ. ඒ මිනිසුන්ගේ දවසක වැටුප කපනවා. ලොකු

ලොක්කෝ මහ පුටුවල ඉඳගෙන හමුදාවේ සොල්දාදුවාගේ දවසක වැටුප කපනවා, ආපදාවලට දෙන්න කියලා. ඒ මිනිස්සු දන්නේත් නැහැ. ඒ වාගේ වැඩ මේ වෙලාවේදී වෙනවා.

ඒ වාගේම කියන්න ඕනෑ මේ ආපදා තත්ත්වයත් එක්කම දකින්න තිබෙන තවත් දෙයක්. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් ග්‍රාම නිලධාරි සහ NPP කාර්යාලයේ ග්‍රාම නිලධාරි කියලා දෙන්නෙක් ඉන්නවා. රුපියල් 25,000 දෙන්න, රජයේ ග්‍රාම නිලධාරියි, NPP කාර්යාලයේ නිල නොලත් ග්‍රාම නිලධාරියි කියලා දෙන්නෙක් යනවා. NPP කාර්යාලයේ එක්කෙනාත් ග්‍රාම නිලධාරි එක්ක යනවා. ඒක දැන් ග්‍රාම නිලධාරිටත් වදයක් වෙලා තිබෙන්නේ. අර ගෙදරට දෙන්න එපා කියනවා, මේ ගෙදරට දෙන්න කියනවා, අරයා වෙන පක්ෂයක කියනවා, මෙයා වෙන පක්ෂයක කියනවා. එහෙම කරන්න බැහැ. ඔයගොල්ලන්ගේ ආණ්ඩුව ආවේ, system change කරන්න. System change කරන්න ආවා නම්, ඒ වැඩේ හරියට කරන්න ආණ්ඩුව දැනගන්න ඕනෑ. ඒකෙන් දේශපාලනය කරන්න එපා. හරි විධියට රුපියල් 25,000 දෙන්න, රුපියල් 50,000 දෙන්න, ගෙවල් දෙන්න. NPP එකට එක ගංවතුරක්, සමගි ජන බලවේගයට වෙන ගංවතුරක්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වෙනම ගංවතුරක් ආවේ නැහැ. ඒ වාගේම නාය යනකොට NPP එකේ අයට එකක්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වෙන එකක්, සමගි ජන බලවේගයට වෙන එකක්, පොහොට්ටුවට වෙන එකක් කියලා නාය ගියේ නැහැ. එක පාරටම නාය ගියා. ඒවායේ තිබුණු ඔක්කෝම ගෙවල් විනාශ වුණා. එතැනදී අරයාගේ ගෙදර, මෙයාගේ ගෙදර කියලා වෙන් වුණේ නැහැ. නමුත්, මෙතැන මාර කෙළියක් වෙලා තිබෙන්නේ. ආපදා සහන දෙන්න ප්‍රජා සංවර්ධන නිලධාරිගේ නිර්දේශය දෙන්න ඕනෑ කියලා එයා ග්‍රාම නිලධාරිගේ පිටිපස්සෙන් හැම ගෙදරක් ගානේම යනවා. හැමෝටම ගංවතුර ආවා; හැමෝටම නාය යෑම බලපෑවා. ඒ හැම පක්ෂයකම අයගේ ගෙවල් කැඩුණා. ඒ හැමෝම පාවිච්චි කරන පාරවල්, පාලම් කැඩුණා. මේ ආපදාව දෙමළ ද, සිංහල ද, මුස්ලිම් ද, බර්ගර් ද කියලා බලලා ආවේ නැහැ. මේ ගංවතුර මුස්ලිම් මිනිහාටත් ආවා, දෙමළ මිනිහාටත් ආවා, සිංහල මිනිහාටත් ආවා, කතෝලික මිනිහාටත් ආවා. NPP කාර්යාලයේ එක්කෙනාගේ නිර්දේශය නැත්නම්, රුපියල් 25,000 දෙන්න බැහැ කියා නිර්දේශ කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේවා දෙකයි පනහේ වැඩ. මේවා අපේ ආණ්ඩුවලිනුත් කළා. මේවා කරලා තමයි අපේ ආණ්ඩුත් වැඩ වරද්දාගත්තේ. හැබැයි, මේ ආණ්ඩුව ආවේ මේවා කරන්න නොවෙයි. මිනිස්සු මේ ආණ්ඩුවෙන් මේවා බලාපොරොත්තු වුණේ නැහැ. මේ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණේ, පිරිසිදු රටක් හදලා පිරිසිදු විධියට වැඩ කරයි කියලා.

මේ ආපදාව ගැන කියනවාට අමතරව තවත් කාරණයක් ගැන මම මේ වෙලාවේ කියන්න ඕනෑ. ආණ්ඩුව දැන් ලොකු වැරැද්දක් කරගන්නයි යන්නේ. ඒ මොකක් නිසා ද? හොඳට අහගන්න මේක. ලංකාවේ වැඩිපුරම - සියයට 80ක් - පාවිච්චි කරන්නේ ලිට්‍රෝ ගෑස්; නිල් පාට සිලින්ඩරයේ පුරවපු ගෑස් එක. මෙතෙක් කල් - අද වෙනකල් - ලිට්‍රෝ ගෑස් සැපයීම කරගෙන ගියේ ඕමාන් කොම්පැනියකින්. ඕමාන් කොම්පැනියකින් තමයි ලිට්‍රෝ ගෑස් අද වෙනකල් දෙන්නේ. හැබැයි, ගෑස් ගෙන්වීම පළමුවැනිදා ඉඳන් ස්විට්සර්ලන්තයේ Geogas නමැති කොම්පැනියකට දීලා තිබෙනවා. කැබිනට් අනුමැතියක් දීලා තිබෙනවා. ඒ කියන්නේ ස්විට්සර්ලන්තයේ Geogas කියන කොම්පැනියට අවස්ථාව දීලා තිබෙනවා ගෑස් ගෙන්වන්න. අවුරුදු 10ක් තිස්සේ අද වනකල් ප්‍රශ්නයක් නැතිව ගෑස් ගෙන්වපු ඕමාන් කොම්පැනිය අයින් කරලා Geogas කොම්පැනියට ගෑස් ගෙන්වන්න දීලා තිබෙනවා. ඕමාන් කොම්පැනියෙන් ගෙන්වපු හැම ගෑස් සිලින්ඩරයක්ම මුහුද මැද ඉඳලා ප්‍රමිති ආයතනය check කළා. මා හිතන විධියට ප්‍රමිති ආයතනය මුහුද මැද ඉඳලා check කරලා තමයි ගෑස් ටික ගෙනැල්ලා දුන්නේ. හැබැයි, මේ ගොල්ලෝ ගිවිසුම් අත්සන් කරන්නේ නැහැ දැන්. තවම ගිවිසුම් අත්සන් කරලා නැහැ. මේ ගොල්ලෝ කියනවා ලංකාවට නැව් 4කින්- හරියට දවස් හතරකට සැරයක් ගෑස් නැවක් ඕනෑ අපේ රටට. හැබැයි, ටෙන්ඩරය ලැබුණාට පස්සේ මේ සමාගම කියනවාලු, "අපට මුහුද මැදට ගෙනැල්ලා check කරන්න බැහැ, ප්‍රමිති ආයතනයේ සහතික අවශ්‍ය නැහැ" කියලා. ඒ වාගේම මේ ගොල්ලෝ කියනවා ලු, අපට නැව් දෙකකින් ගෑස් ගෙනැල්ලා දෙන්න අවස්ථාව දෙන්න කියලා. මේ ගොල්ලෝ තවම ගිවිසුම් අත්සන් කරලා නැහැ. මම ස්ථිර වශයෙන්ම කියනවා, මේ කියන සමාගමට ඒ අවස්ථාව ගියොත් තව මාස තුනක් යනකොට ලංකාවේ ලිට්‍රෝ ගෑස් - නිල්පාට සිලින්ඩරවල පිරවූ ගෑස්- හිඟයක් අනිවාර්යයෙන් ඇති වෙනවා. ඒක කාටවත් වළක්වන්න බැහැ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව වැටුණේත් ගෑස් ප්‍රශ්නයෙන් සහ සහ විදුලිය ප්‍රශ්නයෙන්. ඒ නිසා ඔබතුමන්ලා ආණ්ඩුව හැටියට වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ. වගකීම් විරහිතව කටයුතු කරන්න ගියොත් ලබන පෙබරවාරි, මාර්තු වෙනකොට අනිවාර්යයෙන් මේ රටේ ලිට්‍රෝ ගෑස් හිඟයක් ඇති වෙනවා. අද දෙසැම්බර් 18වැනි දා. අලුත් සමාගම තවම 1වැනි දා ටෙන්ඩර් එක අත්සන් කරලා නැහැ. අලුත් සමාගම ටෙන්ඩර් එක අරගෙන කොන්දේසි දම දමා ඉන්නවා, අත්සන් කරන්නේ නැතුව. එහෙම වුණොත් ආයෙත් සැරයක් ලංකාවේ ගෑස් නැතුව ගිහිල්ලා මිනිසුන්ට උයා ගන්න බැරි තැනට පත් වෙනවා පත් වෙනවාමයි. ඒ නිසා වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම මේ අලුත් සමාගම මේ වෙනකල් ආසියාවේ කොහේවත් ගෑස් බෙදා හැරලා නැති සමාගමක් බවත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ඊළඟට මම මේ සභාවට කියන්න ඕනෑ, අද ඩොලර් එක රුපියල් 313යි. "සීයා" භාර දුන්නේ 305න්. සීයා ඔබතුමන්ලාට රට භාර දෙනකොට රුපියල් 305යි ඩොලර් එක. අද රුපියල් 313යි. ඒක තිබුණු තත්ත්වයෙන්වත් පවත්වා ගන්න ඔබතුමන්ලාට තවම බැරි වෙලා තිබෙනවා. අඩුම වශයෙන් රුපියල් 305වත් තියා ගන්න බැරි තත්ත්වයට අද මේ රට වැටිලා තිබෙනවා.

ඒ වාගේම දැන් මේ ආණ්ඩුව සමෘද්ධි බැංකු ටිකට වැඩේ දෙන්න යනවා. සමෘද්ධි බැංකුවල තිබෙන්නේ ගමේ මිනිසුන්ගේ සල්ලි. දැන් සමෘද්ධි බැංකු ටික අයින් කරන්න හදනවා. ඒක ප්‍රතිව්‍යුහගත කරලා වෙනත් ගේමක් දෙන්න යනවා. ඒවාට අත තියන්න යන්න එපා. ඒවායේ තිබෙන්නේ මේ රටේ ඉන්න අහිංසක ජනතාවගේ සල්ලි. සමෘද්ධි බැංකු හරහා, ඒ සල්ලිවලින් තමයි දිවිනැඟුම බැංකු පවත්වාගෙන යන්නේ.

ඒ වාගේම මම මේ වෙලාවේදී කියන්න ඕනෑ, ඔබතුමන්ලා "Sri Lankan Day" එක පටන් ගත්තා. ඒක කර ගන්න බැරි වුණා, මේ ආපදාවත් එක්ක.

ඒ වාගේම බලන්න, වාහනවලට number plates ටිකවත් දී ගන්න බැරි ආණ්ඩුවක් නේ මේ ආණ්ඩුව. මාස හයක් වෙනවා, වාහන ගෙන්වලා. තවම ඒවාට number plates ටික දී ගන්න බැහැ. Number plates දෙන වැඩේ ඒ සමාගමෙන් අයින් කරලා තිබෙනවා. හරි, ඒකට කමක් නැහැ. ඔබතුමන්ලාට හරි යන්නේ නැති කවුරු හරි ඉන්නවා නම් අයින් කරන්න. අයින් කරලා අලුත් කට්ටියකට දෙන්න. හැබැයි ඒක ඉක්මන් කරන්න. මිනිස්සු දැන් ඒක දිහා බලාගෙන ඉන්නවා. මේ රටට වාහන ගෙනැල්ලා, වාහන ලක්ෂ ගණනක් දැන් විකුණලා ඉවරයි. ජපානයේ වාහනය හදලා, ගෙනැල්ලා මෙහේ විකුණලා, ඔබතුමන්ලා tax එකත් අරගෙන ඉවරයි. ආණ්ඩුවට තවම ඒවාට number plates ටික දී ගන්න බැහැ. Number plates නැතුව ගොඩක් අය බලාගෙන ඉන්නවා.

ඊළඟ කාරණය ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විකුණා ගන්න බැරුව මාස තුනක් ගියොත් වාහනයකින් tax එක විධියට

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

සියයට 3ක් ගන්නවා. දැන් කවුද ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ව්‍යසනය අස්සේ වාහන ගන්නේ? වාහන ගන්න පුළුවන්ද මිනිසුන්ට මේ ව්‍යසනයක් වෙලා තිබෙද්දී? දැන් සේල්වල වාහන තිබෙනවා. ඔබතුමන්ලා ඒවායෙන් tax ගන්නවා සියයට 3 ගණනේ, මාස තුනෙන් තුනට. ඒක ඉතාම අසාධාරණයි. ඒ නිසා ලංකාවේ දැන් වාහන විකුණන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා ඒ ගොල්ලන්ට සහනයක් දෙන්න ඕනෑ. මාස තුනෙන් තුනට සියයට 3ක් tax ගන්න එක අයින් කරලා, මාස හයකින්වත් tax ගන්න විධියක් හදලා දෙන්න කියලා අපි මේ ආණ්ඩුවට කියන්න ඕනෑ.

ඒ වාගේම විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කළා. විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට වන්දි දෙනවා, අයින් වෙන්න කිව්වා. 12වැනි මාසයේ අයින් වෙන්න ගිය මිනිස්සු දැන් අයින් වෙන්න බලාගෙන ඉන්නවා. ඒ අය අයින් වෙන්න බලාගෙන ඉන්නකොට දැන් කියනවාලු තවත් අවුරුද්දක් කල් දෙනවා කියලා. ඒ මිනිස්සු ආණ්ඩුව ගෙනාපු ප්‍රතිපත්තියට එකඟ වෙලා, ආණ්ඩුව ගෙනාපු තීන්දුවට කැමති වෙලා, වන්දි අරගෙන අයින් වෙන්න ඉන්නේ. ඒ මිනිස්සු විදේශ රටවලට යන්න වාගේ දේවල්වලට සූදානම් වෙලා ඉන්නේ. ඒ මිනිසුන්ට කියනවාලු, ඒක තව අවුරුද්දකින් පස්සට දමනවා කියලා. ඒ වාගේ වැඩ තමයි ඉතින් මේ ආණ්ඩුවේ තිබෙන්නේ.

ඒ වාගේම පදවිය රෝහලේ යන්ත්‍ර තඹුත්තේගමට ගලවාගෙන යනවා. පදවිය කියන්නේ දුෂ්කර පළාතක්. දුප්පත් මිනිස්සු ජීවත් වන ප්‍රදේශයක්. තඹුත්තේගමට ඕනෑ නම් තඹුත්තේගමට අලුතින් ගෙන යන්න කියන්න. පදවිය රෝහල කියන්නේ තඹුත්තේගමට කිලෝමීටර 150ක් විතර ඈතින් තිබෙන රෝහලක්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ.

ඒ විධියට බලනකොට, විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ ප්‍රශ්න, වාහන නොම්මරවල ප්‍රශ්න වාගේ හැම පැත්තකම ප්‍රශ්න තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ආපදාවත් එක්ක වෙච්ච හානිය කියලා නිම කරන්න බැහැ. පිටස්තර මිනිස්සු උදව් කළා අපට; සහයෝගය දුන්නා. හැම පළාතකින්ම මිනිස්සු ආවා. රාජ්‍ය නිලධාරින් මහන්සි වුණා. රාජ්‍ය නිලධාරින් අපට දායකත්වය දුන්නා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා කථාව අවසන් කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒ ගෙනාපු බඩු භාණ්ඩ තවමත් දිසාපති කාර්යාවල තිබෙනවා. ඒවා තවමත් බෙදා ගන්න බැහැ. දැන් මාසයකට කිට්ටු වෙන්න එනවා, ආණ්ඩුවෙන් ගෙනැල්ලා දීපු ඒවා නොවෙයි, පිටස්තර මිනිස්සු, ස්වේච්ඡා සංවිධානවලින් මිනිසුන්ට බෙදා දෙන්න කියලා ගෙනැල්ලා දීපු බඩු භාණ්ඩ තමයි තවමත් දිසාපති කාර්යාලවල, AGA officesවල තිබෙන්නේ. ඒක ආණ්ඩුව පිළිගන්න ඕනෑ. මේ ආණ්ඩුවට තවම මුදල් වියදම් කර ගන්න බැරි වුණා. රුපියල් 25,000ක මුදල තවම හරියට දීගන්න බැරි වුණා. රුපියල් 25,000ක මුදල අවතැන් වුණු සියයට 50කට තවම දීලා නැහැ. ඒ වාගේ තවත් ගොඩක් දේවල් තිබෙනවා. හැබැයි, මේවා ඉවර වෙනකොට, ඊළඟ වැස්ස එනකොටත් මේ ආණ්ඩුවට මේ වැඩ ඉවර කරන්න පුළුවන් වෙයි ද කියලා විශ්වාසයක් නැහැ කියන එක මේ වෙලාවේ ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමාගේ කථාවට මම ලොකුවට අභියෝග කරන්නේ නැහැ. හැබැයි, එතුමා පෞද්ගලිකව අසෝක රන්වල මන්ත්‍රීතුමාගේ පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් කරපු ප්‍රකාශය ඇත්තටම මම ඉතාම කනගාටුවෙන් සහ පිළිකුලෙන් මේ සභාවේදී හෙළා දකිනවා. මොකද, අසෝක රන්වල මන්ත්‍රීතුමා ගැන පෞද්ගලිකව දන්න සියලුදෙනා, - *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. ඔබතුමන්ලාගේ කථා අපි අහගෙන ඉන්නවා නේ. ඒ පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් කරපු ප්‍රකාශය දැඩි ලෙස හෙළා දකින්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will give you half a minute, Hon. Minister.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ඒ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය තුළින් කථා කරපු දේ තමයි මේ අය මේ විධියට කරගහගෙන යන්නේ. ඒ අනතුර සිදුවන අවස්ථාවේදී එතුමා බීමතින් හිටියා ද, නැද්ද කියන කරුණු අදාළ අධිකරණයට වාර්තා වෙයි. ඒ නිසා සමාජ මාධ්‍ය තුළ තිබෙන දේවල් සම්බන්ධයෙන් කථා කරන්න මේ සභාවේ කාලය නාස්ති කරන්න දෙන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Anton Jayakody. You have 11 minutes. *[Interruption.]* Hon. Members, restrain yourselves, please. - *[Interruption.]*

Hon. Anton Jayakody, would you please commence your speech? You have 11 minutes and your time has already started.

[පූ.භා. 11.43]

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටම ව්‍යසනයකට පත් වෙලා තිබෙන අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට යම් කාලසීමාවක් ලබාදීම පිළිබඳව මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

ඇත්තටම ගත්තොත් අපේ රටේ ලොකු ව්‍යසන ඇති වෙන්නේ විශේෂයෙන්ම ජල අතිරික්තයක් හෝ ජල හිඟකමක් නිසායි. මෙතැනදී ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙන්නේ ජල අතිරික්තයක් හේතුවෙන් ලැබුණු ප්‍රතිඵලයක්. ජල අතිරික්තයකදී අපට එක පැත්තකින් ගංවතුර - flooding - සහ අනෙක් පැත්තෙන් නාය යෑම් - landslides - ඇති වෙනවා. මෙන්න මේ ගංවතුර සහ නාය යෑම් තමයි විශාල ව්‍යසන බවට පරිවර්තනය වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේක ටිකක් ගැඹුරින් අධ්‍යයනය කර ගත්තොත් හොඳයි. අපට ජලය ලැබීම සම්බන්ධයෙන් අපි දැඩි අවධානයක් යොමු කර ගත්තොත් හොඳයි. අපේ රටට ප්‍රධාන වශයෙන්ම වර්ෂාව ලැබෙන ආකාර 4ක් තිබෙනවා. එකක්, මාර්තු-අප්‍රේල් ඉඳලා පළමු අන්තර් මෝසමෙන් වර්ෂාව ලැබෙනවා. ඊළඟට, මැයි සිට සැප්තැම්බර් දක්වා නිරිතදිග මෝසම ලැබෙනවා. දෙවැනි අන්තර් මෝසම ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා ලැබෙනවා. ඊළඟට, ඊසානදිග මෝසම දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා ලැබෙනවා. මෙහිදී ඉතා කෙටි කාලයක් තුළ අපට වැඩිම වර්ෂාපතනයක් ලැබෙන කාලසීමාව තමයි දෙවැනි අන්තර් මෝසම. ඒ කියන්නේ, ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා කාලය. ඒක රටේ මුළු වර්ෂාපතනයෙන් මාස 2ක කාලයක්. මාස දෙකක් ඇතුළත වාර්ෂික වර්ෂාපතනයෙන්, සියයට 30ක වර්ෂාපතනයක් අපට ලැබෙනවා. මම මේ දත්ත ටික කිව්වේ 1990 ඉඳලා 2024 දක්වා වූ දත්ත විශ්ලේෂණයකින්.

මේ ගැන කථා කරද්දී අපට මිලිමීටර් 1,734ක දළ average එකක වර්ෂාපතනයක් ලැබෙනවා. මෙන්න මේ පළමු සහ දෙවැනි අන්තර් මෝසම්වලදී තමයි වැඩිම සුළි කුණාටු තත්ත්වයක්, ඒ වාගේම අඩු පීඩන තත්ත්වයක් නිර්මාණය වීමේ හැකියාව බහුලවම තිබෙන්නේ. අන්න ඒ නිසා තමයි වාර්ෂිකව ලැබෙන වර්ෂාපතනයෙන් සියයට 30ක පමණ වූ වර්ෂාපතනයක් මේ මාස දෙකක කාලය තුළ ලැබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් අපට තිබෙන ප්‍රශ්නය මොකක්ද? මෙවැනි වර්ෂාපතනයක් පිළිබඳව අපි කථා කරද්දී ගෝලීය උණුසුමක් සම්බන්ධයෙන් අවධානය යොමු නොකර බැහැ. මේ ගෝලීය උණුසුම නිසා පසුගිය වසර 30 ඇතුළත අපේ රටේත් වාෂ්පීකරණය දෙගුණ වෙලා තිබෙනවා. මෙන්න මේ හේතුව නිසා ඇති වන ජල වාෂ්ප ප්‍රමාණය හේතුවෙන් ඉතා කෙටි කාලයක් තුළ ලැබෙන වර්ෂාපතනය, ලැබිච්ච ප්‍රමාණයට වඩා දැන් දෙගුණ, තෙගුණ වෙලා තිබෙනවා. අපට ලැබී තිබෙන තොරතුරු අනුව මීට පෙර මිලිමීටර් 100ක, 200ක වර්ෂාපතනයක් ලැබුණත්, දැන් මිලිමීටර් 400, 500, 600 දක්වා වැඩිවෙලා තිබෙනවා. මේ වර්ෂාපතනය දිනක්, දින දෙකක් ඇතුළත ලැබෙන වර්ෂාපතනයක්. ඇත්තටම ගත්තොත් මේක මාස 3, 4කදී අපේ රටට ලැබෙන වර්ෂාපතනයක්. මාස 3, 4කදී ලැබෙන වර්ෂාපතනයක් දින දෙකක් ඇතුළත අපට ලැබෙනවා. මෙන්න, climate change එක. මේක ගෝලීය උණුසුමේ ප්‍රතිඵලයක්. ඒක climate change එකක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා.

අපේ රටේ සියලු designs, අපේ රටේ සියලු ඉදිකිරීම්වල ප්‍රමාණය අපි බලලා තිබෙන්නේ කොහොමද? ඒ බෝක්කුවක් වෙන්න පුළුවන්; පාලමක් වෙන්න පුළුවන්; පාරක් වෙන්න පුළුවන්. මේ සියලු දේවල් *හදන්නේ* මිලිමීටර් 100, මිලිමීටර් 150, මිලිමීටර් 200ක්වූ උපරිම වර්ෂාපතනයකට. දැනට ලැබෙන මිලිමීටර් 400, මිලිමීටර් 500, මිලිමීටර් 600 වාගේ වර්ෂාපතනයන් ඒවාට ඔරොත්තු දෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාය යෑම් සම්බන්ධයෙන් ගත්තොත්, මෙවරත් ගොඩක් වෙලාවට නායයෑම් සිදු වුණේ කණ්ඩි කඩා වැටීම නිසාය කියන එක අපි දන්නවා. විශේෂයෙන්ම ඉදිකිරීම් කටයුතු සඳහා කපනු ලැබූ කණ්ඩි අස්ථාවර වීම තමයි විශාල වශයෙන් සිද්ධ වුණේ. ඒ වාගේම අපි දන්නවා, අපේ ස්වභාවික බෑවුම් විශාල ප්‍රමාණයක් අස්ථාවර වුණු බව. මොකද, මේ සියල්ල එක පැත්තකින් අපි විසින් design කළේ; අප විසින් මාර්ගයක්, ගොඩනැඟිල්ලක් ඉදි කිරීමේ දී ඒ බෑවුම - slope එක - අපි ස්ථායීව තබා ගැනීමට අවශ්‍යකරන දත්තයන් calculate කළේ මිලිමීටර් 150, මිලිමීටර් 200 වර්ෂාපතනයන්ට අනුවයි. හැබැයි දැන් ඒවා ඊට එහා ගිහිල්ලා, අපේ ස්වභාවික බෑවුම් සහ අප විසින් නිර්මාණය කරපු බෑවුම් මෙන්න මේ වර්ෂාපතනයන්ට දැන් අස්ථාවර වෙනවා. අපිට මේ ගැන අලුතෙන් හිතා බලන්න වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොඩි අස්ථාවරවීමක් තුළ ස්වභාවික බෑවුම් විශාල ප්‍රමාණයක් නාය ගියා. හසලක සිදුවුණු නාය යෑමේ දී කිලෝමීටර 7ක් දුරට මෙන්න මේ බෑවුම දිගේ එය චලනය වීම සිදු වෙලා තිබුණා, අපි දැක්කා. ඒ වාගේම soil mechanicsවලදී, එහෙම නැත්නම් පාංශු සම්බන්ධයෙන් අධ්‍යයනයේ දී අපි දන්නවා, මෙවැනි වර්ෂාපතනයක දී ජලය ලැබීමේදී ඒක ප්ලාස්ටික් තත්ත්වයට පත් වෙනවා. ඊටත් වැඩිය ජලය ලැබීමේ දී මේක ද්‍රාවණ තත්ත්වයට පත්වෙනවා. මම හිතන විදියට මිලිමීටර් 400ක, මිලිමීටර් 500ක වාගේ වර්ෂාපතනයක් කෙටි කාලයකදී ලැබීම තුළින් මෙන්න මේ කඳුවල තිබෙන පස් ද්‍රාවණයක් බවට පත් වෙනවා, ගලාගෙන එනවා. බොහෝ කඳු අස්ථාවර වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නායයෑම් සම්බන්ධයෙන් හොඳ උදාහරණයක් මට පෙන්වන්න පුළුවන්. එහි විශාලත්වය තේරුම් ගැනීමට නායයෑම්වල දී මිය ගිය ප්‍රමාණය පෙන්වන්න පුළුවන්. 2003දී නාය යෑම්වලින් 218 දෙනෙක් මිය ගියා. 2014දී 100 දෙනෙක් මිය ගියා. මම මේ තොරතුරු ඉදිරිපත් කරන්නේ 100කට වැඩිය මිය ගිය ප්‍රමාණයන් ගැනයි. ඒ වාගේම 2016දී 151ක් මිය ගියා. 2017 දී 262ක් මිය ගියා. 2025 දී 700කට වැඩි ප්‍රමාණයක් මිය ගියා. මේකෙ ප්‍රධානම හේතුව තමයි මේ සියලු මිය යෑම්වලට හේතුව වුණේ විශාල වර්ෂාපතනයක් තිබීමයි. මිලිමීටර 400, මිලිමීටර් 500, මිලිමීටර් 600 දක්වා වූ වර්ෂාපතනයක් තිබීමයි. අපි දන්නවා, 2017 ඇතිවුණු නායයෑම් විශේෂයෙන්ම දකුණු පළාතට බලපෑ බව. ඒකෙදිත් විශාල වර්ෂාපතනයක් අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට අපි ගංවතුර - flood - තත්ත්වයන් ගත්තොත් මම නියෝජනය කරන පුත්තලම දිස්ත්‍රික්කයෙත් විශේෂයෙන්ම මාඔය, දැදුරු ඔය, මල්වතු ඔය තමයි විශාල වශයෙන් හානියට පත් වුණේ. මේ ගංගා ද්‍රෝණිවල විශාලත්වය ගත්තොත් - මා ඔය ද්‍රෝණියේ විශාලත්වය වර්ග කිලෝමීටර 1,510ක්. වර්ෂාපතනය නිසා වසරකට ගලා ගෙන යන ජල ප්‍රමාණය ගත්තොත්, ඒකට කියුබික් මීටර් මිලියන 4,100ක් වාගේ ජලය ලැබෙනවා. ඒකෙන් ඉවත් වෙලා යන ප්‍රමාණය 1700ක්, 1800ක් වාගේ ප්‍රමාණයක්. මේ, වසරකට. මෙන්න මේ වාගේ දවසකදී, එහෙම නැත්නම් දවස් දෙකකදී මුළු වසරකට ලැබෙන වර්ෂාපතනයෙන් හතරෙන් එකක් ලැබීම නිසා මොකක්ද සිද්ධ වෙන්නේ? පැයක්, දෙකක් ඇතුළත විශාල ගං වතුරක් - floods - නිර්මාණය වෙනවා. ඒක දැදුරු ඔයටත් එහෙමයි. ඒක මල්වතු ඔයටත් එහෙමයි. ඒක මහවැලි ගඟටත් එහෙමයි. ඒක කැලණි ගඟටත් එහෙමයි.

මේ ගං වතුර තත්ත්වයන් සම්බන්ධව ගත්තොත් කොත්මලේ ආශ්‍රිතවත් වැරදි මතවාදයක් ගොඩනැඟුවා. මේ වැරදි මතවාදය තමයි මේ ජලාශයේ වාන් දොරටු ක්‍රමානුකූලව ඇරියේ නැහැ කියන එක. මම විමසා බැලුවා, මේ වාන් දොරටු අරින්න කලින් වැස්ස පටන් ගන්නකොට සියයට 40ක්, 45ක් තමයි කොත්මලේ

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

ජලාශය පිරිලා තිබුණේ. මහවැලි ගඟේ විශාල වපසරියක් තිබෙනවා. මේ වර්ෂාපතනයත් සමඟ පැය කිහිපයකින්,- අපි දන්නවා වැස්ස වැහැලා සැලකිය යුතු කාලයක් යනවා ගඟට වතුර එක්කාසු වෙන්න. ඇත්තටම ගත්තොත්, පැය කිහිපයක් තුළ මේකේ වතුර වැඩි වෙන්න පටන් ගත්තා. එහි සිටින දේශපාලන අධිකාරිය මේකට කිසිදු සම්බන්ධයක් නැහැ. එහි සිටින නිලධාරින්, ඉංජිනේරුවන් තීරණය කරනවා, dam එකේ safety එක සහ reservoir එකේ safety එක සම්බන්ධයෙන් මොකක්ද කරන්නේ කියලා. ඒ වෙලාවේ ගතයුතු තීරණය අරගෙන වාන් දොරටු විවෘත කරන එක තමයි කළේ. අපේ කිසිදු මන්ත්‍රීවරයෙකු මේකට සම්බන්ධ නැහැ කියලා මම හිතනවා. දේශපාලන අධිකාරියෙන් නොවෙයි ඒක තීරණය කරන්නේ. මොකද, ඒක technical කාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පවුල් හැටියට ගත්තොත් පුත්තලම දිස්ත්‍රික්කයේ පවුල් 95,000ක් ව්‍යසනයට පත් වුණා. ජනතාව 330,000ක් මේ ව්‍යසනයට ලක් වුණා. ඇත්තටම ගත්තොත් මේකේ විශේෂත්වය තමයි, අපි මේ ව්‍යසනය ආරම්භයේ ඉඳලාම - මුල ඉඳලාම - ක්‍රියාත්මක වෙන්න පටන් ගැනීම. අපි දන්නවා, මේ ව්‍යසනය ආරම්භ වෙන්න කලින් ජනාධිපතිතුමා විසින් මේ පාර්ලිමේන්තුවේ රැස්වීමක් පැවැත්වුවා කියලා. එදිනම හවස අපි පුත්තලම ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුවත් එක්ක රැස්වීමක් පැවැත්වුවා. ඊට පහුවදා - ජලයෙන් යට වෙන්න කලින් - මම සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක නිලධාරින් මැදිහත් වෙලා අපි තීරණය කළා, එකදු පුද්ගලයෙකුවත් මේකෙන් මිය යන්න බැහැ, අපි සියලු පහසුකම් සපයන්න ඕනෑ, ගැටලුවක් ඇති නොවෙන්න ඔක්කොම rescue කිරීම සඳහා කටයුතු කරන්න ඕනෑ කියලා. අහඹු සිදුවීම් දෙකකින් පුද්ගලයන් දෙදෙනෙකු මිය ගියා. නමුත් දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආසනයක් විධියට වෙන්නප්පුව ආසනය යම් විධියකට යහපත් තත්ත්වයකට ගන්න අපට පුළුවන් වුණා කියලා මම හිතනවා. ඒ වාගේම ආහාරපාන ලබා දෙන්න අපට පුළුවන් වුණා. විශේෂයෙන්ම පොලීසිය - ASP, SSP - මැදිහත් වෙලා බෝට්ටු විශාල ප්‍රමාණයක් යොදා ගන්න පුළුවන් වුණා. Navy එක මේ සඳහා විශාල වශයෙන් මැදිහත් වුණා. ඒ මඟින් අපට යම් ප්‍රමාණයක් rescue කර ගන්න පුළුවන් වුණා. ඒ වාගේම ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. වහලවල් මත සිටින පුද්ගලයන් බේරා ගැනීම සඳහා එතුමා අපට හෙලිකොප්ටර් දෙකක් ලබා දුන්නා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Anton Jayakody, your time is up now.

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
මට තව තත්පර 30ක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

හැබැයි, ටික වෙලාවකින් එතුමා මට කිව්වා, එක හෙලිකොප්ටරයක් ඉතා හදිසි තත්ත්වයක් නිසා මාවනැල්ලට යවනවා කියලා. ඇත්තටම රාජ්‍ය සේවය ගත්තොත්, විශේෂයෙන්ම ඒ ආශ්‍රිතව තිබෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමහර නිලධාරිනියන්, ප්‍රාදේශීය ලේකම්වරියන් තමන්ගේ දරුවෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානවල තියලා දවස් දෙකක් තුනක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රැඳී සිටිමින් මේ ජනතාව වෙනුවෙන් සේවය කරන්න පටන් ගත්තා. බහුතර සේවක සංඛ්‍යාවක් මේ වෙනුවෙන් සහයෝගය ලබා දුන්නා. ඇත්තටම කියන්න කනගාටුයි, අපේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් මේවා හාස්‍යයට ලක් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have exceeded your time.

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
මම අවසන් කරන්නම්.

මම ස්තුතිවන්ත වෙනවා, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, Navy එක, Army එක, විශේෂයෙන්ම රාජ්‍ය සේවය, ඒ පැත්තේ සිටින ව්‍යාපාරිකයෝ, එහි සිටින ප්‍රජාව මේ ව්‍යසනයෙන් ගැලවීම සඳහා විශාල සහයෝගයක් ලබා දුන්නා, විශාල වශයෙන් කැප වෙලා වැඩ කළා. විශේෂයෙන්ම අපේ දේශපාලන අධිකාරිය, අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය සභාව ඇතුළු සියලුදෙනා එක්කාසු වෙලා මේ වනකොට අපේ පුත්තලම දිස්ත්‍රික්කයත්, වෙන්නප්පුව ආසනයත් සැලකිය යුතු ප්‍රමාණයකට උඩට අරගෙන තිබෙනවා. අපි වතුර බෝතල් පස්සේ ගිහිල්ලා දේශපාලනයක් කරන ව්‍යාපාරයක් නොවෙයි. ඒ අයට අවශ්‍ය පහසුකම් සලසලා මේ වනකොට හොඳ තත්ත්වයකට ළඟා වෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ සඳහා ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Namal Rajapaksa. You have ten minutes.

[පූ.භා. 11.55]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටට ව්‍යසනයක් වූ වෙලාවේ ස්වේච්ඡාවෙන් ඉස්සරහට ඇවිල්ලා ජනතාවගේ ජීවිත ආරක්ෂා කරන්න මැදිහත් වූ සියලුදෙනාට මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. අදටත් මේ පාර්ලිමේන්තුවේ අපි මුණ ගැහෙන වෙලාවේදීත් විහාරස්ථානවල, පාසල්වල කඳවුරු තිබෙනවා. විහාරස්ථානයේ නායක හාමුදුරුවෝ, පොඩි හාමුදුරුවරු, දායක සභාව, පාසලේ විදුහල්පතිවරු, කාර්ය මණ්ඩලය ජනතාව ආරක්ෂා කරන්න කටයුතු කරනවා. ඒ වාගේම තමයි රාජ්‍ය නිලධාරින්. ග්‍රාම නිලධාරිගෙන් පටන් ගත්තාම ප්‍රාදේශීය ලේකම්තුමා; ලේකම්තුමිය දක්වා, දිසාපතිවරයා දක්වා, අමාත්‍යාංශ ලේකම්වරු දක්වා මේ වනකොටත් විශාල කර්තව්‍යයක් ඉටු කරනවා. හැබැයි, ආණ්ඩු පක්ෂයේ කථා අහනකොට ඔබ මේ වර්ෂාව, නාය යාම, ගංවතුර සාමාන්‍යකරණය කිරීමට උත්සාහ කරනවා අපි දැක්කා. මිලිමීටර ගණන් ඉඳලා කියනවා. මීට පෙරත් පස් කඳුවලට යට වෙලා, ජල කඳන්වලට අහු වෙලා ජීවිත නැති වෙලා තිබෙනවා, ඒ නිසා මේක එතරම් ප්‍රශ්නයක් නැහැ කියන තැනට අද මතයක් හදන්න උත්සාහ කරනවා. ඒක සාධාරණ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අහිංසක මිනිසුන්ගේ ජීවිත නැතිවෙලා තිබෙනවා. කුඩා දරුවන් පවා පස් කඳුවලට යටවෙලා තිබෙනවා. ඒකට වගකිව යුතු පුද්ගලයෝ කවුද කියලා හොයන්න ඕනෑ. ඔබතුමන්ලා පූර්ණ නිගමනයකට ඇවිල්ලා ඉවරයි, ඒ සඳහා වගකියන්න ඕනෑ නිලධාරින් කියලා. නිලධාරින් ක්‍රියාත්මක වුණේ නැහැ කියලා තමයි ඔබතුමන්ලා සම්පූර්ණයෙන්ම කථා කරන්නේ. මහජන ඡන්දයෙන් පත් වුණේ නිලධාරින් නොවෙයිනේ? රටේ ජනාධිපතිවරයා යටතේ තිබෙන අමාත්‍යාංශයකට තමයි මේ කටයුතු අයිති වන්නේ. මේ, විධායක ජනාධිපතිවරයා යටතේ තිබෙන විෂයයක්. හැබැයි, මේ චෝදනාව නිලධාරින්ගේ ඇඟේ ගහලා ඔබතුමන්ලාගේ ඇඟ බේරාගන්න හදන්න එපා.

මේ සම්බන්ධයෙන් හොයන්න Select Committee එකක් පත් කරන්න කියලා ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා මීට ටික වේලාවකට කලින් ගිහිල්ලා විපක්ෂ නායකතුමා ඇතුළු මන්ත්‍රීවරුන් ගණනාවක් අත්සන් කරපු යෝජනාවක් කථානායකතුමාට භාර දුන්නා. අපි හොයමු, මේකට වගකියන්න ඕනෑ කවුද, වගකීම් පැහැර හැරියේ කවුද කියලා. ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුව පත්වෙලා මේ වනකොට අවුරුද්දකුත් මාස දෙක තුනක් ගිහිල්ලා තිබෙනවා. ඒ කාල සීමාව ඇතුළත ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව කැඳෙව්වාද? මීට පෙරත් ගංවතුරක් ආවා. නමුත් මේකට සූදානම් වුණාද? කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරින් කියපු කාරණා ඔබ පිළිගත්තාද? මේවා හොයන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට කලිනුත් මිලිමීටර් 400ට වඩා වැස්සා, මීට කලිනුත් මිලිමීටර් 500ට වඩා වැස්සාම නාය ගියා, සියදෙනෙකුට වඩා මැරිලා තිබෙනවා, ඒ අතින් මේ සැරේ හොඳයි කියලා මෙතැනට ඇවිල්ලා කියනවා. ඔබතුමන්ලා ඒ කථා කියන්න නම් ලැහැස්ති වන්න එපා. මේක ඔබට විහිළුවක්. *[බාධා කිරීමක්]* හික්, හික් ගගා ඉන්න. මැරුණු අහිංසක මිනිස්සුන්ගේ පවුල්වල අයට තමයි වේදනාව තිබෙන්නේ. ඔබතුමන්ලාට මේක විහිළුවක්. අපි දැක්කානේ, ඔබතුමන්ලාගේ විහිළු. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා කරුණාකරලා දැන්වත් විහිළු නොකර අහගන්න. *[බාධා කිරීමක්]* අපෙන් අහගන්නත් එපා. මිනිස්සු පස් කඳුවලට යටවෙනකල් බලාගෙන ඉඳලා, ඔබතුමන්ලා දැන් මෙතැනට ඇවිල්ලා විහිළු කරන්න ලැහැස්ති වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයට චෝදනා කරලා මේ ප්‍රශ්නයත් බේරාගන්න පුළුවන් කියලා හිතනවා නම්, ඒක වැරදීමක්. පාසල් ඇතුළු කඳවුරුවල අදටත් මිනිස්සු ඉන්නවා. ඒ මිනිස්සුන්ට ගෙවල් දෙනවා කියලා ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී කිව්වා. රුපියල් ලක්ෂ 50ක් දෙනවා, ලක්ෂ 100ක් දෙනවා කිව්වා. ටකරමක් ගිහිල්ලා තිබුණත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කිව්වා. ඔබතුමන්ලා අද වෙනකල් ප්‍රාදේශීය ලේකම්වරුන්ට දැනුම් දීලා තිබෙනවාද, කොහොමද ඒක ක්‍රියාත්මක කරන්නේ කියලා, කොහොමද ඒ ආධාර දෙන්නේ කියලා, කොහොමද ඒ ජීවිත ගොඩනඟන්නේ කියලා? හැබැයි, ඔබතුමන්ලාට හිත රිදෙන දෙයක් කිව්වාම, ඒ ගැන හොයන්න පොලීසියෙන් යවනවා. ජනාධිපතිතුමාගේ හෝ ඇමතිවරයෙකුගේ හිත රිදුණොත්, පොලීසිය, CID එක, ඒ ඔක්කෝම යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අහිංසක මිනිස්සුන්ගේ ජීවිත නැතිවෙලා තිබෙනවා. හැබැයි, තවමත් කඳවුරුවල ජීවත් වන මිනිස්සුන්ගේ හිත් හදන්න යන්න කාටවත් බැරිවෙලා තිබෙනවා. ඒවාට යන්න පොලීසි නැහැ. ඒවාට ආණ්ඩුත් නැහැ. ඒවාට පළි නිලධාරින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොත්මලේ රම්බොඩ ගම්මානයේ නාය යෑමක් සිද්ධ වුණා. NBRO එකෙන් ගිහිල්ලා ලියුම දුන්නේ මොකක් කියලාද? බිත්ති පැළුණු ගෙවල් තිබෙන අයට කිව්වා, ගෙවල්වලට යන්න, මිලිමීටර් 50ට වැඩියෙන් වැස්සොත් පොඩ්ඩක් අවධානයෙන් ඉන්න, මිලිමීටර් 100ට වැඩියෙන් වැස්සොත් පරිස්සම් වෙන්න, මිලිමීටර් 150ට වැඩියෙන් වැස්සොත් එතැනින් යන්න කියලා. NBRO එක මිනිස්සුන්ට එහෙම කියනවා. ඒකද, අනතුරු ඇඟවීම? නිලධාරින්ගේ පුරප්පාඩු තිබෙනවා නම්, ඒ පුරප්පාඩු පියවන්න ආණ්ඩුව කටයුතු කරන්න ඕනෑ. නිලධාරින් නැහැ කියමින් මිනිස්සු හැමදාම කඳවුරුවල තියන්න ලැහැස්ති වෙන්න එපා.

නුවරඑළිය, නානුඔය Dessford Estate එකේ සේවකයින්ට ප්‍රශ්නයක් තිබෙනවා. මේ ප්‍රශ්න සම්බන්ධව හාම්පුත්තු එක්ක සාකච්ඡා කරන්න වෙනවා. මොකද දැන් බහුතරයක් තරුණ පරම්පරාව වතුවල වැඩ කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, හාම්පුත්තු එක්ක තිබෙන ගිවිසුමට අනුව වත්තේ වැඩ කළේ නැත්නම් සහන ලැබෙන්නේ නැහැ. ඒ මිනිසුන්ගේ ගෙවල් දැන් අනාරක්ෂිතයි නම්, ඒ වෙනුවෙන් සාකච්ඡා කරන්න ආණ්ඩුව මැදිහත් වෙනවාද, මැදිහත් වෙලා තිබෙනවාද? මම මේ කිව්වේ එක වත්තක් ගැන විතරයි. කොටගල Lochiel Estate එක ගත්තත් ඒ හැම තැනම මේ ප්‍රශ්නය තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ වන විට යටිතල පහසුකම් ලබා දීම පිළිබඳව ලොකු අභියෝගයක් තිබෙනවා. ඒක අපි දන්නවා. ඒවා හදන්න කාලයක් යන්න පුළුවන්. හැබැයි, තාවකාලිකව ලබා දෙන විසඳුම මොකක්ද? ඔබතුමන්ලාගෙන් ඇහුවාම කියනවා, පාරවල් ටික හැදුවා, දැන් හරි කියලා. ඔව්, පස් ටික දෙපැත්තට කරලා තිබෙනවා, අපි ඒකට චෝදනා කරන්නේ නැහැ. උඩුනුවර ගමේ ජනතාව එකතුවෙලා, පන්සලේ හාමුදුරුවෝත් එකතුවෙලා වුලාහය මහා විද්‍යාලයට යන පාර බොහොම අමාරුවෙන් හදාගත්තා. ඊයේ ඇති වුණු වැස්සෙන් එම ස්ථානය නැවත කඩාගෙන ගිහිල්ලා තිබෙනවා. වැස්සට බැණලා ඒකෙනුත් ඇඟ බේරාගන්න පුළුවන්.

මේ ජනතාව නැවත පදිංචි කරන්න ඔබතුමන්ලාට තිබෙන සැලැස්ම මොකක්ද? පසුගිය ආණ්ඩුවලට, වැස්සට, නාය යෑමට බණින්න එපා. ඔබතුමන්ලාගේ පොළොන්නරුවේ රාජ්‍ය නායකයාත් ඉන්න නිසා මම මේකත් කියනවා. සමහර ප්‍රදේශවල වේල්ල - dam එක- කඩාගෙන ගියා. ඔබතුමන්ලා ඒකට ගන්න පියවර මොකක්ද?

ගොවිතැන ගනිමු කෝ. ඔබතුමන්ලාගේ ප්‍රදේශවල හැමතැනම ගොවි ගම්මාන පිටින් විනාශ වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා මේවාට විසඳුම් කියනවා. හැබැයි, ඔබතුමන්ලා ඒවා කියන්නේ කටින් විතරයි නේ. ඔබතුමා රාජ්‍ය නායකයා හින්දා මට ඒවා පිළිගන්නත් වෙයි. හැබැයි දැන්වත් අවංක වෙන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අධිකරණ ඇමතිතුමා පෙනෙනවා නේ. ඔහොම හැරිලා බණින්න ඕනෑ නැහැ නේ, ඔබතුමා ඇත්ත කිව්වා නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාවගේ ගොවි බිම් විනාශ වෙලා තිබෙනවා. ඉතිරි වුණු අස්වැන්නවත් විකුණා ගන්න විධියක් නැති තැනකට ඔවුන් පත්ව තිබෙනවා. ඔබතුමන්ලා වන්දි දෙන්න කථා කරනවා. ඇහුවාම කියනවා, සල්ලි දුන්නා කියලා. හැබැයි, මිනිස්සුන්ගේ අතට සල්ලි ලැබිලා තිබෙනවාද? සමහර අයට රුපියල් 25,000 ලැබිලා තිබෙනවා. කොළොන්නාව ආසනයේ සමහරුන්ට හම්බ වෙලා තිබෙනවා, සමහරුන්ට හම්බ වෙලා නැහැ. 9,000කට පමණයි තවම හම්බ වුණේ. ඉතිරි අයට හම්බ වෙලා නැහැ. කොටසකට ලැබිලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමාත් කොළඹ දිස්ත්‍රික්කයේ. එතුමාත් ඒ ගැන දන්නවා. හැබැයි, ගම්වලට යනකොට තත්ත්වය මොකක්ද?

නිවාස ප්‍රශ්නයට ඔබතුමන්ලාගේ විසඳුම මොකක්ද? ජනාධිපතිතුමා කිව්වා, නිවසක් හදාගන්න රුපියල් ලක්ෂ 50ක්

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

දෙනවා කියලා. ඒ රුපියල් ලක්ෂ 50 දෙන්නේ කවදාද? නිවස හා ඉඩම සම්පූර්ණයෙන් විනාශ වුණොත් රුපියල් ලක්ෂ 100ක් දෙනවා කිව්වා. ඒ රුපියල් ලක්ෂ 100 දෙන්නේ කවදාද, ඉඩමටයි, නිවසටයි. දැන් මාසයකටත් ළඟයි. ඔබතුමන්ලා ළඟ රුපියල් ට්‍රිලියනයක මුදලක් තිබෙනවා නම්, මුදල් දෙන්න බැරි කමක් නැහැනේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසානයේ මොකක්ද වෙන්නේ? ජනාධිපතිතුමා මෙතැන - පාර්ලිමේන්තුවේ- ඇවිල්ලා කියනවා. හැබැයි, නිලධාරින්ට ඒවා ලිඛිතව යන්නේ නැහැ. ග්‍රාම නිලධාරිට ඒ බලය ලැබෙන්නේ නැහැ. මිනිස්සු වට කර ගන්නේ ග්‍රාම නිලධාරි. මිනිස්සු ගිහිල්ලා මුදල් ඉල්ලන්නේ ප්‍රාදේශීය ලේකම්ගෙන්. ඒ අය දන්නේ නැහැ නේ, ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ කියන ඔක්කෝම බොරු කියලා. මොකද ජනාධිපතිතුමාම කිව්වා නේ, බොරු කියන්න ඕනෑ නම් පාර්ලිමේන්තුවේදී කියන්න කියලා. ඒ නිසා තමයි දිස්ත්‍රික් කමිටුවට ගිහිල්ලා එක කථාවකුයි, පාර්ලිමේන්තුවේ තව කථාවකුයි කිව්වේ. ඒ නිසා තමයි තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවේ එකක් කියලා, එළියේ තව එකක් කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල්වල, පන්සල්වල ඉන්න ජනතාව නිවාසවලට යැවීම සම්බන්ධව ඔබතුමන්ලාට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? NBRO එකෙන් වාර්තා දෙනවාද? එහෙම වාර්තා දෙනකොට ඔබතුමන්ලා ආණ්ඩුවක් විධියට ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? ආණ්ඩුවක් විධියට මේ සම්බන්ධව ගන්න විසඳුම මොකක්ද? පාසල් යන දරුවාට නිල ඇඳුම් ගන්න රුපියල් 15,000ක් දෙනවා කිව්වා. රුපියල් 25,000ක් දෙනවා කියලා පටන් ගත්තේ. රුපියල් 25,000ක් හරි, රුපියල් 15,000ක් හරි කියමු කෝ. ඒක දෙන්නේ කවදාද? අග්‍රාමාත්‍යවරිය ඉස්කෝල පටන් ගන්න කියලා නියෝග කරලා තිබෙනවා. දැන් ළමයින්ට නිල ඇඳුම් නැහැ, පාසල් උපකරණවලත් හිඟයක් තිබෙනවා. අපේ අය පුළුවන් විධියට ඒවා එකතු කරලා දෙනවා. ඒක නොවෙයි නේ, වෙන්න ඕනෑ. ආණ්ඩුවෙන් යම් පොරොන්දුවක් වුණා නම් ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න ඕනෑ.

මේ ආණ්ඩුවේ සමහර ඇමතිවරුන් ඉන්නවා, පස බලලා මේක තළලා හදන්න පුළුවන් කියලා කියන්න පුළුවන් අය. එහෙම කියන්න ගමේ හැමෝටම බැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ආණ්ඩුවේ ඇමතිවරුන් සමහර තැන්වලට යැව්වාම ඒ අය එතැන බලලා මෙතැනට පස් දාලා තළන්න ඕනෑ, මෙතැනට බෝක්කුව ගහන්න ඕනෑ, මෙතැනට මුක්කු ගහන්න ඕනෑ, chemical ගහන්න ඕනෑ කියලා කියනවා. මොකද, එහෙම කියන්න පුළුවන් විද්‍යාත්මක දැනුමක් තිබෙන අය අද ආණ්ඩුවේ ඉන්නවා. හැබැයි, අපට එහෙම දැනුමක් නැහැ. අපි ඒක NBRO නිලධාරින්ගෙන්, ඉංජිනේරුවන්ගෙන් තමයි අහන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. *[බාධා කිරීම්]* ඒ පැත්ත බලලා හිනා වෙන්න එපා, හොඳ නැහැ. අපි එහෙම තමයි අහන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට දෙන විසඳුම මොකක්ද? එම නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ, ඔබතුමන්ලාගේයි, අපේයි තිබෙන දේශපාලන ප්‍රශ්න පස්සේ බේරාගන්න කියලා; ඒවා පස්සේ බේරාගනිමු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Namal Rajapaksa, your time is up.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, මේ වෙලාවේ අවතැන් කඳවුරුවල ඉන්න ජනතාව ගෙවල්වලට යවන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. ගොවි බිම්වලට හානි වුණු ගොවියාට ඔබතුමන්ලා දෙන සාධාරණය, ඔබතුමන්ලා දෙන උපකාරය, ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ මොකක්ද කියලා කියන්න. අක්කරයට ඉල්ලපු රුපියල් ලක්ෂය දෙනවාද, නැද්ද කියන කාරණය පිළිබඳව කියන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවසක ටකරමක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කියපු අය ඒ රුපියල් ලක්ෂ 10 දෙනවාද, ඉඩමක් ගන්න රුපියල් ලක්ෂ 50ක් දෙනවාද, ඉඩමක් අරගෙන සම්පූර්ණ ගෙයක් හදන්න රුපියල් ලක්ෂ 100ක් දෙනවාද, පාසල් යන දරුවාට රුපියල් 25,000 දෙනවාද, නිවාස කුලිය වශයෙන් රුපියල් 25,000 දෙනවාද කියන කාරණා පිළිබඳව තීන්දුවක් අරගෙන කටයුතු කරන්න.

අවසාන වශයෙන් මම ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. ගරු කථානායකතුමාටත් මේ පිළිබඳව දැනුම් දෙන්න. මේ සම්බන්ධව හොයන්න විශේෂ කාරක සභාවක් - Select Committee එකක් - පත් කරන්න. හැබැයි, ඒ කාරක සභාව පත් කිරීමේදී ආපදාවට ලක් වුණු ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ප්‍රමුඛතාව දෙන්න. කන්ටේනර් ප්‍රශ්නයේදී වාගේ ආණ්ඩුවෙන් අටයි, මෙහෙන් හතරයි දාලා, ආණ්ඩුවෙන් සභාපතිකමට පත් කරලා, හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ කරන්නේ නැතුව ගම්පොල, නුවරඑළිය, කොත්මලේ, කෑගල්ල, මාතලේ, අනුරාධපුරය, පොළොන්නරුව, නැඟෙනහිර පළාතේ මූතූර්, අම්පාර වාගේ ඇත්තටම ආපදාවට ලක් වෙච්ච ප්‍රදේශවල මන්ත්‍රීවරු මේ කමිටුවට පත් කරගෙන මේ ප්‍රශ්නය මෙතරම් ඔඩුදුවන්න හේතු වුණු සාධක පිළිබඳව අවංකව, සද්භාවයෙන් හොයන්න කියන ඉල්ලීමත් මම කරනවා.

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පිළිබඳව සහ පොළොන්නරුව දිස්ත්‍රික්කය පිළිබඳව නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා. ඒ නිසා මම විනාඩියක පොඩි පැහැදිලි කිරීමක් කරනවා. අපට ඊයේ වෙනකොට හෙක්ටෙයාර හාරදහස් ගණනක් පිළිබඳව වාර්තා වෙලා තිබෙනවා. රුපියල් ලක්ෂ 3,610ක් ඊයේ වෙනකොට දාලා තිබෙනවා. ඉතුරු මුදල් ටික වාර්තා ආවාම දමනවා. හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂ එකහමාර ගණනේ දමලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Rajeevan Jeyachandramoorthy. You have nine minutes.

[பி.ப. 12.08]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற சீரற்ற காலநிலை காரணமாக ஏற்பட்ட பேரழிவுக்குப் பின்னரான நாட்டின் தற்போதைய நிலைமை தொடர்பான சபை ஒத்திவைப்புப் பிரேரணைமீதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மகிழ்ச்சி யடைகின்றேன். இந்த நாட்டில் 'தித்வா' புயலால் பாரிய பாதிப்புகள் ஏற்பட்டு, மக்கள் இன்னோரன்ன துன்பங்களை அனுபவித்து இருக்கிறார்கள். நாட்டில் சுனாமியால் ஏற்பட்ட பாதிப்பைவிட இந்த 'தித்வா' புயலால் ஏற்பட்ட பாதிப்பு 3 மடங்கு அதிகமெனக் கூறப்படுகின்றது. *[இடையீடு]* Hon. Deputy Speaker, I cannot speak amidst this noise. Please give me more time. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you may continue.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

இந்த 'தித்வா' புயலால் நாடு பூராவும் மக்கள் பல்வேறு விதங்களில் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். அவர்கள் நேரடி யாகவும் பாதிக்கப்பட்டு இருக்கிறார்கள்; மறைமுகமாகவும் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். 25 மாவட்டங்களிலும் அவற்றின் புவியியல் காரணிகளை அடிப்படையாகக்கொண்டு வெவ்வேறு பாதிப்புகள் ஏற்பட்டுள்ளன. உதாரணத்துக்கு, மலையகத்தில் மண்சரிவால் பாதிப்பு ஏற்பட்டிருக்கிறது என்றால், வடக்கு மாகாணத்தில் வெள்ளத்தால் பாதிப்பு ஏற்பட்டிருக்கிறது. நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற வடக்கு மாகாணத்தில் வெள்ளத்தால் பாரிய பாதிப்புகள் ஏற்பட்டுள்ளன. அதிலும் குறிப்பாக, முல்லைத்தீவு, மன்னார் மாவட்டங்களில் பாரிய பாதிப்புகள் ஏற்பட்டுள்ளன. அதேபோல், கிளிநொச்சி, யாழ்ப்பாண மாவட்டங்களிலும் பாதிப்புகள் ஏற்பட்டுள்ளன. இம்மாவட்டங்களில் பல வீடுகள் வெள்ளத்தில் மூழ்கியுள்ளன.

இந்தச் சூழலில் அரசாங்கம் எடுத்துவரும் நடவடிக்கைகள் சம்பந்தமாக மக்களுக்குத் தெளிவுபடுத்தவேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது. நாங்கள் பொறுப்புவாய்ந்த அரசாங்கம் என்ற வகையில், நாட்டில் என்றுமில்லாதவாறு ஏற்பட்டிருக்கின்ற இந்த அனர்த்தத்தை முகாமைத்துவம் செய்வதிலும் மக்களுக்குச் சரியான முறையில் தீர்வைப் பெற்றுக்கொடுப்பதிலும் காத்திரமான பங்கு வகிக்கின்றோம். யாழ்ப்பாணம், கிளிநொச்சி மாவட்டங்களில் அனர்த்தம் ஏற்பட்ட சகல இடங்களையும் நாங்கள் சென்று பார்த்தோம். உண்மையிலேயே அந்தப் பிரதேசங்களில் இன்றும் வெள்ள நீர் தேங்கி நிற்கின்றது; பலருடைய வீடுகள் வெள்ளத்தில் மூழ்கிக் கிடக்கின்றன. இவை தொடர்பில் அரசாங்கம் உரிய நடவடிக்கைகளை எடுத்து வருகின்றது. எங்களோடு அரசாங்க அதிபர்கள், பிரதேச செயலாளர்கள், சமுர்த்தி உத்தியோகத்தர்கள், கிராம சேவையாளர்கள் என அனைவரும் ஒத்துழைத்து வேலை செய்கிறார்கள். நாங்கள் யாரையும் குற்றஞ்சாட்டவில்லை. சனாதிபதி என்றாலும் சரி, பிரதமர் என்றாலும் சரி, பாராளுமன்ற உறுப்பினர்கள் என்றாலும் சரி, அரசாங்கக் கட்சியினர் என்றாலும் சரி, நாங்கள் கண்காணிப்பு நடவடிக்கைகளில் ஈடுபடும்போது ஆங்காங்கே சில குறைபாடுகளைக் கண்டால் அதைச் சொல்லி நிவர்த்திசெய்ய வேண்டிய தேவையிருக்கின்றது. அந்த வகையில், நாங்கள் அவர்களைப் பாதிக்கப்பட்ட எல்லா இடங்களுக்கும் அழைத்துச் சென்று நிலைமைகளைக் காட்டியிருக்கிறோம். அதை அவர்களும் புரிந்துகொண்டார்கள். அந்த வகையில், மக்களுக்கு நிவாரணங்களைச் சரியாகப் பெற்றுக் கொடுப்பதற்குரிய பல வேலைத்திட்டங்களை நாங்கள் செய்து வருகின்றோம்.

இந்தப் பேரிடரிலிருந்து இலங்கையை உடனடியாக மீட்பதற்காக எங்களுடன் சேர்ந்து அரச அதிகாரிகள் மட்டு மல்லாது, முப்படையினர், பொலிஸார், மதத் தலைவர்கள், சமூக அமைப்புகளைச் சார்ந்தவர்கள் என எல்லோரும் களத்தில் நின்றார்கள். அவர்கள் அனைவருக்கும் அரசாங்கத்தின் சார்பில் எங்களுடைய நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றோம். ஏனென்றால், அவர்களால்தான் இந்த நாட்டு மக்கள் விரைவாக மீண்டெழக்கூடியதாக இருந்தது. தற்போதும் புள்ளிவிபரங்கள் எடுக்கப்பட்டு வருகின்றன.

யாழ்ப்பாணம், கிளிநொச்சி மாவட்டங்களில் காணப்படு கின்ற அடிப்படைப் பிரச்சினை என்னவென்றால், வெள்ள நீர் கடலுக்குச் செல்லமுடியாத நிலை காணப்படுவதுதான். கிளிநொச்சி மாவட்டத்தில் இரணைமடுக் குளம், கல்மடுக்குளம், கனகாம்பிகைக் குளம், புழுதிக்குளம், விசுவமடுக்குளம், பிரபந்தானைக்குளம் ஊடாக நிரம்புகின்ற நீர் கண்டாவளை, கரைச்சிப் பகுதிக்கூடாகவே கடலைச் சென்றடைகின்றது. அங்குள்ள கால்வாய்கள், மதகுகள், சிறு பாலங்கள் என்பன நீண்ட காலமாகப் புனரமைக்கப்படாததன் காரணமாக அந்தப் பிரதேசங்களிலுள்ள மக்கள் வெள்ளத்தால் கூடுதலாகப் பாதிக்கப்படுகிறார்கள். நான் நினைக்கின்றேன், அங்குள்ள கால்வாய்கள் 100 கிலோமீற்றர் நீளமுடையதாக இருக்குமென்று. நேற்றையதினம் நான் DCC கூட்டத்தில் இது சம்பந்தமாகக் கலந்துரையடினேன். 200 மில்லியன் ரூபாய் கிளிநொச்சி மாவட்டத்துக்கு ஒதுக்கப்படுமாகவிருந்தால், இந்தக் கால்வாய்களைத் துப்புரவுசெய்து, அதனூடாக 90 சதவீதமான பாதிப்புகளைக் குறைக்க முடியுமென நான் நினைக்கின்றேன். இதற்கான நிதியை ஒதுக்கி, குறித்த வேலைத்திட்டத்தை மேற்கொண்டால் அந்த மாவட்டத்தில் வெள்ளப் பாதிப்புகள், மக்கள் இடம்பெயர்தல், கால்நடைகள் மற்றும் பயிர்களின் அழிவுகள் என்பவற்றை எதிர்காலத்தில் குறைக்க முடியும். எனவே, நான் இதனை இந்த இடத்தில் ஒரு கோரிக்கையாக முன்வைக்கின்றேன். ஏனென்றால், இது ஓர் உடனடித் தீர்வாகவும் நீண்ட காலத் தீர்வாகவும் அமையும்.

சிறு மழை பெய்தால்கூட, யாழ்ப்பாணத்தின் பொம்மைவெளி, கோப்பாய் பகுதியின் வாதராவத்தை, கரவெட்டிப் பிரதேசத்தின் இராஜகிராமம், குடவத்தை போன்ற பகுதிகள் நீரிலே மூழ்கின்றன. இராஜகிராமம் என்பது உண்மையிலேயே பாதிக்கப்பட்ட ஒரு பிரதேசம்! அந்தப் பிரதேசத்தில் வெள்ளநீர் வெளியேறிச் செல்கின்ற பாதைகள் நீண்ட காலமாக துப்புரவு செய்யப்படாமல் இருக்கின்றது. மேற்குறித்த நிதி ஒதுக்கீட்டுடன் சேர்த்து, இதற்கான நிதி ஒதுக்கீட்டையும் செய்தால், அங்கு ஏற்படுகின்ற வெள்ள நிலைமையைக் குறைக்க முடியுமென நம்புகின்றேன்.

'பிரஜாசக்தி' வேலைத்திட்டம் என்பது, எங்களுடைய அரசாங்கத்தால் முன்னெடுக்கப்படுகின்ற ஒரு வேலைத் திட்டமாகும். இதை யாரும் விமர்சிக்க முடியாது. இப்பொழுது பலர், "எரிகிற வீட்டில் பிடுங்கினது இலாபம் போல" நாட்டில் ஏற்பட்டிருக்கின்ற அழிவுகளை வைத்து, மீண்டும் பழைய நிலைக்குச் செல்ல முடியும், ஆட்சியைக் கவிழ்க்க முடியுமென

[ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා]

நினைத்துக்கொண்டு இருக்கிறார்கள். இவற்றைச் செய்வதற் குரிய நேரம் இதுவல்ல. இது அரசாங்கத்தோடு இணைந்து மக்களுக்காகச் செய்கின்ற ஒரு வேலைத்திட்டமாகும். எனவே, அரசாங்கத்தோடு இணைந்து செயற்பட வேண்டுமென நான் இந்த இடத்தில் எல்லோரையும் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

ஓர் உயிரிழப்பு என்றாலும், அது பெரியதோர் இழப்புத்தான். அதேபோல்தான் சொத்தழிவும் கால்நடை இழப்பும். அவற்றை இழந்தவர்களுக்குத்தான் அதன் வலியும் வேதனையும் தெரியும். அது ஆடாக இருந்தாலும் சரி, மாடாக இருந்தாலும் சரி, நெல் வயலாக இருந்தாலும் சரியே! இவற்றுக்குப் பாதிப்பு ஏற்படும்போது நாங்கள் எல்லோரும் ஒன்றிணைந்து பணியாற்ற வேண்டும். அண்மையில் நான் யாழ்ப்பாணத்துக்குச் சென்றபோது, சிலர் தமக்குக் கதிரை ஒதுக்கப்படவில்லை என்று சொல்லி DCC கூட்டத்திலிருந்து வெளிநடப்புச் செய்ததைப் பார்த்தேன். நாங்கள் கதிரைக்குச் சண்டை பிடிக்க வந்தோமா அல்லது மக்களுக்குச் சேவையாற்ற வந்தோமா என்பதைப் பார்க்க வேண்டும். உண்மையிலேயே நாங்கள் மக்களுக்குச் சேவை செய்தால்தான் அவர்கள் எங்களை வாழ்த்துவார்கள்; போற்றுவார்கள். குறுகிய அரசியல் இலாபம் கருதி அரசாங்கத்தால் முன்னெடுக்கப்படுகின்ற வேலைத்திட்டங்களை இல்லாமற்செய்ய முனைவதை அல்லது, அதை வேறு வழியில் divert பண்ண முற்படுவதை நாங்கள் ஒருபோதும் ஏற்றுக்கொள்ள மாட்டோம்.

'பிரஜாசக்தி' வேலைத்திட்டம் என்பது அரசாங்கத்தால் சரியான முறையில் முன்னெடுக்கப்படுகின்ற ஒரு வேலைத் திட்டமாகும். அந்த வேலைத்திட்டத்தின் ஊடாக வறுமையால் வாடும் மக்களைச் சரியான முறையில் இனங்கண்டு, சமூகத்தில் காணப்படும் வறுமையை ஒழிப்பதற்காக நாங்கள் அரசாங் கத்தோடு சேர்ந்து பாடுபட்டுக்கொண்டு இருக்கின்றோம். இந்த வேலைத்திட்டம் சரியாக நடைமுறைப்படுத்தப்பட்டால், நாட்டில் வறுமை இல்லாது ஒழிக்கப்படும். அன்புக்குரிய மக்களே! இந்தப் 'பிரஜாசக்தி' வேலைத்திட்டத்தை முழுமையாக நடைமுறைப்படுத்துவதற்கு நீங்கள் ஒத்துழைக்க வேண்டும். இந்த 'பிரஜாசக்தி' வேலைத்திட்டத்தினூடாக சமூகத்தில் நீண்ட காலமாகத் தீர்வு காணப்படாமல் இருக்கின்ற விடயங்களுக்குத் தீர்வு காணப்பட வேண்டும். இது அரசாங்கத்தின் ஒரு வேலைத்திட்டம்! இதை யாரும் தங்களுடைய சுயநலத்துக்காக கண்டபடி விமர்சிக்க முடியாது என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்கின்றேன். நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற யாழ்ப்பாண மாவட்ட மக்களுக்கு இன்னும் தேவைகள் இருக்கின்றன. அங்கு வெள்ளத்தால் பாதிக்கப்பட்டவர்கள் நிறையப் பேர் இருக்கிறார்கள்.

வடமராட்சிக் கிழக்கில் கொட்டில் வீடுகளில் வசிக்கின்ற மக்கள் இருக்கிறார்கள். அவர்களை நாங்கள் வளப்படுத்த வேண்டும். அவர்களுக்குக் காணி என்பது பாரிய பிரச்சினை யாக இருக்கின்றது. அங்கு அரைவாசிக்கும் மேற்பட்ட காணிகள் வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்தின் கட்டுப்பாட்டின் கீழே இருக்கின்றது. அவர்களுக்கான காணிகளைப் பெற்றுக்கொடுத்து, அதில் வீடுகளைக் கட்டிக் கொடுத்து, அவர்களை நிரந்தரமாகக் குடியேற்ற வேண்டும். எங்களுடைய பிரதேசங்களில் வெள்ள அனர்த்தம் இனியும் ஏற்படாதவாறு கால்வாய்கள் அமைக்கப்பட வேண்டும். கடந்த காலங்களில் வீதிகளுக்குக் குறுக்காக இருந்த 'போக்கு'கள், மதகுகளை அகற்றிவிட்டு roadஐ மட்டும் போட்டிருக்கிறார்கள்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Give me one more minute, Sir.

வீதிகளுக்கு குறுக்காகக் காணப்படுகின்ற பாலங்கள், மதகுகள் ஊடாக வெள்ளநீர் கடலை நோக்கிச் செல்லக்கூடிய வகையிலான திட்டங்களை மேற்கொள்ள வேண்டும். அதற்காகத்தான் நாங்கள் - அரசாங்கம் - பாடுபடுகின்றோம். மக்களுக்குத் தெரியும், நாங்கள் என்ன வேலை செய்கிறோம் என்று. எம்முடன் சேர்ந்து மக்களும் இந்த நாட்டைக் கட்டியெழுப்ப முன்வர வேண்டுமெனக் கேட்டு விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. S.M. Marikkar. You have nine minutes.

[අ.භා. 12.17]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ පරිපූරක ඇස්තමේන්තුවෙන් රුපියල් බිලියන 250ක් වෙන් කරලා තිබෙනවා, මාර්ග, පාලම්, දුම්රිය මාර්ග, වාරිමාර්ග පහසුකම්, රෝහල්, පාසල් ඇතුළු හානියට පත් යටිතල පහසුකම්වලට කියලා. පසුගිය 11වැනි දා අපි යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සොයාගත්තා, RDA එකට විතරක් රුපියල් බිලියන 190ක් ඕනෑ බව. පාලම්, දුම්රිය මාර්ග, වාරිමාර්ග ඇතුළු ඔක්කෝටම රුපියල් බිලියන 250යි දාලා තිබෙන්නේ. RDA එකට අයිති පාරවල්වලට විතරක් රුපියල් බිලියන 190ක් අවශ්‍ය වෙනවා. තවම පළාත්බද මාර්ග, පළාත් පාලන ආයතනවලට අයිති මාර්ග ගැන තක්සේරුවක් කරලා ඉවර කරලාත් නැහැ. එතකොට, RDA එකට අයිති පාරවල්වල හානිය බැලුවොත් කිලෝමීටර 12,000යි. කිලෝමීටර 90,000ක් තිබෙනවා පළාත්බද මාර්ග සහ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග. ඒ නිසා මේ මුදල ප්‍රමාණවත්ද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. මේකත් නිකම් අර නත්තල් පප්පා වාගේ කථාවක්ද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා.

ඊළඟට, විදුලිබල මණ්ඩලයට විතරක් රුපියල් බිලියන 20ක් පාඩුයි. විදුලිබල මණ්ඩලයට මේකෙන් සල්ලි දෙනවාද කියලා මම දන්නේ නැහැ. හැබැයි, අපි දන්න තරමට විදුලිබල මණ්ඩලය ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක් ණය ගන්න හදනවා. ඒ ණය ගත්තාම විදුලි බිල වැඩි කරනවා කියලා ඔවුන් පැහැදිලිවම කියනවා. එතකොට, මේකද වෙන්න ඕනෑ?

ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට රුපියල් බිලියන 6ක් පාඩුයි. කෝ, ඒකට අවශ්‍ය කාරණා විස්තරාත්මකව තිබෙනවාද? නිල නොවන වශයෙන් අපට ආරංචි විධියට මේ ව්‍යසනයේදී යටිතල පහසුකම්වලට සිදු වූ හානියේ පාඩුව විතරක් රුපියල් බිලියන 900ක් වෙනවා. එතකොට මේ රුපියල් බිලියන 900 අපි වාගේ දුප්පත් රටකට තනියම දරන්න පුළුවන්ද කියලා ප්‍රශ්නයක්

තිබෙනවා. මොකද, ගෝඨාභය රාජපක්ෂ VAT එක අඩු කරලා රුපියල් බිලියන 880ක් බදු සහන දුන්නාම රටේ ආර්ථිකය කඩාගෙන වැටුණා. අපි පැහැදිලිවම කියන්න කැමැතියි, මේ ආණ්ඩුව තවම අපේ රටට සිදුවෙලා තිබෙන හානිය පිළිබඳව හරියට වීඩියෝ පටයක් හදලා නැති බව, ජාත්‍යන්තරයට present කරන්න. ජාත්‍යන්තරයට present කරලා ඔවුන්ගේ අනුකම්පාව අරගෙන, ඔවුන්ගේ ආධාර ඇතිව තමයි අපට මේ ගමන යන්න වෙන්නේ. මොකද, අපි නොකර ඉන්නකොට ඔවුන් ඇවිත් තක්සේරුවක් කළොත්, සුනාමියේදී වෙච්ච වැඩේ තමයි වෙන්නේ. එතකොට එතැනින් එහාට රුපියලක්වත් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මොකද, අපට පෙනෙන දෙයක් තමයි, මේගොල්ලන් එක්ක මොන meeting එක කළත්, ඒගොල්ලන් meeting එකට කලින් පැලවත්තෙන් තීරණය අරගෙනයි එන්නේ කියන එක. Meeting එක තියන්නේ බොරුවට. ඔළුව වන වනා ඉඳලා ඒගොල්ලන් හිතාගෙන ආපු ටික තමයි කරන්නේ. ඔහොම කළොත් ඇනගන්න එක ඇනගන්නවාමයි; ෂුවර් ඇන්ඩ් ෂොට්. ඔන්න ඕක ලියලා තියාගන්න. ඒ නිසා ඔබ කළ යුත්තේ වහාම ලංකාවේ තත්ත්වය පිළිබඳව අදාළ presentation එක හදලා ජාත්‍යන්තරයට present කරලා, ආධාරක සමුළුවක් පවත්වලා ඒකෙන් උපරිම ආධාර ලබා ගැනීම වාගේම තවදුරටත් ණය කල් දමාගන්න පුළුවන්ද කියලා බලන එකයි. මොකද, මේ කථා පෙට්ටි නේ; ඇවිදින පුස්තකාල. කදිර්ගාමර්ලා හැටහුටහමාරක් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා කොලොන්නාවට ආවාද දන්නේ නැහැ. ගංවතුර බැහැලා ගිහිල්ලා සුමාන දෙකයි, තවම කුණු අස්කර ගන්න බැහැ, ඒ ප්‍රදේශයේ. ඒ මිනිසුන්ට නැවත පදිංචියට ගෙවල්වලට යන්න බැහැ. මඩුරුවෝ පිරිලා, කුණු ගොඩවල් පිරිලා, විශේෂයෙන් බ්‍රන්ඩියාවත්ත, වෙන්නවත්ත, මෙගොඩ කොලොන්නාව, වෙලේවත්ත, කිත්තන්පහුව වැනි ප්‍රදේශවල. මම දන්නේ නැහැ, ප්‍රාදේශීය සභාවට ට්‍රැක්ටරය පෙනෙනවාද, නැද්ද කියලා. පිට පළාත්වලින් ට්‍රැක්ටර් ගෙනෙනවා ලු; බැකෝ ගෙනෙනවා ලු. ඒ එකක්වත් පේන්න නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෙදරට යන මනුස්සයාට තමන්ගේ නිවස සුද්ද කරගන්න තමයි රුපියල් 25,000ක් දෙනවා කිව්වේ. කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දළ වශයෙන් 30,000කට මේ ආපදා තත්ත්වයෙන් affect වෙලා තිබෙනවා. ඊයේ සවස වෙනකොටත් 9,000කට ආසන්න ප්‍රමාණයකට තමයි රුපියල් 25,000 ගෙවලා තිබුණේ.

වියළි ආහාර සලාක දෙනවා කියලා කිව්වා. මම දන්නේ නැහැ, දෙන්නේ කොහෙන්ද කියලා. රුපියල් 25,000 බැගින් පවුල් 30,000ට ගෙවා ගන්න බැරි ආණ්ඩුව, රුපියල් 50,000ක් දෙනවා කිව්වා, රුපියල් ලක්ෂ 50ක් දෙනවා කිව්වා, ටකරම ගියත් අච්චර දෙනවාය කිව්වා. හැබැයි මේවා ඔක්කෝම බොරු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අද පෙන්වා දෙන්නම්, මේවා බොරුයි කියන එක. මොකද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ආරංචි විධියට කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අර්ධ හානි වෙච්ච ගෙවල් 3,000යි කියලා තමයි තිබෙන්නේ. ඒ හැම ගෙදරකටම අඩි 4 සිට අඩි 12 දක්වා වතුර ආවා. එතකොට ගෙවල් 3,000කට ද මේ පාඩුව දෙන්නේ? ඉතුරු ගෙවල් 27,000ට දෙන්නේ නැද්ද? ඉන්නකෝ, සබ්බුව හම්බ වෙයි එහෙම කරන්න ගියොත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2016දීත් ගංවතුරක් ආවා. රවි කරුණානායක මන්ත්‍රීතුමා එවකට මුදල් ඇමති හැටියට insurance එකක් දාලා තිබුණා, රුපියල් මිලියන 330ක වාරිකයක. අපි ඒ පවුල් 27,000ටම පළමුවැනි වටයේදී ගෙදරට යන්න රුපියල් 10,000ක් දුන්නා. දෙවැනි වටයේදී පවුල් 23,000කට ගෙදරට අවශ්‍ය බඩුමුට්ටු ගන්න රුපියල් 15,000ක් දුන්නා, ඒ කාලයට හරියන විධියට. ඊට පස්සේ පවුල් 19,905කට රුපියල් ලක්ෂ 19,000ක වන්දි දුන්නා. වතුර ආපු හැම ගෙයක්ම හානි වුණා සේ සැලකුවා. 2016දී එහෙමයි කළේ. මොකද, වතුර ආපු හැම ගෙදරකටම ගිහිල්ලා බලන්න, ගෙවල්වල බිත්තිවල පාට මොකක්ද කියලා. ඒ ගෙවල්වල ඇඳක්, පුටුවක් තිබෙනවාද, ළමයින්ගේ ඉස්කෝල පොත් ටික තිබෙනවාද කියලා බලන්න. ඒ නිසා මේ මිනිස්සුන්ට වුණු ව්‍යසනයත් එක්ක විහිළු කරන්න නම් එන්න එපා. ඡන්ද ගන්න බොරු කිව්වාට කමක් නැහැ. මිනිස්සුන්ගේ පීඩාව ගැන බොරු කියන්න ලැහැස්ති වෙන්න එපා.

ඒ වාගේම, මේ නිලධාරින් අන්දනවා. ව්‍යසන කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙක් විධියට අගෝස්තු මාසයේ තිබුණු meeting එකේදී මම කිව්වා, මේ insurance එක නැවත ගේන්න කියලා. මොකද, සමහර නිලධාරින් බදු මුදල්වලින්ම තමයි මේවා ගෙවන්න try කරන්නේ. රජයකට බදු මුදල්වලින් ඔක්කෝම ගෙවන්න බැහැ. හැබැයි දැන් කියනවා, ඒ insurance එක ගේන්න බැරි හේතුව ගෙවපු premium එකකට return එක හම්බ වෙලා නැති නිසා කියලා. අවුරුද්දකට වාරිකය රුපියල් මිලියන 330යි. 2016දි කොලොන්නාවට විතරක් අපි අරගෙන තිබෙනවා, රුපියල් ලක්ෂ 23,000ක්. අපි වාහනයක් රුපියල් 80,000කට විතර insurance කරනවා නම් ඒක accident වුණොත් විතරයි return එක හම්බ වෙන්නේ. Accident එකක් වුණේ නැති වුණොත් return එක එන්නේ නැහැ. දැන් ජනාධිපතිතුමාට තොරතුරු දෙනවා, අවුරුදු පහේම premium එක එකතු කරලා එක අවුරුද්දකට ලැබිච්ච return එක විතරක් දාලා. ඔන්න, ඇවිදින පුස්තකාල!

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා, ගංවතුර එද්දි ආණ්ඩුව වගකීම් විරහිතව හැසිරුණේ කොහොමද කියලා. බෝට්ටු 3යි දාලා තිබුණේ ආණ්ඩුවෙන්. මම බෝට්ටු දෙකක් දැම්මා, සජිත් ප්‍රේමදාස මැතිතුමා දෙකක් දැම්මා. වැඩිම බෝට්ටු ප්‍රමාණයක් දැම්මේ ව්‍යාපාරිකයෝ. ආණ්ඩුව එහෙමද හැසිරෙන්නේ? දැන් ඒක ඉවරයි කියමුකෝ. පශ්චාත් ආපදා තත්ත්වය තුළ මිනිස්සුන්ට ගෙදරට යන්න ඒ සල්ලි දෙන්න පරක්කු වෙනවා නම් අඩුම ගණනේ කුණු ටික අස්කරලා දෙන්නවත් ආණ්ඩුවට හැකියාවක් නැහැ. ප්‍රාදේශීය සභා ඔක්කොගේම බලය ගන්න දත කාගෙන ගියා නේ. ඉතින්, ඒවායේ තිබෙන බැකෝ ටික මෙහාට ගෙනැල්ලා දාන්න බැරි මොකද? ඇයි, සිවිල් ආරක්ෂක බලකාය මේවාට දාන්න බැරි? එහෙම කරලා මේවා පිරිසිදු කරන්න පුළුවන් නේ. ගමේ ග්‍රාම නිලධාරි දන්නවා ගමේ ගෙවල් කීයක් තිබෙනවාද, ඒ ගෙවල්වල පදිංචි කවුද කියලා. මේ රුපියල් 25,000 දෙන්න ඔච්චර හොය හොයා ඉන්න ඕනෑද? ඒ ගේම් එක ගහන්න ගියා. හැබැයි, වැරදුණා. ජේවීපී ප්‍රජා සංවර්ධන සමිතියේ සභාපතිගෙයි, ජේවීපී ආපදා සමිති සභාපතිගෙයි අත්සන ගන්න ගියා නේ. හැබැයි, වැඩේ පත්තු වුණා නේ. ඒ නිසා දැන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු forms බෙද බෙද, ඇද ඇද ඉන්නවා. මම පැහැදිලිව කියන්න කැමැතියි, මේ සිකුරාදා වෙද්දිවත් කරුණාකරලා මේ රුපියල් 25,000 ගෙවලා ඉවර කරන්න කියලා. කරුණාකරලා ඒක දෙන්න. මොකද, ඒ මිනිස්සු අසරණ වෙලා ඉන්නේ, ආදායම් මාර්ග නැති වෙලා තිබෙන්නේ.

අපේ ප්‍රදේශවල ඉන්න ගොඩක් අය ඉතා සුළු ව්‍යාපාරිකයෝ. පෙට්ටි කඩ කරන, ත්‍රීවීලර්වල බිස්නස් කරන, pavement එකේ බිස්නස් කරන අය තමයි ඉන්නේ. ඒ අයගේ ව්‍යාපාරවලට වන්දි ලබා දෙනවාද? දැන් මේ ගෙවෙන හැම දවසක් පාසාම, ඒක පරක්කු කරන්න, පරක්කු කරන්න ඔවුන්ට ඔවුන්ගේ ජීවිකාව ආරම්භ කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම කැලණි ගඟ ආසන්නයේ තිබෙන factoriesවලට නැවත සම්පූර්ණ යථා තත්ත්වයට පත්වෙන්න බැරි වෙලා තිබෙනවා. ඔවුන්ට ණය සහන

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ලබා දෙනවා නම් කලින් ලබා දෙන්න. මොකද, ඒ පළාතේ මිනිස්සු විශාල ප්‍රමාණයක් ඒවායේ රැකියා කරනවා. ඒ factories activate වුණේ නැත්නම් ඒ මිනිස්සුන්ටත් ආදායම් මාර්ග නැති වෙනවා. ඒ නිසා අපි කියනවා, කටින් බතල කොළ හිටවන්නේ නැතුව අවශ්‍ය කටයුතු කරන්න කියලා. මේ මඩ බලකාය දාලා එක එක්කෙනාට මඩ ගහමින් හිටියාට, ආපදා තත්ත්වය පහව ගියායින් පස්සේ, ඔයගොල්ලන්ගේ කියුම්-කෙරුම් ටික බලාගන්න, මොකක්ද වෙන්නේ කියලා බලන්න, පළාත් සභා ඡන්දය තියන්නකෝ. ඔක්කෝම හරි නම්, ඔක්කෝම හරියට කරලා තිබෙනවා නම්, පිළිවෙළට යනවා නම්, ඇවිදින පුස්තකාල ඔක්කෝම system එක හරියට change කරලා තිබෙනවා නම්, මිනිස්සුන්ට හරියට ප්‍රතිලාභ ලැබිලා තිබෙනවා නම්, ආපදාවට මුහුණ දෙනකොට හිටපු තත්ත්වයට වඩා හොඳ ජීවිතයක් ඔබ ඔවුන්ට ලබා දී තිබෙනවා නම් අන්න ඒක කරන්න කියලා අපි කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව දෙයක් කියන්න ඕනෑ. ඒ, යටිතල පහසුකම් සංවර්ධනය ගැනයි. මා දන්නා තරමින් ඒ කටයුතු කරන කණ්ඩායම් ජනාධිපතිතුමාට ලියලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Give me one more minute please.

යටිතල පහසුකම් ඇති කිරීමේ කටයුතු එක පාරටම කරන්න ලංකාවේ තිබෙන machineries ප්‍රමාණවත්ද? එහෙම නම් priority දෙන්නේ මොනවාටද? ඒවා හදලාද මම දන්නේ නැහැ. රජයෙන් සල්ලි දෙන්නේ වැඩේ කරලා ඉවර වුණාට පස්සේ. ඔවුන්ට අවශ්‍ය ප්‍රාග්ධනය තිබෙනවාද, නැත්නම් ඔවුන්ට අඩු පොලියට ණය ලබා දීමට අවශ්‍ය චක්‍රලේඛ නිකුත් කරනවාද කියන කාරණය ඉතාම වැදගත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන්, මම ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. ඔබතුමාට කොළොන්නාව ආසනයෙන් ඡන්ද 12,000ක් හම්බ වුණා; මටත් වඩා ඡන්ද හම්බ වුණා. අපි පාරවල් හැදුවා; bunds හැදුවා; ගේට්ටු හැදුවා; පොම්පාගාර හැදුවා. ගලක්වත් අල්ලන්නේ නැතුව ඔබතුමා ඡන්ද 12,000ක් ගත්තා. ඒ නිසා කරුණාකර මේ රුපියල් 25,000 මේ සිකුරාදටවත් ලබා දෙන්න කටයුතු කරන්න; ඒකට මැදිහත් වෙන්න; ඒකට දායකත්වය ලබා දෙන්න. මොකද ඔබතුමාට ඡන්දය දුන්නු ජනතාව එතැන ඉන්නේ. ඔබතුමා වෙනුවෙන් රැස්වීම් තියපු ජනතාව එතැන ඉන්නේ. අපට දවල්ට රැස්වීම් තියලා ඔබතුමාට රෑට බුරියානි දීපු කට්ටිය ඉන්නවා. ඒ මිනිසුන්ට ඒක ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) V.S. Radhakrishnan. You have six minutes and your time starts now.

[ප.ව. 12.27]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சீரற்ற காலநிலை காரணமாக ஏற்பட்ட பேரழிவுக்குப் பின்னரான நாட்டின் தற்போதைய நிலைமை தொடர்பான சபை ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதம் இன்றைய தினம் நடைபெற்றுக் கொண்டு இருக்கின்றது.

இந்த நாட்டில் ஏற்பட்ட அனர்த்தத்தால் இலங்கையின் பல்வேறு பகுதிகள் மோசமாகப் பாதிக்கப்பட்டு இருந்தாலும், மலையகப் பகுதி மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கின்றது என்பது எல்லோருக்கும் தெரிந்த விஷயமாகும்.

தோட்டப்புறங்களிலுள்ள மக்கள் இடம்பெயர்ந்து நகரங்களிலுள்ள பாடசாலைகள், கோயில்களில் இருக்கின்ற இந்தச் சூழ்நிலையில், அவர்களை வீடுகளுக்குச் செல்லுமாறு அரசாங்கம் சொல்கின்றது. ஆனால், அதற்கான எந்தவித வசதிகளையும் ஏற்படுத்திக் கொடுக்கவில்லை. அம்மக்கள் வாழ்ந்த இடம் குடியிருப்பதற்குப் பொருத்தமற்றதென NBRO சொன்ன பிறகுதான் அவர்கள் இடம்பெயர்ந்து campக்கு வந்தார்கள். அவர்கள் campக்கு வந்தபிறகு, "இப்பொழுது நீங்கள் போகலாம்" என்று சொன்னால் என்ன அர்த்தம்? எனவே, NBROஇன் Reportஐ முறையாகப் பெற்றுக்கொண்ட பிறகு அவர்களை அனுப்புவதுதான் நன்றாக இருக்குமென்பது என்னுடைய கருத்தாகும். குறிப்பாக, வேவண்டன் பகுதியிலிருந்து இடம்பெயர்ந்த மக்கள் இப்பொழுது காமினி திசாநாயக்க வித்தியாலயத்தில் தங்கியிருக்கிறார்கள். அவர்களை தொண்டமான் தொழிற்பயிற்சி நிலையத்துக்கு அல்லது வேறு பாடசாலைகளுக்கு அல்லது வீடுகளுக்குப் போகுமாறு சொல்கிறார்கள். அவர்களுடைய நிலையை அறிந்து செயற்பட வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன். நேற்றுக்கூட, மலையகத்தின் பல இடங்களில் போராட்டங்கள் நடைபெற்றன. குறிப்பாக, வேவண்டன் பகுதியிலும் நோர்வூட் பகுதியிலும் மஸ்கெலியாவின் ஸ்டொக்கம் பகுதியிலும் போராட்டங்கள் நடைபெற்றன.

இந்த நேரத்தில் நான் அரசாங்கத்திடம் ஒரு வேண்டுகோளை விடுக்க விரும்புகின்றேன். மாண்புமிகு சனாதிபதி அவர்கள் கடந்த காலங்களில் அது பற்றி பல கூட்டங்களில் பேசியிருந்தார். 2026ஆம் ஆண்டுக்கான Budgetஇன் இரண்டாவது வாசிப்பு மீதான விவாதம் இச்சபையில் நடைபெறும்பொழுது, தோட்டத் தொழிலாளர்களின் சம்பள அதிகரிப்பு சம்பந்தமான விடயம் பேசப்பட்டது. அதன்போது, NPPஐச் சேர்ந்த 159 பாராளுமன்ற உறுப்பினர்களும் சொன்னார்கள், “தோட்டத் தொழிலாளர்களுக்கு நிறையப் பிரச்சினைகள் இருக்கின்றன, அவர்களுக்குக் கட்டாயம் சம்பள உயர்வு கொடுக்க வேண்டும், அவர்கள் 'லயன்' அறைகளில் வாழ்கின்றார்கள், 'லயன்' முறையை ஒழிக்க வேண்டும், அவர்களுக்கு நல்ல வாழ்க்கையை ஏற்படுத்திக் கொடுக்க வேண்டும்” என்று. இது மிகவும் சந்தோஷமான விடயம்! அதேபோல், தோட்டத் தொழிலாளர்களின் காணிப் பிரச்சினை சம்பந்தமாகவும் NPP உறுப்பினர்கள் பேசி, அவர்களுக்கு 7 பேர்ச்சஸ் வீதம் காணியைப் பெற்றுக்கொடுத்து, அவர்கள் அங்கேயே குடியிருப்பதற்கான வசதி வாய்ப்புகளை உருவாக்கிக் கொடுக்க வேண்டும். நாங்கள் எக்காரணம் கொண்டும் யாழ்ப்பாணத்துக்கு வருவதற்கோ, மட்டக்களப்புக்கு

வருவதற்கோ தயாரில்லை. அதாவது, வடக்கு, கிழக்குக்கு வருவதற்குத் தயாரில்லை.

எங்களைப் பொறுத்தவரை, நாங்கள் மலையகத்தில்தான் வாழ ஆசைப்படுகின்றோம். ஏனெனில், மலையகம் எங்களது தாயகம்! அங்கு நாங்கள் வாழ்வதற்கான வசதிகளைச் செய்துதர வேண்டும். கௌரவ அமைச்சர் சமந்த வித்யாரத்ன அவர்களே, நீங்கள் தோட்டக் கம்பனிகளுடன் நேரடியாகப் பேச்சுவார்த்தை நடத்தி, இதற்கான முயற்சிகளை எடுக்க வேண்டும். எங்களுடைய காலத்தில் அதனைச் செய்ய முடியாமல் போனது. உங்களுடைய காலத்திலாவது அதைச் செய்து கொடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இன்று எமது நாட்டில் 103,000 ஹெக்டெயாரிலே தேயிலை, இறப்பர் போன்றன பயிரிடப்படுகின்றன. தோட்டத் தொழிலாளர் களுக்கு 7 பேர்ச்சஸ் வீதம் காணி வழங்குவதென்றால், அதற்கு ஒதுக்கவேண்டியது 5,000 ஏக்கர்தான். அவர்களுக்கு 5,000 ஏக்கர் காணியை ஒதுக்கிக் கொடுப்பதால் உங்களுக்கு எந்தவித நட்டமும் ஏற்படப் போவதில்லை. அவர்களும் இந்த நாட்டு மக்களென நீங்கள் 159 பேரும் கடந்த காலங்களில் பேசியிருக்கிறீர்கள். எனவே, அவர்களுக்கு காணிகளைப் பிரித்துக் கொடுப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென நான் இந்த நேரத்தில் விநயமாகவும் அன்பாகவும் கேட்டுக் கொள்கின்றேன். இனியும் எங்களுடைய சமூகம் ஒதுக்கப்பட்ட சமூகமாக வாழ முடியாது என்பதை நாங்கள் ஏற்றுக்கொள்ள வேண்டும்.

நேற்று முன்தினம் பல பாடசாலைகளைத் திறப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட்டது. அதன் அடிப்படையில், நுவரெலியா மாவட்டத்தில் 551 பாடசாலைகள் உட்பட மத்திய மாகாணத்தில் 1,531 பாடசாலைகள் திறக்கப்பட்டதாகச் சொன்னார்கள். அவ்வாறு இல்லை! வட்டகொட பகுதியில் இருக்கின்ற யொக்ஸ்போர்ட் தமிழ் வித்தியாலயம் மண்சரிவு - earth slip - காரணமாக மூடப்பட்டு இருக்கிறது. அந்தப் பாடசாலையில் கல்வி கற்கும் மாணவர்களை ஏனைய இரண்டு பாடசாலைகளுக்கு அனுப்புகிறீர்கள். இது தற்காலிகமாகச் செய்யப்பட வேண்டிய வேலையாகும். ஆனால், அந்தப் பாடசாலையை முற்றுமுழுதாக இல்லாமல் செய்ய முடியாது. ஆகையால், அதற்கான புதிய பாடசாலைக் கட்டிடங்களைக் கட்டிக்கொடுப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டு மெனக் கேட்டுக் கொள்கின்றேன்.

நான் கௌரவ பிரதம அமைச்சர் அவர்களிடம் ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். இப்பொழுது அதிபர் பதவிக்குத் தகுதியான 1,162 பேர் இருக்கிறார்கள். அவர்களை அதிபர் பதவிக்கு நியமிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். இப்பொழுது சொல்கின்றார்களாம், 50 வயதுக்கு மேற்பட்ட வர்களை நியமிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்று. எனினும், இவர்களால் மீண்டும் ஒரு முறை பரீட்சை எழுதுவதற்கு முடியாமல் போய்விடும். ஆகவே, மேற்குறித்த 1,162 பேருக்கும் அதிபர் பதவியை வழங்க வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன்.

குறிப்பாக, எமது நாட்டில் அனர்த்தம் ஏற்படும் போதெல்லாம் உடனடியாக உதவி செய்கின்ற இந்திய அரசாங்கத்துக்கு எமது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம். அண்மையில் அனர்த்தம் ஏற்பட்டபோது, எங்களுடைய நுவரெலியா மாவட்டத்துக்கு வெளிமாவட்ட மக்கள் நிவாரணப் பொருட்களை அனுப்பியிருந்தார்கள். என்னுடைய நண்பரான கௌரவ திலிப் வெதஆரச்சி அவர்கள் கூட, 3 லொறிகளில் நிவாரணப் பொருட்களை அனுப்பி யிருந்தார். அதேபோல, கௌரவ சிறீதரன் அவர்களும் யாழ்ப்பாணத்தில் இருந்து அனுப்பியிருந்தார். இவ்வாறு நாட்டின் பல பகுதிகளிலும் இருந்து எங்களுக்கு நிவாரணப் பொருட்கள் வந்தன. அரசாங்கம் கொடுத்ததைவிட, மக்கள் கொடுத்த நிவாரணப் பொருட்கள்தான் அதிகம்! அவர்களுக்கும் இந்த நேரத்தில் நன்றி சொல்லவேண்டிய கடமை எங்களுக்கு இருக்கின்றது. இந்த அனர்த்தத்தால் பலர் உயிரிழந்து இருந்தாலும்கூட, ஏனையவர்களைக் காப்பாற்றவேண்டிய பாரிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது. அதேபோல், இனிவருகின்ற விடயங்களையும் கவனிக்க வேண்டிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது. அரசாங்கத்துக்குப் பாரிய சுமை இருக்கின்றது. இது இலகுவான விடயமல்ல. ஆகவே, இந்தச் சுமையை நீங்கள் ஏற்றுக்கொண்டு நல்ல முறையில் வேலைகளைச் செய்ய வேண்டும். அதற்கு எங்களுடைய ஒத்துழைப்பு என்றும் இருக்குமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Arun Hemachandra. You have 11 minutes.

[අ.භා. 1.00]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රථමයෙන් මම ස්තුතිවන්ත වෙනවා මේ වාගේ ඉතා කාලීන විවාදයකට සම්බන්ධ වන්නට මටත් අවස්ථාව ලබා දීම පිළිබඳව.

මම හිතන විධියට, "දිට්වා" සුළි කුණාටු තත්ත්වයත්, ඒ තත්ත්වය එක්ක නිර්මාණය වෙච්ච ආපදා තත්ත්වය බැලුවොත්, මෑත ඉතිහාසයේ ලංකාවේ සිද්ධ වෙච්ච දැවැන්තම, බරපතළම ව්‍යසනයක් විධියට තමයි අපට මේක දකින්නට ලැබෙන්නේ. මෙතැනදී මට පැවරී තිබෙනවා වගකීම් දෙකක්. එකක් තමයි, විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට මේ ක්ෂේත්‍රයට අදාළව යම්කිසි කරුණු කාරණා ඉදිරිපත් කිරීම. අනෙක් එක තමයි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා විධියට අපේ දිස්ත්‍රික්කයේ සිද්ධ වෙච්ච දේවල්, අපේ දිස්ත්‍රික්කය තුළ අපි කරපු දේවල් සම්බන්ධව යම් කරුණු කාරණා ඉදිරිපත් කිරීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බලයට පත් වන්නට කලින් විපක්ෂය අපගේ විදේශ ප්‍රතිපත්තියට අදාළව දිගටම විවේචන, මඩ, අවලාද වැනි විවිධ දේවල් එල්ල කරමින් සිටියා. නමුත්, පසුගිය දවස් කිහිපය තුළ සිද්ධ වෙච්ච දේවල් එක්ක,

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

විශේෂයෙන්ම විදේශ රටවල්, ආයතන, රාජ්‍ය නොවන සංවිධාන වැනි විවිධ මාර්ගවලින් අපට ලැබිච්ච උදවු උපකාර, තාක්ෂණික සහයෝගය එක්ක තවදුරටත් ඒ ප්‍රශ්න අහන්න කාටවත් සදාචාරමය අයිතියක් නැහැ කියන පණිවුඩයත් මම දෙන්න කැමැතියි.

I wish to place on record the sincere appreciation of the Government and the people of Sri Lanka of all the friendly nations, international organizations and humanitarian partners who extended timely assistance following Cyclone Ditwah. The support provided in the form of emergency relief, technical expertise and financial assistance significantly strengthened our national response efforts and was extended with respect for Sri Lanka's sovereignty and national mechanisms.

All assistance was coordinated through established Government channels to ensure transparency, efficiency and alignment with assessed needs. On behalf of this House, I convey our gratitude to the international community for the solidarity, cooperation and goodwill shown to Sri Lanka during this difficult time. අපගේ ගරු විජිත හේරත් ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. එතුමාටත් වෙනම කථාවක් තිබෙනවා. මේ ව්‍යසන අවස්ථාවේදී විදේශ සම්බන්ධතා, විදේශ රටවල්, විදේශ ආයතන හරහා අපට ලැබිච්ච සහයෝගය ගැන ගරු ඇමතිතුමා මීට වඩා විස්තරාත්මකව කරුණු දක්වයි කියන විශ්වාසය මට තිබෙනවා.

ඒ නිසා මම මේ මොහොතේ අපගේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අදාළව යම්කිසි කරුණු කාරණා කිහිපයක් පැහැදිලි කරන්නට කැමැතියි. විශේෂයෙන්ම ගත්තොත්, ගරු ජනාධිපතිතුමා පත් වන්නේ පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ. ඒ සැප්තැම්බර් මාසයේ සිට ගත්තොත්, පසුගිය මාස 15ක කාලය තුළ මේ ආපදා කළමනාකරණයට අදාළව අපගේ දිස්ත්‍රික්කය තුළ අපි කටයුතු කරගෙන ගියා. ඒ වාගේම තමයි, අපි බලයට පත් වන්නට පෙර සිටම ඕනෑම විපතක්, ඕනෑම ආපදාවක් සිද්ධ වුණු හැම අවස්ථාවකම අපගේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඇතුළු විවිධ ආයතන එක්ක ඍජු සම්බන්ධතා පවත්වමින් අපේ කටයුතු ටික කරගෙන ආවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපඅ කවදාකවත් කාගේවත් කකුලෙන් අදින්න ගියේ නැහැ. අපි කවදාකවත් ආපදාවක් සිද්ධ වෙච්ච මොහොතකදී පොරකාගෙන ගිහින් බඩු මලු බෙදන්න, photos දමන්න ගියේ නැහැ.

මම ජනතා විමුක්ති පෙරමුණේ පූර්ණකාලීන දේශපාලනයට සම්බන්ධ වුණේ 2015දී. 2016දී දැවැන්ත ව්‍යසනයක් සිද්ධ වුණා කැලණි ගඟ ආශ්‍රිත බියගම ඇතුළු ප්‍රදේශවල. ඒ අවස්ථාවේ අපි ගියා, බියගමට. ගිහින් අපි ඒ ගම්වල ඉන්න මිනිස්සු එක්ක වැඩ කළා. අපි එහෙම වැඩ කළේත් එවකට ඒ ප්‍රදේශවල වැඩ කරපු මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන්ලා, ග්‍රාම නිලධාරිවරු, ප්‍රාදේශීය ලේකම්වරු ඇතුළු සියලුදෙනා එක්ක. ඒ කාලයේත් අපි කිසිසේත්ම පැවැති යන්ත්‍රණය කඩාකප්පල් කරමින් ඒ වැඩේ කරන්නට සූදානම් වුණේ නැහැ. නමුත්, කියන්න කනගාටුයි. දැන් සමහර උදවිය මේ යන්ත්‍රණය කඩාකප්පල් කරමින් බඩු මලු බෙදන එක විතරයි මොකක් හෝ ව්‍යසනයකට දෙන උත්තරය. ඒක තමයි ඔවුන් දක්වා තිබෙන ප්‍රතිචාරය. ඒක නම් ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

මෙතැනදී ඉතාම හොඳ පැහැදිලි කිරීමක් අවශ්‍යයි කියා මම හිතනවා. මේ "දිට්වා" සුළි කුණාටු තත්ත්වය ඇති වුණේ පසුගිය නොවැම්බර් මාසයේ 26, 27 දෙදින තුළ. අපි දිස්ත්‍රික්කයක් විධියට පෙර සූදානමක් තිබුණා. අපේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11ක් තිබෙනවා. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11 තුළම ආපදා කළමනාකරණයට අවශ්‍ය රැස්වීම් අපි පසුගිය නොවැම්බර් මාසයේ 04වැනි දා සිට 20වන දා දක්වාම කැඳෙව්වා. මේ සම්බන්ධව අපට යම්කිසි අදහසක් තිබුණා. මොකද, අපේ දිස්ත්‍රික්කය ගත්තාම හැම අවුරුද්දේම දෙසැම්බර් මාසයේම යම්කිසි කුණාටු තත්ත්වවලට මුහුණ දෙනවා, විශේෂයෙන්ම බෙංගාල බොක්ක ආශ්‍රිතව පිහිටි දිස්ත්‍රික්කයක් නිසා. ඒකටත් අපි පෙර සූදානමකින් හිටියේ. නමුත්, මේ ඇති වූ ආපදාව ගත්තොත්, ඒක අපි බලාපොරොත්තු වුණාට වඩා දැවැන්ත තත්ත්වයක්. හැබැයි, ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් වසම ගත්තොත්, වෙන දා ගංවතුරට යට වනවා. මේ සැරේ ගංවතුරට යට වුණේ නැහැ. ඒකට හේතුව මේකයි. පසුගිය මාස 13ක පමණ කාලය තුළ අපට ලැබුණු සියලු මුදල්, -ඒ කියන්නේ, විමධ්‍යගත මුදල් වෙන්න පුළුවන්, අනෙකුත් රේඛීය ආයතන හරහා අපට ලැබුණු මුදල් වෙන්න පුළුවන්, පළාත් සභා හරහා අපට ලැබුණු මුදල් වෙන්න පුළුවන්- හරියාකාරයෙන් කළමනාකරණය කරමින් අපි ආපදා කළමනාකරණය කියන ක්ෂේත්‍රයටත් යම්කිසි සැලකිය යුතු කොටසක් වෙන් කරලා තිබුණා. ඒ වාගේම තමයි කින්නියා නගරයේත් වෙන දා යට වන සමහර ප්‍රදේශ මෙවර යට වුණේ නැහැ. හේතුව තමයි, අපි අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරගෙන කානු පද්ධතිය සහ වාරි පද්ධතිය ඇතුළු විවිධ දේවල් සම්බන්ධව අවශ්‍ය කටයුතු කළා. මොකද, අපට විද්‍යාත්මකව යම්කිසි අදහසක් තිබුණා, මේ කාල වකවානු තුළ යම්කිසි ව්‍යසනයක් සිදු වෙයි, එම නිසා ඒකට අදාළ විද්‍යාත්මක ප්‍රතිචාරයක් අපි දක්වන්න ඕනෑ කියලා. අපි ඒ සඳහා දිගටම කටයුතු කළා.

පැවැති කුණාටු තත්ත්වය බරපතළ තත්ත්වයට පත් වන බවට නොවැම්බර් 27වන දා ප්‍රකාශයට පත් කිරීමත් එක්ක, එදා සිට අපි දෙසැම්බර් මාසයේ 06වන දා දක්වා දවසකට අවම වශයෙන් එක වතාවක්, එහෙම නැත්නම් දවසකට දෙවතාවක් අපි ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණයට අදාළව පිහිටවපු Steering Committee එක කැඳෙව්වා. ඒ කමිටුවට එන්න බැරි කට්ටියට online හරහා සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණා. Physically එන්න පුළුවන් හැමෝම ඇවිල්ලා ඒ රැස්වීමට සහභාගි වෙන්න කියන පණිවුඩය අපි ලබා දුන්නා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නියෝජනය කරන නියෝජිතයෝ හරහා අපේ දිස්ත්‍රික්කය තුළ ඉතා හොඳ සම්බන්ධීකරණයක් පවත්වාගෙන ගියා. එහි නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා. අපේ දිස්ත්‍රික් ලේකම්තුමා සහ මේ කටයුත්තට අදාළව ත්‍රිවිධ හමුදාව, පොලීසිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය ඇතුළු විවිධ ආයතන අපි ඒක රාශි කර ගත්තා. පළාත් සභා මට්ටමිනුත් සම්බන්ධ වුණා. අපගේ ආණ්ඩුකාරතුමා ඇතුළු ඒ යන්ත්‍රණයටත් අපි මේ අවස්ථාවේ ස්තුතිය පුද කරනවා. අපි ඒ සියලුදෙනා ඒක රාශි කරගෙන හොඳ coordinated effort එකක් ඇති කරගෙන අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරගෙන ගියා. ඒකෙන් අපට හානිය අවම කරන්න පුළුවන්කමක් ලැබුණා. වාසනාවන්ත විධියට අපගේ දිස්ත්‍රික්කයේ එක මරණයක්වත් වාර්තා වුණේ නැහැ. නමුත්, අපට අභියෝගයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. මේ ගංවතුර තත්ත්වය ගැන අපි ගම්වලට ගිහින් පැහැදිලි කළා. විශේෂයෙන්ම මහවැලිය ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ ගෙවල්වලට ගිහිල්ලා රාත්‍රී 12.00, පාන්දර 01.00 හා 02.00 වන කල් අපි පැහැදිලි කළා. වතුර මට්ටම ශීඝ්‍රයෙන් ඉහළ යෑම ගැන පැහැදිලි කළා. නමුත්, සමහර අය ඒකට එච්චර හොඳ ප්‍රතිචාරයක් දැක්වූයේ නැහැ. අපි ජනතාව එක්ක කථා කරද්දී, සමහර අය ආවේ නැහැ. අපි ළඟ තිබෙන තොරතුරු අනුව 260කට අධික පිරිසක් අපි හෙලිකොප්ටර් යවලා ගුවන් මාර්ගයෙන් මුදාගෙන තිබුණා. ඒ වාගේම අපගේ අහස් සීමාවේ ගුවන් යානා 5ක් අඛණ්ඩව ජනතාව මුදා ගැනීමේ කටයුතුවලට සම්බන්ධ වෙලා

තිබෙනවා. Beechcraft සහ Bell 212 ඇතුළු යානා යොදා ගෙන තිබුණා. ඒ වාගේම ජනාධිපතිතුමාගේ Bell 421 කියන VIP helicopter එක පවා අපට දීලා තිබුණා. අපට ඒ යානා හරහා quick response එකක් දක්වමින් මුදා ගැනීමේ කටයුතු ඉතා හොඳ විධියට කරන්න පුළුවන්කමක් ලැබුණා.

අපේ දිස්ත්‍රික්කයේ camps 80ක් තිබුණා. පවුල් විධියට ගත්තාම 8,919ක් ඒ රැඳවුම් මධ්‍යස්ථානවල හිටියා. පුද්ගලයන් විධියට ගත්තොත්, 26,694ක් විතර හිටියා. අපි රුපියල් 25,000 දීමනාව ලබා දෙන්න campsවලට නොගිය අයගේ නම් ටික පවා පළමු වටයේ එකතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ සඳහා සමත් පවුල් 15,943ක් අපි තෝරා ගත්තා. දෙවැනි වටයටත් අපි යම්කිසි අවස්ථාවක් දීලා තිබෙනවා. කවුරු හරි පවුලක අය ඒකට එකතු නොවුණා නම් තමන්ගේ ග්‍රාම නිලධාරි හරහා සම්බන්ධ වෙන්න පුළුවන් කියන ඒ පණිවුඩයත් ලබා දීලා තිබෙනවා. දැනට පවුල් 13,956කට රුපියල් 25,000ක දීමනාව - ගෙවල් ශුද්ධ කිරීමට අදාළ ගෙවීම - ගෙවලා හමාරයි; අද උදේ 10.30ට ලැබුණු වාර්තා අනුව සියයට 87ක් විතර ගෙවලා හමාරයි. සමහර තැන්වලදී circulars සම්බන්ධ ප්‍රශ්න තිබුණා. පසුගිය කාල සීමාව තුළ රාජ්‍ය නිලධාරින්ට එම වන්දි ගෙවලා තිබුණේ නැහැ. ඒ වාගේම සමහර තැන්වල පිට රටවල හිටපු අයට ඒ දීමනා, වන්දි ඇතුළු මේ දේවල් දීලා තිබුණේ නැහැ. නමුත් ඒ අයටත් දෙන්න ඕනෑ කියලා අපි තීරණය කළා. මුල්ම කාලයේ දෙන්න බැරි වෙච්ච අයට පවා දැන් අපි තීරණයක් අරගෙන ගෙවන්න පටන්ගෙන තිබෙනවා. දිස්ත්‍රික්කයක් විධියටත්, අමාත්‍යාංශයක් විධියටත් අපි මේ තත්ත්වයට ඉතා හොඳ විධියට මුහුණ දීලා තිබෙනවා. ඇත්තටම අපේ ස්තුතිය පුද කරනවා, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Arun Hemachandra, your time is up now.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
Hon. Deputy Speaker, please give me one more minute.

අපට මේ කටයුතු ඉතාම සාර්ථකව කරගෙන යාමට අපට උදවු කරපු සියලු දෙනාට අපේ ස්තුතිය පුදකරනවා. රාජ්‍ය ආයතන වෙන්න පුළුවන්, පෞද්ගලික ආයතන වෙන්න පුළුවන්, ත්‍රිවිධ හමුදාව වෙන්න පුළුවන්, ඒ සියලුදෙනාට අපේ ස්තුතිය පුද කරනවා. මෙම ව්‍යසනය නිසා මරණයට පත් වුණු අයගේ පවුල්වලට, පීඩාවට පත් වෙච්ච සියලු දෙනාට අපගේ ශෝකය ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Amila Prasad. You have six minutes.

[අ.භා. 1.12]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මේ ව්‍යසනය සිදු වෙච්ච කාල සීමාවේදී මීරිගම, දිවුලපිටිය, කටාන, මීගමුව ආශ්‍රිත ප්‍රදේශවලට බලපෑ ගංවතුර තත්ත්වයට ප්‍රධාන හේතුව වුණේ මා ඔය ඔස්සේ ගලායන ජලය පිටාර ගැලීමයි. ඒ ව්‍යසනයත් එක්ක අපි තේරුම් ගත යුතු දෙයක් තිබෙනවා. මා ඔයේ ගලායන ජලය සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු ආණ්ඩුවක් විශේෂ වාරි ව්‍යාපෘතියක් නිර්මාණය කරලා නැහැ. මේ ව්‍යසනයෙන් පස්සේ අපි අනාගතය දිහා බලලා කටයුතු කරන්න ඕනෑ. ආණ්ඩුවට මම පළමුව යෝජනාවක් කරනවා. කුමන හෝ ආකාරයක තරමක් විශාල ප්‍රමාණයේ වාරි ව්‍යාපෘතියක් හරහා මේ ජලය වයඹ පළාතට හරවන්න පුළුවන් නම්, එක පැත්තකින් ව්‍යසනයෙන් සිදු වෙන විනාශය අවම කරගන්න පුළුවන්; අනෙක් පැත්තෙන් වයඹ පළාත සහ එතැනින් එහාට තිබෙන රජරට පළාත දක්වා ජල අර්බුදය සඳහා විසඳුමක් හොයා ගන්න පුළුවන්. මම ආරම්භයේදීම ඒ යෝජනාව කරන්න කැමැතියි. ඒ වාගේම කටාන ආශ්‍රිත ප්‍රදේශවලටත්, ගම්පහෙන් එහා පැත්තටත් දඬුගම් ඔයේ විශාල ජල කඳක් විශේෂ වාරි ව්‍යාපෘති හා සම්බන්ධ නොවී ගලාගෙන යනවා. ඒ පිළිබඳව ආණ්ඩුවේ අවධානය පළමුව යොමු කරන්න කියාත් ඉල්ලීමක් කරනවා.

මේ ගංවතුර උවදුරත් එක්ක දකින්නට ලැබුණු අඩුපාඩු ගණනාවක් තිබෙනවා. එකක් තමයි, අපි තවමත් රාජ්‍යයක් විධියට ප්‍රමුඛතා හඳුනා ගැනීමේ දෝෂයක සිටිනවා කියන එක. ගම්පහ දිස්ත්‍රික්කයට අදාළවම කථා කළොත්, අධික වර්ෂාපතනයත් එක්ක එන ඒ ගංගාවල උපරිම ජල මට්ටම් ලකුණු කිරීමේ ඉඳලා තිබෙන ගැටලු තවමත් නිරාකරණය වෙලා නැහැ.

අලුත් ගංවතුර උවදුරත් එක්ක මම ඉල්ලීමක් කරනවා, පහුවෙලා කරන්න බැරි දේවල් සම්බන්ධයෙන්. දෙවැනි යෝජනාව හැටියට, මා ඔය ආශ්‍රිත ප්‍රදේශවල උපරිම ගංවතුර මට්ටම සලකුණු කිරීමේ වැඩ පිළිවෙළක් යොදන්න කියලා ඉල්ලීමක් කරනවා. මොකද, ප්‍රාදේශීය ලේකම්වරු, කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉහළින් පවතින ප්‍රදේශවල අයට කථා කරලා තමයි ගංවතුර පිළිබඳව තොරතුරු දැනගන්නේ. ඒ නිසා මේක ඉතාම වැදගත් වැඩක්, බොහොම පොඩි වැඩක්. නමුත් ඒවා කෙරිලා නැහැ. ඒ වාගේම මේ ගංගාව ආශ්‍රිත ප්‍රදේශයේ reservations ලකුණු කිරීම නැවත සිදු කරන්න කියලාත් ඉල්ලීමක් කරනවා. රජයේ ඉඩම්වල ඒක ලකුණු කරලා තිබුණාට, පෞද්ගලික ඉඩම්වල එහෙම ලකුණු කිරීමක් වෙලා නැති නිසා ගඟ අයිනට එනකම් ස්ථිර ගොඩනැඟිලි හදලා තිබෙනවා. හදලා තිබෙන ඒවා ඉවත් කරන්න බැරි වුණත්, අලුතෙන් ගොඩනැඟිලි ඉදි කිරීමේදී ඒ පිළිබඳව අවධානය යොමු කරන්න පුළුවන්. මේ උවදුරෙන් අපි ඉගෙන ගත යුතු පාඩම නම්, යළි ඇති වන මෙවැනි අර්බුදවලදී ඇති වන බලපෑම හැකි තාක් අවම කර ගැනීමට කටයුතු කිරීමයි.

තුන්වෙනි යෝජනාව තමයි, ලංකාවේ සමස්ත සිතියම අරගෙන කොයි කොයි ප්‍රදේශවලද ජනතාවට පදිංචි වෙන්න සුදුසු, කර්මාන්තවලට සුදුසු ප්‍රදේශ, වගාවලට සුදුසු ප්‍රදේශ මොනවාද, පදිංචියට නුසුදුසු භූමි ප්‍රදේශ මොනවාද කියලා සලකුණු කිරීම සඳහා රජයේ ආයතනවලට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න කියන එක. මම මේක කියන්න හේතුව මේකයි. ඒ වාගේ දේවලට අවධානය යොමු නොකිරීම නිසා ආණ්ඩුවක් විධියටත්, රජයක් විධියටත්, රටක් විධියටත් මේ වෙලාවේදී බොහෝ ගැටලුවලට මුහුණ පාන්න සිද්ධ වෙලා තිබෙනවා.

මේ ව්‍යසනයෙන් පසුව මීරිගම සහ දිවුලපිටිය ආශ්‍රිත ප්‍රදේශවල; මීරිගම ආසනයේ නිවාස 100ක් සහ දිවුලපිටිය ආසනයේ නිවාස 70ක් ඉවත් කරන්න නියමිතයි කියලා මේ වෙද්දී ප්‍රාදේශීය ලේකම්වරු හඳුනාගෙන තිබෙනවා. ඒ වාගේම අධි අවදානම් කලාපයට අමතරව අවදානම් ප්‍රදේශවල නිවාස ආශ්‍රිතව පවතින ජල මාර්ග වෙනස් කර ගන්න, නිවාස ආසන්නයේ පස් අයින් කර ගන්න, පොළොවේ ආනතිය වෙනස් කර ගන්න කියලා පෞද්ගලිකව යෝජනා කළාට, ඒ නිවෙස්වල ඉන්න අයට ඒවාට

[ගරු අමිල ප්‍රසාද් මහතා]

මුදල් වියදම් කර ගන්න බැහැ. අවම සහන යටතේවත්, ඒ කියන්නේ අඩු පොලියකටවත් ඒ අයට මේ සඳහා මුදලක් වෙන් කරන්න පුළුවන් නම්, - ඉදිරි කාල සීමාවේදී ගෙවීමේ පදනම මත - ඒ අයට තමන්ගේ නිවස ආශ්‍රිතව පවතින ඒ අවදානම් තත්ත්වයන් මහ හරවා ගන්න පුළුවන් වෙයි. ඒ නිසා මම ඒ යෝජනාවත් කරන්න කැමැතියි.

නිවාස හානි සහ අර්ධ නිවාස හානි සම්බන්ධයෙන් 8/2025 කියන චක්‍රලේඛය නිකුත් කළත්, ඒකට අනුකූලව අනෙකුත් ආයතන නිකුත් කළ යුතු චක්‍රලේඛ ඉදිරිපත් කරලා නැති නිසා ඒ අවශ්‍ය කරන ප්‍රතිපාදන වෙන් කිරීමේදී තවමත් රාජ්‍ය සේවය හිර වෙලා තිබෙන බව දකින්නට ලැබෙනවා.

මේ ව්‍යසනයත් එක්ක ඇති වෙච්ච තවත් ගැටලුවක් තිබෙනවා. ස්ථිර පදිංචිකරුවන්ට අමතරව කුලී නිවාසවල පදිංචි ජනතාවක් ඉන්නවා. ඒ අයටත් මේ අනතුරින් තමන් ජීවත් වන ස්ථානය අහිමි වෙලා තිබෙනවා. ඒ අයවත් අත් හරින්නේ නැතිව, ඒ අයගේ සමාජ පරිසරය එකවර වෙනස් නොවන පරිදි මේ සහන කටයුතුවලදී අවධානය යොමු කරන්න කියන යෝජනාවත් ආණ්ඩුවට කරන්න කැමැතියි.

මෙහිදී ව්‍යාපාරික පැත්ත ගැන කථා කළොත්, අඩු හානි සිද්ධ වෙච්ච අය ඉන්නවා; වැඩි හානි සිද්ධ වෙච්ච අය ඉන්නවා. ඒ ව්‍යාපාර ටික ප්‍රකෘතිමත් කර ගත්තේ නැත්නම් මෙතැනින් පස්සේ ආර්ථික අර්බුදයක් එනවා. ආණ්ඩුවට මම තවත් යෝජනාවක් කරන්න කැමැතියි. පුළුවන් නම් ඒ අයගේ ව්‍යාපාරය යළි නඟා සිටුවා ගන්න අවුරුදු දෙකක් විතර නොගෙවා සිටීමේ පදනම මත හෝ අඩු පොලී යටතේ ණය සහනයක් ලබා දෙන්න. හේතුව, ආර්ථිකය කඩාගෙන වැටුණොත් ඒ සියල්ලට වඩා බලපෑමක් සිද්ධ වෙන නිසා.

ජනාධිපතිතුමා එදා පාර්ලිමේන්තුවට ඇවිල්ලා නත්තල් සීයා වාගේ ගොඩක් දේවල් කියලා ගියා. තහඩුවක් ගියත් ලක්ෂ 10ක් දෙනවා, ලක්ෂ 50ක් දෙනවා, ලක්ෂ 100ක් දෙනවා වාගේ දේවල් කිව්වා. නමුත් මම සැප්තැම්බර් මාසයේ 13වෙනි දා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත පිළිබඳ විවාදයේදීත් ඇහුවා, ආණ්ඩුවේ මේ පිළිබඳව වූ ප්‍රතිපත්තිය කුමක්ද කියලා. ඒ වෙලාවේදීත් අදහසක් ඉදිරිපත් වුණේ නැහැ. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේදී ජනතාවට ඉඩම් සොයාගෙන නිවාස හදා ගන්න අවස්ථාව ලබා දුන්නොත්, ඒ අය අනිවාර්යයෙන්ම ඉඩමට අඩු මුදලක් වෙන් කරලා, නිවාසයට වැඩි මුදලක් වෙන් කරන්න ගිහින් ඒ ප්‍රශ්නය මත යළි යළිත් මෙවැනි අර්බුද ඇති විය හැකියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Amila Prasad, your time is up now.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙවැනි ආපදාවක් සිදු වූ අවස්ථාවකදී නිවාස යෝජනා ක්‍රමයක් අනුගමනය කරන්න පුළුවන් නම් හොඳයි කියලා මම ආණ්ඩුවට යෝජනා කරනවා. අඩු තරමින් තට්ටුවකට නිවාස හතර බැගින් තට්ටු පහකවත් නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්, ඒ හරහා මේ ව්‍යසනය ඇතුළෙන් අලුත් එළියක් ලංකාවට ගන්න පුළුවන්. මොකද, මෙවැනි අවස්ථාවකදී ලෝකයේ අනෙක් රටවල් අනුගමනය කරන ක්‍රමවේදය සහ අපි අනුගමනය කරන ක්‍රමවේදය අතර වෙනස්කම් තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරමින්, නගර ආසන්නව නිවාස ව්‍යාපෘති ඉදිකිරීම කෙරෙහි අවධානය යොමු කරලා, මේ ජනතාව ඒ විධියට නැවත පදිංචි කිරීමේ ක්‍රමවේදයක් ගැන ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මම කරනවා.

අවසාන වශයෙන් මම තව දෙයක් කියන්න කැමැතියි. මේ ක්‍රියාවලිය ඇතුළේදී ග්‍රාම නිලධාරින්ට මෙම ස්ථානවල ඡායාරූප අරගෙන, වීඩියෝ කරගෙන upload කරන්න කියලා කිසියම් number එකක් දුන්නා නම්, මීට වඩා කාර්යක්ෂමව මේ සහන සේවා කටයුතු සිද්ධ කරන්න තිබුණා. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය පැත්තෙන් එහෙම දෙයක් සිද්ධ නොවීම විශාල අඩුපාඩුවක් ලෙස අපි දකිනවා. ඒ වාගේම ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය භාර නියෝජ්‍ය ඇමති හැටියට ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියනවා, තමන්ගේ කාර්යභාරය ඉෂ්ට කරන්න කියලා. හොරකම් කරන්න විතරක් නොවෙයි, ඩිජිටල් අමාත්‍යාංශය තිබෙන්නේ. මේ වාගේ ව්‍යසනවලදී ඒ අමාත්‍යාංශය පැත්තෙනුත් අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින්, ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගැනත් ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියලා අවසාන වශයෙන් ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Vijitha Herath. You have 15 minutes.

[අ.භා. 1.19]

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනපේක්ෂිත විධියට අපේ රට ආපදා තත්ත්වයකට ලක් වුණා. ඒ ආපදා තත්ත්වයට ලක් වුණු පළමු මොහොතේම රජයක් විධියට, සියලු රාජ්‍ය යන්ත්‍රණ ශක්තිමත් කරන්න අපි සක්‍රියව මැදිහත් වුණා. ඒ වාගේම ක්ෂණිකව ආණ්ඩු පක්ෂ හා විපක්ෂ මන්ත්‍රීවරුන් සියලුදෙනා එකතු කරලා, මේ පාර්ලිමේන්තුවේදීත් ඒ පිළිබඳව තීන්දු තීරණ ක්ෂණිකව ගත්තා. එදා විපක්ෂයත් යෝජනා කළා, ඒ ඇති වුණු තත්ත්වය නිසා හදිසි නීතිය ප්‍රකාශයට පත් කරන්න කියලා. ඇත්තටම 27වැනි දා තමයි, ඒ බරපතළ තත්ත්වය ආරම්භ වුණේ. 28වැනි දාම අපි හදිසි නීතිය ප්‍රකාශයට පත් කළා. මහජන ආරක්ෂක ආඥාපනත යටතේ එලෙස හදිසි නීතිය ප්‍රකාශයට පත් කළේ, සියලු සේවා අත්‍යවශ්‍ය සේවා බවට පත් කරලා, මේ ව්‍යසනකාරී තත්ත්වයෙන් රටේ ජනතාවත්, ඒ හානියට පත් වුණු

ස්ථානත් කාර්යක්ෂමව යථා තත්ත්වයට පත් කරන්නයි. මේ සිද්ධිය ඇති වුණු අවස්ථාවේ ඉඳලා රටක් විධියට, ශ්‍රී ලාංකීය ජාතිය විධියට පාට, පක්ෂ, ජාති, ආගම්, කුල භේදයෙන් තොරව සියලුදෙනා එකමුතුව, එකාවන්ව මේ ව්‍යසන තත්ත්වයෙන් රට මුදාගන්න මැදිහත් වුණා. ඇත්තටම ඒකේ ප්‍රතිඵලයක් විධියට තමයි, ඉක්මනින්ම ඒ තත්ත්වය වෙනස් කර ගන්න අපට හැකියාව ලැබුණේ. ඒ සිද්ධිය ඇති වුණු 27වැනි දාම අපි අවශ්‍ය සියලු පාර්ශ්ව කැඳෙව්වා. ඒ වාගේම අවශ්‍ය දැනුම්දීම් සිද්ධ කළා. ගන්න ඕනෑ තීන්දු කඩිනමින් අපි එදාම ගත්තා. ඒත් එක්කම විපතට පත් වෙලා ඉන්න ජනතාව මුදාගැනීමේ මෙහෙයුම් අපි ආරම්භ කළා. ඒක තමයි ඒ අවස්ථාවේදී ඉක්මනින්, හදිසියේම කළ යුතුව තිබුණේ. ඒ සම්බන්ධයෙන් ත්‍රිවිධ හමුදාවම මැදිහත් වුණා. නාවික හමුදාව, ගුවන් හමුදාව, පාබල හමුදාව හා පොලිසිය යන සියලු පාර්ශ්ව තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් මැදිහත් වෙලා විපතට පත් වුණු, අතරමං වුණු ජනතාව මුදාගන්න කටයුතු කළා.

ඒ වාගේම ගරු අගමැතිතුමියත්, මමත් 28වැනි දාම සියලු රාජ්‍ය තාන්ත්‍රිකයන් කැඳෙව්වා. ඒ අවස්ථාවේ සහභාගි වෙන්න බැරි අයට Zoom තාක්ෂණය හරහා ඒ සාකච්ඡාවට සම්බන්ධ වන්න අවශ්‍ය ඉඩ පහසුකම් අපි සැපයුවා. ඒ වාගේම ඉන්දියාවේ නව දිල්ලියේ ඉන්න ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරියත් ඒ සාකච්ඡාවට අපි සම්බන්ධ කර ගත්තා. අපි වහාම ජාත්‍යන්තර ආධාර ඉල්ලා සිටියා; අපට ඉක්මනින්ම, හැකි පමණින් විපතට පත් ජනතාව මුදාගැනීම සඳහා උපකාර කරන ලෙස අපි ඔවුන්ගෙන් ඉල්ලා සිටියා. පැය 6ක් යනකොට අසල්වැසි ඉන්දියාව ඔවුන්ගේ choppers දෙකක් විපතට පත් වුණු ජනතාව මුදාගන්න ලංකාවට එව්වා. විවිධ තැන්වල අතරමං වෙලා හිටපු ජනතාව ඒ යානා දෙක මඟින් මුදාගන්න හැකියාව ලැබුණා. ලංකාවේ ගුවන් හමුදාවට අයත් ගුවන්යානා, හෙලිකොප්ටර් යානාවලට අමතරව, ඉන්දියානු රජය මඟින් ක්ෂණිකව ලබා දුන් යානා දෙකත් කඩිනමින් ඒ operation එකට මැදිහත් වුණා.

ඒ වාගේම පාකිස්තානයත් අපට ඉක්මනින්ම හෙලිකොප්ටර් යානයක් ලබා දුන්නා. ඒ හෙලිකොප්ටර් යානය හරහා විවිධ තැන්වල අතරමං වෙලා හිටපු අය මුදාගන්න අපට පුළුවන් වුණා. සිද්ධිය වෙලා පැය 24ක් යනකොටම ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ඉල්ලපු සහයෝගයට ප්‍රතිචාර ලැබුණා. ඇත්තටම ගත්තොත්, ලෝකයේ සියලුම රටවල් වාගේ අපට මූල්‍යමය වශයෙන් උදවු කළා; ද්‍රව්‍යමය වශයෙන් උදවු කළා; වෛද්‍ය කණ්ඩායම් එව්වා. ආහාර ද්‍රව්‍ය වාගේම මෙවැනි ආපදා තත්ත්වයකදී අත්‍යවශ්‍ය වන විවිධ ද්‍රව්‍ය ගුවන්යානාවලින්, නැව්වලින් ඒ රටවල් තවමත් අපට ලබා දෙමින් තිබෙනවා. ඒ නිසා රජයක් විධියට, රටක් විධියට ඒ සියලු රටවලට අපේ ස්තුතිය පිරිනමනවා. එතැනදී භේදයක් තිබුණේ නැහැ. පාකිස්තානය සහ ඉන්දියාව අතර ප්‍රශ්න තිබුණත්, ලංකාව සම්බන්ධයෙන් මැදිහත් වෙද්දි ඒ දෙපාර්ශ්වයම අපේ මිතුරන් විධියට මැදිහත් වුණා; තවමත් මැදිහත් වනවා.

ඒ විතරක් නොවෙයි, ලතින් ඇමෙරිකානු කලාපයේ රටවල් ද එහෙමයි. බ්‍රසීලය කියන්නේ, අපේ රටට ඈතින් පිහිටි රටක්. නමුත්, බ්‍රසීලයේ ඉඳලා එවන සමහර උපකරණ අපට තවමත් ලැබෙමින් පවතිනවා. අපට ඈතින් පිහිටි ලතින් ඇමෙරිකානු කලාපයේ, අප්‍රිකානු කලාපයේ රටවල් පවා අපට උදවු කළා; උදවු කරමින් පවතිනවා. විවිධ රාජ්‍ය නායකයින්, විදෙස් අමාත්‍යවරුන් ලංකාවේ ඇති වෙච්ච තත්ත්වය පිළිබඳව තමන්ගේ කනගාටුව ප්‍රකාශ කළා. අපේ ජනාධිපතිතුමා, අපේ අගමැතිතුමිය ඉන්දියානු අග්‍රාමාත්‍යවරයාට, ඒ වාගේම පාකිස්තානු අගමැතිතුමාට, භූතානයේ, නේපාලයේ රාජ්‍ය නායකයින්ට දුරකථන මඟින් කථා කරලා ඔවුන් කරපු උපකාරයට ස්තුතිය පිරිනැමුවා; අපේ දුක බෙදාගත්තා. ඒ අයගේ උදවු උපකාර අපට ලැබුණා. අපට ආසන්නම රට වෙච්ච මාලදිවයිනත් එහෙමයි. ඇත්තටම හිතාගන්න බැරි විධියට මාලදිවයිනේ ජනතාවත්, එහි ජීවත් වන ශ්‍රී ලාංකිකයිනුත් මාධ්‍ය හරහා මෙන්ම විවිධ සාමූහික ක්‍රියාකාරකම් මඟිනුත් එකතු වෙලා අපේ රටට මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර උපකාර කළා. තවමත් ඒ campaign එක යනවා. මේක හිතාගන්න බැරි එකක්. අපට දැනුණා, අපට තේරුණා, රටක් විධියට අපි තනිවෙලා නැහැ කියලා. මේ අවස්ථාවේදී මුළු ලෝකයම අපිත් එක්ක අත්වැල් බැඳගත්තා. අපිත් එක්ක හදවතින්ම ඉන්නවා කියන පණිවුඩය ඒ අවස්ථාවේ ඒ සියලුම රටවල් අපට ලබා දුන්නා. අදටත් ඒ සහයෝගය ඔවුන් අපට ලබා දෙමින් තිබෙනවා.

ඒ ඇති වෙච්ච ව්‍යසනකාරී තත්ත්වයේ මුල් අවස්ථාවේදී අවශ්‍ය වුණේ ජීවිත බේරාගැනීම වාගේම ඉක්මන් සහන සැපයීම. ඒ ඉක්මන් සහන සැපයීමේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ සියලුම ආයතන වාගේ අපට උදවු උපකාර කළා. විශේෂයෙන් ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව, ලෝක ආහාර සංවිධානය, UNICEF එක තවමත් අපට උදවු කරමින් පවතිනවා. ඒ සියලුම සංවිධාන සක්‍රියව මැදිහත් වෙලා ලංකාවේ විපතට පත් වෙච්ච ජනතාවට මූල්‍යමය වශයෙන් සහ ද්‍රව්‍යමය වශයෙන් උදවු කරනවා. ඒ විතරක් නොවෙයි, ලංකාව තුළ ක්‍රියාත්මක වන සිවිල් සංවිධානත් එහෙමයි. ඒ සිවිල් සංවිධාන නියෝජනය කරන ප්‍රධානීන් අපි කැඳෙව්වා. කැඳවා අපි ඔවුන්ටත් කිව්වා, මේ ව්‍යසනකාරී අවස්ථාවේදී රජයත් එක්ක ඒකාබද්ධව මේ කටයුතු සඳහා මැදිහත් වන්න කියලා. ඒ අනුව ඒ සිවිල් සංවිධානත් මේ කටයුතුවලට සක්‍රියව මැදිහත් වන්න පටන් ගත්තා. ජාත්‍යන්තර සිවිල් සංවිධානත් ඒ අයට පුළුවන් ආකාරයට ලංකාවේ විපතට පත් වෙච්ච ජනතාවට උදවු උපකාර කරන්න මැදිහත් වුණා, මැදිහත් වෙමින් පවතිනවා.

ඒ වාගේම තමයි, මේ විපත ආරංචි වෙච්ච පළමු මොහොතේ ඉඳලාම ලෝකය පුරාම විසිරිලා ඉන්න ශ්‍රී ලාංකිකයින් ස්වේච්ඡාවෙන් අපේ රටට ආධාර, උපකාර කරන්න මැදිහත් වුණා; තවමත් මැදිහත් වෙමින් ඉන්නවා. මේ operation එක ක්‍රියාත්මක කරන්න අපි 28වැනි දාම විදේශ කටයුතු අමාත්‍යාංශයේ විශේෂ හදිසි ඒකකයක් පිහිටෙව්වා. සංචාරකයින් අතරමං වෙලා සිටිනවා නම් ඔවුන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා සංචාරක අමාත්‍යාංශයේ, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ විශේෂ මෙහෙයුම් ඒකකයක් අපි ක්ෂණිකව පිහිටෙව්වා. හදිසි දුරකථන අංකයක් අපි ලබා දුන්නා, කොහේ හරි තැනක සංචාරකයෙක් අතරමං වෙලා ඉන්නවා නම් වහාම ඒ පිළිබඳව දැනුම් දෙන්න කියලා. ඒ දැනුම් දීමට අනුව අපි මැදිහත් වුණා. මේ ව්‍යසන තත්ත්වයේදී සංචාරකයින් ලක්ෂ ගණනක් රට තුළ හිටියා. මම සතුටින් කියනවා, එකදු සංචාරකයෙකුටවත් ජීවිත හානියක් ඇති වෙන්න අපි ඉඩ දුන්නේ නැහැ කියන කාරණය. අපි ඔවුන්ගේ ජීවිත බේරා ගත්තා. අපි සමත් වුණා, රටක් විධියට කිසිදු සංචාරකයෙකුගේ ජීවිතයට හානියක් නොවන ආකාරයට ඒ සංචාරකයින්ව ආරක්ෂා කර ගන්න. ඒක විශාල කැප කිරීමේ ප්‍රතිඵලයක්. ඒ වාගේම විදේශගත ශ්‍රී ලාංකිකයෝ විවිධ දුෂ්කරතා මැද්දේ ජීවත් වෙන ගමන්, රැකියා කරන ගමන් විදේශවල තිබෙන ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට, මහ කොමසාරිස් කාර්යාලවලට තමන්ගේ ධනය පරිත්‍යාග කරන්න, තමන් උපයා ගත් මොනවා හරි බඩු භාණ්ඩ තිබෙනවා නම් ඒවා ගෙනැල්ලා පරිත්‍යාග කරන්න මැදිහත් වුණා. මුදල් අමාත්‍යාංශයෙන් ඒ සම්බන්ධයෙන් ක්ෂණික තීන්දුවක් ගත්තා. ඒ අනුව, ගිණුම් අංක 6ක් පළමු අවස්ථාවේදී හඳුන්වා දුන්නා. අපි සියලු තානාපති කාර්යාලවලට ඒ ගිණුම් අංක ලබා දුන්නා. ඒ වාගේම ඒ රටවල ඉඳලා මුදල් එවන්න බැරි නම් ඒ තානාපති කාර්යාලවලට, මහ කොමසාරිස් කාර්යාලවලට මුදල් ලබා දෙන්න අපි ඉක්මනින් ගිණුම් විවෘත කරලා, ඒ ගිණුම්වලට මුදල් ලබා දෙන්න කියාත් ඉල්ලීමක් කළා. ඒකට මුදල් අමාත්‍යාංශයෙන් විශේෂ අවසරයක් අපි ලබා ගත්තා. මොකද,

[ගරු විජිත හේරත් මහතා]

සමහර දේවල් ක්ෂණිකව කරන්න ගියාම නීත්‍යානුකූල ගැටලු මතු වෙනවා. ඒ නිසා අපි ඉක්මනින් ඒ නීත්‍යානුකූල ගැටලුත් විසඳාගෙන මේ ගිණුම්වලට මුල්‍ය උපකාර කරන්න දැනුම් දීලා තිබෙනවා. ඒ ක්‍රියාවලිය හරහා විශාල වශයෙන් අපට ආධාර උපකාර ලැබෙමින් තිබෙනවා.

ඒ වාගේම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත්, මුදල් අමාත්‍යාංශයත්, Sri Lanka Customs එකත්, එහි නිලධාරිනුත්, ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරිනුත් ක්ෂණිකව සම්බන්ධ කරගෙන වරායේ විශේෂ බහලුම් ඒකකයක් පිහිටෙව්වා. ඒ බහලුම් ඒකකයට නිලධාරි කණ්ඩායමක් යෙදෙව්වා. විදේශ රටවලින්, විවිධ සංවිධානවලින්, ශ්‍රී ලාංකිකයින්ගෙන් ලැබෙන සියලු ද්‍රව්‍යමය ආධාර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ලිපිනයට එවන්න කියා දැනුම් දුන්නා. ඒ ලිපිනයට එවන දේවල් මම කලින් කිව්ව බහලුම් මධ්‍යස්ථානයට යනවා. එතැනින් ඒ දේවල් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට එනවා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් රටේ විපතට පත් වෙච්ච දිස්ත්‍රික්කවලට ප්‍රමුඛතා පදනම මත දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා, ප්‍රාදේශීය ලේකම්වරු හරහා වාගේම ග්‍රාම නිලධාරි හරහා ගමේ ජනතාවට ඒවා බෙදා හරින යන්ත්‍රණය ක්‍රියාත්මක කළා. මුදල් අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය ඒකාබද්ධව වරාය තුළ අපි ඉක්මනින් ඒකකයක් පිහිටුවලා ඒක ක්‍රියාත්මක වුණා. ඒ නිසා මේ සිදුවීම ඇති වෙච්ච ගමන් ඒ ඒකක ස්ථාපිත කරලා ක්ෂණික මැදිහත්වීම් අපි සිදු කරනු ලැබුවා. ඒකේ ප්‍රතිඵලයක් විධියට අද අපි මේ ව්‍යසනකාරී තත්ත්වයට හොඳින් මුහුණ දීලා, ඒ ජනතාව එයින් මුදා ගන්නත්, ඒ ජනතාවට අවශ්‍ය කරන සහන සපයන්නත් සමත් වෙලා තිබෙනවා. යම් තැනක, දෙකක අඩුපාඩු සිදු වෙනවා. මේ වාගේ මහා ව්‍යසනයක් ඇති වුණාම එවැනි කලබලකාරී තත්ත්වයකදී අඩුපාඩු වෙනවා. මොකද, සන්නිවේදනයේ ප්‍රශ්න ඇති වුණා; දුරකථන වැඩ කළේ නැහැ; ප්‍රවාහන පහසුකම් තිබුණේ නැහැ; සමහර තැන්වලට යන්න බැහැ. අදත් මීමුරේ ගමට යන එක බාධාවක් වෙලා තිබෙනවා. ඉතින්, එහෙම බාධා මැද්දේ තැනක, දෙකක අඩුපාඩුවක්, දෙකක් වෙන්න ඇති. එවැනි අඩුපාඩුවක්, දෙකක් පෙන්වා දීලා ඒකෙන් මේ සමස්ත දැවැන්ත කාර්යභාරය හෑල්ලුවට ලක් කරන්න දෙන්න බැහැ. ඇත්තටම බොහෝ තැන්වලදී විපක්ෂයේ බොහෝ දෙනා මේ වෙනුවෙන් සහයෝගය ලබා දුන්නා. ආපදාවට පත් වෙච්ච අවස්ථාවලදී ගම්වල හිටපු ජනතාව පක්ෂය මොකක්ද, ජාතිය මොකක්ද කියලා බැලුවේ නැහැ. කවුරුත් එකා වාගේ ඒ වෙනුවෙන් මැදිහත් වුණා. එක්කෙනෙක්, දෙදෙනෙක් සමහර වාචාල කථා දෙකතුනක් කිව්වාට, පොදුවේ ගත්තාම විපක්ෂයේ බහුතරයක් දෙනා මේ ක්‍රියාවලියේදී රටක්, ජාතියක් විධියට එකට වැඩ කළා. එහෙම වාචාල කථා කියන එක්කෙනෙක්, දෙන්නෙක් හැමදාමත් ඉන්නවා. ඒ අය ගැන අපි අනුකම්පා කරනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආපදා තත්ත්වය මධ්‍යයේදීත් අපි සංචාරකයින් කැඳවා ගැනීම ඉතාම සක්‍රියව පවත්වාගෙන ගියා. දෙසැම්බර් මාසයේ පළමු දවස් 10 ඇතුළත සංචාරකයෝ 93,000ක් ලංකාවට ඇවිල්ලා තිබෙනවා. මේ වෙනකොට මිලියන 2.2ක් -ලක්ෂ 22ක්- සංචාරකයින් ලංකාවට පැමිණ තිබෙනවා. 2018 අවුරුද්ද තමයි, වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් ලංකාවට ආපු වර්ෂය. මේ අවුරුද්දේ අපට ඉලක්කයක් තිබුණා. හැබැයි, මේ ආපදා තත්ත්වය නිසා එහි යම් වෙනසක් වෙයි කියලා අපි හිතුවා. නමුත්, ඇත්තටම සංචාරකයින්ගේ පැමිණීම ඉතාම හොඳින් සිද්ධ වෙනවාය කියන එක අපි සතුටින් කියනවා. ඒ වාගේම අපි ඒ සම්බන්ධයෙන් ආඩම්බර වනවා. සංචාරකයින් පැමිණීම හරහා ඩොලර් බිලියන 3 ඉක්මවා ආදායම ගන්න තැනට අපි මේ වනකොට ඇවිල්ලා තිබෙනවා. ඒකත් අපි ආරක්ෂා කර ගත්තා. ඒකත් රටක් විධියට අපි ලබපු ජයග්‍රහණයක් කියන එක මම මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදේ ප්‍රශ්නයක් මතු කරමින් ලොකු භයක් ඇති කළා, මේ තත්ත්වය නිසා ලොකු අර්බුදයක් වෙනවා, තව මාස දෙකතුනකින් ආර්ථිකයේ ලොකු කඩා වැටීමක් සිද්ධ වෙනවා, ගෑස් නැති වෙනවා, ගෑස් හිඟයක් ඇති වෙනවා, රට ලොකු අර්බුදයකට මුහුණ දෙනවා කියලා. මේ වාගේ දේවල් හරහා ජනතාව බිය වද්දන්න උත්සාහ කරනවා. ඒක ඉතාම පහත්, නින්දිත උත්සාහයක්. එහෙම කිසිදු භයක් ඇති වෙන්න දෙයක් නැහැ. ආර්ථිකය ශක්තිමත්ව ඉස්සරහට යනවා. වැටුණු තැනින් අපි ඊටත් වඩා හොඳට ශක්තිමත්ව නැඟිටිනවා. ඒ ධෛර්යය මේ රටේ ජනතාවට තිබෙනවා. ඒ නිසා විපක්ෂයේ එක්කෙනෙක්, දෙන්නෙක් ඔය වාගේ කට කැඩිච්ච කථා කිව්වාට, බොරු භය ඇති කරලා ජනතාව බිය වද්දන්න හැදුවාට, ජනතාව ඒවා පිළිගන්නේ නැහැ. ජනතාව අද සූදානම්, මේ තත්ත්වයෙන් රට ගොඩ ගන්න.

කිසිසේත්ම ගෑස් හිඟයක් ඇති වෙන්නේ නැහැ. පසුගිය දින කිහිපයේදී ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රමවේදයට අනුව ටෙන්ඩර් කැඳවීමක් සිදු වුණා. ඒ ටෙන්ඩර්වලට අනුව අලුත් සමාගමක් තෝරා ගත්තා. පසුගිය දවස්වල ගෑස් ලබා දුන්නේ ඕමාන සමාගම තමයි. ඕමාන සමාගමට වඩා ඩොලර් ශත 15ක් අඩුවෙන් අලුත් සමාගමක් ටෙන්ඩරයට bid කළා, ඉල්ලුම් කළා. ඒ අනුව එම ටෙන්ඩර් කමිටුව මඟින් අලුත් සමාගමක් වන ස්විට්සර්ලන්තයේ Geogas සමාගමට ඒ ටෙන්ඩරය ලබා දුන්නා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, your time is up.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඒ ගිවිසුම් අත්සන් කරලා තිබෙන්නේ. නමුත්, ඒ ගිවිසුම් අත්සන් කරලා නැහැ කිව්වා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. ඒ ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. තත්ත්ව පරීක්ෂා කරන්නත් ඒගොල්ලන් අනුමැතිය ලබා දීලා තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් කිසිම ගැටලුවක් නැහැ. තත්ත්ව පරීක්ෂා කරනවා. පළමුවැනි නැව ජනවාරි මාසයේ 5වැනි දා වෙනකොට ලංකාවට එනවා. ඒ නිසා අලුත් සමාගමෙන් අලුතින් ගෙන්වන ගෑස් ලබන මාසයේ 5වැනි දා වෙනකොට ලංකාවට එනවා. ඒ අනුව, කිසිදු ආකාරයකින් රටේ ගෑස් හිඟයක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා බොරු බිය වැද්දීම් කරන්න එපා. ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. මේ ඇති වෙච්ච ආපදා තත්ත්වයට මුහුණ දීලා, මේ කඩාගෙන වැටුණු රට ඒ තත්ත්වයෙන් මුදා ගන්න අපි සියලු දෙනාම එකතුවෙලා, එකාවන්ව නැඟිටිනවා. ඒ අධිෂ්ඨානය අපට තිබෙනවා. අපි ඒ අධිෂ්ඨානයෙන් යුක්තව ඉස්සරහට යමු.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) Chamindranee Kiriella. You have six minutes.

[අ.භා. 1.36]

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලැබිලා තිබෙන විනාඩි 6ක කෙටි කාලය තුළ විශේෂයෙන් මම නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රශ්න සම්බන්ධව මේ සභාවේ අවධානය යොමු කරවන්න බලාපොරොත්තු වෙනවා. මේ ඇති වුණු ව්‍යසන තත්ත්වය හේතුවෙන් වැඩිම මරණ සංඛ්‍යාවක් සිදු වෙමින්, වැඩිම ප්‍රදේශ ගණනාවක් ව්‍යසනයට පත් වුණේ මහනුවර දිස්ත්‍රික්කයේ බව අපි දන්නවා. අදත් අපි දැක්කා, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් උඩුදුම්බර, මැදදුම්බර සහ දොළුව යන ප්‍රදේශවලට නාය යෑම් පිළිබඳව රතු නිවේදන නිකුත් කර තිබෙනවා. උඩුදුම්බර ප්‍රදේශයට මිලිමීටර් 200ට වැඩි වර්ෂාපතනයක් ලැබෙන බවට වාර්තා වෙලා තිබෙන මොහොතක තමයි මට අද මේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබුණේ.

ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට පැමිණිලා සඳහන් කරනවා අපි දැක්කා, මේ ආපදාවෙන් පීඩාවට පත් පුද්ගලයින්ට මූලික පියවරක් වශයෙන් රුපියල් 25,000ක දීමනාවක් ලබා දෙනවා කියලා. නමුත්, එය හරියට සිදු නොවීම ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. මොකද, මහනුවර දිස්ත්‍රික්කය ගැන කථා කළොත්, දෙසැම්බර් මාසයේ 15වැනි දා වෙනකොට ලැබුණු වාර්තා අනුව මහනුවර දිස්ත්‍රික්කයේ පවුල් 51,596ක් ආපදාවට ලක් වෙලා තිබෙනවා. නමුත්, මේ රුපියල් 25,000ක මුදල වෙන් කරලා තිබෙන්නේ පවුල් 21,431කට විතරයි. කෙටියෙන් කිව්වොත්, මහනුවර දිස්ත්‍රික්කයේ ආපදාවට ලක් වුණු පවුල් 30,000කට ආසන්න ප්‍රමාණයකට ඒ රුපියල් 25,000 වෙන් කරලා නැහැ. ගරු විජිත හේරත් අමාත්‍යතුමා මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා. එතුමා මේ රජයේ ඉන්න ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්. ඒ නිසා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා මම එතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මොකද, මම කලින් කිව්වා වාගේ, මහනුවර දිස්ත්‍රික්කයේ ආපදාවට ලක් වුණු පවුල් 51,596න්, සියයට 50කටවත් මේ රුපියල් 25,000 වෙන් කරලා නැහැ. මොකද, රුපියල් 25,000 ලබා දීමේ මාර්ගෝපදේශයට අනුව, පූර්ණ හානියට පත් වූ නිවෙස්, අර්ධ හානියට පත් වූ නිවෙස් වාගේම නිවාස හානියක් සිදු නොවුණද සුළු ගංවතුර තත්ත්වයකට ලක් වූ නිවාස ද ඒ සඳහා සුදුසුකම් ලබන නිසා විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කයේ ආපදාවට ලක් වුණු පවුල්වලින් සියයට 50කටත් වැඩි ප්‍රමාණයකට රුපියල් 25,000 බැගින් ලබා දෙන්න අද වනකොට මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

මේ රුපියල් 25,000 ලබා දීමේ ප්‍රගතිය පිළිබඳව අපි බැලුවොත්, මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් නිකුත් කර තිබෙන වාර්තාවකට අනුව රුපියල් 25,000 මුදල ලබා දී තිබෙන්නේ සමහර ප්‍රදේශවල සියයට 20කටත් වඩා අඩු පවුල් ප්‍රමාණයකටයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන්ම උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් 3,000ක් වෙනුවෙන් මේ රුපියල් 25,000 වෙන් කර තිබුණත්, අද වෙනකොට ඒ මුදල පවුල් 627කට විතරයි ලබා දීලා තිබෙන්නේ. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් 1,000කට ඒ මුදල වෙන් කර තිබුණත්, පවුල් 329කට විතරයි අද වනකොට ලබා දීලා තිබෙන්නේ.

පන්විල පවුල් 1,105කට මේ රුපියල් 25,000 වෙන් කර තිබුණත්, අද වෙනකොට පවුල් 248කට විතරයි ලබා දීලා තිබෙන්නේ. ඒ වාගේම උඩුදුම්බර පවුල් 800කට රුපියල් 25,000 වෙන් කර තිබුණත්, පවුල් 143කට විතරයි ලබා දීලා තිබෙන්නේ. මිනිපේ පවුල් 1,000කට එම මුදල වෙන් කර තිබුණත්, පවුල් 344කට විතරයි ලබා දීලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රුපියල් 25,000ක මුදල ඒ අයට ඉතාම වටිනවා. මොකද, මේ අවස්ථාව වනවිට එම ජනතාවට තමන්ගේ නිවෙස්වල තිබෙන හැම දේම නැති වෙලා. නමුත් අඩුම වශයෙන් මූලික පියවරක් වශයෙන් වෙන් කරපු මේ රුපියල් 25,000වත් ලබා දීලා නැහැ. ඒ නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරන්නට කියා මා ඉල්ලා සිටිනවා.

මම පසුගිය දවස්වල දොලුව ප්‍රදේශයේ තිබෙන කඳවුරු කිහිපයකට ගියා. දොලුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රජතලාව ගම්මානයේ පවුල් 321ක් දැනට අවතැන් වෙලා සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම ජනතාව පන්විලතැන්න ශ්‍රී රණසිංහාරාම විහාරස්ථානයේ තමයි මේ දිනවල සිටින්නේ. නමුත් අද වනතෙක් කිසිම රාජ්‍ය අනුග්‍රහයක් එම කඳවුරට ලැබී නැහැ. විශේෂයෙන්ම මේ අවස්ථාවේ මම මතක් කරන්න ඕනෑ, පූජ්‍ය මයිලපිටියේ සමිද්ධිවංශ ස්වාමීන් වහන්සේව. උන්වහන්සේ දන්නා කට්ටිය සහ ගමේ කට්ටිය තමයි අර අවතැන් වුණු පවුල් 321කට අද වෙනකම් ආහාරපාන ඇතුළු සියලු දේවල් ලබා දෙන්නේ. කිසිම රාජ්‍ය අනුග්‍රහයක් අද වෙනකම් එම කඳවුරට ලැබී නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිල්ලඹ ගමේ තිබෙන ප්‍රධාන පාරක් තමයි ගුරුකැලේ සිට ගොඩවත්ත හරහා එලර්ටන් හෝටලය අසලින් යන ප්‍රධාන මාර්ගය. එම මාර්ගයේ කිලෝමීටරයක් විතර මේ වනවිට කැඩිලා තිබෙන්නේ. ඒ සම්බන්ධවත් අවධානය යොමු කරන්න කියන ගමන්, විශේෂයෙන්ම ගම්පොළ නගර සභාව ගැනත් කෙටියෙන් සඳහන් කරන්න මා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, ගම්පොළ නගර සභාව ගැන විශේෂයෙන්ම මේ දිනවල මාධ්‍ය තුළ නොයෙකුත් අදහස් දැක්වුණා. ගම්පොළ නගර සභාවේ සභාපති වන අපේ සමගි ජන බලවේගයේ ඉරුක වීරරත්න මැතිතුමා ඇතුළු ගම්පොළ ආසනයේ සමගි ජන බලවේගයේ සංවිධායක අසේල අමරසේන මැතිතුමා විශාල කාර්යභාරයක් මේ ව්‍යසනයෙන් පසුව සිදු කළා. සාමාන්‍යයෙන් දවසකට කුණු ටොන් 15ක් විතර තමයි එම නගර සභාවෙන් ඉවත් කරන්නේ. නමුත් මේ ව්‍යසනයෙන් පසුව කුණු ටොන් 25,000ක් පමණ ගම්පොළ නගර සීමාවේ තිබුණා. ඉතින් දවසකට කුණු ටොන් 15ක් ඉවත් කරන මේ නගර සභාවට -එය සතු සීමිත සම්පත් එක්ක- අපි දළ වශයෙන් ගණනය කළොත්, මේ සති 3 ඇතුළත දිනකට ටොන් 1,300ක් විතර අයින් කරන්න අවශ්‍ය වුණා, මේ සිදු වුණු ව්‍යසනය නිසා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ව්‍යසනය නිසා විශේෂයෙන්ම ගම්පොළ නගරය විසාලා නුවරක් බවට පත් වුණා. මම හිතන විධියට, ගම්පොළ නගරයෙන් සියයට 75ක්ම ගංවතුරට යට වෙලා විශාල ආපදාවකට ලක් වුණා, එම ජනතාව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, your time is up.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එම නගර සභාව සතුව සීමිත සම්පත් ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. සේවකයින් 60දෙනෙක්, බැකෝ යන්ත්‍ර එකක් සහ ට්‍රැක්ටර් දෙකක් තිබුණේ. ඒ තිබෙන සීමිත සම්පත් එක්ක තමයි එම නගර සභාවට මේ ව්‍යසනයෙන් පසු තත්ත්වයට මුහුණ දෙන්නට සිදු වුණේ. මම කලින් කියපු ආකාරයට අපේ සභාපතිතුමා මෙන්ම ආසන සංවිධායකත්, ඒ වාගේම ජාතික ජන

[ගරු නිතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය ]

බලවේගයේ ගම්පොළ නියෝජනය කරන මන්ත්‍රීතුමාත් එම අවස්ථාවේදී සහාය ලබා දුන්නා. ඒ වාගේම අපේ තවත් සභා රාශියක විශේෂයෙන්ම කාත්තන්කුඩි සහ බෙන්තර නගර සභාවල සාමාජිකයන් ඇවිල්ලා ගම්පොළ නගරය පවිත්‍ර කරන්න උදවු කළා. ඒ අනුව, අද වෙනකොට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගම්පොළ නගරයෙන් කුණු කසළ සියයට 75ක්ම ඉවත් කිරීමට එම නගර සභාවට හැකි වෙලා තිබෙනවා, විශේෂයෙන්ම මේ සියලු දෙනාගේම උදවු උපකාර නිසා. ඒ ගැනත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sunil Handunnetti. You have 15 minutes.

[අ.භා. 1.43]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආපදාව නිසා අපේ රටේ ජනතාවගෙන් විශාල පිරිසක් විපතට පත් වුණා වාගේම, කර්මාන්ත ව්‍යාපාර විශාල ප්‍රමාණයකුත් හානියට පත් වුණා. මේ විපත එන්න කලින් අපේ කර්මාන්ත අමාත්‍යාංශය ව්‍යාපාර කර්මාන්ත පිළිබඳ දත්ත එකතු කිරීමේ වැඩසටහනකයි හිටියේ. ඒක අපිට පහසුවක් වුණා, මේ විපතෙන් පස්සේ කර්මාන්තවලට සිදු වී තිබෙන හානිය පිළිබඳව දත්ත, තොරතුරු ඉක්මනින් ලබා ගැනීමට.

ඊයේ වනවිට අපේ දත්ත පද්ධතියට කර්මාන්ත ව්‍යාපාර 29,649ක් ලියාපදිංචි වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒවායෙන් 10,000කට වැඩි ප්‍රමාණයකට සිදු වී තිබෙන හානිය පිළිබඳව අපි දැනටමත් අදාළ කර්මාන්ත ව්‍යාපාර ස්ථානවලටම ගිහිල්ලා හඳුනා ගෙන තිබෙනවා.

මෙහිදී ක්ෂුද්‍ර - micro-level - ව්‍යාපාර හැටියට 12,300ක්, කුඩා - small - ව්‍යාපාර හැටියට 9,844ක්, මධ්‍යම - medium-level - ව්‍යාපාර හැටියට 6,644ක් සහ විශාල පරිමාණයේ ව්‍යාපාර හැටියට 861ක් තිබෙනවා. ඒකෙන් 685ක් තිබෙනවා, හැම මට්ටමේම අපනයන කර්මාන්ත. ඉතින් ඒ කර්මාන්තවලට යළි නැඟී සිටීම සඳහා වන විශේෂ වැඩසටහනක් රජය හැටියට අපි ක්‍රියාත්මක කරනවා. රජයේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ඇතුළේ ලියාපදිංචි වෙලා තිබෙනවාද, නැද්ද කියන එක කෙසේ වෙතත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා, ග්‍රාම නිලධාරින් හරහා, අපේ අමාත්‍යාංශයේ ගම් මට්ටමේ නිලධාරින් හරහා ඔවුන්ගේ විපත පිළිබඳව අපේ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය දැනුවත් කරන විගසින් අපි ඒ ව්‍යාපාර ලියාපදිංචි කර ගන්නවා. එහෙම ලියාපදිංචි කරන හැම ව්‍යාපාරයකටම, කර්මාන්තයකටම අපි පළමු පියවර හැටියට රුපියල් 200,000ක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඊයේ හවස වෙනකොට මුදල් අමාත්‍යාංශය අපේ අමාත්‍යාංශයට රුපියල් බිලියනයක මුදල් ප්‍රතිපාදනයක් ලබා දුන්නා. මේ කර්මාන්ත ව්‍යාපාර විසිනවදහස් ගණන අතරින් කර්මාන්ත 9,628ක් සඳහා අපි ඊයේ හවසම රුපියල් බිලියන 105ක් දිස්ත්‍රික්ක 17කට ලබා දීලා තිබෙනවා. මේ සති දෙක ඇතුළත අපි තවදුරටත් ඒ මුදල් ලබා දෙන්න කටයුතු කරනවා. ඒ වාගේම කෘෂි ක්ෂේත්‍රයේ ව්‍යාපාර, කර්මාන්ත 2,498ක් සහ සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාර 634ක් තිබෙනවා. ඒ වාගේම මේ 29,649 අතරේ "වෙනත්" කියන category එක යටතේ 8,265ක් තිබෙනවා. ඒ හැම එකකටම අපි මේ ප්‍රතිපාදන ලබා දෙන්න කටයුතු කර තිබෙනවා; කටයුතු කරමින් ඉන්නවා.

ඊට අමතරව අපි ඊයේ දවසේදී බැංකු ප්‍රධානීන්, ණය ආයතනවල ණය අංශවල නිලධාරින්, මහ බැංකුවේ නියෝජිතයන් සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් කැඳවලා ඔවුන් සමඟ සාකච්ඡා කළා, ව්‍යාපාර, කර්මාන්ත යළි නඟා සිටුවීම සඳහා අවශ්‍ය පහසුකම් දෙන්නේ කොහොමද කියලා. විශේෂයෙන්ම ණය අරගෙන තිබෙන අයට අමතර ගෙවීම් කිසිවක් නැතුව තමන්ගේ ණය පියවීමට මාස 3-6 අතර සහන කාලයක් ලබා දෙනවා. අපි දැක්කා, කලින් වතාවලදී -කොවිඩ් වසංගතය කාලයේදීත්- ණය දෙනකොට ණය නැවත පොලී බවට පත් කළ ආකාරය. ඒ කියන්නේ, ඒ පොලිය ණයක් බවට පත් කළා. නමුත් එහෙම අමතර කිසිදු පොලියක් හෝ අමතර ගාස්තු අය කිරීමකින් තොරව මාස 3-6 අතර කාලයක් සඳහා ණය ගෙවීම දීර්ඝ කරන්න අවශ්‍ය මාර්ගෝපදේශ දැන් බැංකුවලින් නිකුත් කරලා තිබෙනවා. අදාළ ව්‍යාපාර, කර්මාන්ත හානි වෙච්ච, ණය ගෙවන්න තිබෙන අය තමන්ගේ බැංකුවට ගිහිල්ලා ඒ ඉල්ලීම කරන්න ඕනෑ.

ඇත්තටම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, මේක මහා විපතක් බව. සමහර විට ඒගොල්ලන්ට තවම ඒ ව්‍යාපාර, කර්මාන්ත පිළිබඳව හිතන්නවත් කාලයක් නැහැ. ඒ නිසා අපි hotline number එකක් දුන්නා; QR code එකක් දුන්නා; අපි මාධ්‍යවලින් බොහෝ වෙලාවට මේ පිළිබඳව දැනුවත් කළා. ඒ වුණත් ලියාපදිංචි වෙන්න තවත් අය ඉන්නවා කියලා මම විශ්වාස කරනවා; මේ විසිනවදහස් ගණනට වඩා ඉන්නවා කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මහජන නියෝජිතයන් හැටියට ඔබතුමන්ලාගෙනුත් අපි ඉල්ලීමක් කරනවා, ඔබතුමන්ලාගේ ප්‍රදේශවල ඉන්න ව්‍යාපාර, කර්මාන්ත කරන අයට කියන්න, මේ සඳහා පොඩි form එකක් තිබෙන්නේ, පුරවලා භාර දෙන්න කියලා.

ඊළඟට, මහ බැංකුව දැනටමත් මාර්ගෝපදේශ නිකුත් කර තිබෙනවා, සියයට 3ක අඩු පොලී ණයක් ලබා දෙන්න. මොකද, ගරු ජනාධිපතිතුමා පසුගිය අය වැයේදී ඉදිරිපත් කළ ආකාරයට ව්‍යාපාර, කර්මාන්තවලට ණය පහසුකම් ලබා දෙන්න අපට රුපියල් මිලියන 80,000ක් වෙන් වනවා. ඒකෙන් සියයට 3ක පමණ අඩු පොලියකට ණය පහසුකම් ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම අපි අපේ අමාත්‍යාංශය හරහා ලියාපදිංචි කළ සියලු දත්ත බැංකුවලටත් ලබා දෙනවා. බැංකු සහ අප අතර සති පතා සාකච්ඡාවක් පවත්වමින් තමයි අපි මේ කටයුතු කරන්නේ; අපි සමාලෝචනයක් කරනවා.

ඒ වාගේම අපි දන්නවා, මේ විපතෙන් පසුව යළි නැඟී සිටීමේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාල කාර්යභාරයක් කරන්න තිබෙන බව. ඉදිකිරීම්වලට අවශ්‍ය වැලි, ගල්, පස් ආදී හැම දෙයක්ම ලබා දෙන්න ඕනෑ, යළි ගොඩනැඟීම සඳහා. ඒ සඳහා තිබෙන නීති රීති ලිහිල් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපේ අමාත්‍යාංශය යටතේ තමයි තිබෙන්නේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය. අපි දන්නවා, ගොඩක් අවසර ලබා ගැනීම්වලදී බරපතළ ප්‍රශ්න මතු වෙන බව. දැන් මේ උවදුරේදී මහවැලි ගඟේත්, අනෙත් ගංගාවලත් වැලි ගොඩක් ඇවිල්ලා කුඹුරුවල ගොඩ ගැහිලා තිබෙනවා. ඒවා ඉවත් කරන්න ගියාම ප්‍රශ්න මතු වෙනවා.

නීතිය අනුව ගත්තොත්, කුඹුරුවල මඩ ඉවත් කර ගන්නත් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අවසරය ගන්න ඕනෑ. නමුත්, අපි ඒ නීති ලිහිල් කරලා ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, දිසාපතිතුමන්ලා වෙත චක්‍රලේඛ නිකුත් කර තිබෙනවා, ඒවාට අදාළව ලිහිල් ක්‍රියාවලිය පාවිච්චි කරන්න කියලා. එහි ශාස්ත්‍රීය ක්‍රියාවලිය වෙනුවට, ආපදා තත්ත්වය ගැන සැලකිල්ලට ලක් කරලා කටයුතු කරන්න කියා අපි ඉල්ලීම් කර තිබෙනවා. අපි ඒ අදාළ චක්‍රලේඛ නිකුත් කර තිබෙනවා. මෙම කර්මාන්ත සම්බන්ධයෙන් වූ හානිය පිළිබඳව අද දක්වා තිබෙන තොරතුරු - දත්ත- සියල්ල මම **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම, මාතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හැටියටත්, මඩකලපුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හැටියටත් මම අදහස් කරනවා මේ ආපදා තත්ත්වයේදී අප ගත්තු ක්‍රියාමාර්ග පිළිබඳව යම්කිසි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ කියලා. විශේෂයෙන්ම මෙවැනි ගංවතුර තත්ත්වයකදී, එනම් මිලිමීටර් 150ක, 180ක වාගේ මට්ටමකට වැහැලා ගංවතුරක් ආපු හැම වෙලාවේම වැඩිම පීඩාවට ලක් වෙච්ච දිස්ත්‍රික්කයක් තමයි මාතර දිස්ත්‍රික්කය. ගාල්ල දිස්ත්‍රික්කයත් එහෙමයි. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඒ ගැන දන්නවා. ගාල්ල දිස්ත්‍රික්කයට ගිං ගඟ ආශ්‍රිතව ගංවතුර ප්‍රශ්නය ආවා. අපේ දිස්ත්‍රික්කය වන මාතර නිල්වලා ගඟ ආශ්‍රිතව ගංවතුර ප්‍රශ්නය ආවා. හැබැයි, මේ වෙලාවේ අපි නිල්වලා ගඟ ආශ්‍රිත ගංවතුර ආපදාව කළමනාකරණය කර ගත්තේ කොහොමද? පසුගිය අප්‍රේල් මාසයේ ඉඳලා අපි නිල්වලා ගඟ ශුද්ධ පවිත්‍ර කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 25කට පස්සේ අපි නිල්වලා ගඟ අකුරැස්සේ ඉඳලා මාතර දක්වා කිලෝමීටර 34ක් සම්පූර්ණයෙන්ම ශුද්ධ කළා. ඒකේ ප්‍රතිඵලය හැටියට තමයි එම දිස්ත්‍රික්කයේ ගංවතුර ආපදාව කළමනාකරණය කරන්න අපට පුළුවන් වුණේ. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි මාතර ඇතුළු දකුණේ ජනතාවට බදුල්ලට ගිහිල්ලා, බදුල්ලේ සහෝදර ජනතාවට උදව් කරන්න අවස්ථාව ලැබුණේ. එහෙම නොවුණා නම් ඇත්තටම රටේ අනෙක් දිස්ත්‍රික්කවලින් මාතරටත් උදව් කරන්න එන්න සිද්ධ වෙනවා; ගාල්ලටත් උදව් කරන්න එන්න සිද්ධ වෙනවා. Facebook එකේ තිබෙනවා අපි දැක්කා, "නිල්වලා කොමලිය නිදි" කියලා සඳහනක්. නැහැ, අපි එයාව නිදි කෙරෙව්වා. පසුගිය කාලය පුරාම අපි නිල්වලා ගඟ ශුද්ධ පවිත්‍ර කරලා, ඒ අදාළ කටයුතු කරපු නිසා තමයි ආපදාවට පත් වූවන්ට පිහිට වෙන්න බදුල්ලට යන්න පුළුවන්කම අපට ලැබුණේ. අදත් - අප මේ කථා කරන වෙලාවේත්- මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභාවල රියැදුරන් සහ වාහන 40කට වඩා, JCB උපකරණ 40කට වඩා බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩ කරනවා. ඒගොල්ලන්ට නිවාඩු නැහැ. ඒගොල්ලන් බදුල්ල දිස්ත්‍රික්කයේ දිවා රාත්‍රී සේවය කරනවා. ඒගොල්ලන් තවමත් එහේ වැඩ. එම නිසා මම ඒ අයට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම PRD එකේ, RDA එකේ, ලංකා විදුලිබල මණ්ඩලයේ, NBRO එකේ නිලධාරීන් දිවා රාත්‍රී සේවය කරනවා. ත්‍රිවිධ හමුදාව, ස්වේච්ඡා කණ්ඩායම් ආසන්න වශයෙන් 4,000කට වැඩි පිරිසක් මාතරින්, ඒ වාගේම අනෙකුත් තැන්වලින් බදුල්ල දිස්ත්‍රික්කයට ගිහිල්ලා වැඩ කරනවා. ඔබතුමන්ලා දකින්න ඇති, ස්වාමීන් වහන්සේලා පවා ගිහිල්ලා මුට්ට කර ගහනවා; බර අදිනවා; වැඩ කරනවා. ඒ හැම දෙනාටම මම ස්තුතිවන්ත වෙනවා. හෘදය සාක්ෂියක් තිබෙන ඕනෑම කෙනෙකුට ඒ කැපකිරීම්වල වටිනාකම දැනෙනවා ඇති.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ වාගේම මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ මාධ්‍ය ආයතනවලට. මොන පරස්පරතා තිබුණත් මාධ්‍ය ආයතන විශාල සත්කාරයක් පසුගිය ටිකේ කළා. විශේෂයෙන්ම අපේ රටේ සියලු මාධ්‍ය රටේ සිද්ධ වන ක්‍රියාවලිය පිළිබඳව එක දිගට දැනුවත් කිරීම් කළා. අවදානම තිබෙන තැන් පිළිබඳව සියලු මාධ්‍යවලින් දැනුවත් කිරීම් කළා. මම ඒ මාධ්‍ය ආයතනවලටත් විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම ප්‍රාදේශීය සභා ගැනත් මම කියන්න ඕනෑ. වැලිගම ප්‍රාදේශීය සභාවේ වැඩ බලන සභාපතිතුමා අපේ පක්ෂයේ කෙනෙක් නොවෙයි; අපේ ස්වාමීන් වහන්සේනමක්. උන්වහන්සේ ඇතුළු විපක්ෂ මන්ත්‍රීවරු -ප්‍රාදේශීය සභාවේ නම් ඒ ප්‍රාදේශීය සභාවේ පාලක සභාව- ගිහිල්ලා අපේ කණ්ඩායම් එක්ක වැඩ කළා. ඒ වාගේම, ප්‍රාදේශීය සභාවල සභාපතිවරු බොහෝ දෙනෙක් ගිහිල්ලා වැඩ කළා. මාතර දිස්ත්‍රික්කයේ ඒ කටයුතු සම්පූර්ණයෙන්ම සම්බන්ධීකරණය කළේ අපේ දිස්ත්‍රික් ලේකම්තුමා. මම එතුමාට ගොඩක් ස්තුතිවන්ත වෙනවා.

මඩකලපුව දිස්ත්‍රික්කය ගැනත් මම කියන්න ඕනෑ. මේ පීඩාවේදී අපට ගොඩක් ලොකු හානියක් වුණේ නැති වුණත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14ක, ග්‍රාම නිලධාරි වසම් 257ක් මේ ආපදාවෙන් පීඩාවට ලක් වුණා. එහිදී විශේෂයෙන්ම කෘෂි ඉඩම්, පශු සම්පත් ක්ෂේත්‍රයේ ඉඩම් විනාශ වුණා. ඒ වාගේම, ධීවර ක්ෂේත්‍රයටත් හානි සිද්ධ වුණා. ජන ජීවිත අඩාල වුණා. මිනිස් ජීවිත 4ක් අපට අහිමි වුණා. පවුල් 13,972ක්, පුද්ගලයන් හැටියට ගත්තොත් 41,346දෙනෙක් ආපදාවට ලක් වුණා. ඉහත සඳහන් කළ පරිදිම, පුද්ගල මරණ 4ක් සිදු වුණා. සම්පූර්ණ නිවාස හානි 11ක්, අර්ධ හානි 832ක් වාර්තා වුණා. දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා දැනට අපි ප්‍රාදේශීය වශයෙන් ඇස්තමේන්තු කර තිබෙනවා, රුපියල් මිලියන 6,612ක යටිතල පහසුකම් damage වෙලා තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ලේඛනයත් **සභාගත*** කරනවා.

ඒ වාගේම, අපි මඩකලපුව දිස්ත්‍රික්කයේ ආරක්ෂිත මධ්‍යස්ථාන - safe camps - 21ක්; පවුල් 1,412ක්; සාමාජිකයන් 3,998ක් නඩත්තු කළා. අපි අද වනකොට රුපියල් 25,000 බැගින් 12,466දෙනෙකුට රුපියල් 311,650,000ක් ලබා දී තිබෙනවා, මඩකලපුව දිස්ත්‍රික්කයේ.

ඒ, අද උදේ ලැබුණු වාර්තා අනුවයි. නිදහස් කළ මුදල් ගත්තොත්, වියළි ආහාර සඳහා රුපියල් 53,513,200ක්, පිසූ ආහාර සඳහා රුපියල් 10,300,000ක්, මරණාධාර සඳහා රුපියල් 4,000,000ක්, ඉන්ධන සඳහා රුපියල් 800,000ක් අපි ලබා දී තිබෙනවා. ඒ වාගේම, නිවාස කුලී හැටියට තාවකාලිකව මසකට රුපියල් 25,000ක දීමනාවක් හැටියට තවත් රුපියල් 311,650,000ක් අපි ලබා දී තිබෙනවා. ඒ කියන්නේ, තමන්ගේ නිවාස ශුද්ධ පවිත්‍ර කර ගැනීම් සඳහා ලබා දෙන රුපියල් 25,000ක මුදල.

මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙන්න ඕනෑ මඩකලපුව මහ නගර සභාවේ නගරාධිපතිතුමාට. මොකද, එතුමා අපේ රැස්වීම් හැම එකකටම සහභාගි වෙලා විශේෂ සහයෝගයක් ලබා දුන්නා. විශේෂයෙන්ම එතුමා එතුමාගේ උපකරණ, නිලධාරීන් වෙනත් ප්‍රාදේශීය සභාවලට යෙදෙව්වා. ඒ වාගේම කාත්තන්කුඩියේ නගරාධිපතිතුමා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා බොහෝ දේවල් ලබා දුන්නා. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

සිරිනාත් මහත්මයාත් අපගේ කමිටුවලට සහභාගි වෙලා අදහස් දැක්වූවා; තම සහයෝගය ලබා දුන්නා. මම එතුමන්ලාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, විපක්ෂය නියෝජනය කළත් ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමාත් පක්ෂ, පාට භේදයකින් තොරව මෙම ආණ්ඩුව කරන කාර්යභාරය නිසි ඇගයීමකට ලක් කළා. මම ඒ ගැනත් විශේෂයෙන්ම අවධාරණය කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම තවත් පුංචි දෙයක් මම කියන්න ඕනෑ. මේ ක්‍රියාවලිය, මේ විපත අප අපේක්ෂා කළ දෙයක් නොවෙයි; අප බලාපොරොත්තු වෙච්ච දෙයක් නොවෙයි. හැබැයි, රටක් හැටියට අප මේ විපතට මුහුණ දුන් ආකාරය මුළු ලෝකයේම ඇගයීමට ලක් වෙලා තිබෙනවා කියා මම විශ්වාස කරනවා. විශේෂයෙන් අපගේ ගරු ජනාධිපතිතුමා ගැන කියන්න ඕනෑ. පෞද්ගලිකව එකිනෙකාට විශේෂයක් කරන්නේ නැති වුණාට මේ ක්‍රියාවලියේදී ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා ලබා දුන් නායකත්වය අතිවිශිෂ්ටයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නායකත්වය නිසා තමයි අපි හැමෝම අපේ කාර්යභාරයේ කොටස මේ විධියට භාර ගත්තේ. විශේෂයෙන්ම, ත්‍රිවිධ හමුදාවේ නායකයා හැටියට, සේනාධිනායකයා හැටියට ගරු ජනාධිපතිතුමා ඒ මෙහෙයුම අතිසාර්ථකව සිදු කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sunil Handunnetti, you have two more minutes.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ගරු අර්කම් මන්ත්‍රීතුමාගෙනුත් විනාඩි 5ක් ලබා දෙනවාය කිව්වා. ඒ වෙලාවත් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම, නායකත්වය අද මුළු ලෝකයේම අවධානයට ලක් වෙලා තිබෙනවා. විපතක් තමයි මේක. හැබැයි, ඒ විපත අවස්ථාවක් බවට පත් කරගෙන ශ්‍රී ලංකාව යළි ගොඩනැඟීම - "Rebuilding Sri Lanka" - වෙනුවෙන් එතුමා නායකත්වය දීලා තිබෙනවා; මෙවැනි ආපදාවකදී කටයුතු කරන්නේ කොහොමද කියා පෙන්වා තිබෙනවා. මේ සිදුවීම වෙච්ච මොහොතේ ඉඳලා, එනම් මේ ආපදාව සිද්ධ වෙච්ච මොහොතේ ඉඳලා මේ කාලය ඇතුළත වැඩිම කාලයක් වැඩිම පීඩනයකින් නිදි නැතිව මේ රටේ හිටපු මනුස්සයා කවුද කියලා ඇහුවොත්, ඒ අපේ ජනාධිපතිතුමා කියලායි මා හිතන්නේ. එතුමා හැම පුද්ගලයෙකු ගැනම පෞද්ගලිකව සොයා බැලුවා; අප ගැන සොයා බැලුවා; අප දිස්ත්‍රික්කවලට දෙන නායකත්වය ගැන සොයා බැලුවා. අපට විතරක් නොවෙයි, අපට කථා කරලා අනෙක් පැත්ත හැරෙන කොට දිස්ත්‍රික් ලේකම්වරුන්ට කථා කළා; ප්‍රාදේශීය ලේකම්වරුන්ට කථා කළා; අපේ පක්ෂයේ -ජාතික ජන බලවේගයේ- පහළ ඉන්න සංවිධායකවරුන්ට පවා කථා කළා. හැම දෙයක්ම වෙන වෙනම පරීක්ෂා කළා. ඒ සුවිශේෂත්වය අපි අගයන්න ඕනෑ. එහෙම කළේ නැත්නම්, ඇත්තටම අපි මිනිස්සු නොවෙයි. ඒ නිසා තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලංකාවේ නියෝජිත මහත්මයා කිව්වේ, එතුමන්ලාගේ රටකදීවත් මෙවැනි විපතක් සිදු වූ වෙලාවක මෙවැනි තත්ත්වයක් නොදැක්ක බව; ජනතාවගේ මේ සාමූහිකත්වයක්, මේ බැඳියාව පුදුම සහගත බව. රටක මෙවැනි විපතක් වෙච්ච වෙලාවක ඒ රට ජාත්‍යන්තර වශයෙන් ඉහත කී පරිදි අවධානයට ලක් වෙන්න ඒ රටේ නායකත්වයේ සුවිශේෂත්වයක් තිබිය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. එම සුවිශේෂත්වය තමයි අපට මේ බලපා තිබෙන්නේ.

මම පෞද්ගලිකව දන්නවා, ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ සාමාජිකයෙකු හැටියටත්, එමෙන්ම මේ ක්‍රියාවලියට මැදිහත් වූ වෙලාවේදීත් අපව මෙහෙයවන්න අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා කොයි ආකාරයෙන්ද කටයුතු කළේ කියලා. ඒ වාගේම තමයි මුදල් අමාත්‍යාංශයේ හා අනෙකුත් අමාත්‍යාංශවල නිලධාරින්. විශේෂයෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් සම්පත් කොටුවේගොඩ මැතිතුමා ඉතා විශේෂ මැදිහත්වීමක් කළා. ඔබතුමන්ලා හෘදය සාක්ෂියට එකඟව කථා කළොත් කියයි, ඔබතුමන්ලා කථා කරපු හැම telephone call එකකටම එතුමන්ලා answer කරලා තිබෙන බව. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සම්පත් තුයියකොන්තා මැතිතුමා හැම telephone call එකකටම answer කරලා තිබෙනවා. කිසි කෙනෙකුට වෙනස්කමක් කරලා නැහැ. මොකද, ගරු ජනාධිපතිතුමා ඇතුළු අපට ඕනෑ වුණේ පක්ෂ හැටියට නොව, පුද්ගලයන් හැටියට නොව රටක් හැටියට මේ ආපදාවට මුහුණ දෙන්නයි. අපට ඕනෑ වුණේ ඒ හැර වෙන මොකවත් නොවෙයි. ඒ නිසා විශේෂයෙන් වෙච්ච දෙයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක අපට හොඳ අත්දැකීමක්.

මොකද, රාජ්‍ය නිලධාරින් තුළ යම් බියක් තිබුණා නම්, යම් සැකයක් තිබුණා නම් මේ වැඩ කරලා අප විගණනයට අහු වෙයි කියලා, අද ඒ භය නැති වෙලා තිබෙනවා. ඇත්තටම 2004දී සුනාමි ව්‍යසනය ඇති වෙච්ච වෙලාවේ, සුනාමියෙන් විපතට පත් වුණු අයට සහන සැලසීම සඳහා ලබා දුන් සහනාධාරවලට සිද්ධ වෙච්ච දේවල් නිසා, නිලධාරින්ට ලැබුණු punishments නිසා, කොවිඩ්-19 වසංගතය පැවති කාලයේ සහන බෙදන්න ගිහිල්ලා වෙච්ච දේවල් නිසා, නිලධාරින්ට ලැබුණු punishments නිසා නිලධාරින් විශාල පීඩාවකින් කටයුතු කරන්නේ. හැබැයි, අද ඒක වෙනස් වෙලා තිබෙනවා. ස්වේච්ඡා සේවය කියන එක රාජ්‍ය සේවයේ කොටසක් බවට පත් කළා, මේ විපත විසින්. විපත විපතක් තමයි. හැබැයි, විපතකට මුහුණ දෙද්දී ස්වේච්ඡා සේවය රටකට මොන තරම් වැදගත් ද කියන එක ඔප්පු කළා. ඒ ඔප්පු කිරීමේ නායකත්වය ලබා දුන්නේ වෙන කවුරුත් නොවෙයි, අපේ ජනාධිපති අනුර දිසානායක සහෝදරයා. පක්ෂයක් හැටියටත් අපි ආඩම්බර වෙනවා, එවැනි නායකයෙක් අපට ඉන්න එක ගැන. රටක් හැටියටත් මම විශ්වාස කරනවා, අපේ රටේ ජනතාව තුළ ඒ ඇගැයීම තිබෙනවා කියලා. ඒ ඇගැයීම ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂිය තුළත් තිබෙන බව මම දන්නවා. ඒ නිසා මම ඒක විශේෂයෙන් අවධාරණය කරන්න ඕනෑ. මොකද, විවාදය පැවැත්වෙන මේ වෙලාවේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ නැති නිසා අප ඒක නොකියා ඉන්නවා නම් අපි කෘතඥ පූර්වක මිනිස්සු නොවෙයි.

ඒ වාගේම ආපදාවලට ලක් වුණු දිස්ත්‍රික්කවලට මැදිහත් වෙච්ච අපේ හැම දෙනාම තමන්ගේ ගෙදර පීඩාවට පත් වෙලා තිබෙද්දීත් ඒ වැඩ කළා. විශේෂයෙන්ම රජයේ නිලධාරින් කටයුතු කළ ආකාරය ගැන මම කියන්න ඕනෑ. සමහර ප්‍රාදේශීය ලේකම්තුමන්ලාගේ ගෙවල් ආපදාවට ලක් වෙලා තිබුණා. ග්‍රාම නිලධාරින්ගේ ගෙවල් යට වෙලා තිබුණා. හැබැයි, ඒ අය ඒ ගෙදරට යන්නේ නැතිව මිනිස්සු වෙනුවෙන් වැඩ කළා. දිසාපතිතුමන්ලා හුඟ දවසක් ගෙවල්වලට ගියේ නැහැ. ඒගොල්ලන් වැඩ කළා. ඒ රාජ්‍ය සේවකයන් සියලුදෙනාට මම හිස නමා ආචාර කරනවා. අපේ අමාත්‍යාංශයෙත් එහෙමයි. මේ විපත සිදු වූ වෙලාවේ ඉඳලාම ඒ අය වැඩ කළා. අපි ආහාර ඉල්ලුවා නම්, බෙදා හරින්න දේවල් ඉල්ලුවා නම්, සාමාන්‍ය මිනිස්සු අපි ඉල්ලුවාට වඩා දේවල් අපට දුන්නා. විශේෂයෙන්ම අපි භාර ගත්ත බදුල්ල දිස්ත්‍රික්කයේ ඉල්ලුවාට වඩා දේවල් දෙන්න සූදානමක් තිබුණා. අදත් ඒක එහෙමයි. ඒක තමයි රටක වෙන්න ඕනෑ දේ. හැබැයි, කියන්න කනගාටුයි, අපට අපේ

පාර්ලිමේන්තුවෙන් ඒ අත්දැකීම ඒ තරම් ලැබුණේ නැහැ. හැබැයි, රටෙන් ඒ අත්දැකීම ලැබුණා. ඒ නිසා රටේ ජනතාවට ඒ පිළිබඳ කෘතවේදීත්වය පළ කරනවා.

විශේෂයෙන්ම ඊළඟ පියවර යළි නැඟිටීමයි. අපි සාමාන්‍ය තත්ත්වය තුළ සාමාන්‍ය විධියට වැඩ කරන්නත්, විශේෂ තත්ත්වය තුළ විශේෂ විධියට වැඩ කරන්නත් පුළුවන් මිනිස්සු කියලා ශ්‍රී ලාංකිකයෝ ඔප්පු කළා. ඒ නිසා අපට ෂුවර් එකක් තිබෙනවා, විශ්වාසයක් තිබෙනවා, අපි මේ උවදුරෙන් ඉතාම කෙටි කාලයක් තුළ යළි නැඟිටිනවා කියලා. ඉන්දුනීසියාවේ ජකර්තා නුවර මේ දේ සිද්ධ වුණා, අනෙක් රටවල්වල මේ දේ සිද්ධ වුණා, පිලිපීනයට මේ දේ සිද්ධ වුණා, තායිලන්තයට මේ දේ සිද්ධ වුණා. හැබැයි, ඒ හැම රටකටම වඩා ඉතාම කෙටි කාලයක් තුළ අපි යළි නැඟිටින බව සහතික කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි, ඔබතුමාට.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් පොඩි කාරණාවක් දැන ගන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Rauff Hakeem.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, කර්මාන්ත අමාත්‍යතුමා නිසායි මේක කියන්නේ. ත්‍රිකුණාමලය, පොළොන්නරුව, අනුරාධපුරය සහ සෙසු දිස්ත්‍රික්කවල වී මෝල්වලට රුපියල් ලක්ෂ දෙකක් දීලා මදි. ඒ පිළිබඳ පොඩි සැලකිල්ලක් කරන්න. අඩුම වශයෙන් කෙටීම සඳහා රජයෙන් ලබා දෙන වී තොගය පොඩ්ඩක් වැඩි කරලා දීලා හරි ඒක හරිගස්සන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ස්තුතියි. ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ රුපියල් ලක්ෂ දෙක ව්‍යාපාර කිරීම සඳහා දෙන එකක් නොවෙයි. ඒක මදි කියලා අපි හොඳටම දන්නවා. මේක අර ගෙයක් ශුද්ධ කර ගන්න ලබාදෙන රුපියල් 25,000 වාගෙයි. මේකත් ඒ ස්ථානය පිරිසිදු කරගෙන යළි පවත්වාගෙන යෑමට සූදානම් කර ගැනීම සඳහා ලැබෙන එකක්. අපි ඊළඟට සාකච්ඡා කරන්න ඕනෑ insuranceවලින් කොච්චර ගන්න පුළුවන් ද කියලා බලන්න. අපි insurance ආයතන එක්ක කථා කරනවා, බැංකු එක්ක කථා කරනවා. අපි ඒ අයට package එකක් තමයි හඳුන්වා දෙන්නේ. ඒගොල්ලන්ට යළි නැඟිටීම සඳහා අවශ්‍ය සැලැස්මක් අපි හදනවා. ඒ පිළිබඳ අපි සාකච්ඡා කරමින් ඉන්නේ. ඇත්තටම අපි ඒ දේ කරලා දෙනවා. ආපදාවට පත් වූ හැම කර්මාන්තයකටම අපි ඒ කටයුතු සූදානම් කරන්නම්. ඒ සඳහා අන්තර් අමාත්‍යාංශ සාකච්ඡාවකුත් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) M.L.A.M. Hizbullah. You have seven minutes.

[பி.ப. 2.05]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடந்த வாரம் இடம்பெற்ற அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மற்றும் உயிரிழந்தவர்களின் குடும்பத்தினருக்கு ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் சார்பில் என்னுடைய ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன். எதிர்பாராத விதமாக இடம்பெற்ற இந்த அனர்த்தத்தால் கிட்டத்தட்ட 22 இலட்சம் மக்கள் பாதிக்கப்பட்டு இருக்கிறார்கள்; ஆயிரக்கணக் கானவர்கள் வீடுகளை இழந்திருக்கிறார்கள்; உறவுகளை இழந்திருக்கிறார்கள். அவர்களுடைய வாழ்க்கையை மீளக் கட்டியெழுப்பி, நாட்டைக் கட்டியெழுப்புவதற்கு அரசாங்கமும் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களும் எடுத்து வருகின்ற முயற்சிகளை நாங்கள் பாராட்டுகின்றோம். மாண்புமிகு சனாதிபதி அவர்கள் பாதிக்கப்பட்ட மக்களுடைய வாழ்க்கையை மீளக் கட்டியெழுப்புவதற்காக அதிகமான நிவாரணங்களை - relief packagesஐ - அறிமுகம் செய்திருக்கிறார். அதையும் நாங்கள் பாராட்டுகின்றோம். எனினும், அந்த நிவாரணங்கள் இன்னும் பாதிக்கப்பட்ட மக்களைச் சென்றடையவில்லை என்பதுதான் பிரச்சினையாக இருக்கின்றது.

அனர்த்தத்தால் பாதிக்கப்பட்ட பல பிரதேசங்களுக்கு நாங்கள் சென்றிருந்தோம். குறிப்பாக, மூதூர், திருகோண மலை, பொலன்னறுவை, கண்டி, கம்பளை, கெலிஓயா, கேகாலை போன்ற இடங்களுக்கு எங்களுடைய கட்சியின் தலைவரும் கண்டி மாவட்டப் பாராளுமன்ற உறுப்பினருமான கௌரவ ரஊப் ஹகீம் அவர்களின் வேண்டுகோளின் பேரில் சென்றிருந்தோம். கடந்த 2-3 நாட்களுக்கு முன்னர்கூட, நான் சில பிரதேசங்களுக்கு விஜயம் செய்திருந்தேன். இன்னும் அந்த மக்களுக்கான கொடுப்பனவுகள் வழங்கப்பட்டு இருக்கவில்லை. அதுமாத்திரமல்ல, வீதிகளைத் துப்புரவு செய்தல் மற்றும் அதனுடன் தொடர்புபட்ட எந்த வசதிகளும் செய்து கொடுக்கப்படவில்லை என்ற குறையும் இருக்கின்றது. நாங்கள் அரசாங்கத்தைக் குறை சொல்லவில்லை. ஏனெனில், பாதிக்கப்பட்ட மக்களுக்குக் கொடுப்பதற்குத் தேவையான முழு நிதியையும் சனாதிபதி அவர்கள் ஒதுக்கீடு செய்திருக்கிறார். கிராம மட்டத்தில் இருக்கின்ற ஒருசில உத்தியோகத்தர்களின் அசமந்தப் போக்கினால்தான் இந்தப் பிரச்சினை ஏற்பட்டிருக்கிறது.

கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்களுடைய பேச்சை நான் கேட்டுக்கொண்டு இருந்தேன். அவர் எமது மட்டக்களப்பு மாவட்ட அபிவிருத்திக் குழுவின் தலைவர் என்ற அடிப்படையில், அந்த மாவட்டம் பாதிக்கப்பட்டபோது அதனை மீளக் கட்டியெழுப்புவதற்கு நிறைய முயற்சிகளை எடுத்திருக்கிறார். அதற்காக அவருக்கு என்னுடைய நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். அரச இயந்திரம் சரியாக இயங்குவதை உறுதிசெய்ய வேண்டும். நான் கெலிஓயாவில் இருக்கின்ற கலிகமுவ பிரதேசத்துக்குச் சென்றபோது, அனர்த்தம் ஏற்பட்டு 14 நாட்கள் வரை அப்பிரதேசத்துக்கு எந்தவோர் உத்தியோகத்தரும் சென்றிருக்க வில்லை என்பதை அறிந்தேன். அந்தப் பிரதேசத்துக்குப் பொறுப்பான கிராம சேவகர் மகப்பேறு காரணமாக maternity leaveஇல் இருப்பதாகச் சென்னார்கள். அந்தப் பிரதேசம் வெள்ளத்தால் முழுமையாகப் பாதிக்கப்பட்ட பிரதேசம்! கிட்டத்தட்ட 25 அடி உயரத்துக்கு அங்குள்ள வீடுகளுக்குள் வெள்ள நீர் புகுந்திருக்கிறது.

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

வெள்ளம் காரணமாக வீடுகளிலிருந்த முழுப் பொருட்களும் சேதமடைந்து, அவை குப்பை மேடுகளாக வீடுகளுக்கு முன்னாலுள்ள வீதிகளில் 15-20 அடி உயரத்துக்கு குவித்து வைக்கப்பட்டு இருக்கின்றன. அந்த மக்கள் வருடக் கணக்கில் கஷ்டப்பட்டு உழைத்து வாங்கிய இலட்சக்கணக்கான ரூபாய் பெறுமதியுடைய வீட்டு உபகரணங்கள்தான் - கதிரை, beds, mattresses, cookers போன்றவைதான் - அவ்வாறு வீதிகளில் குவித்து வைக்கப்பட்டு இருக்கின்றன. நாங்கள் அவற்றைத் துப்புரவு செய்ததுடன், எங்களால் முடிந்த அனைத்துப் பணி களையும் செய்தோம். அங்குள்ள மக்களுக்கும் உள்ளூராட்சி மன்றங்களுக்கும் உரிய வசதிகளை அரசாங்கம் செய்து கொடுத்தால், வேகமாக இந்தப் பணிகளைச் செய்ய முடியும். ஒதுக்கப்பட்ட நிதி மக்களைச் சென்றடைய வேண்டும்; அவர்களுடைய தேவைகள் நிறைவுசெய்யப்பட வேண்டும்; அவர்களுடைய பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும்; அதற்கான நடவடிக்கைகளை அரசாங்கம் முன்னெடுக்க வேண்டும்.

அக்கரைப்பற்று கல்வி வலயத்திலுள்ள Pottuvil Osmania Junior Collegeஇன் கட்டிடம் முழுமையாக இடிந்து வீழ்ந்துள்ளது. இதனால் அங்கு கற்றல் - கற்பித்தல் செயற்பாடுகளை முன்னெடுக்க முடியவில்லை. அங்கு தற்காலிக கட்டிடமொன்றை அமைப்பதற்கு அரசாங்கம் நிதி ஒதுக்கியிருக்கிறது. எதிர்காலத்தில் அந்தப் பாடசாலைக்கு நிரந்தரக் கட்டிடமொன்றை அமைத்துக் கொடுப்பதற்கு கௌரவ அமைச்சர் அவர்கள் உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அனர்த்தத்தால் மிக மோசமாகப் பாதிக்கப்பட்ட எங்களுடைய பிரதேசங்களிலுள்ள மக்கள் இன்னோரன்ன பிரச்சினைகளை எதிர்கொண்டு இருக்கின்றார்கள். அவர்களால் தங்களுடைய வீடுகளுக்குப் போக முடியவில்லை. அவை பழுதடைந்த நிலையில் காணப்படுகின்றன. பாதிக்கப் பட்ட வீடுகளுக்குரிய மதிப்பீட்டை அரச தொழில்நுட்ப உத்தியோகத்தர்களால் மாத்திரம் செய்ய முடியாது. ஏனெனில், அங்குள்ள பிரதேச செயலகத்திலும் பிரதேச சபையிலும் தலா ஒருவரே இருக்கிறார். எனவே, இதனை ஏதோவோர் அடிப்படையில் விரிவுபடுத்துவதற்குரிய நடவடிக்கைகளை அரசாங்கம் எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

Hon. Deputy Speaker, it is with great pleasure that I acknowledge today the presence of His Excellency Essa Abdulla Al Ghurair, a distinguished and leading investor from Dubai, who is observing our Proceedings from the Hon. Speaker's Gallery. His visit to Sri Lanka at this important moment reflects his confidence in our country and his interest in exploring meaningful investment opportunities. Sri Lanka, today, stands at a turning point, offering vast potential in sectors such as infrastructure, education, renewable energy, tourism and technology.

On behalf of the people of Sri Lanka, I respectfully invite His Excellency Essa Abdulla Al Ghurair to consider larger and long-term investments in our nation. Such investments would not only strengthen economic growth, but would also create employment, transfer knowledge and build lasting partnerships between Sri Lanka and the United Arab Emirates. We value investors who look beyond short-term returns and believe in the future of a country. Sri Lanka welcomes partners who wish to to build partnerships with us and we assure them a transparent, investor-friendly environment and the full support of the Government.

I once again warmly welcome His Excellency Essa Abdulla Al Ghurair to our Parliament and wish him every success in his engagements in Sri Lanka. Also, I thank Dr. Fazul Jiffry who took all efforts to bring him to Sri Lanka.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. K.V. Samantha Viddyarathna. You have 13 minutes.

Order, please! Before he starts, the Hon. Deputy Chairperson of Committees will take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමා, කථාව ආරම්භ කරන්න.

[අ.භා. 2.11]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ සිදු වුණු ස්වාභාවික ව්‍යසන ගත්තොත්, මෙම ව්‍යසනය අපි දන්නා යුගයේ, අපි දන්නා ඉතිහාසයේ සිදු වුණු දරුණුතම ස්වාභාවික විපත කියලා අපි කවුරුත් දන්නවා. මෙම සිදුවීම වෙලා අදට දින 22ක් වෙනවා. නව රජයක් විධියට මේ ආපදාවට මුහුණ දෙමින් ඒ දින 22 තුළ අපි කරපු කළමනාකරණ කටයුතු දිහා බැලුවාම, හෘදය සාක්ෂියට එකඟව කල්පනා කර බැලුවොත්, මහා විපතක් සිදු වුණත් අපි වෙහෙස මහන්සිවෙලා, නිවැරදි කළමනාකරණයකින් යුතුව කටයුතු කර තිබෙනවා කියලා බොහෝදෙනා පිළිගන්නවා ඇති. බිම සිටින මිනිස්සු හැටියට අපට බිමේ ජනතාවගෙන් ඒ ප්‍රතිචාරය ලැබෙනවා.

අනෙක් පැත්තෙන්, මේ රට මෙම ස්වාභාවික විපතට මුහුණ දෙනකොට, අපි භාර ගෙන තිබෙන්නේ ඊට ඉස්සෙල්ලා තවත් විපතකට ලක් වුණු රටක් කියන එකත් මම මතක් කරන්න කැමැතියි. ආර්ථික වශයෙන් දැඩි ආපදාවකට ලක්වෙලා ණය ගෙවාගන්න අපහසු වෙච්ච රටක් තමයි අපි භාර ගත්තේ. මේ

රටට අත්‍යවශ්‍ය දේවල් ගේන්න බැරි, පඩි ගෙවාගන්න අපහසු තත්ත්වයට පත් වුණු, ආර්ථික ආපදා තත්ත්වයට පත්වෙලා තිබුණු යුගයක් තිබුණා. ඒ ආර්ථිකය හදන්න භාර දෙන්න ඕනෑ ජාතික ජන බලවේගයට කියලා ජනතාව කල්පනා කළා. වසරක් ගිහිල්ලා, පසුගිය දා අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට ඒ ආර්ථික ආපදා තත්ත්වයට පත් වුණු රටේ මහා භාණ්ඩාගාරය පිරී ඉතිරී යන අතිරික්තයක් සහිත රටක් ලෙසට කළමනාකරණය කරගෙන තිබෙනවා. ඒක විපක්ෂය පැත්තෙනුත් කියැවුණා. ජාතික සහ ජාත්‍යන්තර තලවලත් ඒ ගැන සාකච්ඡා වෙන්න පටන් ගත්තා. ආර්ථික ආපදා තත්ත්වයට පත් වුණු රට අපි ටික කාලයක් ඉදිරියට අරගෙන යනකොට මෙම දරුණු ගණයේ "දිට්වා" සුළි කුණාටුව නිසා ආපදාවට පත් වුණා. එම ආපදා තත්ත්වයට මුහුණ දීමත් එක්ක රටේ නායකයා හැටියට එක පැත්තකින් ජනාධිපතිතුමාට බරපතළ ව්‍යසන දෙකක් සහිත රටකට තමයි නායකත්වය සපයන්න සිද්ධවෙලා තිබෙන්නේ. කොහොම නමුත්, "දිට්වා" සුළි කුණාටුව නිසා අද වෙනකොට -අද තිබෙන වාර්තා මම ගන්නේ- මේ රටේ ආපදාවට ලක් වුණු පවුල් ප්‍රමාණය 490,385ක් වෙනවා. ඒ තුළ 1,702,719ක ජනතාවක් ඉන්නවා. මෙහිදී අපේ ආදරණීය රටවැසියන් 643දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. 183දෙනෙක් අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ ආපදා තත්ත්වය කළමනාකරණය කර ගැනීම සඳහා ජනාධිපතිතුමාගේ ඉඳලා අපි මේ දින 21 තුළ දිවා රෑ නැතුව විශාල මහන්සියක් ගත්තා. ඇත්තටම මේ කියන සමහර දේවල් පසුගිය දවස්වල අපේ කන්වලට ඇහුණේ නැහැ. මොකද, ඒ තරමට බිමේ ජනතාව වෙනුවෙන් අපට වැඩ කරන්න සිද්ධ වුණු නිසා. ඒ නිසා ඇත්තටම ඒවාට අවධානය යොමු වුණේ අඩුවෙන්.

ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා කිව්වා වාගේ, මේ රටේ ජනතාවගෙන් විශාල පිරිසක් මේ වෙනුවෙන් ඇප වුණා, කැප වුණා කියලා අපි දන්නවා. පක්ෂ, විපක්ෂ දේශපාලන නායකයෝත් ඒ අතර සිටියා. විපක්ෂය පැත්තෙන් මේ පාර්ලිමේන්තුවෙන් සම්බන්ධ වුණු ප්‍රමාණය නම් ඉතාම අඩුයි. බදුල්ල දිස්ත්‍රික්කයේ දේශපාලනඥයකු හැටියට මම කියන්න කැමැතියි, මේ කාරණයත්. ඇත්තටම මාතර, මොනරාගල වාගේ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය සභාවල විපක්ෂයේ මන්ත්‍රීවරු අපේ ගම් බිම්වලට ඇවිල්ලා ගෙවල් ශුද්ධ කරලා, ඇළ වේලි ශුද්ධ කරලා දෙනවා අපි දැක්කා. අපි ඒ ගැන කථා කළා. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා. මෙම ආපදාව සිදු වුණු මොහොතේ ඉඳලා අපි රාජ්‍ය යන්ත්‍රණය නිසි ලෙස කළමනාකරණය කළා. අපේ බදුල්ල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව මුල් දවස් ටිකේ උදේ 7.00ට රැස් වුණා, ආපහු රෑ 7.00ට රැස් වෙලා ඊළඟ දවසේ වැඩ සූදානම් කළා. දින 5කට ආසන්න කාලයක් එහෙම කරලා, අවශ්‍ය කටයුතු යම් පිළිවෙළකට වට්ටගත්තාට පස්සේ උදේ රැස් වන එක නවත්වලා රාත්‍රියේ රැස් වෙන්න පටන් ගත්තා. ඒ විධියට දින 12ක් පැන්නාට පස්සේ දිනයක් හැර දිනයක් අපි රැස් වෙන්න පටන් ගත්තා. අද වෙනකොටත් අපි ඒ විධියට රැස් වෙනවා. රැස් වෙලා අවශ්‍ය තීන්දු තීරණ ගන්නවා.

මේ රටේ යම් මතයක් තිබුණා, රාජ්‍ය සේවය දුර්වලයි කියලා. හැබැයි, මේ රටේ රාජ්‍ය සේවකයෝ පෙන්නුවා, එයාලට මේ රටේ අසීමිත දේවල් කරන්න පුළුවන් කියලා. පැය 72ක් යනකොට බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට බීමට අවශ්‍ය ජලය සියයට 100ක්ම ලබා දුන්නා. රාජ්‍ය නිලධාරින්, ස්වේච්ඡාවෙන් වැඩ කරන පිරිස් ඒ වෙනුවෙන් දායක වුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ බදුල්ල දිස්ත්‍රික්කයේ ජල සම්පාදනය සියයට 100ක්ම බිඳ වැටුණා. පැය 72ක් යනකොට මහියංගනය හැර ඉතුරු ටික ඔක්කෝම හදලා දුන්නා.

අපේ බදුල්ල දිස්ත්‍රික්කයේ විදුලිය සම්බන්ධතා සියයට 63කින් බිඳ වැටුණා. දින 12ක් යනකොට අපි එය සියයට 90ක් යථා තත්ත්වයට පත් කළා. අපේ සෞඛ්‍ය පද්ධතිය තුළ රෝහල් 14ක් - මධ්‍යස්ථාන 14ක් - අකර්මණ්‍ය වුණා. විශාල විනාශයක් සිදු වුණු මහියංගනය රෝහලේත් පැය 72ක් යනකොට ප්‍රතිකාර කිරීම පටන් ගත්තා. ඒ විධියට හැම තැනින්ම හාස්කම් පෙන්නුවා. මේවා කරනකොට අපට පහසුකම් ගොඩක් තිබුණේ නැහැ. අපේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ - PRDD එකේ - රියදුරෙක් සහිත මැෂින් එකයි තිබුණේ; බැකෝ එකක් විතරයි තිබුණේ. හැබැයි, මේ වෙනකොට මැෂින් 36ක් වැඩ කරනවා. ඒ සම්බන්ධයෙන් දකුණු පළාතේ නිලධාරින්ට අපි ස්තුතිවන්ත වෙනවා. අපේ සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ප්‍රාදේශීය සභාවල සභාපතිවරුත් සෑහෙන්න වෙහෙස මහන්සි වුණා. මම ඊයෙත් යනකොට වැලිගම, අකුරැස්ස සභාපතිතුමා පාලමක් හදන තැන මැෂින් එක දාගෙන වැඩ කරමින් හිටියා. මම පෙරේදා මෙමලයට යනකොට හක්මන සභාපතිතුමා මැෂින් එකක් දාගෙන වැඩ. ඒගොල්ලෝ ඒ විධියට කැප වුණා, ඇප වුණා. මේ තත්ත්වය එහෙමයි කළමනාකරණය කළේ. අපි දින 22කදී හාස්කම් දක්වන දේවල් සිදු කරලා තිබෙනවා. ඒ නිසා අපි ඒවා දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කාලය තුළ අපි ජනතාව වෙනුවෙන් කරන්න ඕනෑ හැම පැත්තක් ගැනම හිතුවා. අපේ දිස්ත්‍රික්කයේ 88දෙනෙක් මිය ගියා. ඒ අයගේ සිරුරු ගොඩ අරගෙන ගෞරවාන්විත විධියට අවසන් කටයුතු කළා. ඒවාට අපේ ආරක්ෂක අංශ ඇතුළු පිරිස් පස් කඳු භාර භාර මහා දායකත්වයක් දුන්නා. ඉන්දියාවෙන් විශේෂ කණ්ඩායම් ආවා. ඔවුන් මේ කටයුතුවලට දායක වුණා. ඉන්දියාවෙන් විශේෂ ජංගම රෝහලක් මහියංගනයට ගෙනැල්ලා කාර්ය මණ්ඩලය 85ක් යොදවලා ප්‍රතිකාර කිරීම ආරම්භ කළා. දහස් ගණනක් ඒකෙන් ප්‍රතිකාර ලබා ගත්තා. අපි එම නිලධාරින්ට ස්තුතිවන්ත වෙනවා, ගෞරව කරනවා. අපි ඒ විධියට වැඩ කළා.

අපේ බිමල් රත්නායක ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමා අපේ දිස්ත්‍රික්කය තුළ මාර්ග සංවර්ධන අධිකාරියේ කටයුතු කඩිනමින් කරලා දුන්නා. ප්‍රධාන මාර්ග 25ක් අවහිර වුණා. අද වෙනකොට ඒ මාර්ග 25ම ඇරලා තිබෙනවා. අපේ පාලම් එකසිය ගණනක් කඩාගෙන බිඳගෙන ගියා. අපේ මාර්ග සංවර්ධන අධිකාරියට අයිති ප්‍රධාන පාලම් 7ක් නැති වුණා. අපි දවස් 15ක් යනකොට මාඋස්සාගොල්ලේ පාලම හදලා ඇල්ල පස්සර පාර විවෘත කරලා දුන්නා. ස්ප්‍රින්වැලි ප්‍රදේශයේ ඇති අවුරුදු 200ක් පරණ පාලමක් ගලවා ගෙන ගියා. අද ඊයේ වෙනකොටත් රෑ දවල් නැතිව එහි වැඩ කරනවා. මේ සති අන්තය වනකොට පාලම සවි කරනවා. මේ, මාස ගාණක් යනකොට කෙරෙන දේවල්. ඉස්සර මේවා අවුරුදු ගණනක් ගත වුණු දේවල්. එම නිසා අපි කවුරුත් දන්නවා, මේ කෙරෙන දේවල් මොනවාද කියලා.

මම මේ රටේ ජනතාවට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සාමාන්‍යයෙන් ඉස්සර ආපදාවක් වුණාම කටයුතු සිද්ධ වුණේ කොහොමද? මීරියබැද්ද නාය ගියා කියනවා, සාමසර කන්ද නාය ගියා කියනවා, මාතරට ගංවතුර කියනවා. එතකොට, අර තැනට උදවු කරන්න ලංකාවේ තවත් දිස්ත්‍රික්ක 15ක්, 20ක් තිබෙනවා. මේ වතාවේ අපට උදවු කරන්න ඉතිරි වුණේ දිස්ත්‍රික්ක සුළු ප්‍රමාණයක් විතරයි, ගරු මන්ත්‍රීතුමනි. මාතරට පුළුවන් වුණා, ගාල්ලට පුළුවන් වුණා. එවැනි දිස්ත්‍රික්ක සුළු ප්‍රමාණයකට විතරයි උදවු කරන්න පුළුවන් වුණේ. ඒ නිසා මුලින් ආපු සහන යාත්‍රා දැන් එන්නේ නැහැ. ඒවා සතියක් වාගේ යනකොට නැවතුණා. මොකද, කොළඹින් ගේන්නද, ගම්පහින් එවන්නද, මහනුවරින් එවන්නද, කුරුණෑගලින් එවන්නද? ඒ අයටත් ආපදාව ආවා. එහෙම තිබෙද්දීත් පුළුවන් මිනිස්සු ටික ගෙදර කන්න තිබෙන හාල් ටික එව්වා, ඇඳුම් පැළඳුම් එව්වා. ඒ අය එහෙම කළා. එදා අපට එවපු හාල් කිලෝ දෙක වුණත්

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

වටිනවා. හැබැයි, විපක්ෂයේ සමහර කණ්ඩායම් ගිහිල්ලා ටොන් ගණනින් බෙදුවේ කුහකකම. ඔවුන් මිනිස්සු අතරේ මතභේද ඇති කරන්න මහන්සි ගත්තා. ඒ ගැන අපේ කනගාටුව පළ කරන්න කැමැතියි.

කොහොම නමුත්, අපි මේ වෙනකොට මේ තත්ත්වය කළමනාකරණය කරලා සැලකිය යුතු මට්ටමකට ගෙනැවිත් තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. අපේ බදුල්ල දිස්ත්‍රික්කය වාගේ තැන් ආපදාවට ලක් වුණු මොහොතේ ඉතාම දුර්වල තත්ත්වයක තමයි තිබුණේ. මම කිව්වා නේ, අපේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට තිබුණේ මැෂින් එකයි කියලා. මහියංගනය යට වුණාම ඒ කණ්ඩායම් කථා කරලා කිව්වා, මෝටර් බෝට්ටුවක් එවන්න කියලා. අපේ ජෙනරාල් අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමා එදා -27වැනි දා- රාත්‍රියේ අපේ කමිටුව කැඳවන්න ගියා. එතැන ඉඳලා කථා කරලා රාත්‍රියේම පානමින් මෝටර් බෝට්ටුව පටවලා මහියංගනයට එව්වා. බදුල්ල නගරය යට වුණා. බදුල්ලට මෝටර් බෝට්ටුවක් ගන්න තැනක් තිබුණේ නැහැ. කථා කරලා, කථා කරලා අන්තිමට ධීවරයෙකුගේ මෝටර් බෝට්ටුවක් අපි හම්බන්තොටින් පටවලා ඒම බදුල්ලට ගෙනාවා. අන්න ඒ විධියට තමයි මේ කටයුතු සිද්ධ කරන්න වුණේ. කොහොම නමුත්, මේ දින 22ක කාලය තුළ අපි විශාල කාර්යභාරයක් සිදු කළා. රටේ හැම තැනම තිබෙන පාරවල් ටික විවෘත කළා. දැන් නුවරඑළියේ ප්‍රධාන පාරවල් ටික විවෘත කරලා තිබෙනවා, මහනුවර ප්‍රධාන පාරවල් විවෘත කරලා තිබෙනවා. රෝහල් සාමාන්‍ය තත්ත්වයට අරගෙන තිබෙනවා. ජන ජීවිතයේ සැලකිය යුතු පංගුවක් සාමාන්‍ය තත්ත්වයට ගෙනැල්ලා තිබෙනවා. දරුවෝ පාසල් යනවා, ලෙඩ්ඩු රෝහල්වලට එනවා, කඩ ටික විවෘත වෙලා තිබෙනවා, ගොවියෝ ගොවි බිම්වලට බැහැලා ඒ කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ලෝකයත් එක්ක සලකනකොට මේ කරන දේවල් විශිෂ්ට තැනක තිබෙනවා කියලා අපට වඩා ජාත්‍යන්තරය කියනවා, ඔබතුමන්ලා නොකිව්වාට. එම නිසා මේක හරියට තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද වෙනකොට නිවාස පිරිසිදු කර ගැනීමේ රුපියල් 25,000ක දීමනාව ලංකාවේ පවුල් 257,479කට ලබා දීලා තිබෙනවා. අද දවල් 12.00ට නිකුත් කළ වාර්තාව අනුවයි මම මේ තොරතුරු කියන්නේ. වී ගොවීන්ට වෙච්ච හානියට වන්දි විධියට අද දවල් 12.00 වනකොට රුපියල් මිලියන 1,535ක් ගෙවලා තිබෙනවා. ඒ, ගොවීන් 26,072කට. පොඩි කාලයක් ඇතුළත රජයත්, රාජ්‍ය නිලධාරිනුත් මේ විධියට විශාල කාර්යභාරයක් කර තිබෙනවා.

බදුල්ල දිස්ත්‍රික්කයේ අපට අයිති කිලෝමීටර 70ක දුම්රිය මාර්ගයක් තිබෙනවා. ඒ කිලෝමීටර 70ටම ලොකු අලාභ හානියක් වුණා. දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයින්, සාමාන්‍ය ජනතාව, NBRO එක මැදිහත් වෙලා ඒ කිලෝමීටර 70ම මේ වනකොට හදලා ඉවරයි. ලබන 20වැනි දා උදෑසන අඹේවෙලින් දුම්රියයි, බදුල්ලෙන් දුම්රියයි දෙපැත්තට ධාවනය කරන්න පටන් ගන්නවා. අපේ ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය ඇමතිතුමාත් මේ පිළිබඳව කිව්වා.

මේ, සංචාරකයින් එන මාසය. නුවරඑළියට එන සංචාරකයා, ඇල්ලට එන සංචාරකයා දුම්රියෙන් ගමන් කරන්න බලාපොරොත්තු වනවා. ඒ නිසා කඩිනමින් මේ මාර්ගය අපි හැදුවා. සමහරුන් කිව්වේ මේවා අවුරුදු තුන හතරකින්වත් ගොඩ දාන්න බැරි වෙයි කියලායි. නමුත් අපි කඩිනමින් මේ වැඩ ටික කළා. විපක්ෂය ඒවා තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ දිස්ත්‍රික්කයේ වැව්, අමුණු, ඇළවල් විනාශ වෙච්ච ප්‍රමාණය ඔක්කෝම 1,357යි. මේ, දැනට වාර්තා වෙලා තිබෙන ප්‍රමාණය. තව කොච්චර තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. අපේ සුළු වාරිමාර්ගවල අමුණු 492ක් කඩාගෙන ගිහිල්ලා සහමුලින්ම විනාශ වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

මට තව විනාඩි පහක් අපේ අර්කම් ඉල්යාස් නියෝජ්‍ය ඇමතිතුමාගේ කාලයෙන් දෙනවා කිව්වා, එතුමා කථා කරන්නේ නැහැ කියලා. ඒ කාලය මට ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

අපි වාරි දෙසතියක් පටන් ගත්තා. "බිඳුණු වැව් අමුණු හදන - සිඳුණු කෙත් බිම් වඩන දිට්වා පරදන ධෛර්යයේ මහා වාරි මෙහෙයුම" කියලා අපි වාරි මෙහෙයුමක් පටන් ගත්තා. ඒ සඳහා 5,000ක බලඇණියක් අපි ගෙනාවා, හාලිඇල ක්‍රීඩාංගණයට. රටේ ජනතාව මේ දේවල්වලට උදවු කළා. මේ වනකොට දවස් අටක් වනවා, ඒ මෙහෙයුම සාර්ථක ලෙස ක්‍රියාත්මක වනවා. ඌවපරණගම ආසනයේ තිබෙන මහා වාරිමාර්ගයක් වන ඌමා ඇළ ව්‍යාපෘතිය නිල වශයෙන් අක්කර 2,005යි, ජනතාව අස්වද්දගත්ත ඒවාත් එක්ක අක්කර 3,000ක් වනවා. අපි ඊයේ ඒ මඟින් පළමුවැනි දියවර දුන්නා. දින 12න් අපි ඌමා ඇළ අමුණ පිළිසකර කළා. සමහරුන් කිව්වා, මේක හදන්න බැහැ, කන්න දෙකක් නවත්වන්න වෙයි කියලා. මේ වැඩේට ගමේ මිනිස්සු බැස්සා, ගොවීන් බැස්සා, හමුදාව බැස්සා. අපි අමුණ හැදුවා, පළමුවැනි දියවර දුන්නා. එහෙම නොදුන්නා නම්, අපට තවත් ආපදාවක් එනවා. ඒ ගොවි පවුල්වලට ආදායම නැති වනවා, ඒ දරු පැටවුන්ට පිහානට බත් ටික නැති වනවා, මේ රටටම එළවලු ටික එවන්න බැරි වනවා. ඒ නිසා අපි ඒ වැඩේත් කළා.

අපි ලබන 21වැනි දා සුනුවිසුනු වෙච්ච තව මහා වාරිමාර්ගයක් පිළිසකර කර අවසන් කරනවා. දැන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 1,000ක් බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩ කරනවා. ඒ අය, ගුවන් හමුදාව, පොලීසිය වාගේම මාතරින්, මොනරාගලින්, අම්පාරෙන්, රත්නපුරෙන් ටික ටික මිනිස්සු ඇවිත් අපේ දිස්ත්‍රික්කයේ වැසියොත් එක්ක 5,000ක බලඇණියක් අද වැව් අමුණු හදනවා, බදුල්ල දිස්ත්‍රික්කයේ අහුමුලුවලට ගිහිල්ලා.

මම ස්තුතිවන්ත වනවා, මගේ අමාත්‍යාංශයේ නිලධාරින්ට. පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙක් ඇතුළු කණ්ඩායමක් ඈත ප්‍රදේශ වන මඩොල්සීමට, ඇකිරියට ගිහිල්ලා කැඩුණු අමුණු හදනවා. මේ වනකොට ඒ ප්‍රදේශයට ගිහිල්ලා දවස් ගණනක් වෙනවා. ඒ විධියට ඒ මිනිසුන් කැපවීම් කළා. අපි ඒ වෙනුවෙන් ඒ අයට ස්තුතිවන්ත වෙනවා. ඒ දේවල් අපි එහෙම හදනවා. අපි ලබන 21වැනි දා විවෘත කරනවා, බත්මැඩිල්ල වාරි ව්‍යාපෘතිය. ඒ මඟින් අක්කර 1,450කට වතුර ලබා දෙනවා. අවුරුදු තුනකින්වත් ගොඩ ගන්න බැහැ කියපු ඇළ මාර්ගයේ අමුණ අපි හදලා ගන්නවා. ඒ සඳහා වාරි මෙහෙයුමක් දියත් වනවා. අපි ඒ විධියට මේ වැඩේ කරනවා.

ආපදා කළමනාකරණය ගැන කියනකොට මම මේ කාරණයත් කියන්න කැමැතියි. සමහරුන් කියනවා, මේ දේවල්

හරියට කළමනාකරණය කරන්නේ නැහැ කියලා. ඒ අයගෙන් මම මේ කාරණය අහනවා. 2023දී බදුල්ලේ, හල්දුම්මුල්ලේ, කබරගල කන්ද නාය ගියා. ඒ කාලයේ තිබුණු ආණ්ඩුව පවුල් 50ක්, වහපු තේ factory එකක පදිංචි කළා; සාරිවලින් කාමර වෙන් කරලා පවුල් 50ක් පදිංචි කළා. ඒ අයට ගෙවල් හදලා දුන්නේ නැහැ. අපේ ආණ්ඩුව බලයට ආ පසු පසුගිය මාර්තු 15වැනි දා මුල්ගල් තියලා හමුදාවෙන් දැන් ඒ ගෙවල් 50ම හදමින් තිබෙනවා. ඒ ගැන ස්තුතිවන්ත වෙනවා, සම්පත් කොටුවේගොඩ මහත්මයාට, ජනරාල් අරුණ ජයසේකර මහත්මයාට. මම ජනාධිපතිතුමාගෙන් ඉල්ලුවා, මේ වැඩ ටික කර ගන්න හමුදාව දෙන්න කියලා. දැන් හමුදාව දාලා ඒ ගෙවල් ටික හදනවා. වහල ගහලා ඒවායේ වැඩ දැන් බොහෝදුරට ඉවරයි. තව නොබෝ දිනකින් අපි ඒ ගෙවල් භාර දෙනවා.

2020දී බදුල්ල දිස්ත්‍රික්කයේ අධිඅවදානම් කියලා පාසල් තුනක් අයින් කරන්න කිව්වා. ඒ, දැනට අවුරුදු පහකට උඩදි. ඒ මොනවාද? ලියන්ගහවෙල පාසල, මක්කල්දෙනිය පාසල, මීමලේ පාසල. ඒවා අයින් කළාද, ඉඩමක් දුන්නාද, අලුත් පාසල් හැදුවාද? තවම නැහැ. හැබැයි, අපි ඒවා ආරම්භ කරනවා. දැන් ඒ වැඩ කටයුතු සූදානම් කරලා තිබෙන්නේ. අපි ඒවායේ වැඩ පටන් ගන්නවා. මේ 20වැනි දා සවස 2ට වැලිමඩ ජාතික පාසලේ ක්‍රීඩාංගණයට තව 5,000ක් ගේනවා. බදුල්ල දිස්ත්‍රික්කයේ විනාශ වෙච්ච පාසල් සහ පෙර පාසල් 227ක් තිබෙනවා. ඒ 227ම ප්‍රතිසංස්කරණය කරනවා. සතියක් තුළ ඒවා හදනවා. රෑ දවල් නැතිව වැඩ කරලා ඒවා හදන්න අපි සැලසුම් කරලා තිබෙනවා. ජනතාව ඒවාට කැප වෙනවා, උදවු වෙනවා. ඒ හින්දා ඒවා තේරුම් ගන්න. මිනිහෙකුට ගෙයක් හදන්න සල්ලි නොදුන්නාට, වැවක් හදන්න සල්ලි නොදුන්නාට, ඔබතුමන්ලාගේ ගෙවල් කැඩිච්ච වෙලාවේ, ගිනි තියපු වෙලාවේ ආපදාවක් වුණා කියලා ඔබතුමන්ලා මුදල් ගත්ත හැටි කියන්න මම එච්චර කැමැති නැහැ. අලි සබ්රි හිටපු ඇමතිතුමා ගෙදරට රුපියල් ලක්ෂ 709ක් ගත්තා, ජොන්ස්ටන් ප්‍රනාන්දු රුපියල් ලක්ෂ 934ක් ගත්තා, කෙහෙළිය රඹුක්වැල්ල රුපියල් ලක්ෂ 959ක් ගත්තා. මේ වෙලාවේ ඒවා ඔක්කෝම කියන්න බැහැ. මොකද, දිග ලැයිස්තු තිබෙන්නේ. ඒවා කලින් කියලා තිබෙන ඒවා. හැබැයි දුප්පත් මිනිහෙකුට රුපියල් ලක්ෂ 50ක් දෙනකොට, තේ වත්තේ කම්කරුවාගේ දෛනික වැටුප රුපියල් 400කින් වැඩි වෙනකොට ඒවාට විරුද්ධ වෙනවා.

මේ රටේ දේශපාලනඥයන්ට විතරයි ඉතිහාසයේත් ගෙයකට රුපියල් ලක්ෂ 50, 100 දුන්නේ. අද මේ රටේ ජනාධිපතිතුමා සාමාන්‍ය මිනිහෙකුට ගෙයක් හදාගන්න රුපියල් ලක්ෂ 50ක් දුන්නා. පැල්පතේ හිටියත්, ඒක කැඩුණු කෙනෙකුට රුපියල් ලක්ෂ 50 දීපු පළමුවැනි වතාව මේක. ආපදා කළමනාකරණයේදී ගේ හෝදගන්න, පිරිසිදු කරගන්න රුපියල් 25,000ක් දුන්නේ කවදාද? ගෙදර බඩු-මුට්ටු ගන්න රුපියල් 75,000ක් දුන්නේ කවදාද? ඒවා ලබා දීමේදී මේච්චර ඉක්මනින් ලබා දුන්නේ කොහේද? ලෝකය පිළිගන්නවා, එහෙම දුන්නා කියලා. ඒ හින්දා අපි ඒ ගැන කථා කරන්න කැමැතියි. අපි මේ විධියට නොයෙක් මෙහෙයුම් කරගෙන යනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම අපි මේ රට හදනවා.

අපි දන්නවා, ලෝකයේ සමහර රටවල යම් කරදරයක්, ආපදාවක් ආවාම ඒක නැවත රටට ලාභයක් කරගෙන ඒ රටවල් ගොඩනඟා ගත් අවස්ථා තිබෙනවා කියලා. ලෝකයේ දරුණු විනාශයක් වෙච්ච රටක් තමයි, ජපානය. 1945දී හිරෝෂිමාවලට බෝම්බය වැටුණා, නාගසාකිවලට බෝම්බය වැටුණා. නමුත් ජපානය වැටුණේ නැහැ. ජපානය නැඟිට්ටා; හිටියාට වැඩිය හොඳින් නැඟිට්ටා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම අද කියනවා, මේ රටට මේ මොන ආපදාව ආවත්, මේ ශ්‍රී ලංකාව අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ ආදර්ශවත් විධියට ලෝකයේ විශිෂ්ට ගණයේ ගොඩනැඟීමක් ආපහු කරන රට බවට පත් කරනවා කියලා.

අවසන් වශයෙන් මේ කාරණයත් මම කියන්න ඕනෑ. මේ වෙනුවෙන් කර-උර දීලා උදවු-පදවු කරන ජාත්‍යන්තර ප්‍රජාවට, විදෙස්ගත ශ්‍රී ලාංකිකයින්ට, අපේ රටේ වැසියන්ට, ඒ වාගේම ගෞරවනීය පූජ්‍ය පක්ෂයට මේ වෙලාවේ අපි ස්තුතිවන්ත වනවා. විවිධ ආගම්වල පූජ්‍ය පක්ෂ මේවාට උදවු කළා. අපේ ප්‍රදේශවල හාමුදුරුවරු සිවුර පැත්තකින් තියලා අඳනකඩේ පිටින් අමුණට බැස්සා, වැවට බැස්සා, වැලි කොට්ට කරට ගත්තා, රට හදන්න ධෛර්යයක් දුන්නා. ඒ නිසා අපේ නමස්කාර පූර්වක ස්තුතිය උන්වහන්සේලාට පිරිනමනවා. මේ කටයුතුවලදී ඇමතිවරුනුත් රෑ දවල් නැතුව මහන්සි වුණා. අපේ මන්ත්‍රීවරුන්, සභාපතිවරුන්, ගමේ ඉන්න මන්ත්‍රීතුමා ගත්තාම, තමන්ගේ ගෙදරට ආපදාවක් වෙලාත් ඒ අය මේ වැඩවල නිරත වුණා. රාජ්‍ය නිලධාරින් විශාල ආදර්ශයක් දුන්නා, ඔවුන්ගේ බලය පෙන්නුවා. අපේ දිස්ත්‍රික්කයේ සමහර ප්‍රාදේශීය ලේකම්ලාගේ ගෙවල් යට වුණා. සමහර රජ්‍ය නිලධාරින්ගේ දරුමල්ලෝ මැරුණා. නමුත් ඔවුන් රෑ දවල් නැතුව වැඩ කළා. අපි බදුල්ලේ සමහර කම්වු කැඳවා අවසන් වෙනකොට පාන්දර 1යි, 2යි. ඒත් රාජ්‍ය නිලධාරින් ඉතා සතුටෙන් ඒ කාලය ගත කළා. මම ඔවුන්ටත් මගේ ගෞරවය පුද කරනවා. මේ කටයුතු අපට කාර්යක්ෂම කරන්න පුළුවන් වෙන්නේ ඒ විධියටයි. මතයක් හදන්න හැදුවා, මේ අලුත් ආණ්ඩුව යටතේ රාජ්‍ය සේවකයෝ වැඩ කරන්න බයයි කියලා. මොන බයක්ද? මේ ආණ්ඩුව වෙන කවදාටත් වැඩිය ජනතාවට දෙන්න පුළුවන් සහන දීලා තිබෙනවා.

ඒ වාගේම විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවත් මේ ව්‍යසන අවස්ථාවේදී විශාල කාර්යභාරයක් කළා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවත් මේ වෙනුවෙන් විශාල කාර්යභාරයක් කළා. ඒ වාගේම පොලිසියත් විශාල කාර්යභාරයක් කළා. මේ රටට බොහෝදෙනා මේ අවස්ථාවේදී උදවු කළා. ඒ වාගේම කලාකරුවෝත් උදව්වට ආවා. දැන් ඔවුනුත් මේ වෙනුවෙන් රට පුරා යනවා. අපේ දිස්ත්‍රික්කයේ ආපදා කඳවුරු 181ක් තිබුණා. රොඩ්නි වර්ණකුල, සෝමසිරි මැදගෙදර, මිත්‍ර කපුගේ, රොහාන් ද සිල්වා වැනි කලාකරුවන් ඒවාට ආවා. ඇවිල්ලා අපේ දරුවොත් එක්ක සෙල්ලම් කළා, දරුවොත් එක්ක සින්දු කිව්වා, චිත්‍ර ඇන්දා. මේ විධියට අපේ දිස්ත්‍රික්කයට බොහෝදෙනෙක් ඇවිල්ලා මේ විධියේ කාර්යභාරයක් කළා. ඒ වෙනුවෙන් ඒ සියලුදෙනාට මම ස්තුතිවන්ත වනවා.

අපේ රටේ ජනතාවට අපි කියන්න කැමැතියි, නුඹ වෙනුවෙන් මේ රට ගොඩනඟන්න අපි සූදානම් බවත්, කිසිදු කෙනෙක් බය වෙන්න එපා කියාත්, දෙනවා කියපු ඒවා ඔක්කෝම දෙනවා විතරක් නොවෙයි, ඊට වැඩිය දෙයක් දෙන්න වුණත් වත්මන් රජය සූදානම් බවත්. ඒ පණිවුඩය දෙමින් මම නිහඬ වෙනවා. මට කාලය ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු පලනි දිගම්බරම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.30]

**ගරු පලනි දිගම්බරම් මහතා**
(மாண்புமிகு பழனி திகாம்பரம்)
(The Hon. Palani Thigambaram)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எமது நாட்டில் ஏற்பட்ட அனர்த்தத்தால் உயிரிழப்புகள் ஏற்பட்டுள்ளன. அவ்வாறு உயிரிழந்தவர்களுக்கு என்னுடைய இரங்கலைத் தெரிவித்துக் கொள்கின்றேன். அதிகமான குடும்பங்கள் தங்களின் வாழ்க்கையை இழந்து தவிக்கின்றன.

[ගරු පලනි දිගම්බරම් මහතා]

அவர்களுக்கும் என்னுடைய கவலையைத் தெரிவித்துக் கொள்கின்றேன். நாடு மீண்டும் நெருக்கடியான ஒரு சூழ்நிலையை எதிர்நோக்கியுள்ளது. இந்தச் சந்தர்ப்பத்தில் இலங்கையர்களாக நாம் அனைவரும் ஒன்றிணைந்து நாட்டைக் கட்டியெழுப்புவதற்குச் செயற்பட வேண்டும். இந்த நிலைமையைச் சரிசெய்வதற்கு அரசாங்கம் எடுக்கின்ற எல்லா முயற்சிகளுக்கும் எங்களுடைய முழுமையான ஒத்துழைப்பை வழங்குவோம். இந்த அரசாங்கத்தினர் எதிர்க்கட்சியில் இருக்கும்போது, இயற்கை அனர்த்தங்களை எதிர்கொள்வது பற்றி நிறையவே பேசியிருக்கிறார்கள். ஆனால், இன்று இவர்களுக்கு அதிகாரம் இருந்தும் இயற்கை அனர்த்தத்தால் ஏற்படும் பாதிப்புகளைக் கட்டுப்படுத்த முடியாமல் போயுள்ளது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த அனர்த்தத்தால் கொழும்பு போன்ற நகர்ப்புறங்கள் வெள்ளத்தால் பாதிக்கப்பட்ட நிலையில், நுவரெலியா, பதுளை, கண்டி, மாத்தளை, இரத்தினபுரி, கேகாலை போன்ற மாவட்டங்கள் மண்சரிவால் பாதிக்கப்பட்டன. மண்சரிவால் ஏற்படும் அனர்த்தம் என்பது ஒவ்வொரு மழைக் காலத்திலும் இடம்பெற்றுக்கொண்டுதான் இருக்கின்றது. இயற்கை அனர்த்தங்களைத் தவிர்க்க முடியாது. எனினும், அவற்றால் ஏற்படுகின்ற இழப்புகளைக் குறைக்க முடியும்.

பாதுகாப்பான வீடு கேட்டு மக்கள் போராட்டம் செய்வதை ஊடகங்களில் காணக்கூடியதாக இருக்கின்றது. மலையக மக்களுக்கு வீடுகளைக் கட்டிக்கொடுப்பதற்கு 9 இலட்சம் பேச்சர்ஸ் காணி வேண்டுமெனக் கூறி, வீடமைப்புத் திட்டங்களுக்குக் காணிகளை வழங்குவதில் தடையாக இருக்க வேண்டாம். மலையக மக்களுக்கான வீடுகளை நிர்மாணிக்கத் தேவையான காணியின் அளவு ஒட்டுமொத்த பெருந்தோட்டக் கம்பனிகளின் காணியில் 10 சதவீதமாகும். இதனை வழங்குவதற்கு எந்தப் பிரச்சினையும் இருக்காது. நாங்கள் 'நல்லாட்சி' அரசாங்க காலத்தில் 7 பேச்சர்ஸ் வீதம் காணிகளை வழங்கி, வீடுகளை நிர்மாணித்தோம். அதேபோல், இந்த அரசாங்கமும் 7 பேச்சர்ஸ் அல்லது 10 பேச்சர்ஸ் வீதம் காணிகளை வழங்கி, வீடுகளை நிர்மாணிக்க நடவடிக்கை எடுக்க வேண்டும். நாங்கள் எங்களுடைய ஆட்சிக் காலத்தில் மலையக மக்களுக்கான முக்கிய பல வேலைத்திட்டங்களைச் செய்தோம். ஆனால், ஆளும் தரப்பிலுள்ள உறுப்பினர்கள் நாங்கள் ஒன்றுமே செய்யாததுபோல் பேசுகின்றார்கள். எதிர்க்கட்சியில் இருக்கும்போது, எங்களைவிட நீங்கள்தான் மலையக மக்கள்மீது அதிக அக்கறைகொண்டு பேசினீர்கள். அதே அக்கறையுடன் பாதிக்கப்பட்ட மக்களுக்குக் காணிகளை உடனடியாக வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். ஏனெனில், உங்களிடம்தான் தற்போது அதிகாரம் உள்ளது. பெருந்தோட்டக் கம்பனிகளை அழைத்துப் பேசி, பாதுகாப்பான இடங்களை வழங்க வேண்டும்.

200 வருட காலமாக இந்த நாட்டுக்காக உழைக்கும் பெருந்தோட்ட மக்களுக்குக் காணிகளை வழங்க முடியாது என்றால், அந்தக் காணிகள் எதற்கு? பெருந்தோட்டக் கம்பனிகள் இலாபத்தை மாத்திரமே பார்க்கின்றன. அப்பாவி மக்களின் வாழ்க்கை பற்றி பெருந்தோட்டக் கம்பனிகளும் இந்த அரசாங்கமும் யோசிக்க வேண்டும். இந்திய அரசாங்கத்தால் வழங்கப்பட்ட 10,000 வீடுகள் உள்ளன. இந்த வீடமைப்புத் திட்டத்தின்கீழ், அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மற்றும் அனர்த்த அபாயமுள்ள பிரதேசங்களிலுள்ள மக்களுக்குரிய வீடுகளை விரைவாக கட்டிக்கொடுப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும்.

எமது நாடு நெருக்கடி நிலைமையைச் சந்தித்தபோது பல நட்பு நாடுகள் ஒத்துழைப்பு வழங்கியதுடன், உதவிகளையும் செய்து வருகின்றன. விசேடமாக, அயல் நாடான இந்தியா ஒவ்வொரு சந்தர்ப்பத்திலும் எமக்கு உறுதுணையாக இருந்து வருகின்றது. சுனாமி, கொரோனா மற்றும் பொருளாதார நெருக்கடி காலங்களில் உதவியதுபோலவே, இப்போது ஏற்பட்டுள்ள அனர்த்தத்தின்போதும் அதிகமான உதவிகளை இந்தியா செய்து வருகின்றது. அதற்காக இந்திய அரசாங்கத்துக்கு என்னுடைய விசேட நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමනි, ඇත්තටම ඒ ජනතාව විපතට පත් වෙච්ච වෙලාවේ හැම තැනම පාරවල් බ්ලොක් වෙලා අපි කාටවත් නුවරඑළියට යන්න බැරි වුණා. හැබැයි, ඒ වෙලාවේ ආණ්ඩුවේ නිලධාරින් සහ හමුදාව තමයි ඒ ප්‍රදේශවල ජනතාවට උදවු කරන්න හිටියේ. එම නිසා ඒගොල්ලන්ට මම මේ අවස්ථාවේදී ස්තුති කරන්න කැමැතියි. මම පයින් කොත්මලේට ගියා. ඒ පාරවල්වල යන්න බැහැ. මම එතැනට යනකොට ඇත්තටම ඒ මිනිස්සු අමාරුවෙන් හිටියේ. මම ඔබතුමාට කියන්නේ ඒ ප්‍රදේශවලට එන්න කියායි. නුවරඑළියටත් එන්න. හැබැයි, bylanesවලින් එන්න එපා. වැවන්ඩන් වත්තේ මිනිස්සු එතැනට යන්න කැමැති නැහැ. බගවන්තලාව කිව් වත්තේ මිනිස්සු එතැනට යන්න කැමැති නැහැ. ඒ වාගේම මම නානුඔය ඩෙස්පොඩ් වත්තට ගියා. ඒ රේල් පීලි පවා පහළට ගිහිල්ලා තිබෙනවා. ඒ මිනිස්සුත් එතැනට යන්න කැමැති නැහැ. නමුත් වත්තේ මැනේජර්ලා කියනවා ලු, ගෙවල් හදන්න එතැනට යන්න කියලා. මම ඔබතුමාට මේ කාරණයයි කියන්නේ. අපට ඔබතුමා ගැන විශ්වාසයක් තිබෙනවා. ඔබතුමන්ලා අපටත් වඩා වැඩියෙන් වතුකරයේ ජනතාව ගැන කථා කළා. දැන් ඔබතුමන්ලාට බලය තිබෙනවා. ඔබතුමන්ලා ඒ අදාළ තීන්දු ගන්න. මේ වෙලාවේ ඔක්කෝටම නැතුව නාය යාමෙන් විපතට පත් වුණු අයට පර්චස් 10ක් හරි දීලා ගෙවල් ටික හදලා දෙන්න කටයුතු කරන්න. මොකද, ඉන්දියානු ආධාර මත හදපු ගෙවල් තිබෙනවා. ඒගොල්ලන් එක්කත් කථා කරලා, වහාම ඒ ගෙවල් හදන්න පුළුවන්. ඒ වෙනුවෙන් අපි ඔබතුමාට සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු පලනි දිගම්බරම් මහතා**
(மாண்புமிகு பழனி திகாம்பரம்)
(The Hon. Palani Thigambaram)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

ඒ මිනිස්සු ඇත්තටම ඊයේ පෙරේදා උද්ඝෝෂණ කරන්න පටන් ගත්තා. අපි ඒවාට කිසිම සම්බන්ධයක් නැහැ. ඔබතුමාත් දන්නවා, අපි මේ වෙලාවේ ආපදා තත්ත්වයත් එක්ක දේශපාලනය කරන්න කැමැති නැහැ කියන එක. මේ වෙලාවේ අපි ආණ්ඩුවට සහයෝගය ලබා දෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු පලනි දිගම්බරම් මහතා**
(மாண்புமிகு பழனி திகாம்பரம்)
(The Hon. Palani Thigambaram)
මට මිනිත්තුවක කාලයක් ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විපක්ෂයේ කාලය නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු පලනි දිගම්බරම් මහතා**
(மாண்புமிகு பழனி திகாம்பரம்)
(The Hon. Palani Thigambaram)
ඔබතුමන්ලා පඩි වැඩි කරපු නිසා අපි අය වැයට පක්ෂව ඡන්දය දුන්නා. ඒ වාගේ හොඳ වැඩ කරන ඒවාත් එක්ක අපි ඔබතුමන්ලා සමඟ ඉන්නවා. ඔබතුමන්ලාට බලය තිබෙනවා. පර්චස් හතක් හරි, දහයක් හරි දීලා ඒ මිනිස්සුන්ට ගෙවල් ටික හදලා දෙන්න. පාසල්වල, කෝවිල්වල මිනිස්සු ඉන්නවා. ඒ අයට දිගටම ඒවායේ ඉන්න බැහැ. කරුණාකරලා ඒ අයට ටෙන්ට් හරි දීලා වෙනම පදිංචි කරලා, ඒ ගෙවල් ටික හදලා දෙන්න කියලා මම මේ වෙලාවේදී ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) හංසක විජේමුණි නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.36]

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපි නොහිතපු විදියේ ව්‍යසනයකට ලක් වෙලා ඒ ගැන කථා කරන මොහොතක්, මේ. විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කය ඇතුළු දිස්ත්‍රික්ක කිහිපයකට තදින්ම මේ ව්‍යසනය බලපෑවා. දැන් එහි acute phase එක, එහෙම නැත්නම් මූලික අවධිය පසු කරමින් යන්නේ. ඒ නිසා ඊළඟ පියවර වඩාත් සංවිධානාත්මක කර ගැනීමේ වගකීම අපට තිබෙනවා වාගේම මෙවන් තත්ත්වයක් ඉදිරියේදී ආවොත් මීට වඩා සංවිධානාත්මකව ඒ සඳහා සූදානම් වීමේ වගකීමත් තිබෙනවා. ඒක නිසා මේ ගැන නැවත සොයා බැලීම, නැවත විපරම් කිරීම බොහොම වැදගත් වෙනවා. දේශගුණික හා කාලගුණික විපර්යාස නිසා බලපෑමට ලක් වන ලෝකයේ මුල්ම රටවල් 10 ඇතුළත නම් කරපු එක රටක් තමයි, ලංකාව. ඒක නිසා මේ වාගේ විපත්ති, ව්‍යසන අපට බලාපොරොත්තු වෙන්න වෙනවා. නමුත්, ඒවා ව්‍යසනවලින් තොරව, විපත්තිවලින් තොරව කෙළවර කර ගැනීමේ වගකීම අප සතු වෙනවා. අපි මේ ලෝකයේ තිබෙන දියුණු තාක්ෂණය, දියුණු දැනුම මුසු කරගෙන අපේ රටේ සිටින බුද්ධිමතුන්ගේ, උගතුන්ගේ ඥානය මීට වඩා සංවිධානාත්මකව ලබා ගෙන ඉදිරියේදී වඩාත් සැලසුම් සහගතව මේවාට මුහුණ දීම තමයි මේ මොහොතේදී වඩාත් වැදගත් වෙන්නේ. මේ කාලගුණික තත්ත්වය නිසා මුල් පැය කිහිපය තුළ දැඩි අසීරුතාවකට අපට මුහුණපාන්න සිදු වුණා. විශේෂයෙන්ම අපේ ප්‍රධාන නගරවල වතුර, විදුලිය, සන්නිවේදන පහසුකම් කියන සියල්ල ඇනහිටියා. ඒ වාගේම ප්‍රවාහන පහසුකම් ඇනහිටියා. ප්‍රවේශ මාර්ග නැති වුණා. ඒ වාගේම ඉන්ධන ඇතුළු වෙනත් ආහාර ද්‍රව්‍ය සැපයුම් මාර්ග අවහිර වුණා. ඒ හැම එකක්ම එකින් එක, එකින් එක විසඳාගෙන අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, මේ වෙනකොට අපේ ප්‍රදේශවල ජන ජීවිතය සාමාන්‍ය තත්ත්වයට පත් කරන්න. අපි සාමාන්‍ය තත්ත්වයට නිකම්ම පත් වුණේ නැහැ. මට කලින් කථා කළ ගරු ඇමතිවරු, මන්ත්‍රීවරු ඒ පිළිබඳව සඳහන් කළා. අපේ රටේ සෑම පුරවැසියෙක්ම එම කටයුතු සඳහා දැඩි කැපවීමක් කළා. අපේ ප්‍රදේශවල විපතට පත් වුණු අය පවා ඒ කටයුතුවලට සම්බන්ධ වුණා. අපේ සුරක්ෂා මධ්‍යස්ථානයක් බලා ගත් සහෝදරයකුගේ අම්මා, තාත්තා අනතුරට ලක් වෙලා තිබියදීත්, ගෙවල් අනතුරට ලක් වෙලා තිබියදීත් ඔහු එම සුරක්ෂා මධ්‍යස්ථානය බලා ගන්න කෙනා විධියට කටයුතු කරමින් සිටියා. ඒ වාගේම සමහර නිලධාරින් ඔවුන්ගේ ගෙවල්වලට මොනවා වුණාද කියලාවත් දන්නේ නැතුව සහන කටයුතුවලට සම්බන්ධ වෙලා සිටියා. ඒගොල්ලෝ දවස් හතරකට, පහකට පසුව තමයි ගෙවල්වලට ගිහින් බැලුවේ, ගෙවල් තිබෙනවාද කියලා. ඒ විධියට ඔවුන් මැදිහත් වුණා.

සෞඛ්‍ය සේවාව පැත්තෙන් ගත්තාම, අපට සෑහෙන ලොකු අභියෝගවලට මුහුණ දෙන්න සිදු වුණා. මොකද, අපේ රෝහල් පද්ධතිය වතුර නැතුව, electricity නැතුව පවත්වාගෙන යන්න බැහැ. එම නිසා අපට මුල්ම අභියෝගය වුණේ, විදුලිය ලබා ගැනීමයි. ඒ අනුව අපේ ලංකා විදුලිබල මණ්ඩලය හැම නගරයේම මුලින්ම විදුලිය දුන්නේ රෝහල්වලට. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මුලින්ම ජල සැපයුම දුන්නේ, රෝහල්වලට. අපි ඔවුන්ට හිස නමා ස්තුතිය පුද කරනවා. ඒ වාගේම පොලීසිය ඇතුළු ආරක්ෂ අංශය ලොකු කැපවීමකින් කටයුතු කළා. පසුගිය දවස්වල අපට වැඩියෙන්ම engineersලා එක්ක තමයි වැඩ කරන්න සිදු වුණේ. ඇත්තෙන්ම Ceylon Electricity Board එකේ අය කැලෑ ප්‍රදේශවල තිබෙන ස්ථානවලට හිතා ගත නොහැකි විධියට විදුලි රැහැන් ඇදලා තමයි විදුලිය ලබා දුන්නේ. තවමත් සමහර තැන්වල තාවකාලික විදුලි රැහැන් පද්ධති තමයි තිබෙන්නේ. National Water Supply and Drainage Board එක හිතා ගන්නවත් බැරි විධියට එම ප්‍රතිසංස්කරණ කටයුතු ටික කළා. ඒ වාගේම බොහෝ ආයතනවල නිලධාරින් සහයෝගයෙන් වැඩ කළා. උදාහරණයක් විධියට කිව්වොත්, CECB එකේ ඉංජිනේරුවරු ඇවිල්ලා National Water Supply and Drainage Board එකේ වැඩවලට උදවු කළා. ඒ වාගේම Ceylon Electricity Board එකට සහයෝගය දුන්නා. කවුරුවත් තමන්ගේ සීමා ඉර mark කරන්න ගියේ නැහැ. ප්‍රාදේශීය සභාව මුලින්ම ඔවුන්ට අයිති පාරවල් හැදුවේ නැහැ. ඔවුන් මුලින්ම RDA එකට අයිති පාරවල් තමයි හැදුවේ. ඊට පසුව PRDA එකට අයිති පාරවල් හදලා තමයි ප්‍රාදේශීය සභාවලට අයිති පාරවල් හදන්න කටයුතු කළේ. ඒ වාගේම අපේ ප්‍රාදේශීය සභාව මෙතැනින් අපට අයිති කොටස අවසන් කියලා නැවැත්වූයේ නැහැ. යටිනුවර ප්‍රාදේශීය සභාවේ, කඩුගන්නාව නගර සභාවේ වැඩ ටිකත් අපි එම වාහන දාලා කරලා දැම්මා. මෙම ව්‍යසනයේදී ඒ විධියට තමයි අපි කටයුතු කළේ.

මෙම ව්‍යසනයෙන් අපේ හලාවත රෝහල, මහියංගනය රෝහල සහ වත්තේගම ප්‍රාදේශීය රෝහල කියන රෝහල් තුනම සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය තත්ත්වයට පත් වුණා. මේ වනකොට අපි මහියංගනය සහ හලාවත රෝහල් සාමාන්‍ය තත්ත්වයට පත් කරලා තිබෙනවා. වත්තේගම ප්‍රාදේශීය රෝහල අපි එම ප්‍රදේශයේම වෙනත් තැනක ස්ථාපිත කරන්න බලාපොරොත්තු වන නිසා අපි තාවකාලිකව එම රෝහල ඒ ප්‍රදේශයේ MOH Office එකේ පවත්වාගෙන යනවා. ඒ විධියට අපි වෙනත් ස්ථානවල ස්ථාපිත කරන්න බලාපොරොත්තු වන රෝහල් සංඛ්‍යාව 08යි. හැබැයි, ඒ රෝහල් 08ම අපි පිහිටුවන්නේ එම අදාළ ප්‍රදේශවලමයි; එම ප්‍රදේශ ආශ්‍රිතවමයි. වෙන කොහේවත් ප්‍රදේශවල ස්ථාපිත කරන්නේ නැහැ.

අපේ රෝහල් පද්ධතියට සිදු වුණු හානිය රුපියල් මිලියන 21,135යි. එය විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැනි ආයතනවලට වුණු හානිය හා සසඳා

[ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා]

බැලීමේදී අඩු අගයක් වුණත්, එපමණ හානියක් අපේ රෝහල් පද්ධතියට සිදු වෙලා තිබෙනවා. ඒවා නැවත ගොඩනැඟීම සඳහා ඒ වාගේම මුදලක් අපට වැය වනවා. අපි දැන් මුහුණ පා සිටින අභියෝගය තමයි, කඳවුරුවල ඉන්න අවතැන් වූ ජනතාව යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් තබා ගන්නේ කොහොමද කියන එක. කියන්න සතුටුයි, වතුර සහ කෑම supply එක හරියට දෙන්න නොහැකිව තිබුණු මුල් දවස් දෙක තුනේ සහ තත්ත්වය සම්පූර්ණයෙන් පාලනය කර ගත් පසුවත් කිසිම කඳවුරකින් කිසිදු වසංගත රෝග තත්ත්වයක් වාර්තා නොවී අවතැන් වූ ජනතාව යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් තියාගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒක සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විතරක් නොවෙයි, හැමෝගේම ජයග්‍රහණයක්.

අපේ රෝහල් පද්ධතියේ වෛද්‍යවරුන් හා nursesලාගේ ඉඳලා සුළු සේවකයන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය අඩු පහසුකම් යටතේ ඉතා කැපවීමෙන් වැඩ කළා. අපි එය අගයන්න ඕනෑ. අපි දැන් සාකච්ඡා කරමින් ඉන්නවා, අපේ රට මේ වාගේ ස්වාභාවික ව්‍යසනවලදී නොසැලෙන රටක් බවට පත් කරන්නේ කොහොමද කියලා. මීට දවස් දෙකකට ඉස්සෙල්ලා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ මහාචාර්යවරු කිහිපදෙනෙක් එකතු වෙලා විද්වත් කතිකාවක් පටන් ගත්තා, හදිසියේම ඇති වන කාලගුණික තත්ත්ව හමුවේ පැය කිහිපයක් තුළ අපි මේ රටේ ඒ ඒ ප්‍රදේශවල ජනතාවට කොහොමද පණිවුඩ සන්නිවේදනය කරන්නේ කියන එක සම්බන්ධයෙන්. AI තාක්ෂණය සහ අනෙකුත් තාක්ෂණ ඔස්සේ මේ පණිවුඩ සන්නිවේදනය කරන්නේ කොහොමද, අපි කොහොමද එක් එක් තැන් යටවන ප්‍රමාණය හරියටම නිර්ණය කරගන්නේ කියන එක ගැන ඔවුන්ගේ දැනුම් පද්ධතිය ආශ්‍රයෙන් ඔවුන් අපට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම අපි බලාපොරොත්තු වෙනවා, එවැනි දැනුම් පද්ධතියක් ප්‍රයෝජනයට අරගෙන එළඹෙන මාස කිහිපය තුළ මහවැලි ගඟ ආශ්‍රිතව මහජනතාවට ඒ පිළිබඳ දැනුම් දීමේ ක්‍රමවේදයක් නිර්මාණය කරන්න. ඒ සඳහා අපි මූලික පියවර තබා තිබෙනවා. ඒක අපි ඉදිරියට කරගෙන යනවා. ඒ වාගේම, මේ වෙලාවේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය ලොකු අභියෝගයකට මුහුණ දී තිබෙනවා. මම හිතන විධියට, ලංකාවේ ස්ථාන 8,000කට වැඩි ප්‍රමාණයක් ඔවුන්ට පරීක්ෂා කිරීමට සිදුව තිබෙනවා. නමුත්, ඔවුන්ගේ කාර්ය මණ්ඩලය එතරම් විශාල ප්‍රමාණයක් නැහැ. ඒ නිසා අපි යෝජනාවක් කළා. ඒ යෝජනාව ඔවුන් පිළිගත්තා. ඒ අනුව, වෙනත් තැන්වල ඉන්න භූ විද්‍යාඥයන්ගේ, වෙනත් තැන්වල සිටින මේ සම්බන්ධව දැනුමක් තිබෙන ඉංජිනේරුවන්ගේ සහායත් අරගෙන ඔවුන් මේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට විධිමත් ක්‍රමයක් සම්පාදනය කරගෙන තිබෙනවා. ඒ නිසා එහි අධ්‍යක්ෂ ජනරාල්තුමාට අපි ස්තුතිවන්ත වෙනවා, හුදු සාමාන්‍ය ක්‍රියාවලිය ඉක්මවා ගිහින්, දෙපාර්තමේන්තුවේ සාමාන්‍යයෙන් හිතන විධිය ඉක්මවා ගිහින්, එතැනින් එහාට ගිහින් වැඩ කරන්න ඇති වුණු ඒ එකඟතාව පිළිබඳව.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද උදේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධව නොයෙකුත් දේවල් කථා කළා. ඒවා ගැන මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. නමුත්, එක් කාරණාවක් ඉදිරිපත් වුණා, රෝහලක තිබුණු ඇඳක් වෙනත් තැනකට අරගෙන ගියා කියලා; ඒ කියන්නේ, පදවිය රෝහලේ තිබුණු operationsවලට භාවිත කරන ඇඳක් තඹුත්තේගම රෝහලට අරගෙන ගියා කියලා. ඇත්තටම වෙලා තිබෙන්නේ මේ දවස්වල තඹුත්තේගම රෝහලේ තිබෙන ඇඳ repair කරනවා. පදවිය රෝහලේ මේ දවස්වල operations කරන්න වෛද්‍යවරු නැහැ. ඒ නිසා ඒක තාවකාලිකව තමයි අරගෙන ගියේ. අර ඇඳ හැදුවාම නැවත ඒක පදවිය රෝහලට අරගෙන එනවා. ඒ වාගේම, ඖෂධ සම්බන්ධව කථා කළා. ඒ සම්බන්ධව ගොඩක් උත්තර ලබා දී තිබෙන නිසාත්, ඒ වාගේම අද දවසේ මාතෘකාව ඒක නොවන නිසාත් මේ අවස්ථාවේ මම ඒ ගැන කථා කරන්නේ නැහැ. ඒ හැම දෙයක් සම්බන්ධවම අපි නීත්‍යානුකූලව සහ විධිමත්ව ක්‍රියා කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වූ ඕනෑම දෙයකට අපි අවශ්‍ය වෙලාවේදී අවශ්‍ය විධියට පිළිතුරු ලබා දී තිබෙනවා. ඒ නිසා නැවත නැවතත් ඒ පිළිබඳ සඳහන් කරන්න අවශ්‍යතාවක් නැහැ. අවසාන වශයෙනුත් මම මේ කාරණය කියන්න කැමැතියි. අපි ඉන්නේ අපේ පළමු stage එකේ අවසානයේ. අර ව්‍යසනය අවස්ථාවේ වාගේ නොවෙයි, සංවිධානාත්මකව හා එකමුතුව අපි මේ අභියෝගයට මුහුණ දෙමු. අපට දීර්ඝකාලීන අභියෝගයක් තිබෙනවා. ඒ අභියෝගයටත් අපි මුහුණ දෙමු. අපි නිතර මේ විධියේ දේවල් බලාපොරොත්තු විය යුතු රටක් නිසා ඒ සඳහා මුහුණ දීමට අපේ රට ශක්තිමත් කරමු කියන යෝජනාව කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින පස්වරු 2.00ට පැවැත්වීමට නියමිතව තිබුණා, කොළඹ වරායෙන් කන්ටේනර් 323ක් නිදහස් කිරීම සම්බන්ධව පත් කළ විශේෂ කාරක සභාවේ රැස්වීමක්. මේ යෝජනාව භාර දීලා මාස 2කට වැඩියි. ඒ සිදුවීම සිදුවෙලා මාස 11ක් වෙනවා. එය මේ රටේ සිදු වුණු බරපතළ වංචාවක්. ඒ වාගේම, ගැඹුරු සාකච්ඡාවක් තිබෙන ප්‍රශ්නයක්. මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් හරහා සාකච්ඡා වීම ඉතා වැදගත්. නමුත්, මේ යෝජනාව භාර ගැනීමේ ඉඳලා ඉදිරිය දක්වා විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අද හදිසියේම මේ රැස්වීම අවලංගු කර තිබෙනවා. මේක බරපතළ තත්ත්වයක්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ ආකාරයට මේ වාගේ ජාතික වශයෙන් වැදගත්කමක් තිබෙන කාරණයක් පිළිබඳව සාකච්ඡා කිරීමට තිබෙන රැස්වීම කල් තබපු එක වැරදියි. ඒ පිළිබඳව ගරු කථානායකතුමා කඩිනමින් පියවර ගත යුතුයි කියා අපි විශ්වාස කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඒ පිළිබඳව ගරු කථානායකතුමා එක්ක කථා කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
**(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අධිකරණ ඇමතිතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
**(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)**
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම එම විශේෂ කාරක සභාවේ සභාපති වශයෙන් කටයුතු කරන නිසායි මේ කාරණය දැනුම් දෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දිනට එම කමිටු රැස්වීම යෙදුවේ හදිසියේ. මේක ජනවාරි මාසයේ පවත්වන්නටයි නියමිතව තිබුණේ. මට මේ කමිටුවේ සාමාජිකයින් ගණනාවක් දැනුම් දුන්නා මේ පාර්ලිමේන්තු රැස්වීම් දින දෙක වැටුණේ හදිසියේ, වේලපහ වැටුණේ නැහැ, ඒ නිසා එතුමන්ලාට එන්න අපහසුයි කියලා. ඒ අනුව තමයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම දැනුම් දුන්නේ කලින් යොදපු විධියට ජනවාරි මාසයට මේ රැස්වීම කල් තබන්න ඕනෑ කියලා. එහෙම නැතිව අපි පමා කරන්න කටයුතු කළා නොවෙයි. මොකද, මේ දින දෙකේ පාර්ලිමේන්තු රැස්වීම් වැටුණේ හදිසි අවස්ථාව වෙනුවෙන්. ඒ නිසා අනිවාර්යයෙන්ම ඒ කටයුත්ත ජනවාරි මාසයේ කෙරෙන බව තහවුරු කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
**(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.48]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
**(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)**
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ඛේදවාචකය තුළ අභියෝග ගණනාවක් තිබෙනවා. සමහර ඇමතිවරු තවමත් විපක්ෂයට චෝදනා කරමින් කථා කරනවා මම දැක්කා. ඇමතිවරුන් ගම්වලට ගිහිල්ලා ජනතාවට විහිළු සපයමින් ඉන්නවා අපි ගොඩක් තැන්වලදී දැක්කා.

මම මගේ මේ කථාවේ මුලින්ම කියන්න ඕනෑ මේ ඛේදවාචකය සිදු නොවුණු පළාත්වල ජනතාව -දකුණු පළාත ඇතුළු අනෙකුත් පළාත් ගණනාවක ජනතාව- ඇවිල්ලා ඒ ආපදා තත්ත්වයට මුහුණ දීපු ජනතාව වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉෂ්ට කළ බව. අපි ඒ ගැන සතුටු වෙනවා. ඒ වාගේම අපි ඒ අයට ස්තුති කරනවා. ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සෞඛ්‍ය ක්ෂේත්‍රය, විශේෂයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ඉඳලා ග්‍රාම නිලධාරි දක්වා සියලු නිලධාරින් විශාල කාර්යභාරයක් තමන්ගේ රාජකාරි තත්ත්වයට එහා ගිහින් ජනතාව වෙනුවෙන් ඉෂ්ට කළා කියන එක අපි ඉතාම සතුටින් මතක් කරන්න ඕනෑ.

මේ ප්‍රශ්නය විසඳන්න කියන සමහර දේවල් ඒ කියන තරම් ලස්සනට වෙන්නේ නැහැ. දැන් මේ සභාවේදී ඇමතිවරු ගණනාවක් කථා කළා ඒ දේවල් ඔක්කෝම බොහොම ලස්සනට සිදු වෙනවා වාගේ. එහෙම වෙනවා නම් හොඳයි, නමුත් එහෙම වෙන්නේ නැහැ. කොත්මලේ ජලාශය ආශ්‍රිත සිද්ධියත් එක්ක බලන කොට, මේ ඛේදවාචකයට පෙර මෙහි හානිය අවම කර ගන්න තිබුණු අවස්ථා ගණනාවක් අපට මහ හැරී තිබෙනවා. අපි ඒවා ගැනත් බලන්න ඕනෑ. මොකද, මේ තත්ත්වය තුළ ජීවිත ගණනාවක් අහිමි වෙලා තිබෙනවා. අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේත් ජීවිත විශාල ප්‍රමාණයක් අහිමි වෙලා තිබෙනවා, සමහර අය අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ සියලු ජීවිත හානි සිදු වෙලායි තිබෙන්නේ. නැවත පදිංචි කිරීම තුළත් අපට ප්‍රශ්න ගණනාවක් එනවා. ආණ්ඩුව පාර්ශ්වයේ ගොඩක් කථාවලදී කියැවුණා "මේ වන කොටත් අපි ඉඩම් සොයාගෙන අවසානයි, ස්ථාන හරි, ඔක්කෝම හරි" කියලා. හැබැයි ප්‍රායෝගිකව මහ පොළොව මත එහෙම එකක් නැහැ; භූමිය මත එහෙම සිද්ධියක් වෙලා නැහැ. ඒවාට යම් කාලයක් ගත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එක උදාහරණයක් ගත්තොත්, නාය යාම් නිසා කඳවුරුවල හිටපු ජනතාවට දැන් මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? පාසල් ආරම්භ කරන කොට, ඒ කඳවුරුවල හිටපු අයට එක පාරටම කිව්වා ඉවත් වෙන්න කියලා. පාසල් ආරම්භ කරන්න ඕනෑ තමයි. අපි කියන්නේ නැහැ පාසල් වහලා තියන්න කියලා. නාය ගිය නිවාසවලට අමතරව ඒ ප්‍රදේශයේ අනෙකුත් නිවාසවල ජනතාවටත් දැනුම් දීලා තිබුණා ඒ නිවාසවලින් ඉවත් වෙන්න කියලා. එතකොට පවුල් 75කට, 100කට එක පාරටම අයින් වෙන්න කිව්වාම කොහොමද එයාලා තැනක් සොයාගෙන යන්නේ? එහෙම ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒකට ඕනෑ තරම් උදාහරණ අපට තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
**(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
**(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)**
(The Hon. J.C. Alawathuwala)
මට තව පොඩි කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

දොඩංගස්ලන්ද, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉකිරියවත්ත සම්පූර්ණයෙන් අනතුරුදායකයි කියලා වාර්තාව ලබා දීලා තිබියදී, ඒ අයට කඳවුරෙන් ඉවත් වෙන්න කිව්වා. නමුත් තැනත් සොයා දීලාත් නැහැ. එහේ විතරක් නොවෙයි, ඒ වාගේ ප්‍රශ්න තිබෙන තැන් ගණනාවක් තිබෙනවා.

විශේෂයෙන්ම කියන්න ඕනෑ මාවතගම ආසනයේ දුනුකේවත්ත, කන්දේගෙදර ප්‍රදේශයේ මරණ 9ක් සිද්ධ වුණු බව. ඒ වාගේම ඒ ප්‍රදේශය දැන් ජීවත් වෙන්න සුදුසු නැහැ කියලා වාර්තා දීලා තිබෙනවා. ඒ අනුව අවශ්‍ය ඉඩම් ප්‍රමාණය සුදුසු ප්‍රදේශයකින් සොයා ගන්න අපට අනිවාර්යයෙන්ම සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම ඉඳුල්ගොඩ කන්දේ මරණ 11ක් සිද්ධ වුණා. මාවතගම ආසනයේ, වල්පොලකන්ද ප්‍රදේශයේත් නිවාස ගණනාවක ජනතාවට ඉවත් වෙන්න කියලා තිබෙනවා. දොඩංගස්ලන්ද ආසනයේ දුනුමාව, අඹතැන්න, මීරිස්සල, ඉකිරියවත්ත, අරුණ උදාගම, බඹරකන්ද, කළුගහතැන්න ආදියෙහි මරණ 13ක් සිද්ධ වෙලා තිබෙනවා. මේ කියන සියලු කඳු නාය ගිහින් තිබෙන්නේ. ඒ අයට ඒ ප්‍රදේශවල ජීවත් වෙන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම හිරියාල ආසනයේ පුදුක්කුලම, පල්ලියැද්ද, ඕමාරගොල්ල මරණ 21ක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම දැදුරු ඔය ආශ්‍රිතව ජීවත් වුණු සියලුදෙනාගේම නිවාස හානියට පත් වෙලා තිබෙනවා. නිකවැරටිය ආදි ප්‍රදේශවල විශාල හානි සිද්ධ වෙලා තිබෙනවා, දැදුරු ඔය ජලාශයෙන් එහා කට්ටියට. මේවා සම්බන්ධව දැනට ගෙන තිබෙන ක්‍රියා මාර්ගවලට අමතරව ගත යුතු තවත් ක්‍රියාමාර්ග තිබෙනවා. එහිදී අභියෝග ගණනාවක් තිබෙනවා.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

එකක් තමයි, මරණ සිදු වෙච්ච අයගේ පවුල්වල අයට ඇති වෙලා තිබෙන කම්පනය. තවත් එකක් තමයි, ඒ නිවාසවල ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබීම. එම නිසා අලුතින් නිවාස හදන්න අවශ්‍ය භූමිය ලබා ගැනීමට අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මට තව පොඩි වෙලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ සම්බන්ධයෙන් කථා කරනවා වාගේම ක්‍රියාත්මක වෙන්නත් ඕනෑ. මොකද, අද රුපියල් 25,000 බෙදන එකේ ඉඳලා සමහර තැන්වල අකටයුතුකම් ගණනාවක් වෙලා තිබෙනවා; දේශපාලන මැදිහත්වීම් වෙලා තිබෙනවා. ඒ වාගේම, මේ වනකොට ග්‍රාම නිලධාරි සංගම් දෙකක් කියලා තිබෙනවා, "අපිට බලපෑම් ආපු නිසා මේවා නිසියාකාරව ක්‍රියාත්මක කරන්න බැහැ" කියලා. එහෙම වුණොත් මේක තවදුරටත් ප්‍රමාද වෙනවා. ඒකෙන් අවාසි වෙන්නේ ජනතාවට. ඒ වාගේම, ඒ ජනතාව අද මානසිකව විශාල වශයෙන් පීඩාකාරී තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. ඒ නිසා ඒ සඳහා අවශ්‍ය පියවර ගන්න ඕනෑ කියන එක පැහැදිලිව මම මතක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රියාස් ෆාරුක් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.53]

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැනට සති තුනකට කලින් -පසුගිය 27වැනි දා- ඇති වුණු සුළි කුණාටු විපත ගැන කරන මේ විවාදයේදී මටත් වෙලාව වෙන් කර දීම ගැන ස්තුතිවන්ත වෙනවා. පසු ගිය දවස්වල සිදු වූ ගංවතුර සහ නාය යාම ආපදාවෙන් සියලු දිස්ත්‍රික්කවල මිය ගිය සියලුදෙනාගේම පවුල්වල අයට මාගේ ශෝකය ප්‍රකාශ කරනවා. கடந்த 27ஆம் திகதி - 3 வாரத்திற்கு முன்னர் - ஏற்பட்ட வெள்ளம் மற்றும் மண் சரிவுகளால் பாதிக்கப்பட்ட, உயிரிழந்த அனைத்து மாவட்டத்தைச் சேர்ந்தவர்களுக்கும் எனது அனுதாபத்தைத் தெரிவித்துக் கொள்கின்றேன்.

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර, ගම්පොළ, බෙලිහුල්ඔය, කලුගමුව හා අකුරණ වැනි ප්‍රදේශවලට විශාල හානියක් සිදු වුණා. ඒ හානිය සිදු වුණාට පස්සේ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිසාපතිතුමා, ආණ්ඩුකාරතුමා ඇතුළු සියලු ආයතනවල නිලධාරින් රැස් වෙලා අවශ්‍ය වැඩ කටයුතු කරගෙන ගියා. ඒ වාගේම තමයි, ප්‍රාදේශීය ලේකම් ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලය වාගේම ලංකා විදුලිබල මණ්ඩලය, Water Supply and Drainage Board එක, ත්‍රිවිධ හමුදාව, පොලීසිය ඇතුළු සියලු ආයතනවල නිලධාරින්, ග්‍රාම නිලධාරින්, RDA, PRDA වැනි ආයතනවල නිලධාරින්, ආපදා නිලධාරින් ආදි සියලු දෙනා ඉක්මනින් තැන් තැන්වල රැස් වෙලා ඒ අවශ්‍ය වැඩ කටයුතු ටික ආරම්භ කළා. ඒ වෙලාවේ communication පහසුකම් තිබුණේ නැහැ; electricity තිබුණේ නැහැ; වතුර තිබුණේ නැහැ. ඒ මොහොතේදීත් සියලුදෙනා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එකතු වෙලා මමත් එක්ක වැඩ කළා. ඒ සියලුදෙනාට මගේ ස්තුතිය පුද කරනවා.

ඒ වාගේම තමයි, අපට තවත් හයියක් දෙන්න දවසකින්, දෙකකින් ගාල්ලේ ඉඳලා ඇමතිවරු, මන්ත්‍රීවරු, සභාපතිවරු, ජනතාවත් එක්ක - 1,200ක විතර පිරිසක් එක්ක - මහනුවර දිස්ත්‍රික්කයට ආවා. ඒගොල්ලෝ නිකම් ආවේ නැහැ. Backhoes, pumps, generators, welding plants, කෑම බීම ආදි ඔක්කොම අරගෙන ඇවිල්ලා ඒ අය අපිට උදවු කළා. ඇත්තටම මහනුවර දිස්ත්‍රික්කය යථා තත්ත්වයට පත් කරන්න ඒගොල්ලෝ ලොකු වැඩ කොටසක් අපට කරලා දුන්නා.

ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ, සමහර ප්‍රදේශවල පාරවල තිබුණු කුණු ටික ඇදලා, පාරවල් හෝදලා දීලා, ටවුම් හෝදලා දීලා, ඉස්කෝල සුද්ද කරලා, ඒවා හෝදලා දීලා ඉක්මනින්ම ඒවා යථා තත්ත්වයට පත් කරන්න ඒ අය අපිට උදවු කළා. ඒකට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම තමයි, ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු කණ්ඩායම රෑ දවල් නැතුව වැඩ කළා.

මෙතැන ඉන්න විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු සමහර දේවල් කියනවා. මුදල් දෙන්න පරක්කු වෙනවා, ඒ වාගේම ඒ ජනතාවට අවශ්‍ය දේවල් දෙන්න පරක්කු වෙනවා කියන චෝදනාවල්ද කරනවා. මෙහිදී අපි කනගාටුවෙන් හෝ කියන්න ඕනෑ, විපක්ෂයේ සමහර අය මිනිස්සු ඇවිස්සුවා කියන එක. "පරණ සිදුවීම්වල ඒවාටත් - සමහර විට කලින් බිල්ඩින් එකක් කැඩිලා තිබුණා නම් - ඔයගොල්ලන්ට වන්දි ගන්න පුළුවන්" කියලා ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත මිනිස්සු එව්වා. ඒ වාගේම මුදල් ගන්න කට්ටිය එව්වෙත් එහෙමයි. "ඔයගොල්ලන්ටත් මේ මුදල ලැබෙන්න ඕනෑ" කියලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මිනිස්සු එව්වා. Social mediaවල පළවුණු සමහර voice-cuts අපි දැක්කා. ඒවායේ තිබුණා, ඔයගොල්ලන් යන්න, ගිහිල්ලා ප්‍රාදේශීය ලේකම්තුමිය pressurize කරන්න කියලා. ඒ ආකාරයට තමයි අපට වැඩ කරන්න සිදු වුණේ. ප්‍රශ්න තිබෙන කට්ටියත් හිටියා. විපක්ෂයේ අය ගොඩක් කට්ටිය අවුස්සලා යැව්වා. ඒ නිසා අපට විටින් විට check කරන්න සිදු වුණා.

ඒ වාගේම තමයි සිවිල් සංවිධාන, පල්ලිය, පන්සල හා හැම ආයතනයකම නිලධාරින් ඇවිල්ලා අපට උදවු කළා. අපේ දිස්ත්‍රික්කයට ගොඩක් වැඩ කරලා දුන්නා. ඒකටත් අපේ ස්තුතිය පුද කරනවා.

ප්‍රාදේශීය ලේකම්තුමිය සහ මම නිතරම කඳවුරුවලට ගියා. හැම වෙලාවේම ඒගොල්ලන් ගැන බලලා, ඒගොල්ලන්ට අවශ්‍ය බඩු ටික එව්වා. ඒකෙනුත් සමහර කට්ටිය දේශපාලනය කළා, ඔයගොල්ලන්ට බඩු නැහැ කියලා. සමහර වෙලාවට මම ප්‍රාදේශීය ලේකම්තුමිය ළඟ ඉන්නකොට, බඩු දීලා ඇවිල්ලා ලේකම් කාර්යාලයේ ඉන්නකොට calls එනවා එතැනට බඩු නැහැ කියලා. ඇත්තටම, අපි කවදාවත් ඒ මිනිස්සුන්ට බඩගින්නේ ඉන්න දුන්නේ නැහැ. අපි ඉක්මනටම ඒගොල්ලන්ට කෑම ටික තමයි arrange කරලා දුන්නේ. ඊට පසුව ප්‍රවාහන කටයුතු හරිගස්සලා දුන්නා. ඔයගොල්ලන්ට ආරංචි ඇති, අකුරණ රඹුකේ ඇළ ප්‍රදේශයේ ලොකු නාය යෑමක් වුණා. එහිදී 29දෙනෙකුගේ ජීවිත නැති වුණා. ඊට කලින් දවසේ අපට ආරංචි වුණා, Meezan

colony එකේ නාය යන තත්ත්වයක් තිබෙනවා කියලා. එතකොට මමයි, ප්‍රාදේශීය ලේකම්තුමියයි හවස වැස්සේම ගිහිල්ලා families 20ක් ඉවත් කළා. පහුවදා උදේ තමයි මේ ආරංචිය ආවේ. ප්‍රාදේශීය ලේකම්තුමිය මට කිව්වා, "මන්ත්‍රීතුමා, අපි ගිහිල්ලා හොඳ වෙලාවට ඒ අය ඉවත් කළේ" කියලා. පැයකට පසුව තව එක්කෙනෙක් දුවගෙන ආවා. ඔහු කිව්වා, "එතැන නොවෙයි මන්ත්‍රීතුමා ඊට එහා පැත්තේ තමයි ඒ නාය යෑම වුණේ" කියලා. ඇත්තටම, අපි කවුරුත් නොහිතපු තැනක් තමයි ඒ විධියට නාය ගියේ. ඒ හැම වෙලාවකම ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු ඒ කාර්යමණ්ඩලය සහ අනෙකුත් ආයතනවල කාර්යමණ්ඩල වැඩ කළා. දැන් ඇමතිතුමෙකුත් කිව්වා මේ කාරණය. RDA එකේ කට්ටිය RDA එකට අදාළ පාරවලට කලින් ප්‍රාදේශීය සභා පාරවල් තමයි හරිගස්සලා දුන්නේ. ඒ විධියට ඒගොල්ලන් ඉතාම කැප කිරීමෙන් වැඩ කළා. ඒ සියලුදෙනාටම මගේ ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.01]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජාතිය මුහුණ දුන් අභාග්‍යසම්පන්න ව්‍යසනයකින් පසුව මේ උත්තරීතර පාර්ලිමේන්තුව ඇමතීමේදී මම බලාපොරොත්තු වෙන්නේ නැහැ මේ එක එක සුළු සිදුවීම් සහ ක්‍රියාකාරකම් ගැන සාකච්ඡා කරන්නට. නමුත්, ජාතික ව්‍යසනයක් හමුවේ ජාතියක් හැටියට අපි කටයුතු කරන්නේ කොහොමද කියන එක පිළිබඳව අපට නිවැරදි අවබෝධයක් නැති බව තවදුරටත් තහවුරු වුණු අවස්ථාවක්, මේක. විශේෂයෙන්ම මේ ජාතික ව්‍යසනය හමුවේ අපේ විපක්ෂයට ගෞරවයක් ලබා දෙන්න ඕනෑ සාම්ප්‍රදායික විපක්ෂ දේශපාලනයේ නොයෙදීම සම්බන්ධයෙන්. ඒ වාගේම රජයට ගෞරවයක් ලැබෙන්නටත් ඕනෑ ඔවුන් දැරූ උත්සාහයට. නමුත්, ජාතික ව්‍යසනයක් හමුවේ ඒ පිළිබඳ ජාතික වැඩ පිළිවෙළක් සංවාදයට ලක් කර නැහැ, අද වෙනතුරුත්. අදටත් කථා කරන්නේ, එහෙන් මෙහෙන් අල්ලා ගත්ත සාම්ප්‍රදායික වැඩ, එක එක රාමු ගැන, වෙන වෙනම අමාත්‍යාංශ, වෙන වෙනම ආයතන ගැන. මම ඔබට ආරාධනා කර සිටිනවා, ලොව මෙවැනි ආපදාවලට මුහුණ දුන් රටවල් ඒ ආපදාවලට මුහුණ දීම සඳහා කිනම් ඒකාබද්ධ උපාය මාර්ගයක් යොදා ගෙන තිබෙනවාද කියන එක අධ්‍යයනය කරන්න කියලා. ඒ වාගේම ඒ සඳහා ජාතික ප්‍රවේශයක් ලබා ගැනීමේදී කෙතරම් දුරට සද්භාවය මුසුව, කාර්යක්ෂමව නියුක්ත වෙලා තිබෙනවාද කියන එක අධ්‍යයනය කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි අගය කරනවා මේ රජය ගත් ක්‍රියාමාර්ග. ඒ තමයි රුපියල් 25,000ක් ලබා දීම, රුපියල් 25,000 ඒවා කිහිපයක් ලබාදීම, ඒ වාගේම නිවසක් තනා ගැනීමට රුපියල් මිලියන 5ක් ලබා දීම, ඉඩමක් ලබා ගැනීමට රුපියල් මිලියන 5ක් ලබා දීම. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියත් මමත් දන්නවා, මේ රටේ ජනතාවගෙන් ගහන්න පුළුවන් සියලු බදු ගහලා තමයි ඔබතුමන්ලා ට්‍රිලියන එකක් දැන් එකතු කරගෙන තිබෙන්නේ කියලා. මේ ආපදාවට ලක් වුණත්, ආපදාවේදී කම්පා වුණු සියලු ශ්‍රී ලාංකිකයන්ට බදු ගහලා තිබෙනවා, නැති වෙන්න. ඉතින්, දැන් ඒ බදු වලින් මේ රුපියල් 25,000 ලබා දීම හෝ රුපියල් මිලියන 5 ලබා දීම ඉතා සාධාරණයි. අපිත් ජනතාව උනන්දු කරවනවා, කාර්යක්ෂම මේ වැඩේ කරගෙන මේ මුදල් ලබා ගැනීම සඳහා. හැබැයි, ඔබත් මමත් දන්නවා, මේ සල්ලි ගන්න වෙන්නේ නැවතත් බදු ගහලා. නැවතත් බදු ගහනවා. එහෙම නැත්නම් ගාස්තු වැඩි කරනවා. ඒ සඳහා ධන නිර්මාණයක් කරන්නට අවශ්‍ය නම් නැවතත් මම කියනවා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, උපාය මාර්ගික වැඩ පිළිවෙළක් අවශ්‍ය බව.

සුනාමියට සාපේක්ෂව ගත්තොත්, මෙහිදී අපට විදේශ ආධාර ලැබී තිබෙන්නේ සියයට 1කටත් අඩු ප්‍රමාණයක්. අපට සිදුවුණු හානිය, අලාභය සුනාමියට සාපේක්ෂව ගත්තාම සුනාමිය වෙලාවේ සියයට 80 ඉක්මවා ගියා, අපට ලැබුණු විදේශ ආධාර. නමුත් දැන් අපට තිබෙන්නේ සියයට 1ක් විතර වන සොච්චමක්. දේශීය ආයතනවල පරිත්‍යාග මම දැක්කා. දේශීය පුද්ගල පරිත්‍යාග මම දැක්කා. හැබැයි, ඒවා සොච්චම් මුදල්. මහ විශාල ව්‍යසනයක් සිදු වෙලා තිබෙනකොට එක්කෝ ආධාර වශයෙන්, එහෙම නැත්නම් අපි විසින්ම නිර්මාණය කර ගන්නා ධනයක් නැතුව කොහොමද මේ වැටිච්ච තැනින් අපි ගොඩ එන්නේ? අපි නිකම් බාල දේශපාලනයක් කරලා, බාල විධියට ගමට ගිහිල්ලා අර ප්‍රජා ශක්ති කියලා අටවාගෙන ඉන්න ගමේ තිබෙන මොකක්ද දේශපාලන යන්ත්‍රණයකින් මිනිස්සුන්ට, තමන්ගේ හිතවතුන්ට සල්ලි ටිකක් බෙදලා දීලා එහෙම කටයුතු කරනකොට, අපි වුණත් නැගිටින්නට උත්සාහ කරන මේ රටට දෙන ඒ හයිය අපේ ඇඟෙන් එන්නේ නැහැ; හදවතින් එන්නේ නැහැ. මොකද, අපට පෙනෙනවා මේ ව්‍යසනය හමුවේ ඔවුන් තවමත් ඉතාම පටු තැනක ඉඳලා කටයුතු කරන බව. අර කෑම එකෙත් ගැහුවා, රතු තරුව. ඒ විධියට හිතන්න එපා. එහෙම හිතන්න එපා. මේකෙන් දේශපාලනය කරන්න එපා. මොකද, අපි ඔක්කෝම කැමැතියි එකතු වෙන්න. අපේ තේමාව වැටී වැටී නැඟිටිමු කියන එක. අපිත් ඔබ සමඟ එකතු වෙනවා. මේක අපේ රට. මේක අපේ මව්බිම. මේ අපේ මිනිස්සු. මේ මිනිස්සු නැගිට්ටුවන්න අපි ඔක්කෝම එකතු වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලංකාවේ ගොඩක් ව්‍යවසායකයන් දැන් නැත්තටම නැති වෙලා තිබෙනවා. ඒ මිනිස්සුන්ට ප්‍රාග්ධනය ලබා දෙන වැඩ පිළිවෙළක්, ඒ මිනිස්සු නැඟිට්ටුවන වැඩ පිළිවෙළක් ගැන වහාම කියන්න. වහාම මොකක් හරි වැඩ පිළිවෙළකින් ඒ මිනිස්සු නැඟිට්ටුවන්න ඒ ශක්තිය දෙන්න, ධෛර්යය දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අතරතුර මම තවත් කාරණයක් කියන්නට ඕනෑ. මේ ව්‍යසනය හමුවේ තවත් විශාල ව්‍යසනයක් ඇති වෙන්න ඔන්න මෙන්න නියමිතයි. ඒකත් මම කියන්නට ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසානයි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මට තත්පරයක් දෙන්න.

ඒ තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නමින් එන ව්‍යසනය. මේ ඇති වෙච්ච ව්‍යසනය හමුවේ දඩි බිඩි ගාලා මේ රටට කරන්න හදන්නේ මොකක්ද? අපේ දුප්පත් මිනිහාට එල්ලෙන්න තිබෙන අන්තිම පිදුරු ගහ තමයි නිදහස් අධ්‍යාපනය. අපි ඔක්කෝම ඒකේ එල්ලිලා තමයි මෙතැනට ආවේ. ඒ පිදුරු ගහට තමයි දැන් මේ ගහන්න හදන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,

[ගරු දිලිත් ජයවීර මහතා]

මම කියන්න ඕනෑ මේ ව්‍යසනය හමුවේ මේ කැත වැඩ කරන්න එපා කියලා. කරුණාකරලා මේ ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ජනතාව අතරට ගේන්න, සංවාදයට ලක් කරන්න. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මෙය කියන්නම ඕනෑ. මොකද, බිත්තියත් එක්කම යන්නයි හදන්නේ. අපේ රටේ අධ්‍යාපනයට ගැහුවොත්, ඒක මේ වුණු ව්‍යසනය වාගේ නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න නියෝජ්‍ය ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.08]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආපදා තත්ත්වයෙන් පසුව අප රටක් වශයෙන් මුහුණ දී තිබෙන අභියෝග හමුවේ මාධ්‍යවල වගකීම ගැන අද මම ටිකක් කථා කරන්න හිතුවා. මොකද, බොහෝ දෙනාට නොපෙනුණත්, තිරය පිටුපස ඉඳගෙන රජයේ විතරක් නොවෙයි, පෞද්ගලික මාධ්‍යයත් - ඇතැම් මාධ්‍ය හැරුණුකොට - විශාල භූමිකාවක් ඉටු කළා. මොකද, මෙවැනි ආපදා තත්ත්වයකදී ජාතික මාධ්‍යවලට විශාල ජාතික වගකීමක් තිබෙනවා. මෙම සුළි කුණාටුව ඇතිවීමත් සමඟ විශේෂයෙන්ම තොරතුරු සන්නිවේදනය සම්බන්ධයෙන් දැවැන්ත අභියෝගයකට මුහුණ දෙන්න රජයට සිදු වුණා. ව්‍යාජ තොරතුරු සහ විකෘති කරන ලද තොරතුරු හුවමාරු වෙන්න පටන් ගත්තා. ඒ නිසාම අපි රජයක් ලෙස තීරණයක් ගත්තා, ඉතා ඉක්මනින් තොරතුරු සන්නිවේදනය කිරීමේ අවශ්‍යතාව තිබිය යුතුයි කියලා. ඒ නිසා විශේෂ ආපදා මෙහෙයුම් මාධ්‍ය මධ්‍යස්ථානයක් අපි ඇති කළා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රාජ්‍ය මාධ්‍ය ආයතනවල ප්‍රධානීන්, ජනාධිපති මාධ්‍ය අංශය, අගමැති මාධ්‍ය ඒකකය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, බලශක්ති අමාත්‍යාංශය වාගේ විශාල වපසරියක තිබෙන මාධ්‍ය අංශ එකට වාඩිවෙලා, පැය 24ම ක්‍රියාත්මක වන විධියට විශේෂ ආපදා මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටෙව්වා. මේ ආපදා මෙහෙයුම් මධ්‍යස්ථානය අකුරේගොඩ තමයි තිබෙන්නේ. එතැනදී කරන ලද දැනුවත් කිරීම්, ඒ කියන්නේ මෙම ආයතන හරහා අපට ලැබෙන නිල නිවේදන නිවැරදි ලෙස, ඉක්මනින්ම ජනතාව අතරට බෙදා හැරීමේ මාධ්‍ය වගකීම අප සතුව තිබුණා. මේ හරහා සියලුම ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම්වරු, දිස්ත්‍රික් ආපදා කමිටු ඒකක, පළාත් සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු - ඒ කාලයේ උසස් පෙළ විභාගය පැවැත්වීමට නියමිතව තිබුණා - සහ අනෙකුත් සියලු පාර්ශ්ව දැනුවත් කරමින්, ලැබෙන සියලු තොරතුරු සහ අනතුරු ඇඟවීම් එවෙලේම, ඉතා ඉක්මනින් මාධ්‍යවලට ලබා දීමට මේ ආයතන සියල්ලේම මාධ්‍ය අංශ තිරය පිටුපස ඉඳගෙන වැඩ කටයුතු කළා. ඒ වාගේම මාධ්‍ය දඩමීමා කරගෙන බොරු ප්‍රචාර පතුරවන්නට කැසකවපු මාධ්‍ය එකක් දෙකක් හැරෙන්නට - විශේෂ මාධ්‍යයක් තිබුණා, මම මෙතැන නම කියන්නේ නැහැ - පොදුවේ සියලුම රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය ආයතන ඉතා හොඳ වගකීමකින් කටයුතු කළා. ඒ වාගේම තොරතුරු ඉක්මනින් බෙදා දීලා, තොරතුරු ඉක්මනින් ගලායන්න සලස්වලා තමන්ගේ වගකීම ඉෂ්ට කළා. ඒ වාගේම ජාත්‍යන්තර මාධ්‍ය සමඟ හොඳ සම්බන්ධීකරණයකින් කටයුතු කළා. එම නිසි වගකීම ඉටු කළ මාධ්‍ය ආයතනවලට මා ස්තුතිවන්ත වෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සමාජ මාධ්‍ය භූමිකාව ගැනත් මේ මොහොතේ නොකියාම බැහැ. විශේෂයෙන්ම සමාජ මාධ්‍ය ඉතා බරපතළ වගකීමක් ඉටු කළා. ඒ මොකක්ද? සමාජ මාධ්‍යවල හිටපු, ඒ හරහා විශාල දැනුවත් කිරීමේ කාර්යභාරයක් ඉටු කරපු තරුණ කණ්ඩායම්, ක්‍රියාකාරීන් ස්වේච්ඡාවෙන් ඇවිල්ලා - කිසිම කෙනෙකුගේ බලපෑමකින් තොරව - වැඩ කළා. ඒ වාගේම ගලවා ගැනීමේ මෙහෙයුම්වලට දායකත්වය දුන්නා, තොරතුරු ලබා දුන්නා, ජනතාව දැනුවත් කළා. ඒ වාගේම ඔවුන් ස්වේච්ඡාවෙන්ම කෑම උයන මධ්‍යස්ථානවලට ආහාර බෙදා දෙන ක්‍රමවේද හදමින් එම වැඩ කටයුතුවලට උදවු උපකාර කළා. ඒ තරුණ කණ්ඩායම්වලට මේ මොහොතේ විශේෂයෙන්ම මගේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න ඕනෑ. මොකද, ස්වේච්ඡාවෙන් ආපු ඒ තරුණ කණ්ඩායම් තමයි ඒ මොහොතේ අපට තිබුණු ශක්තිය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කනගාටුවෙන් වුණත් මේ කාරණය කියන්න වෙනවා. ඉතාම පහත් මට්ටමේ ව්‍යාජ තොරතුරු, AIවලින් නිර්මාණය කරපු තොරතුරු, විකෘති කරන ලද තොරතුරු සමාජ මාධ්‍ය හරහා ක්‍රියාත්මක වුණා. සමාජ මාධ්‍ය හරහා ක්‍රියාත්මක වෙච්ච ඒ ව්‍යාජ තොරතුරු නිවැරදි කරන්න අපට විශාල උත්සාහයක් දරන්න සිද්ධ වුණා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට ආපු ලක්ෂ ගණනක දුරකථන ඇමතුම් අතරේ බොරු දුරකථන ඇමතුම්, වැරදි තොරතුරු දීපු දුරකථන ඇමතුම් තිබුණා. මම උදාහරණයක් කියන්නම්. වික්ටෝරියා වේල්ල පුපුරනවා කියලා සමාජ මාධ්‍ය හරහා පණිවුඩ එනකොට, ඒ මාධ්‍ය නිවැරදි කරන්න අපට විශාල කාලයක් වැය කරන්න සිද්ධ වුණා. ඒ වාගේ මාධ්‍ය හැසිරීමකුත් මේ සමාජයේ තිබුණා කියලා මම මේ අවස්ථාවේ දී කියන්න ඕනෑ.

මෙතැන දී පැහැදිලිවම තිබෙන පුළුල් ප්‍රශ්නයක් තමයි - දැන්, දිගින් දිගටම කථා කළා - මේ වාගේ ආපදාවකදී විපක්ෂයේ කාර්යභාරය කෙබඳු විය යුතුද කියලා. ආපදා අවස්ථාවලදී ගම් මට්ටමේ සිට සිටින සියලු රාජ්‍ය නිලධාරීන් තමන්ගේ උපරිමයෙන් කටයුතු කරන බව අපි දන්නවා. ආපදා තත්ත්වයෙන් තමන්ගේ පවුලේ අයට, තමන්ට හානි වෙලා තිබියදීත් තමන්ගේ උපරිමයෙන් ඒ අය වැඩ කළා. සමාජ මාධ්‍යවල පළ වුණු, ග්‍රාම නිලධාරි මහත්මයෙක් බඩු මල්ලක් අරගෙන ගංවතුරේ එන දර්ශනයක් අපි දැක්කා. එවැනි දේවල් දකිද්දීත් විපක්ෂයේ සමහර කණ්ඩායම් තැන් තැන්වලට ගිහිල්ලා කෑමරා ආම්පන්න අටවාගෙන ඒ නිලධාරීන් කුපිත කරන්න උත්සාහ කළා. හැබැයි, මම මේ අවස්ථාවේදී එක දෙයක් කියන්න ඕනෑ. සමහර මන්ත්‍රීවරුන් පෞද්ගලිකව අපට කථා කරලා, මොනවාද මේ ආසනයට කරන්න ඕනෑ, මොනවාද වෙන්න ඕනෑ කියා සොයා බැලුවා. එහෙම වැඩ කරපු මන්ත්‍රීවරුත් හිටියා. අපිට ඒ අය දුරකථන ඇමතුම් දුන්නා. මම ඒ ගැනත් මේ අවස්ථාවේදී ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. අතළොස්සක් වූ මන්ත්‍රීවරුන් පිරිසක් මෙතැන අඩුපාඩු හොයන්නේ නැතුව තමතමන්ගේ හැකියාව අනුව එසේ වැඩ කළා.

මේ අවස්ථාව වනවිට සහන කඳවුරුවල, සුරක්ෂිත මධ්‍යස්ථානවල විශාල ප්‍රමාණයක් ඉන්නවා. අපි දන්නවා, ඒ අය

ගෙවල්වලට යන්න කැමැත්තෙන් ඉන්න බව. පසුගිය කාලවලදී මෙවැනි විපත් සිදු වුණාම, විශේෂයෙන්ම සුනාමිය ආපු වෙලාවේ විපක්ෂය වැඩ කළේ කොහොමද කියලා අපි දන්නවා. බස් නැවතුම් පොළවල් හදමින්, සහන කඳවුරුවලට ගිහින් වැඩ කරමින්, ගෙවල් හදා දෙමින් ඒ කාලයේ විපක්ෂය වැඩ කළේ කොහොමද කියලා අපි දන්නවා. ඒ කියන්නේ විපක්ෂයට ඒ වාගේ භූමිකාවක් තිබෙනවා. නමුත් ව්‍යසනය සිදු වුණු අවස්ථාවේ විපක්ෂය ඒ භූමිකාව අමතක කරලා ඊළඟ දවසේ කැමරා ටිකක් ඔසවා ගෙන ගිහිල්ලා අර ජනතාවගෙන් අහනවා, "රුපියල් 25,000 හම්බ වුණාද? ඔයගොල්ලන්ව ගෙදර යවන්නේ නැද්ද?" කියලා. ඔවුන් එසේ කථා කරන්නේ ජීවිතය බේරාගෙන අමාරුවෙන් ගොඩනැඟෙන්න හදන, මානසිකත්වය කඩා වැටුණු කණ්ඩායමක් එක්ක. ඒ නිසා, ඒ තැන්වල සිටින ප්‍රාදේශීය ලේකම්තුමාගෙන්වත්, ග්‍රාම නිලධාරිතුමාගෙන්වත්, බිමේ සිටින සංවර්ධන නිලධාරිතුමාගෙන්වත් අහන්නේ නැතුව කැමරා ඔසවාගෙන ගිහිල්ලා ඒ මිනිස්සුන්ගෙන් කෑවාද, ගෙදර යන්නේ කවදාද කියලා අහන එක නොවෙයි, සදාචාරය කියලා මම කියන්න කැමැතියි.

ඒ වාගේම, නිලතල නොදරා ස්වේච්ඡාවෙන් සුරක්ෂිත කඳවුරුවල වැඩ කරන දහස් ගණනක ජනතාවක් බිමේ සිටින බව මේ අවස්ථාවේ මම කියන්න කැමැතියි. අපි දැක්කා, ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත මැතිතුමා පසුගිය දවස්වල කථා කරලා කියනවා, "මගේ රටේ නම් මෙහෙම දෙයක් වුණොත්, මිනිස්සුන්ගේ මේ වාගේ නැඟී සිටීමක්, සහයෝගයක් මම පෞද්ගලිකව බලාපොරොත්තු වෙන්නේ නැහැ" කියලා.

අපි මේ ජනතාවට සහන දුන්නේ නැහැ කියනවා. අපි දැනගෙන තමයි මේ සහන package එක දුන්නේ. අපි දන්නවා, රුපියල් 25,000 ලබා දීමේදී ප්‍රායෝගික ප්‍රමාදයන් තිබුණා කියලා. නමුත් අපි ඉතාම ඉක්මනින් රුපියල් 25,000 ලබා දෙන්න කටයුතු කරමින් ඉන්නවා. ග්‍රාම නිලධාරිවරයෙක්, සමෘද්ධි නියාමකවරයෙක්, එහෙම නැත්නම් සංවර්ධන නිලධාරියෙක් එම නිවාසවලට තනියම ගිහිල්ලා බලන්න ඕනෑ. ඒවාට ගමේ මිනිස්සු සහයෝගය දෙනවා. ඒවාත් එක්ක තමයි මේ කටයුත්ත වෙන්නේ. එහෙම නැතුව ජනාධිපතිතුමා මෙතැනදී කිව්වාට, ඊළඟ දවසේ දෙන්නේ නැහැ. ඒකේත් ප්‍රායෝගික වැඩ ටිකක් තිබෙනවා. ඒ ටිකත් කරමින්, දිනපතා updates ගනිමින් තමයි අපි මේ කටයුත්ත සිදු කරන්නේ. ඒ වාගේම සුරක්ෂිත මධ්‍යස්ථානවල සිටින කණ්ඩායම්වලට මාස 3ක්, 4ක් ඒවායේ ඉන්න වෙන බව දනිමින් තමයි ජීවනෝපාය අඛණ්ඩව කරගෙන යා නොහැකි පවුල්වලට දීමනාව ලබා දෙන්නේ. ඒවා ගැන දැනගෙන තමයි තාවකාලික පදිංචිය සඳහා මාසික ගෙවල් කුලී ලබා දෙන්නේ.

ඊළඟට කියනවා, අපිට ලැබී තිබෙන ආධාර මදි ලු, ජාත්‍යන්තර ආධාර ලැබෙන්නේ නැහැ ලු. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අය මුළු ලෝකයටම චිත්‍රයක් පෙන්වන්න හැදුවා. ඒක අසාර්ථක වුණා. නමුත් මුළු ලෝකයටම චිත්‍රයක් පෙන්වන්න උත්සාහ කළා, මේ ආණ්ඩුව තමන්ගේ වගකීම ඉෂ්ට කළේ නැහැ, ඒ නිසා තමයි මේක වුණේ කියලා. එහෙම චිත්‍රයක් මවා පෙන්වා, බොරු ප්‍රවෘත්ති ප්‍රචාරය කරලා මිනිස්සුන්ගෙන් සෑහෙන ප්‍රතික්ෂේප වෙලා සිටින මාධ්‍යයෙන් මම අහන්න කැමැතියි, ඔබ මාධ්‍ය වගකීම ඉෂ්ට කරනවා කියන්නේ කොහොමද කියලා. ඔබ මාධ්‍ය වගකීම ඉටු කළ යුත්තේ මේ ලෝකයම මේ අවස්ථාවේ අපේ රට කෙරෙහි තබා තිබෙන විශ්වාසය, රජය කෙරෙහි තබා තිබෙන විශ්වාසය තහවුරු කරගන්නා ආකාරයටයි, ආධාර ලැබෙන ආකාරයටයි. අපි ජාත්‍යන්තර ආධාර සමුළුවක් පවත්වනවා. එතකොට ජාත්‍යන්තර ආධාර ලැබෙන ආකාරයට තමයි අපි මේක වාර්තාකරණය කළ යුත්තේ. ලබන අවුරුද්දේ අපිට -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමිය.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ආපදා තත්ත්වයකදී මාධ්‍ය වාර්තාකරණය සහ ඒ සම්බන්ධයෙන් වන ආචාර ධර්ම පිළිබඳ පුහුණුවක් සහ දැනුමක් අපේ ලංකාවේ ජනමාධ්‍යවේදීන්ට ලබා දෙන්න අවශ්‍යයි. ඒක ඉතාම අඩුවක් ලෙස අප මේ මොහොතේ හඳුනා ගන්නවා. ඒ වෙනුවෙන් අපි ලබන අවුරුද්දේ යම් වැඩසටහනක් සකස් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා තවදුරටත් මා කියන්නේ, මේක සාමූහික වගකීමක් ලෙස ගන්න කියලායි. මොකද මාධ්‍යයටත්, විපක්ෂයටත් මෙතැනදී සාමූහික වගකීමක් තිබෙනවා. ඒක අමතක කරන්න එපා කියලා ඉල්ලා සිටිමින්, මම කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.18]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 30කට අධික පිරිසක් අත්සන් කරලා අද දිනයේදී ඉල්ලීමක් කළා, විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා. පසුගිය දිනවල ඇති වූ ආපදා තත්ත්වය කළමනාකරණය නොකිරීම පිළිබඳව, ඒ වාගේම එයට හේතු වූ කරුණු කාරණා සෙවීම සඳහා විශේෂ කාරක සභාවක් පත් කරන ලෙස තමයි අපි අද උදේ ගරු කථානායකතුමාට එම ඉල්ලීම භාර දුන්නේ. මොකද අපි විශ්වාස කරනවා, මෙම අවස්ථාවේදී රජය කටයුතු කළ ආකාරයේ ගැටලුවක් තිබෙනවාය කියලා. මෙම ආපදා තත්ත්වය පිළිබඳව නොයෙක් ආකාරයෙන් මේ රජයට අවවාද ලැබුණත්, ඒ සම්බන්ධව ක්‍රියාත්මක නොවීමේ ගැටලුව නිසා බොහෝ පිරිසකට ජීවිත අහිමි වෙලා, දේපළවලට විශාල හානියක් සිදුව තිබෙනවා. එහි අඩුපාඩුව සිදු වුණේ කොතැනද කියලා විමර්ශනය කිරීමේ බලය ඇතුව, විපක්ෂයට ශක්තියක් තිබෙන විශේෂ කාරක සභාවක් පත් කරයි කියලා අපි විශ්වාස කරනවා.

මේ ආපදාව සිදු වුණාට පස්සේ ජනාධිපතිවරයා නොයෙක් ආකාරයේ සහන මේ රටේ ජනතාවට ලබා දෙන්න කටයුතු කරන්න උත්සාහයක යෙදිලා ඉන්නවා. හැබැයි, එතුමා ඒ දේවල් මාධ්‍ය ඉස්සරහ කිව්වාට ඒවා තවම මහ පොළොවේ ක්‍රියාත්මක වීමේ දුර්වලතාවක්, ප්‍රමාදයක් තිබෙනවා. මේ වෙලාවේ රටේ ජනතාව ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ සහන ලබා දීම හැකි ඉක්මනින්, වේගවත්ව ක්‍රියාත්මක කරන්න කියලා. ගංවතුරට යට වෙච්ච නිවාස සුද්ධ පවිත්‍ර කිරීම සඳහා ලබා දෙන රුපියල් 25,000ක මුදල ලබා දීලා අවසන් කරන්නත් තවම හැකි වෙලා

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

නැහැ. ඒක තමයි ඉස්සෙල්ලාම විය යුත්තේ. නමුත් ඒකත් තවම අවසන් වෙලා නැහැ. එතකොට ආපදාවට පත් අපේ පාසල් දරුවන්ට රුපියල් 25,000ක් ලබා දෙනවාය කියලා ඉස්සෙල්ලාම කිව්වා. රුපියල් 25,000 දැන් රුපියල් 15,000ට අඩු වෙලා තිබෙනවා. නමුත් ඒ රුපියල් 15,000වත් තවම දරුවන්ට ලැබිලා නැහැ. පාසලුත් දැන් විවෘත වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා ගංවතුරෙන් ආපදාවට ලක් වෙච්ච ගෙදරකට අත්‍යවශ්‍ය බඩු ගැනීමට රුපියල් 50,000ක මුදලක් ලබා දෙන්න කටයුතු කර තිබෙන බව. ඒ රුපියල් 50,000ක මුදල සාධාරණයි කියලා මම නම් හිතන්නේ නැහැ. මොකද, දැන් හැම ගෙදරකම fridge එකක්, TV එකක්, fans වාගේ උපකරණ තිබෙනවා. ඒ නිසා ඒ සඳහා රුපියල් 50,000ක් ප්‍රමාණවත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් දැවැන්ත ලෙස මේ තුළින් බලපෑමට ලක් වෙලා තිබෙනවා. ඒ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ට රුපියල් ලක්ෂ 2ක් බැගින් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. නමුත් කිසිසේත්ම ඒ මුදලින් සෑහීමකට පත් වන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි මේ ප්‍රශ්නයට යම් ආකාරයකින් විසඳුම් ලබා දෙන්න විපක්ෂ නායකතුමාගේ උපදෙස් මත විපක්ෂ නායක කාර්යාලයේ ආපදා තොරතුරු කේන්ද්‍රයක් ස්ථාපනය කළා. දහස් ගණනක් පිරිස දුරකථනයෙන් අප ඇමතුවා. අමතා ප්‍රකාශ කළ ප්‍රධාන ගැටලුව තමයි, මේ ආණ්ඩුව මේ වෙලාවේ මේ සහන ටිකත් දේශපාලනීකරණය කරන්න උත්සාහයක යෙදෙනවාය කියන එක. ඉතාම කනගාටුයි කියන්න, ප්‍රජාශක්ති කමිටුවල නිර්දේශ අවශ්‍යයි කියලා නොයෙක් ආකාරයේ බලපෑම් සිදු වනවා කියලා මහජනතාව වාර්තා කරලා තිබෙනවා, විපක්ෂ නායක කාර්යාලයේ පිහිටුවා ඇති ආපදා තොරතුරු කේන්ද්‍රයට.

ඒ විධියට දේශපාලනීකරණය එක පැත්තකින් සිදු වනකොට තවමත් මේ චක්‍රලේඛවල අපැහැදිලිතාවක් තිබෙනවා කියන එකත් සඳහන් කරන්න ඕනෑ. සමහර වෙලාවට ඒ චක්‍රලේඛ පිළිබඳව මාධ්‍යයෙන් සඳහන් කළාට, ජනාධිපතිවරයා මාධ්‍ය ඉදිරියට ඇවිල්ලා, එක එක සංවර්ධන කමිටුවලට සහභාගි වෙලා ප්‍රකාශ නිකුත් කළාට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට තවම ඒ පිළිබඳව දැනුම් දීලා නැහැ; ග්‍රාම නිලධාරින් දැනුවත් වෙලා නැහැ. එම නිසා ඒ චක්‍රලේඛ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ වේගය වැඩි කළ යුතුයි. ඒ පිළිබඳව මේ වෙලාවේ අපි සඳහන් කිරීම අත්‍යවශ්‍යයි.

ව්‍යාපාරික ස්ථාන ජලයෙන් යටවීම නිසා හානි සිදුව තිබෙනවා, ඒ වාගේම ගස් කඩා වැටීම් වැනි සිදුවීම්වලින් ව්‍යාපාරික ස්ථානවලට හානි සිදුව තිබෙනවා. ඒ අයට ආධාර ලබා දීම පිළිබඳව දැන් ගැටලු මතු වෙලා තිබෙනවා. එම නිසා තමුන්නාන්සේලා සියලුදෙනාගෙන්ම අපි මේ වෙලාවේ ඉල්ලීමක් කරනවා, මේ ලබා දිය යුතු සහන ටික හැකි ඉක්මනින් උපරිම වශයෙන් ජනතාවට ලබා දෙන්න කියලා. ඒ සඳහා අවශ්‍ය රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුව සම්මත කර ගැනීම වෙනුවෙන් හෙට දිනයේදී විපක්ෂයේ අපි සම්පූර්ණ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.24]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුවේ බලපෑමෙන් ලංකාවට ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව කථා කරන මේ විවාදයේදී, ඒ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වනවා. මේ "දිට්වා" සුළි කුණාටුවට අදාළ ඒ කාලගුණික තත්ත්වයන් අපේ රටට බලපාද්දි, ඊට සමාන්තර කාල සීමාව තුළ අපේ රටේ විතරක් නොවෙයි, මේ කලාපයට අයත් රටවල් ගණනාවකටම සුළි කුණාටු තත්ත්වයන් ඇති වෙලා, ආපදා තත්ත්වයන් සිදු වුණා. විශේෂයෙන්ම තායිලන්තය, මලයාසියාව, ඉන්දුනීසියාව, වියට්නාමය වාගේ රටවල මේ හා සමාන්තර කාල සීමා තුළ මේ ආකාරයේ සුළි කුණාටු තත්ත්වයන් ඇති වුණා. තායිලන්තයේ දකුණු පළාතට නොවැම්බර් 17වැනි දා වාගේ කාලයකත්, ඉන්දුනීසියාවේ උතුරු අචේ ප්‍රාන්තයට නොවැම්බර් 22-25 දක්වා කාලවකවානුවකත් මෙවැනි තත්ත්වයන් ඇති වුණා. මුළු ඉන්දුනීසියාවම මේ ව්‍යසනයට ගොදුරු වුණේ නැහැ. උතුරු පළාතේ අචේ ප්‍රාන්තය පමණයි මේ ව්‍යසනයට ගොදුරු වුණේ. නමුත්, 1,000කට අධික පිරිසක් ඒ අවස්ථාවේ මරණයට පත්වෙලා තිබෙනවා. අදටත් ඒ ප්‍රදේශවල සහන මධ්‍යස්ථාන හදාගන්න නොහැකිව ඉන්නවා. ඉන්දුනීසියාවේ අචේ ප්‍රාන්තය අද වන විට ඒ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. නමුත්, මේ කලාපයේ සිදු වෙච්ච ඒ සිදුවීම්වලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අපේ රජය සමත් වෙලා තිබෙනවා, ඉතා කෙටි කාලයක් තුළ එක පැත්තකින් මරණ ප්‍රමාණය අඩු කරගෙන, ඒ ආපදාවන් අඩු කර ගැනීමට. ඉතා කෙටි කාලයක් තුළ සුරක්ෂා මධ්‍යස්ථාන ගොඩනගලා, ඒ සුරක්ෂා මධ්‍යස්ථානවල සිටින මිනිසුන්ගේ ජන ජීවිත යථා තත්ත්වයට පත් කරමින්, මේ රට ඉතා කෙටි කාලයක් තුළ තිබූ තත්ත්වයට ගන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සුළි කුණාටු තත්ත්වයන්, මේ පාරිසරික විපර්යාස ඇති වෙන්න බලපෑවා, කාලයක් තිස්සේ ගෝලීය මට්ටමිනුත්, අපේ රට ඇතුළේත් සිදු කරන ලද පරිසර විනාශයන්. ඒවායේ ප්‍රතිඵලයක් හැටියට තමයි මෙවැනි ව්‍යසනයන්ට මුහුණ දෙන්න අපට සිද්ධ වන්නේ. මේ කාලගුණික විපර්යාස හරහා ඇතිවන සුළි කුණාටු තත්ත්වයන් හේතුවෙන් පරිසරයත් විනාශ වෙලා තිබෙනවා. පසුගිය දා අපේ රටට බලපෑ මේ සුළි කුණාටු තත්ත්වය හේතුවෙන් අපේ රටේ පරිසර පද්ධතියටත් හානි සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අලිඇතුන් ඇතුළු සංරක්ෂණය කළ යුතු වනජීවීන් සැලකිය යුතු ප්‍රමාණයක් මේ ව්‍යසනයට ගොදුරු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටට ආවේණික -ඒකදේශීය- මත්ස්‍යයන් වන බන්දුල පෙතියා, අසෝක පෙතියා වැනි ඒ මත්ස්‍ය වර්ග ජීවත් වන පරිසර පද්ධතිවලට පස් කණ්ඩි කඩා වැටීම් නිසා, නාය යෑම් නිසා, ජල පහරවල් අවහිර වීම නිසා හානි සිද්ධ වෙලා තිබෙන බවට අපට වාර්තා වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපට කිසියම් තක්සේරුවක් - assessment එකක් - කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, පරිසර අමාත්‍යාංශයට අයත් ජාතික වනෝද්‍යානවලටත්, උද්භිද උද්‍යානවලටත් මේ ආපදාවෙන් හානි සිද්ධ වෙලා තිබෙනවා. එම නිසා පරිසර අමාත්‍යාංශය හැටියට අපි මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා, දෙසැම්බර් 11වැනි දා විශේෂ කමිටුවක් පත් කළා. ඒ කමිටුවෙන් තීරණය කර තිබෙනවා, "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ මේ ආපදා තත්ත්වයෙන් ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතියට සිදුවෙලා තිබෙන

හානිය සම්බන්ධයෙන් තක්සේරුවක් - assessment එකක් - කරන්න. ඒ අනුව Rapid Biodiversity Impact Assessment එකක් කිරීමට අවශ්‍ය තත්ත්ව වාර්තා නිකුත් කරන්න ඒ කමිටුව විසින් දින 14ක් ඇතුළත කටයුතු කර තිබෙනවා.

ඒ වාගේම ඉතා කෙටි කාලයක් ඇතුළත පරිසර අමාත්‍යාංශය යටතට ගැනෙන උද්භිද උද්‍යාන, ජාතික වනෝද්‍යාන සහ සත්වෝද්‍යානවලට හානි පැමිණුණා. ඒ නිසා යම් කාල සීමාවක් අපිට ඒවා වසා තබන්නට සිදු වුණා. නමුත්, අපේ රටේ ජාතික ආර්ථිකයට, විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයට මේ කාල වකවානුව බලපානවා. ඒ නිසා ඉතා කෙටි කාලයක් තුළ ජාතික වනෝද්‍යාන, උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන විවෘත කරන්න අපිට හැකියාව ලැබුණා. විශේෂයෙන්ම පරිසර අමාත්‍යාංශයේ නිලධාරින්, ඒ ආයතනවල විවිධ ක්ෂේත්‍රවල වැඩ කරන නිලධාරින් සහ ස්වේච්ඡා කණ්ඩායම් කියන සියලුදෙනා ඉතා උනන්දුවෙන් මැදිහත් වෙලා, කෙටි කාලයක් තුළ ඒවා විවෘත කර ගැනීම සඳහා උදවු උපකාර කළා. ඒ සම්බන්ධයෙන් අපි ඔවුන්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

මේ ආපදාව පවතින කාල සීමාව තුළ තමයි ලෝක පරිසර සමුළුව කෙන්යාවේ නයිරෝබි නුවරදී පැවැත්වුණේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ සඳහා පරිසර අමාත්‍යවරයා හැටියට මමත් සහභාගි වීමට නියමිතව තිබුණත් මේ ආපදා තත්ත්වය නිසා මට පරිසර සමුළුවට සහභාගිවීමට නොහැකි වුණා. හැබැයි, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරින් ඒ පරිසර සමුළුවට සහභාගි වෙලා මේ ආපදා තත්ත්වය සම්බන්ධයෙන් වාර්තා කරලා, ඊට අදාළව පාරිසරික පැත්තෙන් අවශ්‍ය කරන තක්සේරුවක් කරමින්, ඒ සඳහා අවශ්‍ය කරන විදෙස් ආධාර ලබා ගැනීම වෙනුවෙනුත් දැනටමත් මැදිහත්වීම් කරලා තිබෙනවා. විශේෂයෙන්ම Loss and Damage Fund එක යටතේ අපේ රටට ලබා දී ඇති ආධාර සම්බන්ධයෙන් විශේෂ මැදිහත්වීමක් ඒ තුළ සිදු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පරිසර හානියෙන් පසුව පරිසර අමාත්‍යාංශයත්, ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයත් අවසාන වතාවට රැස් වුණු අවස්ථාවේදී තීරණයක් ගත්තා, ශ්‍රී ලංකාව සඳහා මධ්‍යම අධිසංවේදී කලාප කළමනාකරණ සැලැස්මක් සකස් කරන්න. අන්න ඒ සඳහා අවශ්‍ය කරන අනුමැතිය අපි ලබාගෙන තිබෙනවා.

ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා, මේ ආපදාවට කලින් තමයි කොළඹ-නුවර මාර්ගයේ පහළ කඩුගන්නාව ප්‍රදේශයේ නාය යෑම් ඇති වුණේ කියන එක. ඒ නායයෑම් මේ ආපදාවටත් කලින් තමයි ඇති වුණේ. ඒ නිසා පරිසර අමාත්‍යාංශය යටතේ තිබෙන මධ්‍යම පරිසර අධිකාරිය පහළ කඩුගන්නාව ප්‍රදේශයේ කිලෝමීටර දෙකක වාගේ සීමාව විශේෂ සංවේදී පරිසර පද්ධතියක් හැටියට ප්‍රකාශයට පත් කරන්න තීරණය කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි පරිසර අමාත්‍යාංශය හැටියට "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහනත් සමඟ එකතු වෙලා අපේ රටේ උස් කඳුකර ප්‍රදේශ වාගේම සංවේදී ප්‍රදේශ "සංවේදී කලාප", "සංරක්ෂිත ප්‍රදේශ" හැටියට ප්‍රකාශයට පත් කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න මූලික සාකච්ඡා දැනටමත් ආරම්භ කර තිබෙනවා. ඒ නිසා පරිසර අමාත්‍යාංශය පැත්තෙන් මේ සඳහා අවශ්‍ය කරන මූලික ප්‍රවේශයන් මේ වනවිටත් අරගෙන තිබෙනවා.

මේ "දිට්වා" සුළි කුණාටුව කියන ව්‍යසන අවස්ථාවේදී අපේ රටේ විශේෂ මැදිහත්වීම් ප්‍රමාණයක් සිදු වනවා අපි දැක්කා. විශේෂයෙන්ම විපක්ෂය මේ ආපදා අවස්ථාව පාවිච්චි කරගෙන රජයට විවිධ චෝදනා නඟන්න හදනවා. ඒ විතරක් නොවෙයි, විශේෂයෙන්ම විපක්ෂය රාජ්‍ය නිලධාරින් සම්බන්ධයෙන් වැරදි අදහසක් ඇති කරන්න හදනවා, ඔවුන් මේ ආපදා අවස්ථාවට මැදිහත්වීම සම්බන්ධයෙන්. අපට මතකයි, ඔවුන් මීට කලින් මේ සම්බන්ධව සාකච්ඡා කරද්දිත් මේ ගැන කිව්වා. මේ රජය වංචා, දූෂණවලට මැදිහත් වුණා, නඩු දැම්මා, හිරේ දැම්මා, ඒ නිසා දැන් රාජ්‍ය නිලධාරින් ක්‍රියාමාර්ග වේගයෙන් ගන්න භය වෙලා ඉන්නවා, ඒ නිසා මේ ආපදා අවස්ථාවේදී සහන සැලසීමේදී රාජ්‍ය සේවකයින් හරියට ක්‍රියාත්මක වුණේ නැහැ කියලා ව්‍යංගාර්ථයෙන් ඔවුන් කියනවා. මේ ආපදා අවස්ථාවේදී රාජ්‍ය නිලධාරින් කාර්යභාරයක් කළා කියලා ඔවුන් කටවචනයට කිව්වාට, ව්‍යංගාර්ථයෙන් කියනවා, මේ සම්බන්ධයෙන් නිවැරදි අනාවැකි පළ කළේ නැහැ, නිවැරදි තීන්දු තීරණ ගත්තේ නැහැ කියලා. ඒ විධියට රාජ්‍ය නිලධාරින්ගේ කාර්යභාරය හෑල්ලුවට ලක් කරන්න ඔවුන් උත්සාහ කරනවා. නමුත්, කෑගල්ල දිස්ත්‍රික්කය තුළ වැඩ කරද්දී අපි අත්දැකීමෙන් දන්නවා, කෑගල්ල දිස්ත්‍රික් ලේකම්වරයාගේ ඉඳලා ප්‍රාදේශීය ලේකම්වරුන් දක්වා ඒ සියලු රාජ්‍ය නිලධාරින් තමන්ගේ රාජකාරියෙන් එහාට ගිහිල්ලා, තමන්ගේ රට, තමන්ගේ ජනතාව වෙනුවෙන් කරන්න ඕනෑ යුතුකමක්, වගකීමක් හැටියට සලකා විශාල කැප කිරීම් සහිතව මෙහිදී මැදිහත් වුණු බව.

ඒ නිසා විශේෂයෙන්ම අපි රාජ්‍ය නිලධාරින්ගේ මැදිහත්වීම මේ මොහොතේදී අගය කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, මේ ආපදා තත්ත්වය තුළ ස්වේච්ඡා සේවයක් සිදු වුණු ආකාරය අපි දැක්කා. මුළු රටම වාගේ "දිට්වා" සුළි කුණාටුවට ගොදුරු වුණා. නමුත්, අපේ රටේ තිබුණු විශේෂත්වය තමයි, අඩු ආපදා සහිත ප්‍රදේශවල, අඩු ආපදා සහිත දිස්ත්‍රික්කවල, අඩු ආපදා සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිරිස් වැඩි ආපදා සහිත ප්‍රදේශවලට ගිහිල්ලා මැදිහත් වෙලා ඉතාම ධෛර්යය සම්පන්න විධියට සහන සේවා සැලසීම. ඒ සහන සේවා සැලසීමේදී ඔවුන් ඒ ප්‍රදේශවලට ගියේ හිස් අතින් නොවෙයි. පිරිස විතරක් නොවෙයි, ඒ සහන සේවා කටයුතු සඳහා අවශ්‍ය කරන යන්ත්‍ර සූත්‍ර, ඉන්ධන, ඒ දවස් පහ, හය ගත කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය කෑම බීම ආදී සියල්ල අරගෙන ආපදා සහිත ප්‍රදේශවලට ගිහිල්ලා තමයි, ඒ ප්‍රදේශ ඉතාම කෙටි කාලයක් තුළ යථාවත් කරන්න අවශ්‍ය කරන මැදිහත්වීම් ඔවුන් විසින් සිදු කළේ. ඒක අපේ රට තුළ අපි දැකපු විශේෂ සිදුවීමක්. ඒ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලංකාවේ නියෝජිතවරයා විශේෂ ප්‍රකාශයක් කළා. ඔහු කිව්වා, "මගේ රටේදී නම් මට මෙවැනි දෙයක් අපේක්ෂා කරන්න බැහැ. මේ රටේ ජනතාව එකිනෙකාට උදවු කර ගන්නවා. ඒක පුදුම සහගතයි" කියලා. එවැනි විශේෂ සිදුවීම් අපේ රටේ සිදු වෙද්දී විපක්ෂය ඒවා අගය කරන්න ඕනෑ. මෙවැනි ආපදා අවස්ථාවලදී රටක් හැටියට අපි ඉස්සරහට යද්දී හරි නම් මේ රටේ ජනතාව පෙන්වපු ඒ සාමූහිකත්වය, ධෛර්යය, ශක්ති සම්පන්න බව සහ අනෙකා සම්බන්ධයෙන් සංවේදී වීම අගය කරන්න ඕනෑ. ඒවා සමාජය තුළ බෝ කරන්න ඕනෑ. ඒක අපි රාජ්‍ය නිලධාරින් තුළින්, ස්වේච්ඡා කණ්ඩායම් තුළින් වාගේම මේ රටට ආපු සංචාරකයින් තුළින් දැක්කා. මේ රටේ ජනතාව ඒ විධියට වැඩ කරද්දී විපක්ෂය හැටියට මේගොල්ලන් එවැනි වටිනාකම් ඔසවා තබනවා වෙනුවට මේවායේ සුළු සුළු අඩුපාඩු හුවා දක්වමින්, එවැනි වටිනාකම් නොසලකා හරින්න, එවැනි වටිනාකම්වලට අවමානයක් දක්වන්න තමයි කටයුතු කරන්නේ. ඒ නිසා අපි විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, මෙවැනි දේවල් සිදු කරන්න එපා කියලා. අපි රටක් හැටියට මේ ආපදා තත්ත්වයෙන් මිදෙන්න ඕනෑ. ඒ තත්ත්වයෙන් මිදෙන්න අවශ්‍ය කරන ශක්තිය, ධෛර්යය, සමගි සම්පන්න බව මේ රටේ ජනතාව තුළින් ඉවත් කරන්න, බිඳ වට්ටන්න කටයුතු කරන්න එපා කියා අපි විපක්ෂයෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන් විවිධ අභූත චෝදනා කරනවා. මීට කලින් කථා කළ මන්ත්‍රීවරයා කිව්වා, "ආපදාවට පත් පාසල් ළමුන්ට රුපියල් 25,000ක් ගෙවනවා කිව්වාට ඒක ගෙවන්නේ නැහැ" කියලා. මේවා පට්ටපල් බොරු, අමූලික බොරු. ආපදාවට පත් එක් පාසල් සිසුවෙකුට රුපියල් 10,000ක් ජනාධිපති අරමුදලෙන් සහ රුපියල් 15,000ක් මහා භාණ්ඩාගාරයෙන් වන පරිදි රුපියල් 25,000ක් ගෙවන්න දැනටමත් අපි සැලසුම් කර තිබෙනවා. ඉතාම කෙටි කාලයක් ඇතුළත අපි මේ ආධාර මුදල් ගෙවීමේ කටයුතු ආරම්භ කරනවා. ඒ නිසා අපි විපක්ෂයෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. රටක් හැටියට අපි ආපදාවට ලක් වෙලා ඉන්නවා. මේ රටේ ජනතාව සාමූහිකත්වයෙන්, ධෛර්යය සම්පන්නව ආපදාව පරාජය කරලා, රට නැවත ගොඩනහන්න සූදානම්. ඒකට අකුල් හෙළන්න එපා. වැරදි වටිනාකම් ඔසවා තබන්න එපා. සමානාත්මතාව, සහයෝගීතාව, ධෛර්යසම්පන්න බව අගය කරමින් අකුල් නොහෙළා මේකට ඉඩ දෙන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.37]

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම ගංවතුරෙන් ව්‍යසනයට පත් වෙච්ච ජනතාව වෙනුවෙන් මම මේ කථා කරන්නේ. අඛිල ඉලංගෙයි මහජන කොංග්‍රසයේ නායක ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාගේ නායකත්වයෙන් පක්ෂයක් හැටියට අපි දිවයින පුරා ගිහිල්ලා ක්ෂණිකව ලබා දෙන්න පුළුවන් විසඳුම් ටික ලබා දුන්නා. විශේෂයෙන්ම අපේ පක්ෂයේ නායකතුමා රට වටා යන අතරතුර ඊයේ ගෙලිඔය ප්‍රදේශයටත් ගියා. පක්ෂ නායකයෙක් හැටියට ඒ විධියට එතුමාගේ කාර්යභාරය ඉෂ්ට කිරීම පිළිබඳව මම පළමුවෙන්ම එතුමාටත්, අපේ පක්ෂයටත් ස්තුතිය පුද කරනවා.

විශේෂයෙන්ම මම නියෝජනය කරන්නේ පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම ආසනය. එම දිස්ත්‍රික්කයේ ගොවිතැන් කරන ජනතාව නැත්තටම නැතිවෙලා තිබෙනවා, මේ ව්‍යසනය නිසා. කල්පිටිය ප්‍රදේශය ගත්තොත්, ගොවිතැන ගන්නම දෙයක් නැහැ. එළවලු, පලතුරු ඇතුළු සියලු වගාවන් විනාශ වෙලා තිබෙනවා. ගොවි ජනතාව නඟා සිටුවීමට සහනාධාර දීලා හරියන්නේ නැහැ කියන එකයි අපි කියන්නේ. ඒ මිනිස්සු අද රුපියල් 15,000ට, 20,000ට ගන්න පොහොරවල මිල අඩු කරලා, ඒ මිනිසුන්ට නැවත ගොවිතැන් කරන්න පුළුවන් ශක්තිය ලබා දෙන්න කියලා අපි කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම ලුණු කර්මාන්තය ගත්තොත්, ලංකාවේ නම ගිහිල්ලා තිබෙන්නේ එලිෆන්ට් පාස් හි තිබෙන ලුණු ලේවායයි, හම්බන්තොට ලුණු ලේවායයි පදනම් කරගෙනයි. නමුත්, ලංකාවේ ලුණු නිෂ්පාදනයෙන් සියයට 50කට වඩා බෙදා හරින්නේ පුත්තලම ලුණු ලේවායෙන්. ඒක විශාල වශයෙන් විනාශයට ලක්වෙලා තිබෙනවා. ඒකට සහනාධාර දෙන්න ඕනෑ වාගේම, යටිතල පහසුකම් සපයන්නත් ඕනෑ. විශේෂයෙන්ම එතැනට යන්න පාරක් නැහැ. ඒ සියලු යටිතල පහසුකම් සකස් කර දෙන්න කටයුතු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ඉස්සන් කර්මාන්තය ගත්තොත්, කෝටි ගණනක් වටිනා ඉස්සන් ව්‍යාපෘති විනාශ වුණා. ඒ සඳහාත් වැඩ පිළිවෙළක් හදලා, ඉස්සන් කර්මාන්තය නැවත නඟා සිටුවීමට අවශ්‍ය කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා. ඒ අතරතුර ගරු ජනාධිපතිතුමා පුත්තලමට ආවා, ඇවිල්ලා අපේ ප්‍රදේශයේ ජනතාවගෙන් ප්‍රශ්න ඇහුවා. අහනකොට පුත්තලම-මන්නාරම පාර සම්බන්ධයෙන් ජනාධිපතිතුමාට වැරදි අවබෝධයක් තමයි දුන්නේ. පුත්තලම-මන්නාරම පාර, යුද්ධයට කලින් අපි ආපු පාර. යුද්ධයෙන් පස්සේ ඒ පාර වැහුණා. ඊට පස්සේ ගරු රිසාඩ් ඇමතිතුමා අමාත්‍යාංශය භාරව ඉන්නකොට ඒ පාර ඇරියාට පස්සේ මන්නාරම, පුත්තලම, මරිච්චිකට්ටි ඇතුළු ප්‍රදේශවල මිනිස්සු ඒ පාරේ ගියා. අන්තිමට එදා පුත්තලමේ සමහර නිලධාරින් කිව්වා, අවුරුදු 30ක් ඒ පාර වහලා තිබුණා කියලා. නිලධාරින් බොරු ප්‍රචාර කරලා තිබෙනවා. එම නිසා මම කියනවා, ඒක නිවැරදි කරන්න කියලා. ජනතාව විශාල වශයෙන් ඒ පාර දිගේ පුත්තලමේ ඉඳලා මන්නාරමට එනවා. මිනිස්සු ආපු ඒ පාර යුද්ධය කාලයෙන් පස්සේ වැහුවා. අවුරුදු 30ක් වුණේ නැහැ, අවුරුදු 4කට, 5කට උඩදී තමයි වැහිලා තිබෙන්නේ. ඒ පාර සම්පූර්ණයෙන් කාපට් කරන්න ඕනෑ කියලා අපි කියනවා. මිනිස්සුන්ට යන්න එන්නවත් ඒ පාර ඇරලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම වතුර නිසා දැන් සමහර ප්‍රදේශවල ළමයින්ට පාසල් යන්න බැහැ. එම නිසා ඒ පාසල් විවෘත කරන්න අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම, නිවාස ශුද්ධ පවිත්‍ර කරගන්න ආණ්ඩුවෙන් රුපියල් 25,000ක් ලබා දීමට තීරණය කිරීම පිළිබඳව අපි සතුටු වෙනවා. හැබැයි ඒ ජනතාව AGA Office එකට යන්න කිලෝමීටර 40ක දුරක් යන්න ඕනෑ. නිලධාරින් ගෙන්වලා, පොලීසිය හරි ගෙන්වලා ගම් මට්ටමින් ඒ ආධාර මුදල් ලබා දුන්නා නම්, ඒ ජනතාවට හරිම පහසුයි. AGA Office එකට යන්න සමහර අයට ත්‍රිරෝද රථයට රුපියල් 5,000ක් යනවා. නිලධාරින් ඇවිල්ලා ජංගම ක්‍රමයට එම ආධාර මුදල් ටික ජනතාවට දුන්නා නම්, ඒ ගැන මිනිස්සු ගොඩක් සතුටු වෙයි. සමහර මිනිස්සුන්ට යන්න බැහැ. එම නිසා ජංගම ක්‍රමයක් මඟින් ඒ ආධාර මුදල් ලබා දුන්නා නම් මිනිස්සු සතුටු වෙයි.

විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ, කර්මාන්ත පැත්තෙන් ගත්තොත්, පුත්තලමේ ලුණු කර්මාන්තය, ඉස්සන් කර්මාන්තය, කොහු කර්මාන්තය මේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් දක්වන බව. එම නිසා එම කර්මාන්ත නැවත නඟා සිටුවන්න කියලා අපි දේශපාලන භේදයකින් තොරව ඉල්ලා සිටිනවා. අපි කාටත් දේශපාලනය කරන්න නම් රටක් තිබෙන්නට ඕනෑ. ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ හෝ දේශපාලනය කරනවා නම්, හොඳ ශක්තිමත් ආර්ථිකයක් තිබෙන්නට ඕනෑ, රටේ ප්‍රශ්න විසඳිලා තිබෙන්නට ඕනෑ. එම නිසා අපි මෙතැන වාද විවාද කළාට හරියන්නේ නැහැ. මෙතැන කරන වාද විවාදවලට අනුව ජනතාවට හරියාකාරව සහනාධාර ලැබුණොත් ඔවුන්ට ඒකෙන් ප්‍රයෝජනයක් වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)

මට තව තත්පර 30ක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

දෙසැම්බර් 25 කියන්නේ Christmas දිනය. Christmas කාලයේදී බෙදන්න බඩු විශාල වශයෙන් ගෙනැල්ලා තිබෙනවා. මුහුදු කළපුව පැත්තේ තමයි කතෝලික ජනතාව ඉන්නේ. දෙසැම්බර් 25ට කලින් ආහාර ඇතුළු ඒ බඩු ටික බෙදලා දුන්නා නම්, ඒක ඒ මිනිසුන්ට සතුටක් වෙනවා. මේ වෙලාවේ ඒ ප්‍රදේශයේ ජනතාව විශාල වශයෙන් අමාරුවේ වැටිලා ඉන්නේ. මුහුදු කළපුව පැත්තේ ඉන්න මිනිස්සු දැන් වතුරේ ඉන්නේ. දැන් කච්චේරි හැම එකකම බඩු තිබෙනවා. ඒ බඩු ටික මේ නත්තලට ඉස්සෙල්ලා කතෝලික ජනතාවට සාධාරණ ලෙස බෙදලා දෙන්න කියා ඉල්ලා සිටිමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනයට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු එරංග වීරරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SUJEEWA DISSANAYAKE took the Chair.*

[අ.භා. 3.43]

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප රටේ මෑත ඉතිහාසයේ සිදු වූ දැවැන්තම ව්‍යසනයකට මුහුණ දීලා, එය සාර්ථකව කළමනාකරණය කරලා ජන ජීවිතය යථා තත්ත්වයට පත් කරන්නත්, රට සංවර්ධනය කරන්නත් යන මේ අවස්ථාවේ, ඒ ව්‍යසනයෙන් අපේ රටේ ඇති වූ තත්ත්වය ගැන විමර්ශනය කරන්න, සමාලෝචනය කරන්න යොදා ගත් මේ විවාදයේදී කථා කරන්න මට අවස්ථාව ලබා දීම ගැන මා ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

මේ ව්‍යසනයේ ප්‍රධානම ලක්ෂණය තමයි ඉතාම සුළු කාලයක් ඇතුළත අපේ රටේ පළාත් කීපයකට හැරෙන්න සමස්තයක් විධියට මුළු දිවයිනටම බලපාන විධියට එය ක්‍රියාත්මක වීම. මේ හරහා ඇති වූ නාය යෑම් -පස් කඳු කඩා වැටීම්-, ගංවතුර වැනි තත්ත්වයන් විශාල වශයෙන් රටට බලපෑවා. නොවැම්බර් 28වැනි දා වන විට ඒ බලපෑමේ උච්චතම අවස්ථාව ආවා. ඒ වෙනකොට අපේ රටේ ජනතාව මේ ව්‍යසනය නිසා අවතැන් වෙලා තිබුණා. එහිදී ඒ ජනතාවට විශාල වශයෙන් බලපෑ කාරණයක් තමයි ඔවුන්ගේ සන්නිවේදන පහසුකම් බිඳ වැටීම. මොකද, මේ ව්‍යසනය ඒ හැම පළාතකටම එක හා සමානව බලපෑවා. ඒ හරහා අපේ විදුලි සන්නිවේදන ජාලය අකර්මණ්‍ය වෙලා තිබුණා, 28වැනි දා වෙනකොට.

අපි දන්නවා, අපේ රටේ දුරකතන සන්නිවේදන කුලුනු 16,000ක් පමණ තිබෙනවා. ඒවායින් කුලුනු 4,500ක් පමණ මේ ව්‍යසනය නිසා අක්‍රිය වෙලා තිබුණා. ඒ වාගේම අපේ පළාත් සම්බන්ධ කරන fibre network එක එකොළොස් තැනකින් විසන්ධි වෙලා තිබුණා. එම නිසා පළාත් අතර අපේ සන්නිවේදනය සම්පූර්ණයෙන් බිඳ වැටී තිබුණා. නමුත් අපි හොඳට බලන්න ඕනෑ, මේ පළාත් සම්බන්ධ කරන fibre network එක fibre link එකකින් විතරක් නොවෙයි connect වෙලා තිබෙන්නේ. සමහර පළාත්වල එකකට වැඩි ප්‍රමාණයකින්, අඩුම වශයෙන් දෙකකින් connect වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට නුවරඑළිය ගත්තොත් fibre network එකට fibre links හතරකින් connect වෙලා තිබෙනවා. පසුගිය 28වැනි දා මේ fibre links හතරම disconnect වුණා. ඒ හරහා තමයි අපේ විදුලි සන්නිවේදන කටයුතු බිඳ වැටුණේ, නුවරඑළිය වාගේ දිස්ත්‍රික්කවල. නමුත්, අපේ වාසනාවට අපේ විදුලි සන්නිවේදන සමාගම් ඉතා යුහුසුලුව මේ සම්බන්ධයෙන් වැඩ කළා. ඒ සමාගම්වල කාර්ය මණ්ඩලය නාය යෑම් අවදානම නොතකා, ඒ වාගේම වර්ෂාව, සුළඟ විශාල වශයෙන් තිබියදීම ඒ පළාත්වලට ගිහිල්ලා, පස් කඳු තරණය කරමින් ඒ තිබෙන විදුලි සන්නිවේදන කුලුනුවලට ළඟා වෙලා අවශ්‍ය කටයුතු කළා. සමහර වෙලාවට ජෙනරේටර් උස්සාගෙන, fibre network cables උස්සාගෙන කිලෝමීටර දෙක, තුන පයින් ගිහිල්ලා ඒ විදුලි සන්නිවේදන කුලුනු යථා තත්ත්වයට පත් කරන්න කටයුතු කළා. නොවැම්බර් 30වැනි දා වෙනකොට 4,500ක් වන කුලුනු disconnections, 2,600ක පමණ ප්‍රමාණයකට අවම කරන්නත්, fibre link disconnections 11 සිට 5ක් දක්වා අඩු කරන්නත් අපට හැකියාව ලැබුණා. 30වැනි දා වනකොට අපේ විදුලි සන්නිවේදනය යම්කිසි දුරකට සමස්ත රටේම ක්‍රියාත්මක කරන මට්ටමට ඔවුන් සකස් කර දුන්නා, ඒ ගැටලු නිරාකරණය කිරීම හරහා. ඒ වාගේම අපේ ආපදා සහන සේවා කටයුතු කඩිනමින් කර ගැනීමට අපි ස්ටාර්ලින්ක් සමාගම එක්කත් කථා කරලා, ඔවුන්ගේ තිබෙන Starlink connections 25ක් පමණ ආපදා සහන සේවා ලබා දෙන කණ්ඩායම්වලට නොමිලේ ලබා ගන්න අපට හැකියාව ලැබුණා. දෙසැම්බර් 5වැනි දා වනකොට අපේ විදුලි සන්නිවේදනය සියයට 97කට වැඩි ප්‍රමාණයක් යථා තත්ත්වයට ගෙනැල්ලා මුළු රටේම තිබූ සන්නිවේදන ගැටලුව අපි නිරාකරණය කළා. දැන් වෙනකොට ඒක සියයට 100ක්ම යථා තත්ත්වයට ගෙනැල්ලා තිබෙනවා. මේ වෙනකොට කිසිම ප්‍රදේශයක සන්නිවේදනය අකර්මණ්‍ය වෙලා නැහැ. ඒ වාගේම මේ දුරකථන සමාගම්වලින් අපි -රජයෙන්- ඉල්ලීමක් කළා. මොකද, මේ ආපදා තත්ත්වය නිසා top-up වර්ගයේ ගිණුම්වලට මුදල් දැමීමේ හැකියාව නැති වෙලා තිබුණා. එම නිසා ගොඩක් ගිණුම් disconnect වෙන මට්ටමේ තිබුණා. එම නිසා අප රජය විධියට මේ සමාගම්වලින් ඉල්ලීමක් කළා, අපේ

[ගරු එරංග වීරරත්න මහතා]

ජනතාවට සහන පැකේජයක් දෙන්න කියලා, නොමිලේ පැකේජයක් දෙන්න කියලා. ඔවුන් ඒකට හොඳින් ඇහුම්කන් දීලා, කථා කරන්න, SMS පණිවිඩ යවන්න සහ Internet data පහසුකම් ලබා ගන්න දින තුනක පැකේජයක් ලබා දුන්නා. ලංකාවේ තිබෙන සමාගම් තුන හරහාම එම පහසුකම ලබා දුන්නා. ඔවුන් ඒක දින තුනකට සීමා කළේ නැහැ. අපේ ඉල්ලීම මත දින 9ක් දක්වා එම සහනය දීර්ඝ කරන්නත් ඔවුන් කටයුතු කළා. මේ ව්‍යසන අවස්ථාවේ ඉතාම ඉක්මනින් ඉදිරිපත් වෙලා අපේ ජනතාවට තමන්ගේ සේවාව නොමිලේ ලබා දීම හරහා අපේ රටට මේ ව්‍යසනයට මුහුණ දෙන්න ඔවුන් ලබා දුන් දායකත්වයට මම ඒ සමාගම්වලට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි ආපදා තත්ත්වයන් ඉදිරියේදීත් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා අපේ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ටෙලිකොම් සමාගම් එකතු වෙලා කථා කරගෙන යන්නේ ඉදිරියට අපි මොනවාද කරන්න ඕනෑ කියලායි. පළාත් අතර තිබෙන සම්බන්ධතාව තවදුරටත් ශක්තිමත් කරන්නේ කොහොමද, මේ වාගේ ආපදාවලට ලක් වුණාම networks විසන්ධි නොවෙන්න කරන්න ඕනෑ මොනවාද කියන දේවල් ගැන තමයි මේ දවස්වල කථා කරගෙන යන්නේ. ඒ අනුව fibre විතරක් නොවෙයි, backup මාර්ගයක් විධියට සැටලයිට් වැනි සන්නිවේදන මාර්ගයක් ඔස්සේත් සම්බන්ධ කිරීමට ඇති හැකියාව පිළිබඳව අපි සලකා බලනවා.

දැන් තිබෙන ක්‍රමවේදය අනුව ටෙලිකොම් සමාගමක පාරිභෝගිකයෙකුට ඒ සමාගමේ සම්බන්ධතාව අඩාළ වෙලා නම්, වෙනත් සමාගමක network එකක් පාවිච්චි කරලා දුරකථන සේවා ලබා ගන්න බැහැ. ඒ පහසුකම ඇති කරන්නත් අපි කටයුතු කරලා තිබෙනවා. ඒ ක්‍රමය ඇති කළාට පස්සේ මොකක් හරි සමාගමක network එක අඩාළ නම් ජනතාවට පුළුවන් වෙයි, වෙන network එකකට ගිහිල්ලා අත්‍යවශ්‍ය සේවා හා සම්බන්ධ වීමේ හැකියාව ඇති කර ගන්න. මේකට කියනවා, "camp-on service" කියලා. අපි ටෙලිකොම් සමාගම් එක්ක සාකච්ඡා කරගෙන යනවා, ඒකත් ක්‍රියාත්මක කරන්න.

ඒ වාගේම සන්නිවේදන කුළුනුවල විදුලිය සුරක්ෂිතභාවය ඇති කර ගන්න කරන්න ඕනෑ කටයුතු පිළිබඳව ද අපි ඒ සමාගම් එක්ක කථා කරනවා. උදාහරණයක් විධියට ජෙනරේටර් ලබා දීලා, ජෙනරේටර්වල ධාරිතාව වැඩි කරලා, සූර්ය කෝෂ, බැටරි, ඉන්ධන පහසුකම් තවදුරටත් වර්ධනය කරලා විදුලි විසන්ධි වීමකින් එම පද්ධතිය අඩාළ නොවන විධියට වැඩ කරන්න අපි කටයුතු කරගෙන යනවා.

ඒ වාගේම මේ ව්‍යසනය ඇති වෙච්ච වෙලාවේ අපේ ජනතාවට බලපෑ, තමන් මුහුණ දුන් අපහසුතා සහ ආපදා ඉතාම ඉක්මනින් රජයට දැනුම් දෙන්න අපි ඩිජිටල් මාර්ගයෙනුත් වැඩ කටයුතු කරගෙන ගියා. "Flood support system" කියලා එකක් අපි හඳුන්වා දුන්නා. ඒ හරහා, ඕනෑම තැනක ඉන්න ඕනෑම පුද්ගලයෙකුට පුළුවන්, තමන් මුහුණ දෙන ගැටලුව, තමන්ට අවශ්‍ය උපකාරය ඒ හරහා ඉක්මනින් අපට දන්වන්න. අපි ඒ system එක ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයටත් සම්බන්ධ කරලා ඒ හරහා 6,000කට වැඩි කණ්ඩායමකට සහයෝගය ලබා දීලා තිබෙනවා, ඔවුන්ට තිබෙන ගැටලුව ඉක්මනින් නිරාකරණය කර ගන්න. අප මේ අවස්ථාවේ දැකපු ප්‍රධාන ලක්ෂණයක් තිබෙනවා. ඒ තමයි මෙවැනි digital systems හදන්න උදව් කරන්න 500කට වඩා වැඩි පිරිසක් ස්වේච්ඡාවෙන් දායක වීම.

"Rebuilding Sri Lanka" කියලා අරමුදලක් ස්ථාපිත කරලා දෙස් විදෙස් ශ්‍රී ලාංකිකයන්ගෙන් සහ විදේශිකයන්ගෙන් අපට අවශ්‍ය මූල්‍යමය දායකත්වය ලබා ගන්න අපි කටයුතු කරලා තිබෙනවා. අපි donate.gov.lk කියන website එක හරහා credit cards සහ GovPay වාගේ මාධ්‍යවලින් ආධාර ලබා ගන්න අවශ්‍ය පහසුකම් සලසා දී තිබෙනවා. ඒ හරහා දැන් වෙනකොට රුපියල් බිලියන 4,000කට වැඩි ප්‍රමාණයක් ආධාර වශයෙන් ලබා දෙන්න අපේ සියලුම ජනතාව සැහෙන්න දායකත්වයක් ලබා දීලා තිබෙනවා. මේ මුදල් එන්නේ මහ බැංකුවේ සහ මහා භාණ්ඩාගාරයේ තිබෙන ගිණුම්වලට. විදේශ currenciesවලින් ගිණුම් හයකුත්, දේශීය බැංකුවල ගිණුම් දෙකකුත් හරහා එවන ඒ මුදල් මේ අරමුදලට ලබා දෙන්න හැකියාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම තමයි එවන ද්‍රව්‍යමය ආධාර අපි බදු රහිත කරලා තිබෙනවා; බදුවලින් නිදහස් කරලා තිබෙනවා. අවතැන් වෙච්ච ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාගන්න අවශ්‍ය පහසුකම් අපි ඒ හරහා ලබා දීලා තිබෙනවා; අපේ ශ්‍රී ලාංකිකයන්ට අපි ඒ අවස්ථාව ලබා දීලා තිබෙනවා.

මේ ව්‍යසනයට මුහුණ දෙන්න අපට සෘජුවම සහයෝගය ලබා දුන්නා, ත්‍රිවිධ හමුදාව. ඒ නිසා ඒ අය බෙහෙවින් ඇගයීමට ලක් කරන්න ඕනෑ. මොකද, මේ ව්‍යසනයේදී ඈත දුෂ්කර ප්‍රදේශවල තිබෙන ටෙලිකොම් කණුවලට ළඟා වීමේ හැකියාව අපට තිබුණේ නැහැ. අපට බෝට්ටු සපයන්න, හෙලිකොප්ටර් පහසුකම් ලබා දෙන්න, අපට අවශ්‍ය වූ විට ඉන්ධන ඒ අදාළ ස්ථානවලට ගෙනිහිල්ලා ලබා දෙන්න ඔවුන් සැහෙන්න දායක වුණා. ඒ නිසා ඔවුන්ට හෘදයංගමව ස්තුතිවන්ත වෙනවා, ඔවුන් ලබා දුන්නු සහයෝගයට.

ඒ වාගේම, අපට රාජ්‍ය ආයතනවලින් සැහෙන්න සහයෝගය හම්බ වුණා; පෞද්ගලික ආයතනවලින් වාගේම ජනතාවගෙන් ද සහයෝගය හම්බ වුණා. ඒ හම්බ වෙච්ච සහයෝගය නිසා තමයි අපට මෙච්චර හොඳට මේ ආපදා තත්ත්වය කළමනාකරණය කර ගන්න පුළුවන් වුණේ. ඒ වාගේම, මේ ලබපු අද්දැකීම් එක්ක මින් ඉදිරියට එන අභියෝගවලටත් සාර්ථකව මුහුණ දෙන්න අවශ්‍ය පරිසරය ඇති කරන්න අපි සියලු වැඩ කටයුතු කරනවා කියන ප්‍රතිඥාව ලබා දෙමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.54]

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ව්‍යසනය ගැන කථාවට මම පසුව එන්නම්. ආයෙත් ජාතික ව්‍යසනයක් ඇති වීමේ අභිමුවයි අප දැන් ඉන්නේ. මා එහෙම කියන්න හේතුව මේකයි. මේ බලන්න, මේ පින්තූරයේ ඉන්න අවුරුදු 23ක් වයසැති දුවණිය දිහා. ඇය පසුගිය 12වැනි දා සවස IDH එකට රැගෙන යනවා, කලන්තයක් හැදිලා; වමනයක් හැදිලා. එතකොට Ondansetron කියන එන්නත මේ ළමයාට එන්නත් කරනවා. ඒ වෙනකොට NMRA එකෙන් ඒ එන්නත තහනම් කරලා රෝහල් ඔක්කෝටම -රජයේ රෝහල්වලට විශේෂයි- නියෝගයක් යවලා තිබෙනවා, මේක පාවිච්චි කරන්න එපා කියලා. නමුත්, මේ අල්ලපු වැටේ තිබෙන ඒ රෝහලට ඒ නියෝගය ලැබුණාද කියලා දන්නේ නැහැ.

ඒ දියණියට ඒ බෙහෙත එන්නත් කරනවා. එසේ එන්නත් කරලා පැය කිහිපයකින් පසුව ඒ ළමයා ඇදගෙන වැටෙනවා. ඒ ළමයා එදාම රෑ මරුමුවට පත් වෙනවා. ඒ ළමයාගේ දෙමව්පියන්ගේ ප්‍රකාශ ඉතා පැහැදිලිවම ඉදිරිපත් කරලා තිබෙනවා. මේක ජාතික ව්‍යසනයක්. මේ රටට මේ එන්නත් 270,000ක් ගෙන්නලා තිබෙනවා. මේ එන්නත් 270,000න් 220,000ක්ම මේ වනකොට පාවිච්චි කරලා. කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිතුමා වතුර කවලම් කරලා බෙහෙත් දීලා මිනිස්සු මැරුණා කියලා මේ වනකොට ඒ පවුලම චෝදනා ලබලා තිබෙනවා. ඒකෙන් මිනිස්සු මැරුණාද, නැද්ද කියලා තවම දන්නේත් නැහැ. කොහොම හරි මේක ව්‍යසන තත්ත්වයක්.

මෙතැනදී මට කියන්න තිබෙන්නේ මේකයි. මගේ ගමේ කන්නන්ගර ජාතික පාසලේ; කන්නන්ගර ශ්‍රීමතාණන්ගේ සංකල්පය අනුව ආරම්භ කරපු පළමුවැනි මධ්‍ය මහා විද්‍යාලයට ගිය හතරදෙනෙක් ඉන්නවා, මේ පාර්ලිමේන්තුවේ. මම ඉන්නවා, අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඉන්නවා, සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා, අපේ දම්මික පටබැඳි ඇමතිතුමා ඉන්නවා. එතුමන්ලා "අ" යන්න "ආ" යන්න කිව්වේ ඒ පාසලෙන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
වටගලත් එහේද?

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
ඔව්, වටගලත් එහේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ වුණාට, කොළඹ වගේ ඉන්නේ.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
මම වගකීමෙන් කියනවා, මේ දුවණියගේ පවුලේ සියලුදෙනා ජාතික ජන බලවේගයට - මාලිමාවට - සහයෝගය දුන්නු අයයි කියලා. මේ ව්‍යසන අවස්ථාවේ මේ අවමඟුල් උත්සවයට සහභාගි වෙන්න බැරි වුණා, මේ කියපු අපේ ආදි ශිෂ්‍යයෝ එක්කෙනෙකුටවත්. මෙතුමා නම් ගම්පහ නේ. කමක් නැහැ. ගමේ මිනිස්සුන්ටවත් එන්න බැරි වුණා. රජයෙන් කිසිම ආධාරයක් මේ වෙනකල් ඔවුන්ට ලැබුණේ නැහැ. දැන් රිය අනතුරක් - accident එකක් - වුණොත් වහාම රුපියල් 50,000ක්, 60,000ක්, 100,000ක් ආදි වශයෙන් දෙනවා ඒ කර්තව්‍යයන් කර ගන්න. ඒ අයත් දුප්පත් මිනිස්සු. නමුත්, ඒ අයට අද වෙනකල් කිසිවක් ලැබිලා නැහැ. මේ වාගේ ව්‍යසනයක් වුණායින් පස්සේ ඉවසන්න පුළුවන් කොයි අම්මා තාත්තාටද? තව කීදෙනෙකුට මේක වෙයිද? මේ දුවණියට විතරක් නොවෙයි, එදාම තව දෙදෙනෙකුට මේක වුණා. තව අයට සංකූලතා ඇති වෙලා තිබෙනවා. එන්නත් 220,000ක් ගහලා තියෙද්දි මොකක්ද මේ කරන්නේ?

හොර රහසේ ඉන්දියාවත් එක්ක ගිවිසුම් ගැහුවා. ගිවිසුම් ගහලා දැන් යුරෝපීය බෙහෙත් ඔක්කෝම නවත්වලා තිබෙන්නේ. ගේන්නේ ඉන්දියාවේ බෙහෙත්; බාල බෙහෙත්; අඩු මිල බෙහෙත්. දැන් මුදල් තිබෙන කවුරු හරි කෙනෙක් වුණත් පෞද්ගලික රෝහල්වලට ප්‍රතිකාර ගන්න ගියොත් මොකද වෙන්නේ? ගහන්නේ අර එන්නතම තමයි. "මරුවා සමඟ වාසේ" වාගේ තමයි. මෙන්න මේකත් ව්‍යසන තත්ත්වයක් විධියට සලකා මේ සම්බන්ධයෙන්ද කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේක මම වගකීමෙන් කරන ප්‍රකාශයක්. මොකද, මේවා වෙන්න දෙන්න බැහැ.

අපේ රටට ස්වාභාවික ව්‍යසනයක් කියලා ආපු මේ ආපදාවට කලින් ක්‍රියාත්මක වුණා නම් හානිය මීට වඩා අඩු කර ගන්න තිබුණා. මම අහගෙන හිටියා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කියපු දේවල්. අපිත් ජනතාවට උදව්වට ගියා. පෞද්ගලිකව ගත්තොත්, මට රුපියල් ලක්ෂ ගණනක් වියදම් වුණා. මතුගම, අගලවත්ත අපේ තරුණයන් ඔක්කෝම අරගෙන අපි කලාඹය ගියා. තඹුත්තේගම ගියා කියලා කිව්වොත් එහෙම හොඳ නැහැ නේ. එතකොට කට්ටියට පොඩ්ඩක් upset යයි. ඒ නිසා අපි කලාඹය ප්‍රදේශයට ගියා. අපි වහාම අපේ මේ සුරංග රත්නායක මන්ත්‍රීතුමාගේ ප්‍රදේශයට ගිහිල්ලා ලොකු වැඩ කොටසක් කරලා ආවා. ඒ පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව. මම ඒ ස්ථානයේදීම යමක් කිව්වා. මේ අවස්ථාවේදීත් ඒක කියනවා. මේ වෙලාවේ රුපියල් 25,000, රුපියල් 50,000 දෙන එක හොඳයි. ඒ වුණත්, ඒ ප්‍රදේශවල කුඹුරුවලට මඩ ගිහිල්ලා ඒවා පිට්ටනි බවට පත් වෙලා තිබෙනවා. ඒවායේ වගා කරන්නේ කොහොමද? මේක දැවැන්ත ප්‍රශ්නයක්; බිග් කුව්වන් ! මේ වෙලාවේ මට කියන්න තිබෙන්නේ අපි අපේ යුතුකම කළා කියලායි. අපි කලාඹය ප්‍රදේශයට ගියා; ඊට පස්සේ කඩුවෙල ගියා; ගම්පොළ ගියා; වලපනේ ගියා. ඒ මදිද? කණ්ඩායමක් එක්කයි අපි ගියේ. වතුර ඉවත් කරන මැෂින් පවා අරගෙන ගියා. මතුගම අපේ සභාවේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සියලු දේවල් අරගෙන ගියා. අගලවත්ත මන්ත්‍රීවරු ගියා. බස් ගණනාවක් ගියා. සමාජ මාධ්‍යවල පෙන්වන්න ඇති. අපි කවදාවත් බැනර් එකක් ගහගෙන ගියේ නැහැ, "සමඟි ජන බලවේගය" නැත්නම් "මේ පක්ෂයේ කට්ටිය" කියලා. අපි ගියේ, ජනතාවට උදව් කරන්න. අපි දේශපාලන භේදයකින් තොරව බඩු අරගෙන ගියා, ඇති වෙන්න. අපේ මිනිසුන්ට මම ප්‍රණාමය පුද කරන්න ඕනෑ. අපේ මිනිස්සු බඩු ගෙනැල්ලා පිරෙව්වා. මගේ ස්ටෝරුවල තවත් බඩු තිබෙනවා. තරහා වෙන්න එපා. ආණ්ඩු පක්ෂය, විපක්ෂය කියලා නැහැ කාටහරි මන්ත්‍රීවරයෙකුට අවශ්‍ය නම් වාහනයක් එවන්න පුළුවන් නම් මට බඩු දෙන්න පුළුවන්. ස්ටෝරුවලට බඩු ගෙනැල්ලා දීලා තිබෙනවා. ඇඳුම් තිබෙනවා. වියළි ආහාර ද්‍රව්‍ය තිබෙනවා. මේ සියලු දේවල් ජනතාව දුන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
මේ වෙලාවේ ඒ මිනිසුන්ටත් ස්තුති කරන්න ඕනෑ. ඒ මිනිස්සු පක්ෂ පාට භේදයක් බැලුවේ නැහැ. මාලිමාවේ කට්ටියත් අපට බඩු ගෙනැත් දෙන්න ඇති. ඒක නිසා මේ ව්‍යසනය පිළිබඳව මීට වඩා වගකීමෙන් හිතන්න කියන එක මට කියන්න සිදු වෙනවා. බාල බෙහෙත්වල, විෂ බෙහෙත්වල තිබෙන්නේ වීදුරු කටු කියලා NMRA වාර්තාවකින් කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
එදා තිබුණේ, වතුර. වීදුරු කටු තිබෙන ඒ බාල බෙහෙත් ශරීරගත වුණාට පස්සේ මැරෙන මිනිසුන්ට කවුද වග කියන්නේ?

[ගරු ජගත් විතාන මහතා]

වගකීමක් කිසිසේත්ම නැහැ. ඒ දියණියක් මිය ගියා. බලන්න කෝ, ලස්සන. තාත්තා කෙනෙකුට ඉවසන්න පුළුවන්ද? ඇය අපේ ඉස්කෝලේ දුවක්. එයාට සාධාරණයක් ඉටු කරන්න. ඒක නීතියට යනවාට වඩා හොඳයි. අපි සියලු දෙනා එකතු වෙලා ඇයට සාධාරණය ඉටු කරමු. මට නියමිත කාලය අවසානයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එරංග ගුණසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.01]

**ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගෙන් අවසරයි.

අපි දන්නා අපේ රටේ ඉතිහාසය තුළ සිදු වුණු දැවැන්තම ආපදාව සිදු වී අවසන්. අද දවසේ පාර්ලිමේන්තු විවාදයේදී අපි සාකච්ඡා කරන්නේ ඒ ආපදාව සිදුවීමෙන් පසුව ක්‍රියාවලියක් විධියට, ජනතාව විධියට, ආයතන විධියට අපි කෙසේ නැඟී සිටින්නේද කියන කාරණයයි. ජනතාවාදී ආණ්ඩුවක් ලෙස අපි එහිදී ජනතාවගෙන් එන උපදෙස් හා අදහස් ඒ වාගේම විද්වතුන්ගේ අදහස්, ක්‍රියාකාරීන්ගේ අදහස් සියල්ල ලබා ගන්න සූදානම්. ඒ පිළිබඳ කිසි ගැටලුවක් නැහැ. හැබැයි, පසුගිය කාලය පුරාම මේ ආපදාව වෙච්ච මොහොතේ සිට විපක්ෂයේ යම් පිරිසක්, යම් කණ්ඩායමක් අපට ඔවදන්, අවවාද දෙන්න පටන් අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තිබෙන ප්‍රශ්නය මේකයි. මීට පෙරත් අපේ රටේ මෙවැනි ව්‍යසන වුණා. මෙවැනි ව්‍යසනයක් වුණේ නැති වුණත් මේ ආධාර බෙදීම පිළිබඳව, සහන ලබා දීම පිළිබඳව මේ සභාවේ විවිධ සාකච්ඡා කරනවා. අපේ මන්ත්‍රීතුමියන් කිව්වා වාගේම, අපි ආධාර දෙනවා කියලා තීන්දු ගත්තාට පස්සේ, පහුවදා මාධ්‍ය ආයතනයක කැමරාවක් අරගෙන ගිහිල්ලා අහනවා, රුපියල් 25,000 හම්බ වුණාද කියලා. ඒ වාගේ ලාභ, බාල වැඩ කරන විපක්ෂයේ කණ්ඩායමක් ඉන්නවා. ඒ වාගේම මේ ආපදා අපේ රටට මීට පෙරත් වෙලා තිබෙනවා. අපි දන්නවා, අවිස්සාවේල්ල ආසනයේ සාලාව කියන හමුදා කැම්ප් එකේ පිපිරීමක් සිදු වුණා කියලා. දැනට අවුරුදු නවයකට වැඩියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවම ඒ සියලුදෙනාට වන්දි දීලා අවසන් කරලා නැහැ. නමුත් අද මෙතැන ඇවිල්ලා කියවනවා.

කොළොන්නාව ගත්තොත් මීතොටමුල්ල කුණු කන්ද කඩාගෙන වැටිලා මිනිස්සු මැරුණා. ඒ ගොල්ලන් ඒ ප්‍රශ්නය ඉවර කරලා තිබෙනවාද? ඒ කුණු කන්ද පහළ තවම පවුල් ගණනාවක් ජීවත් වෙනවා. ඒ මිනිසුන්ට තවම ගෙවල් දුන්නේ නැහැ. ඒ මිනිස්සු එතැනින් යැව්වේ නැහැ. එහෙම කටයුතු කරපු කණ්ඩායම්, ඒවාට නායකත්වය දුන් පිරිස් අද අපෙන් අහනවා, මේ ආධාරය දීලාද, මේක දීලාද කියලා. ව්‍යසනය වෙලා තවම දවස් කිහිපයයි ගත වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. ඇත්තටම අපි අද සූදානම් වෙලා තිබුණේ මේ සංවාදය තුළ එකිනෙකාට චෝදනා කරගන්න නොවෙයි. අපි රටක් විධියට පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව ඒකට මැදිහත් වීමට අවශ්‍ය සාකච්ඡාවක් කරන්න තමයි අපි අද මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගෙනාවේ. හැබැයි මම දන්නවා විපක්ෂයේ ඉතා සීමිත මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඉන්නවා, එතුමන්ලා යම් ක්‍රියාවලියක යෙදෙනවා. නමුත් යම් පිරිසක්, යම් කල්ලියක් ඉන්නවා, ඒ කල්ලිය විනාශය විතරයි බලාපොරොත්තු වෙන්නේ; අපරාධය විතරයි බලාපොරොත්තු වෙන්නේ.

ඒ විනාශය වෙද්දී, ඒ මළ ගෙය වෙද්දී, ඒ මළ ගෙදර ගිහින් බූරු ගහන්න බලාගෙන විපක්ෂයේ කණ්ඩායම් කිහිපයක් හිටියා. ඒගොල්ලෝ තමයි මේ කරුණු දක්වමින් සිටින්නේ. ඒක අපි පිළිකුලින් ප්‍රතික්ෂේප කරනවා. අපි දැක්කා අදත්, කුණු කඳු පිළිබඳව, කොළොන්නාවේ ජනතාව පිළිබඳව, ආපදා තත්ත්වය පිළිබඳව අමූලික අසත්‍ය කරුණු ටිකක් ඉදිරිපත් කළා. ඒ මහත්වරු පසුගිය කාලයේ ගිහින් මොනවාද කළේ? කොළොන්නාවේ bund එක තිබෙනවා නේ. ඇත්තටම ඒ ඇමතිවරු ජනතාව පිළිබඳව හිතන්නේ නැතුව තමන්ට කැමැති විධියට ඒ bund එක ඇරියා. මේගොල්ලෝ දැන් මොකද කළේ? මේ ගංවතුර ඇතුළේත් දේශපාලනය කළා. ගිහින් නිලධාරින්ට බලපෑම් කළා. ඊළඟට, උද්ඝෝෂණ කරන්න හැදුවා ඒ bund එක අරින්න කියලා. මේගොල්ලෝ එහෙමයි කටයුතු කළේ. අපි වාරි ඉංජිනේරුවරු නොවෙයි; අපි ඒ පිළිබඳ විශේෂඥයෝ නොවෙයි. ඒවා පිළිබඳ තීරණ ගන්න ආයතන තිබෙනවා.

අපි දන්නවා, කොළොන්නාව ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් බොහෝ ප්‍රමාණයක් තිබෙන බව. ඒවාට කවුද ඉඩ දුන්නේ? මේ මහත්වරු. හැබැයි, නගර සභාවල පිරිස් එක්ක අපි ඒ නිවාස සුද්ද කරන්න යද්දි රාවයක් යවනවා -ප්‍රචාරය කරනවා- ගෙවල් කඩන්නයි එන්නේ කියලා. එහෙම බාල දේශපාලනයක් තමයි කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැලණි ගඟේ කෙළවර තමයි, කොළොන්නාව තිබෙන්නේ. ඒ ප්‍රදේශයේ දැනට කුණු ටොන් 15,000කට, 20,000කට වැඩි ප්‍රමාණයක් ගොඩ ගසා තිබෙනවා. ඒ කුණු ටික අදිද්දී අපට ඒවා තාවකාලික ස්ථානවල dump කරන්න සිද්ධ වෙලා තිබෙනවා. එහෙම dump කරද්දී ගිහින් මිනිස්සු කුලප්පු කරනවා, "අන්න උඹලාගේ ගෙවල් ඉස්සරහා කුණු ගොඩ ගහන්න යනවා" කියලා. එහෙම කට්ටිය මේ. එහෙම කට්ටිය අද මෙතැන ඇවිල්ලා පම්පෝරි දොඩවනවා. ඒවාට උත්තර නොදෙන එක වඩා හොඳයි කියා අපි හිතනවා. මම මේවා කියන්න නොවෙයි හිටියේ. මීට පෙරත් මෙතැන ඇවිල්ලා කෑ ගහද්දී මමත් සද්ද නොකර හිටියා, ඒවාට උත්තර දෙන්න ඕනෑ නැති නිසා. නමුත්, දිගින් දිගටම බොරු සමාජගත කරන නිසාත්, මහන්සියෙන් වැඩ කරන රාජ්‍ය නිලධාරින් අපහසුතාවට පත් කරන නිසාත් තමයි මම මේ තොරතුරු ටික කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආපදාවට ලක් වුණු දිස්ත්‍රික්ක 22 ඇතුළේ කොළඹ දිස්ත්‍රික්කයත් ඇතුළත්ව තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ වැඩියෙන්ම ආපදාවට පත් වෙලා තිබෙන්නේ කොළොන්නාව, කඩුවෙල හා සීතාවක කියන ප්‍රදේශ. පවුල් ප්‍රමාණය ගත්තොත්, 86,000කට වඩා වැඩි ප්‍රමාණයක් ආපදාවට පත් වෙලා තිබෙනවා. පුද්ගලයන් වශයෙන් ගත්තොත්, ලක්ෂ තුනකට වඩා වැඩි ප්‍රමාණයක් ආපදාවට පත් වෙලා තිබෙනවා. එම ආපදාවට පත් වූ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක්ම ඉන්නේ කොළොන්නාව ප්‍රදේශයේ. කොළොන්නාව ප්‍රදේශයේ ගෙවල් විතරක් 55,000කට වැඩි ප්‍රමාණයක් විනාශ වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ලක්ෂ දෙකකට වඩා වැඩි ජනතාවක් ආපදාවට පත් වුණු ආසනයක් ඒක. දැන් සියලුදෙනා එකතු වෙලා ආපදාවට පත් වූ අයට සහන සලසන්න මැදිහත්

වෙමින් සිටිනවා. ඒ මැදිහත් වන ක්‍රියාවලිය කාගේවත් මැජික් එකක් නොවෙයි. අපි ඔක්කෝම එකට එකතු වෙලා වැඩ කරන්න ඕනෑ.

හැබැයි, අද මොනවාද මෙතැනට ඇවිල්ලා කියන්නේ? අද මෙතැනට ඇවිල්ලා අමූලික අසත්‍ය ටිකක් කියනවා. දැන් කියනවා, ආණ්ඩුවෙන් දාලා තිබුණේ බෝට්ටු 3යි ලු. මේවා අසත්‍ය තොරතුරු නේ. ඒ බෝට්ටු ජාතික ජන බලවේගයෙන් දාපුවා නොවෙයි. අපට එහෙම අසනීපයක් ඇත්තේම නැහැ. එතුමා බෝට්ටුවක් දැම්මා ලු. එතුමාම ඒ බෝට්ටුවෙන් එන්න ඇති. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෝට්ටු 70 ගණනක් දාලා තිබුණා. සාමාන්‍ය මිනිස්සු, ව්‍යාපාරිකයෝ සහ මෙතැන ඉන්න විපක්ෂයේ සමහර කණ්ඩායම් ඒ බෝට්ටු ගෙනාවා. ආණ්ඩුවෙන් විතරක් බෝට්ටු 30කට වැඩි ප්‍රමාණයක් දැම්මා. සමහර විට එතුමා අතින් බින්දුව කැපෙන්න ඇති. අද මෙතැනට ඇවිල්ලා කියනවා, අර්ධ හානි තිබෙන්නේ 3,000යි කියලා. මොන බොරුද. මම අද ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් වාර්තාව ගත්තා. දැනට තිබෙන තොරතුරු අනුව අර්ධ හානි 17,052ක් තිබෙනවා. පූර්ණ හානි 130ක් වෙලා තිබෙනවා. හැබැයි මෙතැනදී කිව්වේ, අර්ධ හානි තිබෙන්නේ 3,000ක් කියලා. **ගිහිල්ලා බලන්න.** මොකක්ද මේ දේශපාලනය?

මම ඒකයි කිව්වේ. මළ ගෙවල් ඇතුළේ බුරු ගහන්න බලාගෙන හිටිය සෙට් එකක් මේ. මේගොල්ලෝ හිතුවා, රට විනාශ වෙයි, ජනතාව සහ රජය එකට එකතු වෙලා නැඟිටින වැඩේ නොකර, ඒගොල්ලන්ගේ කාලයේ වාගේ දේශපාලනයට පරිවර්තනය වෙයි කියලා. අපි කාටවත් දවස් ගණනකින් මේ වැඩ කරන්න බැහැ. මොකද, අපි ප්‍රාතිහාර්ය කරන අය නොවෙයි. අපි කවුද? අපි සාමූහිකත්වය විශ්වාස කරන මිනිස්සු. අපි ජනතාවගේ බලය විශ්වාස කරන මිනිස්සු. අපට "පොර" වීමේ ගේම් නැහැ. අපට මානසික අමාරු නැහැ. අපි ඔක්කෝම එකට එකතු වෙලා මේ වැඩෙත් එක්ක පොර බදනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළොන්නාවේ ප්‍රාදේශීය ලේකම්තුමාගේ, ඒ වාගේම සහකාර ප්‍රාදේශීය ලේකම්තුමියගේ ගෙවල් සම්පූර්ණයෙන්ම ජලයෙන් යට වෙලා තිබුණේ. ඒ අය දවස් ගණනාවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තමයි හිටියේ. ඒ අය අපිත් එක්ක එකට එකතු වෙලා වැඩ කළා. කොළොන්නාවේ විතරක් ග්‍රාම නිලධාරි වසම්වල නිලධාරින් 120කට වඩා ආපදාවට පත් වෙලා හිටියා. ඒගොල්ලෝ කිසිවක් ගණන් නොගෙන වැඩ කළා. ලංකාවේම එහෙමයි. ඒක නිසා තමයි දවස් ගණනකින්, සති ගණනකින් මෙම ක්‍රියාවලිය අවසන් වෙන්නේ.

කුණු ඉවත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳවත් කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්න විධියට, අපට තිබෙන තොරතුරු අනුව කොළොන්නාවේ කුණු ටොන් 15,000කට හෝ 20,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. අපි මොකද කළේ? දින 14ක් පුරා අඛණ්ඩව වැඩ කරනවා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු ඒක දන්නවා. විපක්ෂයේ සමහර පක්ෂවල අය අපට හම්බ වනවා. ඒ අයත් වැඩ කරනවා. ඒක හොඳයි. ඒවාට මඩ ගහනවා අපි දැක්කේ නැහැ. ඒ මන්ත්‍රීවරු ගිහිල්ලා වැඩ කරද්දී අපටත් පාරෙදි හමු වෙනවා. සහෝදරයා කියනවා, ඇමතිතුමා කියනවා, වැඩ කරනවා. ඒක මරු. මේ වාගේ මඩ ගහන වැඩ කරන්නේ නැහැ. හැබැයි, මොකද වෙලා තිබෙන්නේ? අද ගත්තොත්, සියයට 82කට වඩා වැඩි ප්‍රමාණයක කුණු ඉවත් කර අවසන්. ලබන ඉරිදා වාගේ වෙද්දී ආපදාවට පත් වෙච්ච මුළු ප්‍රමාණයම අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒක අපේ ප්‍රාතිහාර්යයක් නොවෙයි. ඒක මේ ස්වේච්ඡා සංවිධාන ඇතුළු සියලු දෙනා එක්ව කරපු දෙයක්. ඒ විතරක් නොවෙයි. ඒ දින 14ක කාලය ගත්තත්, මේ වෙද්දීත් වාහන 100කට වඩා වැඩ කරනවා. ඒවා ප්‍රාදේශීය සභාවෙන් ගත්ත වාහන විතරක් නොවෙයි. කොළඹ මහ නගර සභාව, වටේ තිබෙන නගර සභා, මහ නගර සභා ඇතුළු සියලු දෙනා ඇවිල්ලා උදවු කරනවා, මේ ප්‍රශ්නයට මැදිහත් වෙනවා. මම නම කිව්වේ නැතත්, මේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් යටතේ ඉන්න **නගර සභා** මන්ත්‍රීවරුනුත් ඇවිල්ලා මෙතැන කුණු අදිනවා, මම දන්නවා. නියමයි. ඒක තමයි වෙන්න ඕනෑ. කොළොන්නාවේ, ඔරුගොඩවත්තේ සිට අඹතලේට යද්දී, ඒ වාගේම දෙමටගොඩ සිට ඔරලෝසු කණුව ළඟට එද්දී, ඒ වාගේම පරණ පාරේ යද්දී එහි කුණු නැහැ කියන එක අද කාටත් දකින්න පුළුවන්. ඒවා එකතු කරගෙන ගිහින් තිබෙන්නේ. වෙන්නවත්ත ගත්තත්; කුරුණියාවත්ත ගත්තත්; කිත්තම්පහුව ගත්තත්; මෙගොඩ කොළොන්නාව ගත්තත්, ඒ ප්‍රදේශ ගාසා තීරය වාගෙයි තිබුණේ. මේ මිනිස්සු - සාමාන්‍ය ජනතාව ඇතුළු සියලු දෙනා - එකතු වෙලා ඒ ක්‍රියාවලිය අද අවසන් කරමින් තිබෙනවා.

අඩුම තරමින් ඒක අගයන්නේ නැහැ. අපි කියන්නේ ආණ්ඩුවට credit එක දෙන්න කියා නොවෙයි. ඒ ස්ථානවල වැඩ කරන මිනිස්සු, නිලධාරින් ඉන්නවා. වෙන මොකක් හෝ තිබෙන මානසිකත්වයක් මත පදනම්ව ඇවිල්ලා තොරතුරු කියනවා. ඒක වැරදියි. අපි මේ සූදානම් වන්නේ වෙන මොකකටවත් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි සූදානම් වන්නේ මේ ජනතාව පියවරෙන් පියවර ගොඩනහන්නයි. ඒක නිසා තමයි නිවාස පිරිසිදු කිරීම සඳහා රුපියල් 25,000ක මුදලක් ආණ්ඩුවෙන් ලබා දෙන්නේ. ඒ ලබා දෙන්නේ අපේ මුදල් නොවෙයි. පසුගිය අවුරුද්ද තුළ දූෂණය, වංචාව නැතිව, නාස්ති කරන්නේ නැතිව එකතු කරගත් මහජනතාවගේ මුදල්. ඒ මුදල් තමයි අපි විධිමත්ව මේ ජනතාවට ලබා දෙන්නේ. එසේ ජනතාවට මුදල් ලබා දීමේදී වෙනදා වාගේ අපට ගිහින් මීඩියා ෂෝ දාලා බෙදන්න බැහැ. නිලධාරින් ගිහින් ඒවා ගැන යම් තක්සේරුවක් කරන්න ඕනෑ, තොරතුරු ටික ගන්න ඕනෑ. සමහර නිලධාරිනුත් මේ තුළ අපහසුතාවට පත්වෙලා තිබෙනවා. මම දන්නවා, ඒ නිලධාරින් කොළොන්නාවේ විතරක් ගෙවල් 55,000කට යන්න ඕනෑ. එහෙම යන්න අමාරුකමක් තිබෙන නිසා, මීට පෙර ගරු අග්‍රාමාත්‍යතුමියත් මැදිහත් වෙලා ඒකට අතිරේක නිලධාරින් ප්‍රමාණයකුත් යොදවා දැන් ඒ කටයුත්ත සිදු වෙමින් තිබෙනවා. ලබන සිකුරාදා වාගේ වෙද්දී මේ රුපියල් 25,000ක මුදල ලබා දීමේ ක්‍රියාවලිය අවසන් කරන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

ඒ විතරක් නොවෙයි. අපි දැන් යම් සැලසුමක ඉන්නවා. විශේෂයෙන්ම මේ ආපදාව ඇති වෙන්න පෙර අපේ ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් කොළොන්නාවේ ගංවතුර පාලනයත්, කැලණි ගං මිටියාවතේ ගංවතුර පාලනයත් පිළිබඳව කමිටුවක් පත් කර යම් තීන්දු තීරණ ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ඒ අනුව ක්‍රමානුකූලව මේ ජනතාව නඟාසිටුවන්නයි අපි සූදානම් වෙන්නේ. ඒ සඳහා මැදිහත් වීමක් කරන අතරම කැලණි ගඟ පිටාර ගැලීමෙන් ඇතිවන ගංවතුර පාලනය කරමින් ජනතාව ඉන් මුදවාගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ විතරක් නොවෙයි. කොළොන්නාව ප්‍රදේශයට දැනට විධිමත් සැලැස්මක් හදලා තිබෙනවා. ඒක අපි හදපු එකක් නොවෙයි. ඒ පිළිබඳ විෂය දැනුම තිබෙන පිරිස විසින් දැන් හඳුනාගෙන 5,000කට වඩා වැඩි ප්‍රමාණයක් resettlement එකක් සඳහා දැන් යෝජනා වෙලා තිබෙනවා. ඒ නිසා මේ මතු වුණු ආපදා තත්ත්වයත් පාවිච්චි කරගෙන, ඒ ලබපු අත්දැකීම් පාවිච්චි කරගෙන ජනතාවට සුවපහසු ජීවිතයක් අත්පත් කර දීම වෙනුවෙන්, අනවසර ඉදිකිරීම් සියල්ල ඉවත් කර, ජනතාව නඟාසිටුවීමේ බලාපොරොත්තුව සහිතව තමයි අපි වැඩ කරන්නේ. අපි මිනිස්සු විශ්වාස කරනවා. අපට විශ්වාසයක් තිබෙනවා, මේක කළ හැකි දෙයක් කියලා. ඒ වෙනුවෙන් අවංකව වැඩ කරන විපක්ෂයේ මන්ත්‍රීවරුන් එක්ක අත්වැල් බැඳගෙන වැඩ කරන්න අපි සූදානම් කියමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.13]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

அண்மையில் ஏற்பட்ட பேரிடரால் மனித வளம் மட்டுமல்லாமல், பௌதிக வளமும் கூடுதலாகப் பாதிக்கப்பட்டு இருக்கின்றது. இந்த அனர்த்தத்தால் கூடுதலாகப் பாதிக்கப் பட்டு இருக்கின்ற மலையக மக்களுக்கு நிவாரணங்களையும் இழப்பீடுகளையும் தகுந்த முறையில் கொடுக்கவேண்டிய கடமையும் பொறுப்பும் இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. அதேபோல், அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற பண்ணையாளர்கள், மீனவர்கள் மற்றும் அன்றாடம் கூலிவேலை செய்கின்றவர்கள் இந்த அனர்த்த நிலைமை காரணமாக மிகவும் பாதிப்புக்குள்ளாகி இருக்கின்றார்கள். குறிப்பாக, மீனவர்கள் தொழிலுக்குச் செல்ல முடியாமல் ஒரு மாத காலமாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். அதேபோல், பண்ணையாளர்களும் தங்களது கால்நடைகளை இழந்திருக் கிறார்கள். அவர்கள் ஆடு, மாடு, கோழி போன்றவற்றை இழந்தது மட்டுமல்லாமல், பால் உற்பத்தியையும் இழந்திருக் கிறார்கள். இதனால் அவர்கள் மிகவும் பாதிக்கப் பட்டவர்களாகக் காணப்படுகின்றார்கள். உண்மையிலேயே அவர்கள் தங்களது தொழிலை இழந்திருக்கிறார்கள். அவர்கள் மிகவும் வறுமைக் கோட்டுக்குள் இருக்கின்றவர்கள்.

அம்பாறை மாவட்டத்தில் வட்டமடு, ஆலையடிவேம்பு, திருக்கோவில், பொத்துவில், அட்டாளைச்சேனை, நாவிதன்வெளி போன்ற பிரதேசங்களில் இருக்கின்ற கால்நடை வளர்ப்பாளர்கள் மிகவும் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். குறிப்பாக, அவர்களது பால் உற்பத்தித் தொழில் மிகவும் பாதிக்கப்பட்டு இருக்கின்றது. அனர்த்தத்தால் பாதிக்கப் பட்டவர்களுக்கு நீங்கள் 25,000 ரூபாய் உட்பட இன்னும் பல நிவாரணங்களைக் கொடுக்கின்றீர்கள். எனினும், இவர்களுக்கு எந்தவித நிவாரண உதவித் திட்டங்களும் கிடைக்கவில்லை. வீடுகளுக்குள் வெள்ள நீர் புகுந்ததால் பாதிக்கப்பட்டவர் களுக்கு எவ்வாறு நிவாரணமும் இழப்பீடும் கொடுக்கப் படுகின்றதோ, அதேபோல இவர்களுக்கும் நிவாரணத் தொகை பன்மடங்காக கொடுக்கப்பட வேண்டும். ஏனெனில், இவர்கள் மிகவும் வலுவிழந்து இருக்கிறார்கள். இவர்களது ஆடு, மாடு உட்பட கால்நடைகள் அழிந்திருக்கின்றன. அன்றாடம் கூலித்தொழில் செய்கின்றவர்கள் மிகவும் அவதியான, துன்ப கரமான ஒரு சூழ்நிலைக்குள் தள்ளப்பட்டு இருக்கிறார்கள். அவர்கள் யாரிடம் உதவி கேட்பதெனத் தெரியாது அலைந்து திரிகின்றார்கள்.

அம்பாறை மாவட்டத்தின் பல பகுதிகளிலும் வீடுகளுக்குள் வெள்ளநீர் புகுந்திருக்கிறது. எனினும், அவர்களுக்கு நிவாரணம் வழங்கப்படவில்லை. அவர்கள் நிவாரணம் கேட்கும்போது, "அந்த நேரத்தில் எடுக்கப்பட்ட photo இருக்கிறதா? வெள்ளம் வந்ததற்கான அத்தாட்சி என்ன இருக்கின்றது?" என அதிகாரிகள் கேட்கின்றார்கள். இது எவ்வளவு பாதகமான செயலாக இருக்கின்றது. அனர்த்தத்தால் பாதிக்கப்பட்ட ஒரு பகுதியினருக்கு 25,000 ரூபாய் கொடுக்கப்படுகின்ற அதேநேரம், இன்னொரு பகுதி யினருக்குக் கொடுக்கப்படாமல் இருக்கின்றது. இதனால் அவர்களுடைய மனநிலை பாதிக்கப்படுகின்றது. எனவே, பாதிக்கப்பட்ட அனைவருக்கும் இந்த நிவாரணக் கொடுப்பவை வழங்க வேண்டும்.

விசேடமாக, அம்பாறை மாவட்டத்திலிருக்கின்ற திருக்கோவில், காரைதீவு, பொத்துவில் போன்ற பிரதேசங் களில் மிகவும் கூடுதலாக மண்ணரிப்பு ஏற்படுகின்றது. அனர்த்தத்தால் மட்டுமல்லாமல், மண்ணரிப்பு காரணமாகவும் திருக்கோவில் பிரதேசத்தில் காணப்படுகின்ற மிகப் புராதன ஆலயமான திருக்கோவில் ஆலயமும் சிவன்கோவில் ஆலயமும் அழிவடைந்து போகின்றன. ஆயிரம் வருடங் களுக்கு முற்பட்ட, மிகப் புராதனமான ஆலயங்களைப் பாதுகாப்பதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டும். விசேடமாக, திருக்கோவிலில் இருக்கின்ற இந்த ஆலயத்துக்கு மண் அணை போட வேண்டும்; தம்பிலுவில் சிவன்கோவில் அமைந்திருக்கின்ற இடத்தில் கற்களைப் போட்டு மண்ணரிப்பைத் தடுக்க வேண்டும். இதனை கௌரவ அமைச்சர் அவர்கள் கட்டாயமாகச் செய்ய வேண்டும். அத்தோடு வீடுகள், வீதிகள், தோட்டங்கள், விவசாய நிலங்கள் என அதிகளவான இழப்புகள் மண்ணரிப்பால் ஏற்பட்டிருக் கின்றன. அவற்றுக்கான நிவாரண உதவித் திட்டங்களையும் நீங்கள் மேற்கொள்ள வேண்டும். அதேபோன்று, காரைதீவிலும் இதே நிலைமை காணப்படுகின்றது. இதனடிப் படையில், அரசு இதற்கான விடயங்களை முன்னெடுக்க வேண்டுமெனக் கேட்டு எனது உரையை முடிக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.17]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වුණු ආපදාවත් සමඟ අපේ රටේ ජනතාව ලක්ෂ ගාණකට හානි සිදු වුණා, ඔවුන්ගේ ජන ජීවිතය අස්ථාවර වුණා. රටේ සිදු වුණු මේ ආපදාව නිසා ප්‍රධාන වශයෙන් ජන ජීවිතයට අවශ්‍ය මූලික පහසුකම් වුණු ජලය, විදුලිය, මං මාවත් සියල්ල අවහිර වුණා, බිඳ වැටුණා, හානියට පත් වුණා.

ජල සම්පාදන කටයුතු ගත්තාම, දිස්ත්‍රික්ක 25න් ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික්ක 22ක්, 23ක් සම්පූර්ණ හානියට පත් වුණා, ජල සැපයුම් බිඳ වැටුණා. ජනතාව ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු ජල ව්‍යාපෘති, ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ තිබෙන ජල ව්‍යාපෘති, ප්‍රාදේශීය සභා සහ නගර සභා යටතේ තිබෙන ජල ව්‍යාපෘතිවලින් සහ තවත් බහුතරයක් ජනතාව තමන්ගේ ගෙදර තිබෙන ළිඳෙන් හෝ වෙනත් මූලාශ්‍රයකින් තමන්ගේ ජල අවශ්‍යතාව සම්පූර්ණ කර ගන්නවා. ඒ මූලාශ්‍ර සියල්ල එක්කෝ අපිරිසිදු වුණා, නැත්නම් බිඳ වැටුණා, නැත්නම් ගං වතුරට යට වුණා. මේ නිසා අපේ රටේ පානීය ජල සැපයුම සම්පූර්ණ වශයෙන් අඩාළ වුණා.

ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩයෙන් රට පුරා ජලය පිරිපහදු කරන මධ්‍යස්ථාන 342ක් ක්‍රියාත්මක වෙනවා. ඒ 342න් මොනයම්ම ආකාරයකින් හරි ජල පිරිපහදු මධ්‍යස්ථාන 156කට හානි සිද්ධ වුණා. පොම්පාගාරවලට ජලය ගැලුවා, පොම්ප සවුත්තු වුණා, නළ පද්ධති බිඳ වැටුණා, කැඩුණා, නාය ගිය තැන්වලට අහු වුණා. එහෙම නැත්නම් ඒවාට සපයන විදුලි බලය බිඳ වැටුණා. ජල පිරිපහදු මධ්‍යස්ථානවලට යන්න තිබුණු පාරවල් නාය ගිහින්, ඒ පාරවල යන්න බැරි වුණා. මේ විධියේ විවිධ හේතු නිසා ජල පිරිපහදු මධ්‍යස්ථාන 342න් 156ක් දැවැන්ත විධියට බිඳ වැටුණා. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් විතරක් වතුර සපයන නිවාස, පරිශ්‍ර 480,000කට දවස් 2ක් ඇතුළත ජල සැපයුම් නැතිව ගියා. ප්‍රධාන ප්‍රශ්නයක් විධියට ආපදාවට ලක් වුණු ජනතාවට පානීය ජලය සහ තමන්ගේ අවශ්‍යතා සඳහා ජලය නැති ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වුණා. ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ ප්‍රධාන වශයෙන් ග්‍රාමීය ජල ව්‍යාපෘති 3,800ක් ක්‍රියාත්මක වෙනවා. ඒ 3,800න් 622ක් කුමන හෝ ආකාරයකින් බිඳ වැටුණා. ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ග්‍රාමීය ජල ව්‍යාපෘති 622න් පවුල් 135,000කට ජලය සපයමින් තිබුණා. එතැනත් පවුල් 135,000ක් ආපදාවලට ලක් වුණා. ඔවුන්ගේ ජල සැපයුම බිඳ වැටුණා.

මේ ආයතන දෙකෙන් ජල සම්පාදනය කර ගත්ත පවුල්, එහෙම නැත්නම් පරිශ්‍ර දළ වශයෙන් සම්බන්ධතා ලක්ෂ 6කට ජල සම්පාදනය නැතිව ගියා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ, තමන් ජල සම්පාදනය කර ගත්ත ළිංවලට, වෙනත් මූලාශ්‍රවලට මඩ මිශ්‍ර වුණා, ගංවතුර ගැලුවා, යට වුණා, බිඳ වැටුණා. එහෙම ආපදාවට ලක් වුණා. නමුත් ආපදාව සිද්ධ වෙච්ච දිනයේ ඉඳලා දවස් 5-7 අතර කාලයක් ඇතුළත ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයටත්, ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවටත් ඒ ජල සැපයුම් නැවත ස්ථාවර කරන්න පුළුවන්කම ලැබුණා. සමහර ඒවා හදන්න බැහැ. සමහර ඒවා හදන්න හිතන්නවත් බැහැ. නාය ගිහින් නළ පද්ධතිය සම්පූර්ණයෙන් ගළවාගෙන ගිහින්. වතුර ගලලා පොම්ප සවුත්තු වෙලා, පිච්චිලා. ඒ පොම්පවලට විදුලිය සපයන panels පිච්චිලා, ඒ ප්‍රදේශවලට යන්න බැහැ. එහෙම තිබියදී දවස් 5-7 අතර කාලයේදී ඒ ජල සැපයුම නැවත ස්ථාවර කරන්න ජාතික ජල සම්පාදන මණ්ඩලයටත්, ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවටත් පුළුවන් වුණා. මේක මහ දැවැන්ත වැඩක්. මෙච්චර ආපදාවක් සිද්ධ වෙලා කෙටි කාලයක් ඇතුළත ජලසම්පාදන කටයුතු නැවත ස්ථාවර කරන්න ලැබීම ගැන අපි ඇත්තටම සතුටු වනවා. ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙච්ච ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේත්, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේත් නිලධාරින්ට, සේවකයින්ට, විශේෂයෙන්ම තාක්ෂණ නිලධාරින්ට අපේ ස්තුතිය පුද කරන්න කැමැතියි.

ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සිදු වෙච්ච හානිය දළ වශයෙන් ගණන් බලා තිබෙනවා. ඒ අනුව, මේ ආපදාව නිසා දැනට රුපියල් බිලියන 5කට අධික -රුපියල් මිලියන 5,600කට ආසන්න- හානියක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ තිබෙන ජල ව්‍යාපෘතිවලට වෙච්ච හානිය දළ වශයෙන් රුපියල් මිලියන 600ක් පමණ වනවා. ප්‍රාදේශීය සභා ඇතුළු පළාත් පාලන ආයතනවලින් ජලය සපයන ව්‍යාපෘතිවලට වෙච්ච හානිය තවම අපට වාර්තා වෙලා නැහැ. මම හිතනවා, මෙවැනිම හානියක් ඒවාටත් වෙලා ඇති කියලා. මේ ජල සැපයුම නැවත ස්ථාපනය කරන්න මේ ආයතනවල නිලධාරින්, සේවකයින් ලොකු වෙහෙසක් ගත්තා.

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ - National Water Supply and Drainage Board එකේ - සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ සේවක මහත්වරුන් සාමාන්‍යයෙන් වැඩ කරන්නේ එක දිස්ත්‍රික්කයක. නමුත්, ආපදාවෙන් විනාශ වූ මේ ජලසම්පාදන කටයුතු නැවත ස්ථාවර කරන්න, ස්ථාපිත කරන්න වෙනත් දිස්ත්‍රික්කයකට යන්න ඔවුන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වුණා. අපි දන්නවා, මධ්‍යම පළාතේ මහනුවර, නුවරඑළිය දිස්ත්‍රික්කවලත්, ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේත් සිදු වූ ඒ බිඳ වැටීම් ප්‍රමාණය අධික බව. එම දිස්ත්‍රික්කවල ජලසම්පාදන අංශවල දැවැන්ත බිඳවැටීම් සිද්ධ වුණා. කෑගල්ල දිස්ත්‍රික්කයේත් ජලසම්පාදන අංශවල දැවැන්ත බිඳවැටීම් සිද්ධ වුණා. ඒවා නැවත ස්ථාපිත කරන්න ලොකු වෙහෙසක් දරන්නත් සිද්ධ වුණා. ඒ නිසා විශ්‍රාම ගිය සමහර නිලධාරින් පවා මේ කටයුතුවලට ඉදිරිපත් වුණා. ඔවුන් ඒ ප්‍රදේශවලට ගිහිල්ලා දිවා රෑ නොබලා වැඩ කළා. සමහර වෙලාවට ඔවුන්ට ඉන්න තැනක්වත් ලැබුණේ නැහැ. සමහර වෙලාවට මේ කටයුතු කරන්න, ඒ නළ එළන්න යන්න වුණේ, ඒ පොම්පාගාර තිබෙන තැන්වලට යන්න තිබුණේ අනාරක්ෂිත තැන්වලින්. ඒ සමහර තැන්වලට ගියේ බෝට්ටු මඟින්, සමහර තැන්වලට ගියේ පීනලා. ඒ වාගේම ඒ සමහර තැන්වල වැඩ කරන එකත් අනාරක්ෂිතයි. ඒ සියල්ල නොසලකා මේ අවස්ථාවේදී ඔවුන් දැවැන්ත කැප කිරීමක් කළා, වැඩ කොටසක් කළා. ඒකට අපේ ත්‍රිවිධ හමුදා සාමාජිකයිනුත් එකතු වුණා, උදවු කළා. මේ කටයුතුවලදී Master Divers වාගේ ආයතනවලින් diversලාත් ආවා. ඒ වාගේම මේ සමහර පොම්ප නැවත හදන්න Sri Lanka Railway Department එකේ වාගේම Colombo Dockyard එකේ සමහර නිලධාරින් උදවු කළා, සේවකයින් උදවු කළා, ස්වේච්ඡා සංවිධාන උදවු කළා, තරුණ කණ්ඩායම් උදවු කළා, ප්‍රදේශවාසීන් උදවු කළා. ඒ වාගේම ඒ ප්‍රදේශවල විදුලි සැපයුම නැවත ස්ථාපිත කරන්න ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින් උදවු කළා, මහන්සි වුණා. ඒ නිසා අපට දවස් 5ක්, 7ක් යන්න ඉස්සෙල්ලා ජල සැපයුම ස්ථාවර කරන්න පුළුවන් වුණා.

ඒ වාගේම ජල සම්පත් මණ්ඩලයේ සේවකයින්, මහවැලි අධිකාරියේ සේවකයින්, ගොවි සංවිධානවල හා ප්‍රාදේශීය සභාවල කණ්ඩායම් එම ප්‍රදේශවල තිබෙන ළිං පිරිසිදු කර ගන්න උදවු කළා. පොම්ප අරගෙන ඒ ළිංවලට බැහැලා, වතුර ඉහලා, ළිං සුද්ධ කරලා, දවස් කිහිපයක් යන්න කලින් ළිං වැනි මූලාශ්‍රවලින් ලබා ගන්නා ජල සැපයුම නැවත ස්ථාපිත කරන්න ඔවුන් කටයුතු කළා. ඒක දැවැන්ත වැඩක්. ඒ නිසා අපි සතුටු වනවා, ආපදාවෙන් දවස් 5ක්, 7ක් යන්න කලින් අඩුම තරමින් තාවකාලිකව හෝ මේ ජල සැපයුම ස්ථාවර කරන්න, ඒ නිලධාරින්, ඒ ආයතන, ඒ සේවකයෝ, ස්වේච්ඡා කණ්ඩායම් හා ත්‍රිවිධ හමුදාව කටයුතු කරලා තිබෙන එක ගැන. ඒක දැවැන්ත කැප කිරීමක්. ඒ නිසා තමයි අපට පුළුවන් වුණේ, සතියක් යන්න කලින්, ජලය, විදුලිය වාගේම පාරවල් නැවත හදලා එම ප්‍රදේශවල ජන ජීවිත ස්ථාවර කරන්න.

අපට මහනුවර සහ පේරාදෙණිය වැනි රෝහල්වලට ජල සැපයුම කරන්න සිද්ධ වුණේ බවුසර්වලින්. මේ දවස් 5, 7 යනකොට සමහර බවුසර් ගමන් වාර 2,500ක් විතර ගිහිල්ලා තිබෙනවා කියලා තමයි තොරතුරු වාර්තා කරලා තිබෙන්නේ. ඒ විධියට බවුසර් දාලා, කිහිප විටක් ඒ තැන්වලට අපි වතුර යැව්වා. Hospitalsවල කටයුතු අඩාළ නොවන්න අපි ඒ විධියට ඒ තැන්වලට ජලය සැපයුවා. බවුසර් ගමන් වාර 2,500කින් විතර වතුර සපයලා ඒක කරන්න අපට පුළුවන් වුණා. ඒ සඳහා කැපවූ, දායක වූ හැමදෙනාටම මේ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විධියට මේ වෙලාවේ මම ස්තුතිවන්ත වනවා.

ඒ වාගේම මම විශේෂයෙන්ම කියන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. මේ සඳහා විවිධ පාර්ශ්ව දායක වුණු ආකාරය අපේ මන්ත්‍රීවරුන් හා ඇමතිවරුන් කිහිප දෙනෙකුත් මතක් කළා. මේ ආපදාවෙන් නැවත ගොඩ එන්න, ජන ජීවිත ස්ථාවර කරන්න හැමෝම දායක වුණු ආකාරය එතුමන්ලා කිව්වා. අපි දන්නවා, මේ ආපදා අවස්ථාවේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ බන්ධනාගාරය යට වුණු බව. බෝට්ටු යොදාගෙන බන්ධනාගාර රැඳවියන් සිය ගණනක් ඉවතට ගන්න සිද්ධ වුණා. ඊට යාබදව තිබෙන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ බොහෝ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා එතැනින් ඉවතට ගන්න සිද්ධ වුණේත් බෝට්ටු යොදාගෙනයි. මල්වතු ඔය ආශ්‍රිතව තිබුණු නිවාසවල වහල මත සමහරුන් රැඳී

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

හිටියා. ඒ වාගේම සමහරුන් ආපදාවෙන් දිවි රැක ගත්තේ ගහක එල්ලිලා. ඒ නිසා අනුරාධපුර දිස්ත්‍රික්කයට බෝට්ටු විශාල සංඛ්‍යාවක් යොදවන්න සිද්ධ වුණා. අවශ්‍ය තරමට බෝට්ටු නැති නිසා, මුතූර්වල ධීවර කර්මාන්තයේ යෙදෙන සහෝදරවරුන් ඔවුන්ගේ බෝට්ටු අරගෙන ඒ ප්‍රදේශවලට ආවා. ඒ අය මුස්ලිම් ජාතිකයින්. ඒ අයට ජාති භේදයක් තිබුණේ නැහැ, ඒ අය ඇවිල්ලා අපට උදවු කළා. අපි විපක්ෂයේ ඉන්න කොට අපට රතු තරුව සහන සේවා බලකාය තිබුණා තමයි. නමුත් අපි දැන් රජයක් විධියට, රාජ්‍ය යන්ත්‍රණය පාවිච්චි කරමින්, ඇමතිවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, අපේ ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, අපේ සංවිධායකවරුන් යන සියලුදෙනාට ජනතාව එක්ක එකතු වෙලා මේ සඳහා එකාවන්ව උදවු කරන්න පුළුවන් වුණා; නොයෙක් අයුරින් මේ කර්තව්‍යයට කරගහන්න සිද්ධ වුණා. ඒ සම්බන්ධයෙන් අපි සතුටු වනවා. ඒ වාගේ, මේ කටයුතු ස්ථාවර කරගන්න අපටත් යම් යම් කැප කිරීම් කරන්න සිද්ධ වුණා.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, මේ ආපදාවේදී කටයුතු කරපු ආකාරය බැලුවොත්, එකමුතුකම, කැපකිරීම, අනෙකා වෙනුවෙන් දායකත්වය සැපයීම වැනි ආදර්ශ බොහොමයක් අපි දීලා තිබෙන බව. ඒ වාගේම මේ අවස්ථාවේදී දේශපාලන සංස්කෘතියත් අපි වෙනස් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් ආපදාවකදීත් කරන්නේ දේශපාලනය. සමහරු බඩු මල්ලක් අරගෙන යනවා, මාධ්‍ය අරගෙන යනවා, බඩු මල්ල දෙනවා, photo එකක් ගහනවා, voice-cut එකක් දෙනවා. ඒ දේශපාලනය ඉවරයි. අපේ මන්ත්‍රීවරුන් එකාවන්ව වැඩ කරලා ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කර තිබෙනවා. ඒ නිසා ඒ ආදර්ශයත් මේකෙන් පෙන්වා තිබෙනවා. ආපදාවෙන් සතියක් යන්න කලින් මූලික සැපයුම් ස්ථාවර කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා, කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වැඩසටහන් ඔස්සේ මේ දේවල් තිබුණු මට්ටමටත් එහා ගිහිල්ලා සංවර්ධනය කරන්න. ඒ සඳහා අපට සැලැස්මක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි ඉදිරියේදී සාකච්ඡා කරමු.

මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සුජීව දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SUJEEWA DISSANAYAKE left the Chair, and THE HON. UPUL KITHSIRI took the Chair.*

[பி.ப. 4.29]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அண்மையில் எமது நாட்டில் ஏற்பட்ட சூறாவளி மற்றும் வெள்ள அனர்த்தத்தால் 643 பேர் மரணமடைந்து இருப்பதோடு, 183 பேர் காணாமல்போயும் உள்ளனர். எத்தனை பேர் மரணித்திருக்கிறார்கள் என்ற கணக்கெடுப்பை நாங்கள் ஒவ்வொரு நாளும் எடுக்கவேண்டிய தேவை காணப்படுகின்றது. அதேபோல், இந்த நாட்டில் முற்றாகவும் பகுதியளவிலும் ஏறத்தாழ 6,228 வீடுகள் அழிவடைந்து இருக்கின்றன. இந்த அனர்த்தத்தால் கண்டி மாவட்டத்திலே அதிகமான பாதிப்பு ஏற்பட்டிருக்கிறது. கம்பளை, கெலிஓயா, கலுகமுவ, எலமல்தெனிய, அக்குறணை போன்ற பிரதேசங்களிலுள்ள மக்கள் பாதிப்படைந்தபோது, எங்களுடைய ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவரும் கண்டி மாவட்டப் பாராளுமன்ற உறுப்பினருமான கௌரவ ரஊப் ஹகீம் அவர்களுடைய வேண்டுகோளுக்கு இணங்க, கிழக்கு மாகாணத்திலிருந்து ஏறத்தாழ 500 பேர் உதவிசெய்ய வந்தார்கள். அவர்களில் அக்கரைப்பற்றின் மேயரும் முன்னாள் உள்ளூராட்சி மற்றும் மாகாண சபைகள் அமைச்சருமான கௌரவ அதாஉல்லா, காத்தான்குடி நகர சபையின் தலைவர் அஸ்வர், கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஹிஸ்புல்லாஹ், ஏறாவூர் நகர சபையின் தலைவரும் முன்னாள் பாராளுமன்ற உறுப்பினருமான சாலி நழீம், அட்டாளைச்சேனைப் பிரதேச சபையின் தவிசாளர் உவைஸ், முன்னாள் பாராளுமன்ற உறுப்பினரும் பொத்துவில் பிரதேச சபையின் தவிசாளருமான முஷாரப், இறக்காமம் பிரதேச சபையின் தவிசாளர் முஷ்பி ஆகியோரும் அடங்குவர். அவர்கள் வரும்போது, அக்கரைப்பற்று மாநகர சபையின் வாகனங்களையும் எடுத்து வந்திருந்தார்கள். அதன்மூலம் பாதிக்கப்பட்ட பிரதேங் களிலுள்ள மக்களுடைய அடிப்படைத் தேவைகளைப் பூர்த்திசெய்வதற்குரிய வாய்ப்பு எங்களுக்குக் கிடைத்தது.

உண்மையிலே அந்த மக்கள் மிகவும் பாதிக்கப்பட்டு இருந்தார்கள். அவர்களுக்கு அரசாங்கம் உதவிகளைச் செய்கின்ற அதேநேரம், நாங்களும் அவசர அவசரமாக வாகனங்களோடும் மக்கள் சக்தியோடும் சென்று உதவி செய்தோம். உண்மையிலேயே நமது நாட்டு மக்கள் சந்தோஷமடைய வேண்டும். ஏனெனில், ஓர் அனர்த்தம் ஏற்பட்டபோது, சாதி, மத பேதம் இல்லாமலும் அரசியல் ரீதியில் கட்சி பேதம் இல்லாமலும், எல்லோரும் ஒற்றுமைப்பட்டு, இந்த நாட்டை அழிவிலிருந்து மீட்டு கட்டியெழுப்புவதற்கும் பாதிக்கப்பட்டவர்களைக் காப்பாற்று வதற்குமாக நாங்கள் பணி செய்திருக்கிறோம். இதனை நினைக்கும்போது மிகவும் மகிழ்ச்சியாக இருக்கின்றது. அதற்காக எல்லோருக்கும் நன்றி சொல்ல விரும்புகின்றேன்.

அதேபோன்று, கிழக்கு மாகாண ஆளுநர் அவர்கள் அந்தப் பிரதேசத்திலுள்ள உள்ளூராட்சிச் சபைகளின் வாகனங்களைக் கொண்டுவருவதற்கு உதவி செய்தார். அவருக்கும் இந்தச் சந்தர்ப்பத்தில் நன்றி சொல்லக் கடமைப்பட்டு இருக்கின்றேன். நாங்கள் சென்று பார்த்தபோது, உண்மையிலேயே அங்குள்ள மக்கள் மிகவும் பாதிக்கப்பட்டு இருந்ததைக் கண்டோம். தேசிய அனர்த்த முகாமைத்துவக் குழுவின் கூட்டம் மூன்று தினங்களுக்கு முன்னர் மாண்புமிகு சனாதிபதி அவர்களின் தலைமையில் நடைபெற்றபொழுது, நாங்கள் இந்த விடத்தை முன்வைத்தோம்.

மத்திய மாகாணத்திலுள்ள நுவரெலியா போன்ற மலைநாட்டுப் பிரதேசங்களில் இருக்கின்ற மக்கள் பாதுகாப்பாக வாழக்கூடிய நிலைமையை ஏற்படுத்துவதற்குரிய திட்டங்களை நாங்கள் வகுக்க வேண்டும். அதுதான் நாங்கள் அந்த மக்களுக்குச் செய்யக்கூடிய பெரிய நன்மையாக இருக்கும். மலைகளுக்கு மேல் வீடுகள் கட்டப்பட்டுள்ளதால், அவர்களின் உயிர்களை எந்த அரசாங்கத்தாலும் பாதுகாக்க முடியாத நிலைமை காணப்படுகின்றது. எனவே, அவர்கள் பாதுகாப்பாக வாழ்வதற்கு ஏற்ற காணிகளை நிரந்தரமாக வழங்குவதற்குரிய திட்டங்களைச் செயற்படுத்த வேண்டுமென நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களிடம் வேண்டுகோள் விடுத்திருக்கிறோம்.

பாதிக்கப்பட்ட மக்களுக்கு வழங்கப்படுகின்ற 25,000 ரூபாய், 50,000 ரூபாய் கொடுப்பனவுகள் சில இடங்களிலுள்ள மக்களைச் சென்றடையவில்லை. நாங்கள் அந்த மக்களிடம் கேட்டபோது, தங்களுக்கு இதுவரை அந்தக் கொடுப்பனவுகள் கிடைக்கவில்லை எனச் சொன்னார்கள். இதனை நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களின் கவனத்துக்குக் கொண்டு வந்தோம். அதனடிப்படையில், ஒரு வார காலத்துக்குள் அவர்களுடைய கொடுப்பனவுகளை வழங்குமாறு சனாதிபதி அவர்கள் பணிப்புரை வழங்கி இருக்கிறார்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நாட்டில் சுனாமி அனர்த்தம் ஏற்பட்ட பின்னர், அது தொடர்பில் ஆராயவும் எதிர்காலத்தில் அவ்வாறானதொரு அனர்த்தம் ஏற்பட்டால் எவ்வாறு எதிர்கொள்வது என்பது தொடர்பில் திட்டமிடவும் விசேட குழுக்களை அமைத்து, வெளிநாடு களுக்குச் சென்று, இலட்சக்கணக்கான பணம் செலவழித்து ஓர் அறிக்கை தயாரிக்கப்பட்டது. எனினும், அதிலுள்ள விடயங்களை அமுல்படுத்தாத சூழ்நிலையே இருந்துகொண்டு இருக்கின்றது. அனர்த்தம் ஏற்படுகின்ற எந்தவொரு சந்தர்ப்பத்திலும், அதனைச் சந்திப்பதற்கு நாங்கள் தயாராக இருக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට විනාඩි 2ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

கிழக்கு மாகாணத்திலுள்ள மாவிலாறு அணைக்கட்டு உடைப்பெடுக்கும் ஒவ்வொரு முறையும் மூதூர் உட்பட திருகோணமலை மாவட்டத்திலுள்ள ஆயிரக்கணக்கான மக்கள் நஷ்டமடைகின்றார்கள்; பெரும் ஆபத்தை எதிர்கொள்கின் றார்கள்.

தற்பொழுது இச்சபையில் கௌரவ நீர்ப்பாசன அமைச்சர் அவர்கள் இல்லை. கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இருப்பாரென நினைக்கின்றேன். 2024ஆம் ஆண்டு அனர்த்தம் சம்பந்தமான கூட்டம் அம்பாறை மாவட்டக் கச்சேரியில் நடைபெற்றபொழுது, அதில் கௌரவ பிரதிப் பாதுகாப்பு அமைச்சர் அவர்கள் கலந்துகொண்டார். எங்களுடைய அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற சேனநாயக்க சமுத்திரத்தின் அணைக்கட்டானது உடைவதும், அதனை மீளக் கட்டுவதும், மீண்டும் உடைவதும் என்ற நிலையிலே இருக்கின்றது. அதற்காக நாங்கள் ஒவ்வொரு முறையும் மில்லியன் கணக்கில் காசு ஒதுக்குகிறோம். எனவே, அம்பாறை மாவட்டத்திலுள்ள சம்புக்கலப்பு - பெரியகலப்பு வடிச்சல் திட்டத்தையும் கல்முனை பிரதேசத்தில் இருக்கின்ற கரவாகுபற்று வடிச்சல் திட்டத்தையும் நீர்ப்பாசன அமைச்சு முன்னுரிமை அளித்துச் செய்தால் மேற்குறித்த நிலைமையைத் தவிர்க்கக் கூடியதாக இருக்கும். மேற்குறித்த நிலைமையால் அம்பாறை மாவட்டத்தில் ஏறத்தாழ 50,000 பேர் காணிகளை இழந்திருக்கிறார்கள்; தொடர்ச்சியாக வெள்ளம் வந்திருக்கிறது; மீனவர்கள் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். மீனவர்கள் மாதக் கணக்கில் கடலுக்குச் செல்ல முடியாமல் கஷ்டப்படுகிறார்கள். எனவே, சேனநாயக்க சமுத்திரத்தின் drainageஐச் சீர்செய்வதற்கு பெரியகலப்பு வடிச்சல் திட்டத்தையும் கல்முனை - கரவாகுபற்று வடிச்சல் திட்டத்தையும் அரசாங்கம் அனர்த்த முகாமைத்துவ அமைச்சின் ஊடாகவும் நீர்ப்பாசன அமைச்சின் ஊடாகவும் முன்னெடுக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
විනාඩි 5ක්, නේද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, විනාඩි 4යි. මොකද, අනෙක් මන්ත්‍රීවරු,-

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මට විනාඩි 6ක් තිබුණා. දැන් තිබෙන්නේ විනාඩි 4යි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හැමෝගේම වෙලාව අඩු වෙලා යනවා.

[අ.භා. 4.35]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දා මේ රටේ ඇති වෙච්ච දැඩි ව්‍යසනකාරී තත්ත්වය පිළිබඳව කරුණු ගණනාවක් ප්‍රකාශ කරන්න තිබුණත්, මට ලැබී තිබෙන කාල වේලාවත් එක්ක අත්‍යවශ්‍ය කරුණු කිහිපයක් ගැන විතරක් කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. මේ ආපදාව සිදු වෙච්ච මොහොතේදී ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා අවස්ථානුකූලව ප්‍රකාශ කළා අපට මතකයි, මේ රටේ ව්‍යසනයට පත් වෙච්ච ජනතාවට නොයෙකුත් ආකාරයේ සහන ලබා දෙනවා, හානියට පත් වුණු ගෙවල්වලට වාගේම ඉඩම් සම්බන්ධයෙනුත් මුදල් ලබා දෙනවා කියලා. එතුමාගේ ඒ ප්‍රකාශය ඇහුවාම වාගේම ලැබෙන සහන දිහා බැලුවාම ආපදාවට ලක් වෙච්ච ජනතාව බොහොම සතුටු වුණා, ජනාධිපතිතුමා අපේ දිහා බලලා අපට ලොකු සහනයක් සලසා දෙයි කියලා. නමුත්, අන්තිමට එවලා තිබෙන චක්‍රලේඛය දිහා බලනකොට එදා පොරොන්දු වෙච්ච ආකාරයට ඒ

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

මුදල් ටික ලැබේද කියන ප්‍රශ්නය ආපදාවට ලක් වෙච්ච ජනතාව තුළ තිබෙනවා. කෙසේ වෙතත්, ඔබතුමන්ලා පොරොන්දු වෙච්ච ආකාරයට රුපියල් 25,000 දීමනාව ලබා දීමේ කටයුතු මේ වෙනකොට සිද්ධ වෙමින් පවතිනවා. ඒ මුදල මම හිතන විධියට කොටසකට දීලා තිබෙනවා. තවත් විශාල කොටසකට ඒ මුදල් ලබා දෙන්න නියමිතව තිබෙනවා. නමුත්, ඒ සම්බන්ධයෙන් පොඩි අසාධාරණයක් සිදු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, ගංවතුරෙන් හානි වෙච්ච නිවාසවලට තමයි මේ ආධාර මුදල ලබා දෙනවාය කියලා තිබෙන්නේ.

අපි ජීවත් වන කෑගල්ල ප්‍රදේශය විතරක් නොවෙයි, අනිකුත් ප්‍රදේශත් විශාල වශයෙන් නාය ගිය බව අප දන්නවා. නාය යනකොට මම දන්නා තරමින් නිවාසවලට පස් කණ්ඩි කඩා වැටුණා. ඒ නිවාස හෝදා ගෙන ගියා. සුළි සුළංවලින් නිවාසවලට හානි සිද්ධ වුණා. ඒ නිසා මේ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න. එහෙම නැත්නම් ඒ අයට සහන ලබා දීම සම්බන්ධව යම්කිසි ගැටලු සහගත තත්ත්වයක් මතු වෙයි. ඒ වාගේම ජනාධිපතිතුමා ඒ අවස්ථාවේදී කිව්වා, රුපියල් 25,000ට අමතරව නිවාසවලට අවශ්‍ය උපකරණ ටික ලබා ගන්න වාගේම නිවාස පිළිසකර කරගන්න තවත් රුපියල් 50,000ක් ලබා දෙනවාය කියලා. නමුත්, ඒ සම්බන්ධයෙන් තවමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියන එක තමයි අදාළ ආයතනවලට කථා කළාම අපට දැනගන්න ලැබෙන්නේ. ගරු ආපදා කළමනාකරණ විෂයභාර නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා මම රජයෙන් ඉල්ලා සිටින්න කැමතියි, මේ මුදල් ටික ලබා දෙනකොට කොන්දේසිවලින් තොරව ඒ මුදල් ලබා දෙන්න කියලා. ගංවතුරෙන් හානි වෙච්ච අය විතරක් නොවෙයි, නාය ගිහිල්ලා, පස් කඳු කඩා වැටිලා, ගෙවල්වලට හානි සිද්ධ වෙච්ච විශාල පිරිසකුත් අද වනකොට ඉන්නවා. එම නිසා ඒ අයටත් යම්කිසි සහනයක් සලසා දෙන්න.

ඒ වාගේම තමයි, වතු කම්කරු ජනතාවත්. අපේ ගම්වල ඉන්න අය වාගේම වතු කම්කරු නිවාසවල ඉන්න ජනතාවත් අද වනකොට අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. ඒ අයට නොයෙකුත් ආකාරයේ කොන්දේසි දමනවා. ඒ අයට ආධාර ලබා ගන්න ඕනෑ නම් වතු අධිකාරිගේ ලියුම අරගෙන එන්න කියලා කියන අවස්ථා තිබෙනවා. සමහර වෙලාවට වතු අධිකාරි වැඩ කරන අයට විතරයි ඒ ලියුම දෙන්නේ. ඒ නිසා ඒවා සම්බන්ධවත් හොයා බලන්න. නිවාසවල පදිංචි නම් ඒ හැමෝටම අවශ්‍ය ආධාර මුදල් ටික ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න.

මට තවත් කාරණයක් කියන්න තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආපදා තත්ත්වයෙන් පසුව දැන් පාසල් අධ්‍යාපන කටයුතු ආරම්භ කරලා තිබෙනවා. යටියන්තොට ප්‍රදේශයේ පාසල් 5ක් විතර අවදානම් කලාපයේ තිබෙනවාය කියා දැන් NBRI එකේ වාර්තාව ඇවිල්ලා තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ අතුරින් යටියන්තොට මලල්පොළ විද්‍යාලය දැඩි ලෙස ආපදාවට ලක් වෙලා තිබෙනවා වාගේම එය දැඩි අවදානම් තත්ත්වයක තිබෙන්නේ කියලා කියනවා. ඒ නිසා එම පාසලේ ළමයි ඉවත් කරන්න කටයුතු කරනවා. ඒ පාසලේ ළමයි 200ක් ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ළමයි සම්බන්ධව වැදගත් කාරණාවක් මම කියන්නේ. ළමයි 200ක් ඒ පාසලෙන් ඉවත් කරන්න හදනවා. මම හිතන විධියට, ඒ පාසල් ගොඩනැඟිල්ලෙන් ඒ ළමයි ඉවත් කිරීම පමණක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ නිසා මම වාගේම ප්‍රදේශවාසීන් ඉල්ලන්නේ මේ පිළිබඳව නැවත සමීක්ෂණයක් කරන්න කියායි. විශේෂයෙන්ම නාය ගිය ප්‍රදේශවල යම්කිසි වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව අපි දන්නවා. මොකද, මේ ඔක්කෝම ඉඩම් ටික අයින් කරන්න පුළුවන්කමක් නැහැ. අපි කියන්නේ පාංශු සංරක්ෂණ වැඩසටහන් කරලා, ස්ථාවර බැම්ම ගහලා, එහෙම නැත්නම් සංරක්ෂණ වැඩ පිළිවෙළක් කරලා මේ පාසල් ටික ආරක්ෂා කරන්න පුළුවන් නම්, ඒකෙන් දෙමව්පියන්ටත්, ළමයින්ටත් සෙතක් වෙනවා කියන එකයි. ඒ නිසා ඔබතුමන්ලාගේ කාරුණික අවධානය යොමු කරලා ඒ පාසල් ටික සංවර්ධනය කරන්න. ඒ පාසල් තිබුණු ආකාරයට සංවර්ධනය කර ගන්න යම් විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උපාලි සමරසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.40]

**ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෑත ඉතිහාසයේ ගත්තොත්, අපේ මව්බිමට වෙච්ච දැවැන්තම, බරපතළම ආපදාවට තමයි අපි මුහුණ දුන්නේ. ඒ නිසා ජීවිත අහිමි වුණා; දේපළ අහිමි වුණා. ඒ ගැන අපට කම්පනයක් තිබෙනවා. හැබැයි, කම්පනයක් තිබෙනවා වුණත් මේ සිද්ධියෙන් පසුව අපේ සමාජය හැසිරිච්ච විධිය ගැන බලන්න. අපි 2024 නොවැම්බර් මාසයට කලින් මේ සමාජයේ ජනතාවගේ සිතුම් පැතුම්, හැඟීම්, හැසිරීම් සහ ඔවුන්ට තිබුණු ධෛර්යය ගැන කල්පනා කළොත්, වර්තමාන රජය ආවාට පසුව ඇති වුණු මේ සිදුවීමෙන් පස්සේ අපට කම්පනයක් තිබුණත්, මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව ඉතාම විශ්වාසවන්ත ලෙස, සහෝදරාත්මක ලෙස ලොකු බැඳීමක් ඇතුව ස්වේච්ඡාවෙන් කරන ලද ඒ කැප කිරීම් සහ අදටත් කරන කැප කිරීම් දිහා බලනකොට මේ තත්ත්වය මේ ආණ්ඩු කාලය තුළ සිදු වුණු නිසා අපට අද මේ කටයුතු සම්බන්ධව මෙහෙම කථා කරන්න පුළුවන්. හැබැයි, වෙනත් ආණ්ඩුවක් තිබුණා නම්, අපේ රටේ ජනතාව කොහොම හැසිරෙයි ද කියන කාරණය සම්බන්ධයෙන් අපට ඓතිහාසික වශයෙන් කරුණු කාරණා බොහොමයක් ගැන හිතන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම බන්ධනාගාරවල හිටපු සිරකරුවෝ මේ කාරණය සම්බන්ධයෙන් කොච්චර හැඟුම්බර වුණාද, මේ ගැන කම්පනයට පත් වුණාද කිව්වොත්, ඔවුන් ඔවුන්ගේ දෛනික ආහාර වේලක මුදල මේ වෙනුවෙන් පරිත්‍යාග කළා. ඒ වාගේම රටේ කඳුකරයේ ජීවත් වන, වැඩ කරන ඒ තේ දලු නෙළන ආදරණීය ජනතාව තමන්ගේ දවසක වැටුප පරිත්‍යාග කළා. ඒ වාගේම මේ රටේ දකුණු ප්‍රදේශයේ ඉන්න ජනතාව තමන්ගේ ධීවර බෝට්ටු, බැකෝ

යන්ත්‍ර, ටිපර් යන්ත්‍ර අරගෙන අනික් ප්‍රදේශවලට ඇවිල්ලා වැඩ කළා. මේ රටේ ආගමික නායකයෝ සියල්ල එකට එකතු වෙලා මේ කටයුත්තට මැදිහත් වුණා. මම දැක්කා, එක සමාජ මාධ්‍යයක පළ වී තිබුණා, ආදරණීය මුස්ලිම් ජනතාවක් පන්සලකට ගිහිල්ලා, ඒ පන්සල සුද්ද පවිත්‍ර කරනවා. නමුත් 2024 වෙනකොට මේ රටේ ජාතීන් අතර අසමගිය, අවිශ්වාසය, සැකය, වෛරය තමයි හදලා තිබුණේ. එහෙම තිබුණු සමාජයක ජාතික ජන බලවේගය රජය බලයට පත් වෙලා අවුරුද්දක් යද්දී, ඒ වාගේම මේ වාගේ දැවැන්ත ව්‍යසනයක් එනකොට ජනතාව විශ්වාසවන්තව එකතුවීම කියන එක මම දකින්නේ අපට මේ ව්‍යසනයෙන් ඉස්සරහට යන්න, මිදෙන්න, මේක ජය ගන්න පුළුවන් කාරණයක් බවට පත් වෙලා තිබෙනවා කියන එකයි.

අපේ වවුනියාව, මුලතිව්, මන්නාරම දිස්ත්‍රික්ක ගැනත් සඳහන් කරන්න ඕනෑ. 26 වෙනිදා තමයි මම මේ පාර්ලිමේන්තුවේ ඉඳලා ගෙදර ගියේ. සාමාන්‍යයෙන් අපි පැය පහෙන් විතර ගෙදරට යනවා; වවුනියාවට යනවා. නමුත් එදා අපට පැය 13ක්, 14ක් විතර ගියා. ඒ යද්දී, රෑ 12.00ට, රෑ 2.00ට මම දැක්කේ මොකක්ද? ගස් වැටිලා; පොලීසිය සහ ඒ ගම්වල ජනතාව එකතු වෙලා වැස්සේම ඒ වැටුණු ගස් කපලා ඉවත් කරලා වාහනවලට යන්න උදවු කළා. අපි ඒ වෙනකොටමත් වවුනියාවේ දිසාපතිතුමා එක්ක සම්බන්ධ වෙලා හිටියේ. 26වැනි දා සවස ඉඳලා 27 උදේ වෙනකොට ජනතාව සැලකිය යුතු පිරිසක් ඒ නිලධාරින් විසින් ඉවත් කරලා තිබුණා, ජලයෙන් යට වෙන තැන් සම්බන්ධයෙන් අධීක්ෂණය කරලා. අපි 27වැනි දා උදේ ඉඳලා කටයුතු කරලා, විශේෂයෙන් අපේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඇතුළු සියලු ජල කළමනාකරණ අංශ අවශ්‍ය කටයුතු කරලා පියවරෙන් පියවර වැව්වල සොරොව් ඇරියා. ඒ වාගේම වාන් දොරටු ඇරියා, වැව් bund කැපුවා. එහෙම කරලා උපරිම විධියට ජල කළමනාකරණය කරලා ඒ ජලයෙන් ජනතාවට වෙන්න තිබුණු විනාශය අවම කර ගන්න මහන්සි වුණා. ඒ වාගේම මේ සිද්ධියෙන් පස්සේ වතුරට යට වෙලා අවතැන් වෙච්ච ජනතාවක් හිටියා; මේ දිස්ත්‍රික්ක තුනේම හිටියා 150ක් විතර. නාවික හමුදාව, ගුවන් හමුදාව සම්බන්ධ කරගෙන දිසාපතිතුමන්ලා ඇතුළු කණ්ඩායම ඉතා ඉක්මනින් ඒ අය මුදා ගැනීම් කටයුතු සිදු කළා. මේ දිස්ත්‍රික්ක තුනේම දිසාපතිතුමන්ලා, ග්‍රාම නිලධාරින්, සමෘද්ධි නියාමකවරු ඇතුළු රාජ්‍ය නිලධාරි පද්ධතිය මෙහිදී දිවා රෑ නොබලා දැවැන්ත කැප කිරීමක් කළා. ඒ සම්බන්ධයෙන් ඔවුන්ට අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ. වවුනියාවේ දිසාපතිතුමා, මහනුවර දිස්ත්‍රික්කයේ කෙනෙක්. එතුමාගේ ගම සහ ඒ අවට පැති නාය ගිහිල්ලා තිබුණා. දුරකථන සම්බන්ධතා තිබුණේත් නැහැ. එතුමාට දින තුනක් යනතුරු ගෙදර සමඟ කිසිම සම්බන්ධතාවක් තිබුණේ නැහැ. එතුමා ගෙදර අමතක කරලා අපිත් එක්ක එකතුවෙලා දිවා රෑ නොබලා වැඩ කළා. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම්වරු සහ ආපදා කළමනාකරණ කමිටුවේ නිලධාරින් සියලු දෙනාත් අපි සමඟ වැඩ කළා. ඒ අය සමහර දවස්වලට නිදා ගත්තේ පාන්දර දෙකට, තුනට. විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, මේ කටයුතුවලට මැදිහත් වෙච්ච ග්‍රාම නිලධාරිවරයෙකු ගැන. එතුමා වැඩ කළේ, සෙට්ටිකුලම් ප්‍රදේශයේ. ඒ, එම්.එම්.රමේෂ් කියන ග්‍රාම නිලධාරි මහතා. එතුමා තමන්ගේ වසමට යද්දී දැවැන්ත පාලමකින් වැටිලා, එතුමා ගිය යතුරු පැදිය ගහගෙන ගියා. හැබැයි, එතුමා ආපහු ගෙදර ගියේ නැහැ. එතුමා තමන්ගේ වසමට ගිහිල්ලා දවස් තුනක් තිස්සේ වැඩ කළා. දවස් 4ක් ගත වුණාට පස්සේ තමයි එතුමාගේ බයිසිකලය අපට හොයා ගන්න පුළුවන් වුණේ. මම මේ කියන්න උත්සාහ කළේ, රාජ්‍ය නිලධාරින් මේ අවස්ථාවේදී දැවැන්ත ලෙස මැදිහත් වෙමින් වැඩ කටයුතු කළ ආකාරයයි.

මේ වෙනකොට මේ දිස්ත්‍රික්ක තුනේම ආපදා කළමනාකරණ කමිටු තුන් පාරක් කැඳවා තිබෙනවා. ඒ අනුව, මේ වෙනකොට තිබෙන තත්ත්වයන් සහ ඉදිරියේදී ඇති විය හැකි තත්ත්වයන් ගැන සැලකිල්ලෙන් කටයුතු කිරීමට මහන්සිවෙලා තිබෙනවා. මේ දිස්ත්‍රික්ක තුනෙන් වැඩිම හානියක් සිද්ධ වුණේ, මන්නාරම දිස්ත්‍රික්කයට. පසුගිය සතියේ අතිගරු ජනාධිපතිතුමා සම්බන්ධ වෙලා, මන්නාරම දිස්ත්‍රික්කයේ තත්ත්වය සමාලෝචනය කරමින් අනෙකුත් කටයුතු වේගවත් ලෙස සැලසුම් කරන්න සාකච්ඡා කළා. ඒ සඳහා පළාත් සභාව සහ සියලු රාජ්‍ය ආයතනත් සම්බන්ධ කර ගත්තා. මන්නාරම දිස්ත්‍රික්කයේ කුඹුරු අක්කර 22ක් පමණ විනාශවෙලා තිබෙනවා. ගවයින් 10,000කට වඩා මිය ගොස් තිබෙනවා. මෙහිදී ජනතාවට ඉක්මනින් සහන සලසන්නත් ජනාධිපතිතුමා උපදෙස් දුන්නා. මේ ආපදාවේදී වවුනියා දිස්ත්‍රික්කයේ ව්‍යාපාරික ප්‍රජාව විශාල ලෙස මැදිහත්වෙමින් අපට උදව් කළා. අපි ඒ අයගේ උදව් උපකාර රැගෙන කිලිනොච්චිය, මුලතිව් වාගේ දිස්ත්‍රික්කවලට ගිහිල්ලා, ඒ ජනතාවත් සම්බන්ධ කරගෙන ඔවුන්ට වියළි ආහාර ද්‍රව්‍ය ලබා දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු උපාලි සමරසිංහ මහතා**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ)
(The Hon. Upali Samarasingha)
මට තව තත්පර කිහිපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම, සෙට්ටිකුලම් ප්‍රදේශය වාගේ ගංවතුරෙන් යටවෙච්ච ප්‍රදේශවල ගෙවල් දොරවල් සුද්ද පවිත්‍ර කර දුන්නා. වැදගත්ම දෙය තමයි, මේ ව්‍යසනයේදී උතුරු පළාතේ සිංහල, දෙමළ, මුස්ලිම් සහෝදර ජනතාව දේශපාලනයකින් තොරව, ඉතාම බැඳීමකින්, එකමුතුව වැඩ කරපු එක. ඒක තමයි අපේ බලාපොරොත්තුව. අපට මේ ආපදාවෙන් ගොඩ එන්න පුළුවන්. විවිධ දේශපාලන කණ්ඩායම් කුමක් කිව්වත් මහ පොළොවේ ජනතාව, විශේෂයෙන් උතුරේ ජනතාව ආණ්ඩුවත්, ජනාධිපතිතුමාවත් විශ්වාස කරමින් වැඩ කරනවා. ඒ කාරණයත් මතක් කරමින්, මට කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[පි.ප. 4.48]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்றைய தினம் நாங்கள் சீரற்ற காலநிலை காரணமாக ஏற்பட்ட பேரிடருக்குப் பின்னரான நாட்டின் தற்போதைய நிலைமை தொடர்பாக விவாதித்துக்கொண்டு இருக்கின்றோம். எங்களால் சில கள விஜயங்களை மேற்கொள்ளக்கூடியதாக இருந்தது. அந்த வகையில், ஆனைகட்டியவெளியிலுள்ள சமுலையடி வீதியைப் பார்வையிட்டு இருந்தோம். வெள்ளத்தால் பாதிக்கப்பட்டிருந்த செட்டிபாளயம் பிரதேச வைத்தியசாலையையும் நாங்கள் பார்வையிட்டோம்.

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

அதேபோன்று, வெல்லாவெளி, வவுணதீவு, தாண்டியடி, நுவரெலியா போன்ற பகுதிகளையும் நாங்கள் சென்று பார்க்கக்கூடியதாக இருந்தது. அந்த அவதானிப்புகளையும் மக்கள் செய்த முறைப்பாடுகளையும் இந்தச் சபையில் முன்வைக்கலாமென நினைக்கின்றேன்.

அந்த வகையில் பார்க்கின்றபோது, ஆனைகட்டியவெளி - சமுலையடி வீதி படுமோசமாகப் பாதிக்கப்பட்டு இருக்கின்றது. இந்த வீதியானது, பல கிராமத்து மக்கள் நேரவிரயமின்றிப் பயணிக்கின்ற வீதியாகும். நீர் பாய்கின்ற சில இடங்களில் பொருத்தமான பொறிமுறைகளைப் பயன்படுத்தி, அந்த வீதியைப் புனரமைத்துத்தர வேண்டுமென்ற கோரிக்கையை அந்தப் பகுதி மக்கள் எங்களிடம் விடுத்திருக்கிறார்கள். அதேபோன்று, மகிழவெட்டுவான் பாலம் உடைந்து காணப் படுகின்றது. அந்தப் பாலம் புனரமைக்கப்பட வேண்டும் என்றும் மக்கள் கோரிக்கை விடுத்திருக்கிறார்கள்.

இதைவிட, செட்டிபாளையம் பிரதேச வைத்தியசாலையை எடுத்துக்கொண்டால், கிட்டத்தட்ட 3'-4' வெள்ளம் அங்கு பாய்ந்திருக்கின்றது. இதனால் பாதிப்புகள் ஏற்பட்டிருக் கின்றன. மதிலின் அப்புறமாக யானைகளின் நடமாட்டமும் காணப்படுகின்றது. இந்த வைத்தியசாலையில் ஒரு நாளைக்கு கிட்டத்தட்ட 100 நோயாளிகள் சிகிச்சை பெறுகின்றார்கள். எனவே, அந்த வைத்தியசாலை சம்பந்தமாகவும் சுகாதார அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டுமென கேட்டுக் கொள்கின்றேன்.

இதைவிட, தன்னாமுனை பகுதியை எடுத்துக்கொண்டால், எல்லை வீதிக்கு அப்பால் இருக்கின்ற பகுதி முற்றாக வெள்ளத்தில் அமிழ்ந்த நிலையில் காணப்படுகின்றது. அங்குள்ள வீடுகள் நான்கு பக்கமும் வெள்ளத்தால் சூழப்பட்டு இருக்கின்றன. அதனைப் பார்வையிடச் சென்றபோது, வீட்டைச் சுற்றி வெள்ளம் காணப்பட்டாலும், வீட்டுக்குள் தண்ணீர் செல்லவில்லை என்றும் அதனால் 25,000 ரூபாய் கொடுப்பனவு தரப்படவில்லை என்றும் ஒரு பெண்மணி சொன்னார். அதனை உடனடியாக கிராம உத்தியோகத்தருக்கு அறிவித்து அதனைப் பார்வையிடச் செய்திருந்தேன்.

வெள்ளத்தால் பாதிக்கப்பட்டவர்களுக்கு 25,000 ரூபாய் வழங்கப்படுகின்றது. இதனை வினைத்திறனுடன் ஆற்ற வேண்டுமென அரசாங்கம் சொன்னாலும், அடிமட்டத்தில் இதனைக் கொண்டுசென்று அமுல்படுத்துவதில் சில வேளை களில் தாமதம் காணப்படுகின்றது. அர்ப்பணித்து வேலைசெய்கின்ற அரசாங்க அதிகாரிகளை நாங்கள் பாராட்டுகின்றோம். இதில் அசமந்தமாக இருக்கின்ற கிராம சேவை உத்தியோகத்தர்கள் பற்றி முறைப்பாடுகள் இருக்கின்றன. அவர்கள் நேரடியாகச் சென்று அவற்றைப் பார்வையிடாமல் தங்களுக்குக்கீழ் முகவர்களை வைத்துப் பார்வையிட்டு report கொடுக்கிறார்கள் என்ற கருத்து இருக்கிறது. அண்மையில் அங்கு ஓர் ஆர்ப்பாட்டம் நடைபெற்றது. அதில் கலந்துகொண்டவர்களிடம் கேட்ட போது, அவர்கள் இந்தக் கருத்துகளைச் சொல்லியிருந்தார்கள்.

அதேவேளை, இன்னுமொரு விடயம் 'பிரஜாசக்தி' பற்றியது. உண்மையில் போதைவஸ்து எதிர்ப்பு நடவடிக்கை, பாதாள உலக செயற்பாடுகளுக்கு எதிரான நடவடிக்கை, ஊழல் மோசடிக்கு எதிரான செயற்பாடுகள் போன்ற உங்களால் முன்னெடுக்கப்படும் நல்ல விடயங்களை நாங்கள் பாராட்டுகின்றோம். 'பிரஜாசக்தி' என்ற விடயத்தில் கவனமாக இருக்க வேண்டும். ஏனென்றால், மக்கள் வாக்களித்து ஜனநாயக அடிப்படையில் தெரிவு செய்யப்பட்டவர்கள் உள்ளூராட்சி சபைகளில் இருகின்றார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
One minute, please.

அவ்வாறிருக்கையில், தேர்தல்களில் தோற்கடிக்கப்பட்ட அனேகமானவர்கள் இந்த 'பிரஜாசக்தி' திட்டத்தில் உள்வாங்கப்படுகின்றார்கள். ஜனநாயக ரீதியாகத் தெரிவு செய்யப்பட்டவர்களை, மக்களால் நிராகரிக்கப்பட்டவர்கள் கட்டுப்படுத்துகின்ற நிலைமை வருமாக இருந்தால், அது நிச்சயமாக முரண்பாட்டை அல்லது அவர்களுக்கிடையில் போட்டி மனப்பான்மையை ஏற்படுத்தும். எனவே, 'பிரஜாசக்தி' திட்டத்தை அமுல்படுத்துகின்றபோது, முரண்பாட்டை ஏற்படுத்தாமல் நல்லவற்றைச் செய்யுமாறு உங்களிடம் கேட்டுக்கொள்கின்றேன். அத்தோடு, பாதிக்கப்பட்ட விவசாயிகள், மீனவர்கள், தினக்கூலிகள் மற்றும் 'ஓட்டோ' சாரதிகள் போன்றவர்களுக்கும் நிவாரணங்களை அளிக்குமாறு கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරවින්ද සෙනරත් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.52]

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප විසින් අද දවස පුරා මේ කල් තැබීමේ විවාදය පවත්වනු ලබන්නේ අපේ රටේ ඇති වුණු දැඩි ගංවතුර සහ නාය යාම් හමුවේ රට මුහුණ දී තිබෙන තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීමේ අරමුණ ඇතිවයි. රටක් විධියට ගත්තාම, අපේ රටේ පුරවැසියන් ඉතිහාසයේ මුහුණ දුන්නු දැවැන්තම ස්වාභාවික ආපදාවක් ලෙසයි අපට මේ ව්‍යසනය හඳුන්වන්න වෙන්නේ.

මේ ගංවතුර තත්ත්වය නිසා වැඩිම අවදානමකට ලක් වුණේ අපේ රටේ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති අංශයි. මෙම අමාත්‍යාංශය සහ ඒ යටතේ තිබෙන්නේ ජාතික ආර්ථිකයට සෘජුවම බැඳුණු ආයතන පද්ධතියක්. වාරිමාර්ග සහ මහවැලි ව්‍යාපාරය කියන ක්ෂේත්‍රවලට අදාළ වාරි පද්ධති මේ ගංවතුර තත්ත්වයත්, නාය යෑමත් එක්ක දැඩි හානියකට ලක් වුණා. අපේ රටේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලබන ප්‍රධාන ජලාශ 73ක් අපි හඳුනා ගෙන තිබෙනවා. මහා වාරි, මධ්‍ය වාරි සහ කුඩා වාරි වශයෙන් වෙන් කළාම, ප්‍රධාන ජලාශ 73ක් තිබෙනවා. මේ ජලාශ 73ම යම් නිශ්චිත වග කියන ඉංජිනේරුවරයකු යටතේයි පාලනය වන්නේ. එනම්, මෙම ජලාශ කළමනාකරණය කිරීමේ වගකීම භාරව කටයුතු කරන ඉංජිනේරුවරයකු නම් කර තිබෙනවා.

මෙම ව්‍යසනය නිසා අපේ රටේ වාරි පද්ධතිය මුහුණ දුන්නු අර්බුදය හමුවේ විපක්ෂය විවිධ චෝදනා එල්ල කළා. හැබැයි, ඒ කිසිවක් සත්‍ය නොවෙයි කියන එක තහවුරු කරමින්, ඒ ආයතනය තුළ සිටින ඉංජිනේරු මහත්වරුන්, තාක්ෂණික නිලධාරින් ඉතා විධිමත්ව එම තත්ත්වය කළමනාකරණය කර ගන්න සමත් වුණා කියන විශ්වාසය අපට තිබෙනවා.

විශේෂයෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගත්තාම, ජල කළමනාකරණයත්, ජල විද්‍යා අංශයත් කියන අංශ දෙක හරහා තමයි එම පද්ධතිය විධිමත්ව පාලනය කරනු ලබන්නේ. ජලය කළමනාකරණය කිරීම පිළිබඳ විෂය දැනුම වාගේම අත්දැකීම් සම්භාරයක් තිබෙන නිලධාරින් තමයි වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ කටයුතු කරමින් ඉන්නේ. මේ ජලාශ ඉතා විධිමත්, සැලසුම්සහගත ක්‍රමවේදයක් යටතේයි මෙහෙයවනු ලබන්නේ. විශේෂයෙන්ම ඒ ජලාශවලට ඉහළින් ජල මාපක 88ක් සවි කර තිබෙනවා. ඒ වාගේම ඒ ජලාශ ආශ්‍රිතව වර්ෂාමාන සවිකර වර්ෂාපතනය මැනීම සඳහා අවශ්‍ය කටයුතු කර තිබෙනවා. ඒ අනුව රට තුළට ලැබෙන වර්ෂාවේ බලපෑමත් එක්ක ඇති වන තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා ඉතා විධිමත් පද්ධතියක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට තිබෙනවා.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව පැය 24කට වරක් දත්ත එකතු කරමින්, එම දත්ත සමාජගත කරනවා. එම දෙපාර්තමේන්තුවට website එකක් තිබෙනවා. එම website එකට දත්ත එකතු කරනවා. එම දෙපාර්තමේන්තුව එසේ පැය 24කට වරක් දත්ත ලබා ගනිමින්, ජනතාව දැනුවත් කරමින් ඉන්නවා. ඒක සාමාන්‍යයෙන් system එකක් විධියට ඔවුන් සිදු කරන දෙයක්. ඒ වාගේම අධික වර්ෂා, සුළි කුණාටු වැනි හදිසි තත්ත්වයන් ඇති වුණාට පසුව පැය 12න් 12ට, එහෙම නැත්නම් පැයෙන් පැයට තොරතුරු අරගෙන එම දත්ත ජනතාවට සපයමින් ජනතාව දැනුවත් කරන ක්‍රියාවලියක ඔවුන් නිරත වෙනවා. ඒ වාගේම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවත් එක්ක ඒකාබද්ධ වුණු මෙහෙයුමක් කරමින් මේ පද්ධතිය නඩත්තු කිරීම සඳහාත්, පද්ධතිය තුළ වෙන්න පුළුවන් හානිය අවම කර ගැනීම සඳහාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු කරමින් ඉන්නවා.

ඒ වාගේමයි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියත්. වාරිමාර්ග දෙපාර්තමේන්තුව රටේ ගොවි ජනතාවට අවශ්‍ය ජල සම්පාදන ක්‍රියාවලිය තුළ ඉතාම වැදගත්, ලොකු වැඩ කොටසක් කරනවා වාගේම, මහවැලි අධිකාරියත් අපේ රටේ ජල කළමනාකරණයේදී දැවැන්ත කාර්යභාරයක් ඉටු කරමින් ඉන්නවා. ප්‍රධාන ජලාශ 13ක් මහවැලි අධිකාරිය යටතේ මෙහෙයවමින් තිබෙනවා. ඒ 13ම ඉතාම දියුණු තාක්ෂණය භාවිත කරමින්, ස්වයංක්‍රියව ක්‍රියාත්මක වන පද්ධතියක් හරහා තමයි කළමනාකරණය කරන්නේ. CCTV cameras සවි කරලා, ඒ ජලාශවලට එන ජල ප්‍රමාණය, ජලාශවල රැඳෙන ජල ප්‍රමාණය, ජලාශවලින් පිට කරන ජල ප්‍රමාණය යන තොරතුරු සියල්ල ඉතා විධිමත්ව ලබා ගනිමින් ඒවා කළමනාකරණය කිරීම සඳහා මහවැලි අධිකාරිය කටයුතු කරමින් ඉන්නවා.

අපේ රටට 2025 නොවැම්බර් මාසයේ 26, 27 දවස්වල ලැබුණේ, ඉතිහාසයේ වැඩිම වර්ෂාපතනයයි. සාමාන්‍යයෙන් දළ වශයෙන් ගත්තාම අවුරුද්දකට ලැබෙන මිලිමීටර 2,000ක විතර වර්ෂාපතනයෙන් හතරෙන් එකක පමණ ප්‍රමාණයක් - සාමාන්‍යයෙන් මිලිමීටර් 500කට, 600කට ආසන්න ප්‍රමාණයක් - ඒ දින දෙකේදී ලැබුණා. ඒ ප්‍රමාණය කළමනාකරණය කර ගනිද්දී විපක්ෂය විවිධ චෝදනා නැඟුවා. ඒ ඉංජිනේරු මහත්වරු දින ගණනාවක් තිස්සේ තමන්ගේ දරු මල්ලන් පිළිබඳව, තමන්ගේ ගේ දොර පිළිබඳව සොයා බැලීමකින් තොරව ඒ ස්ථානවල රැඳී සිටිමින් වාරි සම්පත රැක ගත්තා වාගේම ජනතාවට සිදු වන හානිය අවම වන විධියට පැවැති තත්ත්වය කළමනාකරණය කළා කියන පණිවුඩය අපි රටට ලබා දෙනවා.

ආණ්ඩුව එසේ කටයුතු කරද්දී විපක්ෂය විවිධ චෝදනා නැඟුවා. අපි විපක්ෂයට කියන්න ඕනෑ, ඔබ කුමන චෝදනා එල්ල කළත් එලක් නැති බව. ඌරෝ කුණු හොයාගෙන හාර හාරා යනවා. ඒ වාගේම මේ අර්බුදය හමුවේත්, රට මුහුණ දුන්නු මේ දැවැන්ත ඛේදවාචකය හමුවේත් විපක්ෂය ආණ්ඩුවේ මොනවා හරි අඩුපාඩුවක් හොයා හොයා යමින් ඉන්නවා. හැබැයි අවාසනාවක මහිම! ඒ ඌරාට කුණු හොයා ගන්න බැරි වුණා. කුණු නැහැ. ප්‍රශ්න නැතුව මේ තත්ත්වය කළමනාකරණය කර ගන්න ආණ්ඩුව සමත් වුණා. ඒ නිසා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව කළ කාර්යභාරය අපි අගය කරන්න ඕනෑ. ඒ නිලධාරින්ට ස්තුති කරන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඔය කථා කරන විපක්ෂයේ ගොඩක් මහත්වරුන්ට කියන්න තිබෙන්නේ මේකයි. දිස්ත්‍රික්කයක් විධියට ගත්තාම, කොළඹ දිස්ත්‍රික්කය වාර්ෂිකව ගංවතුරට හසු වෙනවා. 76 වසරක ශාපය ගැන කථා කරද්දී මේ ගත වෙච්ච දශක දෙක තුළ කොළඹ දිස්ත්‍රික්කයේ ගංවතුර තත්ත්වය පාලනය කර ගන්න ඒ පැවැති ආණ්ඩුවලට හැකියාවක් ලැබුණේ නැහැ. 2023, 2024, 2025 වර්ෂවල ඉඟිනියාගල ජලාශය පිටාර ගලලා, අම්පාර දිස්ත්‍රික්කය ගංවතුර ආපදාවට මුහුණ දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසානයි.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගංවතුරට හැමදාම වාගේ මුහුණ දෙන ස්ථාන තිබුණත් පැවැති ආණ්ඩු ඒ ආපදා කළමනාකරණය කර ගන්න සමත් වුණේ නැහැ. නමුත් ආණ්ඩුවක් විධියට අපි ඒ සඳහා සැලසුම් සකස් කරමින් ඉන්නවා. ගංවතුර වළක්වන්න අපට බැරි වෙයි. හැබැයි, ඒකෙන් සිදු වන හානිය කළමනාකරණය කිරීම සඳහා අපේ ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩියක කාලයක් දෙන්න අමාරුයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
මේ රටේ අවතැන් වෙච්ච පුරවැසියෝ නැවත ඒ තැන්වලට යවන්න අපට බැහැ. විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ, මහනුවර දිස්ත්‍රික්කයේ, බදුල්ල දිස්ත්‍රික්කයේ ඒ මිනිසුන්ගේ නිවාස සම්පූර්ණ ලෙස විනාශ වෙලා, ජීවිත අනාරක්ෂිත වෙලා තිබෙන්නේ. රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීන්දුත් එක්ක ඔවුන්ට ආරක්ෂිතව ජීවත් වෙන්න පුළුවන් ඉඩම් ලබා දීමේ කටයුත්තේදී ඉඩම් අමාත්‍යාංශය විධියට අපි සැලසුම් කරමින් තිබෙනවා, රජය සතු LRC, මහවැලි ඉඩම් ලබා දීලා ඒ ප්‍රශ්නය විසඳන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා. කථාව අවසන් කරන්න.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

ජනතාවට අවම හානියක් වන විධියට, වාරි පද්ධතියට අවම හානියක් වන විධියට අපි මේ අර්බුදකාරී තත්ත්වය ඉතාම හොඳින් කළමනාකරණය කර ගත්තා. මතක තියා ගන්න, මහා වාරි සහ මහවැලිය කියන එකදු වාරි පද්ධතියකටවත් හානියක් නොවෙන්න අපි මේ තත්ත්වය කළමනාකරණය කර ගත් බව. සොරොව් නොතිබීම ආදි විවිධ වූ ගැටලු නිසා අනුරාධපුරයේ සුළු වාරි පද්ධති හානියට පත් වුණත්, අපි මේ තත්ත්වය කළමනාකරණය කරලා රටට ආදර්ශයක් ලබා දුන්නා. ඒ වාගේම රට නිවැරදි දිශාවට ගැනීම සඳහා හෙට දවසේදී ආණ්ඩුව ගනු ලබන තීන්දු තීරණත් එක්ක ජනතාවට නිදහසේ, සතුටින් ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක් හදන්න අප සූදානම් බවත් මතක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.02]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த மாதம் இந்த நாட்டில் ஏற்பட்ட அனர்த்தத்திலிருந்து நாட்டை மீளக் கட்டியெழுப்பி நாட்டை வழமை நிலைக்குக் கொண்டு வருவதற்காக உழைத்துக்கொண்டு இருக்கின்ற கௌரவ அமைச்சர்கள், பாராளுமன்ற உறுப்பினர்கள், உள்ளூராட்சி மன்றங்களின் தலைவர்களுக்கு இந்தச் சபையிலே என்னுடைய மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன்.

குறிப்பாக, கண்டி மாவட்டத்திலே எமது ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவர் அல்-ஹாஜ் ரஊப் ஹகீம் அவர்கள் கிழக்கு மாகாண உள்ளூராட்சி நிறுவனத் தொண்டர்களுடன் பாராளுமன்ற உறுப்பினர்கள், நகர சபை, மாநகர சபை, பிரதேச சபை போன்றவற்றின் இயந்திரங்கள், ஆளணியினரைக்கொண்டு துப்புரவு நடவடிக்கைகளை மேற்கொண்டதை ஞாபகப்படுத்தி அவர்களைப் பாராட்ட விரும்புகின்றேன். கௌரவ உறுப்பினர்களான எம்.எஸ். உதுமாலெப்பை, எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ், நிசாம் காரியப்பர், முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களான நழீம், எம்.எஸ். தௌபீக் மற்றும் காத்தான்குடி நகர சபையின் தவிசாளர் அஸ்வர் அக்கரைப்பற்று மேயர் ஏ. எல். எம். அதாஉல்லா மற்றும் பிரதேச சபைகளின் தவிசாளர்களான உவைஸ், முஸ்மி, ராஸிக், முஷாரப், மாநகர சபைத் தவிசாளரான ஏ.எல். தவம் ஆகியோரையும் அவர்களோடு இணைந்து உதவி நடவடிக்கையில் ஈடுபட்ட இளைஞர்கள் உட்பட அனைவருக்கும் என்னுடைய மனமார்ந்த நன்றியை இந்தச் சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

இந்த நிலைமையின் பின்னராக கடந்த 16ஆம் திகதி இரவு வேளையிலே கிழக்கு மாகாண சபையின் அக்கரைப்பற்று வலயத்தில் பொத்துவில் கோட்டப் பாடசாலையான உஸ்மானியா வித்தியாலயக் கட்டிடம் இடிந்து வீழ்ந்ததால், தற்போது அப்பாடசாலை மூடப்பட்டு இருக்கின்றது. இருநூற்று முப்பத்தேழு மாணவர்களைக் கொண்ட 10 வகுப்பறைகளைக் கொண்ட இந்தப் பாடசாலையின் 7 வகுப்பறைக் கட்டிடம் இடிந்து விழுந்துள்ளது. எழுபது ஆண்டுகளுக்கும் மேல் பழைமைவாய்ந்த கட்டிடமாக இது இருக்கின்றது. இதற்கான தற்காலிகக் கொட்டில்களை அமைப்பதற்காக கிழக்கு மாகாண சபையின் கல்வி அமைச்சின் செயலாளர் பத்து இலட்சம் ரூபாய் நிதியை அவசரமாக ஒதுக்கியிருக்கிறார். இதனைக்கொண்டு தற்காலிகக் கொட்டில்களை அமைத்து மாணவர்களது கல்வியைத் தொடரலாமென நம்புகிறோம். இதற்கு உதவிய செயலாளர், மாகாணப் பணிப்பாளர் ஏ. எம். ரஹ்மத்துல்லாஹ், DEO ஹம்சா, Peace Education Officer அப்துல் மஜீத் அவர்களுக்கும் இதை அவசரமாகச் செய்து முடிக்க முயற்சிக்கும் பாடசாலை அதிபர் சஹாப்தீன் அவர்களுக்கும் SDS Secretary கலீபா அவர்களுக்கும் அப்பகுதியின் முக்கியஸ்தர்கள் பஷீர்கான் நவ்சான், றில்வான், பிரதேச சபை உறுப்பினர் சர்ஹுமுஹைதீன் ஆசிரியர் உட்பட அப்பகுதி இளைஞர்கள் எல்லோருக்கும் எனது மனமார்ந்த நன்றிகளை இந்தவேளையில் தெரிவித்துக்கொள்ள விரும்புகிறேன்.

பொத்துவில் அல்-அக்ஸா வித்தியாலயம் மற்றும் மினாஉல் உலூம் வித்தியாலயம் என்பவற்றினதும் பழைய கட்டிடங்கள் இந்த நிலைமையைப் போன்று உடைப்பு எடுக்கும் நிலையில் உள்ளது. “வருமுன் காப்போம்” என்ற அடிப்படையில், இப்பாடசாலைகளின் கட்டிடங்களும் பரிசீலனை செய்யப்பட்டு, பூரணமாக உடைக்கப்பட்டு புதிய கட்டிடங்கள் அமைப்பதற்கும் இந்த அரசாங்கம் நடவடிக்கைகளை எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கிறேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அனர்த்தம் காரணமாக நாடளாவிய ரீதியாக கரையோர மீனவர்கள் மாத்திரமன்றி, விவசாயிகள் மற்றும் கால்நடை வளர்ப்பாளர்களும் பெரிதும் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். அரசாங்கமானது, இவர்களுக்கான உதவிகளை அல்லது மானியங்களை வழங்குவதற்கு ஏற்பாடுகளைச் செய்ய வேண்டுமென்று இந்தச் சபையிலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன். மேலும், கடந்த ஆண்டில் பொத்துவில் பிரதேசத்திலே ஏற்பட்ட மினி சூறாவளி காரணமாக 15 மீனவர்கள் தங்களது boats உட்பட மீன்பிடி உபகரணங்களை முற்றாகவும் பகுதியளவிலும் இழந்திருந்தார்கள். ஆனால், இன்றுவரைக்கும் அரசாங்கமானது எந்தவிதமான நட்டஈடுகளையும் அவர்களுக்கு வழங்கவில்லை. நான்கு இலட்சம் ரூபாய் வழங்கப்படும் என்று உறுதியளித் திருந்தாலும், இன்றுவரை அது வழங்கப்படவில்லை. இதைத் துரிதமாக வழங்குவதற்கு அரசு நடவடிக்கை எடுக்க வேண்டும். அப்பகுதி மீனவர்கள் சார்பாக ஜே. ஆர். நஜீம் என்பவர் இந்த விடயத்தில் அக்கறையோடு செயற்பட்டு வருகின்றார். கால்நடை வளர்ப்பாளர்களினது விடயத்தையும் பரிசீலனை செய்து அவர்களுக்கும் மானிய அடிப்படையில் உதவிகள் வழங்கப்பட வேண்டும். இவர்களின் சார்பாக அந்தச் சங்கத்தின் தலைவர் ஏ. காதர் செயற்பட்டு வருவதைக் குறிப்பிட விரும்புகிறேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மூதூர் பிரதேச செயலாளர் பிரிவிலே சென்று பார்வையிட்டபொழுது, 42 கிராம அலுவலர் பிரிவுகளைக் கொண்ட 9,516 குடும்பங்களிலுள்ள 31,833 ஆட்கள் பாதிக்கப்பட்டு 34 முகாம்கள் பராமிக்கப்பட்டு வந்துள்ளது. இதில் 6,932 குடும்பங்களுக்கு 25,000 ரூபாய் கொடுப்பனவு வழங்கப்பட்டு இருந்தது. நாற்பது வீடுகள் முற்றாகச் சேதமடைந் திருக்கின்றன. இந்தப் பிரதேச செயலகப் பிரிவும் கிண்ணியா பிரதேச செயலகப் பிரிவும் அடங்கலாக மாவட்டத்தின் ஏனைய பிரதேச செயலகப் பிரிவுகளையும் இயல்பு நிலைக்குக் கொண்டுவருவதற்கு உதவிக் கொண்டிருக்கின்ற அரசாங்க அதிபர், அனைத்து பிரதேச செயலாளர்கள், அனைத்துத் தவிசாளர்கள், அரச உத்தியோகத்தர்கள், சமூக மட்ட உதவுநர்கள் அனைவருக்கும் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். குறிப்பாக, பாராளுமன்ற உறுப்பினர்களான இம்ரான் மஹ்ரூப், சண்முகம் குகதாசன் ஆகியோருக்கும் முன்னாள் பாராளுமன்ற உறுப்பினர் எம்.எஸ். தௌபீக் அவர்களுக்கும் மூதூர் பிரதேச செயலாளர் பிர்னாஸ் இஸ்மாயில் அவர்களுக்கும் உதவிப் பிரதேச செயலாளர் எம். எஸ். எப். றொசானா அவர்களுக்கும் கிண்ணியா பிரதேச செயலாளர் கனி அவர்களுக்கும் நன்றியைத் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට තව තත්පර 30ක් දෙන්න.

மூதூர் பிரதேச செயலாளர் பிரிவில் இருக்கின்ற வேதத்தீவுப் பாலத்தைக் கடந்துதான் மஜீத்புரம் செல்ல வேண்டி இருக்கின்றது. இந்தப் பாலத்தை அரசாங்கம் அமைத்திருந்தால், அந்த மக்களை அனர்த்தத்திலிருந்து பாதுகாத்திருக்க முடியும் என்பதோடு, அனர்த்தத்தால் அவர்களுக்கு ஏற்பட்டிருக்கும் பாதிப்பையும் குறைத்திருக்க முடியும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, திருக்கோவில் பிரதேச செயலாளர் பிரிவு, மருதமுனை பிரதேச செயலாளர் பிரிவு, பொத்துவில் பிரதேச செயலாளர் பிரிவுகளில் அடிக்கடி கடலரிப்பு ஏற்படுவதால், அப்பகுதி மீனவர்கள் உட்பட பொது மக்களும் அச்சத்தில் வாழவேண்டிய நிலைமை ஏற்பட்டிருக்கின்றது. இதனால் இப்பகுதியின் பிரதேச சபைத் தவிசாளர் சசிகுமார் அவர்கள் பல்வேறு சவால்களுக்கு முகம்கொடுத்து வருவதை திருக்கோவில் மக்கள் சார்பாகச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். CCD இதனைப் பார்வையிட்டு, விரைவாக நிரந்தரத் தீர்வை வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். மாளிகைக்காடு மையவாடி கடலால் காவுகொள்ளப்படுவதனால், அடக்கம் செய்யப்பட்ட மனித உடலங்கள் வெளியே கொண்டுவரப் படுகின்றன. இந்தப் பிரதேசத்திலுள்ள பள்ளிவாசல்கள், AL-Meezan Foundation, ஜனாஸா அமைப்புகள் இது தொடர்பில் பல முயற்சிகளை எடுத்தும் இன்றுவரை தீர்வு எட்டப் படவில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථාව අවසන් කරන්න. නැත්නම් ඔබතුමාට කථාවේ ඉතිරි කොටස සභාගත කරන්න අවස්ථාව තිබෙනවා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

CCD இதனைப் பார்வையிட்டு, நிரந்தரத் தீர்வை அப்பகுதி மக்களுக்கு வழங்க வேண்டுமெனவும், இதற்கு அரசாங்கம் உதவி செய்ய வேண்டுமெனவும் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිළිණ සමරකෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.07]

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 8ක කාලයක් තමයි මුලින් වෙන් වෙලා තිබුණේ. නමුත්, දැන් ඒ කාලය විනාඩි 5කට සීමාවෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දිට්වා" සුළි කුණාටුවට මුහුණ දීලා රටම ආපදාවකට පත් වෙච්ච මොහොතේ පාර්ලිමේන්තුව තුළ කෙරෙන විවාදයකදී ඒ සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. මේ ආපදාවට අනුරාධපුර දිස්ත්‍රික්කය මුහුණ දුන්නු ආකාරය පිළිබඳවත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජන ජීවිතයට මේ ආපදාව බලපාපු ආකාරය පිළිබඳවත් මම යම් අදහසක් ප්‍රකාශ කරන්නම්. අනුරාධපුර දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22කින් සමන්විත දිස්ත්‍රික්කයක්. මේ සුළි කුණාටුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22ටම බලපෑවා. සමස්තයක් ලෙස ගත්තාට පස්සේ මුළු ලංකාවම මේ ආපදාවට මුහුණ දෙද්දී, අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව අනුරාධපුර දිස්ත්‍රික්කයට බලපෑම් සිද්ධ වුණේ යම්කිසි අඩු මට්ටමකින්. ඇත්තටම මේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22ට මේ ආපදාව බලපාන්න හේතු වුණු කාරණා කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කය හරහා කලාඔය, මල්වතුඔය, යාන්ඔය කියන ප්‍රධාන ජලධාරා කිහිපයක් ගලාගෙන යනවා. ඒ වාගේම, ලංකාවේ වැඩිම වැව් ප්‍රමාණයක් තිබෙන දිස්ත්‍රික්කය තමයි අනුරාධපුර දිස්ත්‍රික්කය. මේ ජලාශ පිටාර ගැලීම නිසා, ඒවායේ ජලය වැඩිවී වාන් දැමීම වාගේ සිද්ධි ඇති වුණු නිසා මිනිසුන්ගේ ජන ජීවිතයට සැලකිය යුතු බලපෑමක් වුණා. අනුරාධපුර දිස්ත්‍රික්කය කියන්නේ ප්‍රධාන ජලාශ කිහිපයක්ම පිහිටා තිබෙන දිස්ත්‍රික්කයක්. කලා වැව, නාච්චාදූව ජලාශය, රාජාංගනය ජලාශය, පදවිය වැව වාගේ විශාල වැව් ප්‍රමාණයක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙනවා. මේ වැව් සියල්ල පිටාර ගැලීම නිසා එහි බලපෑම අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිටින ජනතාවට සහ සාමාන්‍ය ගොවි ජනතාවට අත් විඳින්න සිද්ධ වුණා.

[ගරු තිළිණ සමරකෝන් මහතා]

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සම්පූර්ණ පවුල් 22,838ක ප්‍රමාණයක් මේ ආපදාවට මුහුණ දුන්නා. මේ ආපදාව නිසා අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුද්ගලයන් 75,250ක් පමණ පීඩාවට පත්වෙලා තිබෙනවා. ඒ වාගේම, අනුරාධපුර දිස්ත්‍රික්කයේ පූර්ණ හානි වූ නිවාස 245කුත්, අර්ධ හානි වූ නිවාස 3,083කුත් තිබෙනවා. දිස්ත්‍රික්කය තුළ අවාසනාවන්ත ලෙස පුද්ගල මරණ 8ක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ විධියට ගත්තාම, මිනිසුන්ගේ ජන ජීවිතයට මේ ආපදාවෙන් විශාල හානියක් සිද්ධ වෙලා තිබෙනවා. මේ ආපදාව අපේ රටේ මිනිසුන්ගේ ජන ජීවිතයට එවැනි බලපෑම් ඇති කරන ගමන්, විශේෂයෙන්ම මහා මාර්ග පද්ධතිය, දුම්රිය ප්‍රවාහන පද්ධතිය ඇතුළු සමස්ත ප්‍රවාහන ක්ෂේත්‍රයටත් එය බලපා තිබෙනවා.

ඊළඟට සුළු වාරි පද්ධතිය සම්බන්ධයෙන් කථා කරද්දී, අමුණු සහ කුඩා වැව් 67ක් සම්පූර්ණයෙන්ම විනාශ වුණා. ඒ වාගේම, තවත් වාරි පද්ධති 504ක් සුළු වශයෙන් විනාශයට පත් වුණා. ඊට අමතරව තවත් වැව් 372ක වාන් කපලා කෘත්‍රිමව ජලය පිට කරන්න අපට සිද්ධ වුණා, ඒ වැව්වල සහ ඒ ජනතාවගේ ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා. ඒ වාගේම, මාස් කන්නයේ ලංකාවේ වැඩියෙන්ම වී වගාව සිද්ධ කරන දිස්ත්‍රික්කය අනුරාධපුර දිස්ත්‍රික්කයයි. මේ ආපදාව නිසා අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී වගා කරන කුඹුරු හෙක්ටෙයාර 9,500කට පූර්ණ හානි සිද්ධ වුණා. ඒ වාගේම, වී වගා කරන කුඹුරු හෙක්ටෙයාර 5,000කට අර්ධ හානි සිද්ධ වෙලා තිබෙනවා. තවත් කුඹුරු හෙක්ටෙයාර 1,000ක් නැවත වගා කිරීමට නොහැකි තත්ත්වයටම පත් වෙලා තිබෙනවා. මේ විධියට ගත්තාට පස්සේ ජන ජීවිතයට සැලකිය යුතු බලපෑමක් මේ ආපදාව විසින් සිදු කර තිබෙනවා. මේ ආපදාව නිසා අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී වගාව, බඩඉරිඟු වගාව, කෙසෙල් වගාව ඇතුළු අනෙකුත් එළවලු සහ පලතුරු වගාවලටත් දැවැන්ත ලෙස හානි සිදුව තිබෙනවා.

හැබැයි, මේ දේ මේ ආකාරයෙන් සිද්ධ වෙනකොට අපි රාජ්‍ය නිලධාරින් එක්ක එකතු වෙලා, ජලාශ භාර ඉංජිනේරුවන් සමඟ එකතු වෙලා, ශ්‍රී ලංකා යුද හමුදාව හා වෙනත් ස්වේච්ඡා සංවිධාන සමඟ එකතු වෙලා, දිස්ත්‍රික්කයේ දේශපාලන නායකත්වයත් මැදිහත් වෙලා ජන ජීවිතය ආරක්ෂා කරන්න අවශ්‍ය මැදිහත්වීම උපරිම අන්දමින් දවස් ගණනක් පුරාවට සිද්ධ කළා. ඉතින් විපක්ෂය අපට මොන මොන විවේචන කළත් දිස්ත්‍රික්කයේ දේශපාලන නායකත්වය සමඟ එකතු වෙලා, ගෞරවනීය ස්වාමීන් වහන්සේලා සමඟ එකතු වෙලා ජාතිකත්වයෙන් තොරව සියලු දෙනා එක මිටට එක තැනකට එකතුවෙලා ජන ජීවිතය ආරක්ෂා කර ගැනීම සඳහා, දේපොළ ආරක්ෂා කර ගැනීම සඳහා තමන්ගේ කෘෂිකර්මාන්තය නැවත ගොඩනැඟීමට අදාළව සාධනීය මැදිහත්වීමක් මේ වන විටත් කරමින් ඉන්නවා. ඒවාගේම තමයි ආපදා කළමනාකරණයත් එක්ක ජනතාවට ලබා දෙන දීමනා නිසි අයුරින් කළමණාකරණය කරලා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ වනවිටත් සකස් කරමින්, දිස්ත්‍රික්කයේ තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයකට මේ දීමනා ටික දීලා තිබෙනවා. කෘෂිකාර්මික බිම් ප්‍රමාණය ගණනය කරමින්, ඒ ප්‍රතිලාභ ලබා දෙන්නට අවශ්‍ය මැදිහත්වීම කරමින් සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ ආපදාව තුළ තිබෙන ලොකුම කනගාටුව තමයි අපට ජීවිත 600 ගණනක් නැති වීම.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න.

ගරු ජනාධිපතිතුමා සමඟ එකතු වෙලා, මෙන්න මේ බිඳ වැටුණු රට, බිඳවැටුණු ආර්ථිකය, බිඳවැටුණු සමාජය නැවත ගොඩනැඟීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය අපේ රජයට තිබෙනවා. ඒ සඳහා උපරිම මැදිහත්වීමක් කරන බවට අපි පොරොන්දු වෙනවා. නැති වුණු ජීවිත, නැතිවුණු දේපොළ වෙනුවෙන් එම ජනතාවට අපේ කනගාටුව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.13]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ සුළි කුණාටුව සම්බන්ධව මට පෙර කථා කරපු, ආණ්ඩු පක්ෂයෙන් අදහස් ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීවරුන්, ගරු ඇමැතිවරුන් සියලු දෙනා ප්‍රකාශ කළේ විපක්ෂයේ කණ්ඩායම් - මේ සම්බන්ධව අදහස් ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීවරුන් - මේ මුවාවෙන් දේශපාලනය කරනවා කියන එකයි. මෙහිදී විශේෂයෙන්ම අපි මතක් කරලා දෙන්න ඕනෑ මෙන්න මේ කාරණය. 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ පැහැදිලිව තිබෙනවා, ජනාධිපතිතුමා විසින් පිහිටුවන ලද විධායක සභාවක් ගැන. මේ විධායක සභාව පිහිටුවා, අවම වශයෙන් මේ ජාතික සභාව මාස තුනකට සැරයක්වත් රැස්වෙන්න ඕනෑ කියලා එම පනතේ පැහැදිලිව තිබෙනවා. ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අගෝස්තු 6වැනි දා මේ ජාතික සභාව රැස් වුණා. ඒ වාගේම එම පනතේම 11 (1) වගන්තියේ තිබෙනවා, රට තුළ මෙවැනි ආපදා තත්ත්වයක් ඇති වෙන්න තිබෙනවා නම්, ව්‍යසන තත්ත්වයක් තිබෙනවා නම්, මේ කමිටුව රැස් කරලා කාලගුණය සම්බන්ධව තත්ත්වය රටේ ජනතාවට පැහැදිලි කරලා දෙන්න ජනාධිපතිතුමාට බලය තිබෙනවා කියලා. මේ කමිටුව අවසාන වශයෙන් 2025 අගෝස්තු 6වැනි දා රැස් වුණා. මේ ව්‍යසනයට පස්සේ නැවත 16වැනි දා රැස්වුණා. ගරු ජනාධිපතිතුමා මේ කමිටුව මේ තත්ත්වය තිබිද්දී රැස් කළේ නැහැ. මම මේ තිබෙන අඩුපාඩු පෙන්වලා දෙන්නේ. ගරු ජනාධිපතිතුමා 27වැනි දා පාර්ලිමේන්තුවට ආවා. එතුමා පාර්ලිමේන්තුවට 27වැනි දා ආවාම ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු, විපක්ෂයේ මන්ත්‍රීවරු, විපක්ෂ නායකතුමා ඇතුළු අපි සියලු දෙනාම පාර්ලිමේන්තුවේ කාරක සභා කාමරයට ගිහිල්ලා අප නියෝජනය කරන ප්‍රදේශවල තිබෙන, මන්ත්‍රීවරු නියෝජනය කරන ප්‍රදේශවල තිබෙන ගැටලු ගැන කථා කළා. විශේෂයෙන්ම මොරගහකන්ද ජලාශයේ මේ වන විට කොච්චර ජලය තිබෙනවාද, පරාක්‍රම සමුද්‍රයේ කොච්චර ජලය ප්‍රමාණයක් තිබෙනවාද කියන ප්‍රශ්න මම ඉදිරිපත් කළා. මේ වනවිට මනම්පිටිය පාලම යට වෙලා තිබෙනවා. එතකොට එකම විකල්ප පාරක් විධියට තිබෙන්නේ කෝච්චි පාර විතරයි කියලා අපි ජනාධිපතිතුමාට පැහැදිලි කර දුන්නා. මන්ත්‍රීවරුන් ඒ

ඒ අයගේ දිස්ත්‍රික්කවල තිබෙන ගැටලු පැහැදිලි කර දුන්නා. 27වැනි දා මේ සම්බන්ධව ජනාධිපතිතුමාව අපි දැනුවත් කළා. මේ වෙනකොට වෙන්න තිබෙන දේ වෙලා ඉවරයි. 28වැනි දා වෙනකොට රටෙන් භාගයක් මේ ව්‍යසනයට ලක් වුණා.

විශේෂයෙන්ම මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තොත්, වී ගොවිතැන විනාශ වෙලා. පොළොන්නරු දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර 4,000කට වැඩි කුඹුරු ප්‍රමාණයක් විනාශ වෙලා තිබෙනවා. අපි රටක් විධියට ගත්තොත්, හෙක්ටෙයාර 615,000ක් වගා කරලා තිබෙනවා. ඒකෙන් හෙක්ටෙයාර 108,000ක් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක් දෙන්න කටයුතු කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයට මඩ වැඩ කරන්න වතුර ලබා දුන්නේ නොවැම්බර් මාසයේ 01වැනි දා. ගංවතුර ඇති වුණේ 28වැනි දා. එතකොට දින 27ක් තුළ අපේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව කුඹුර සකස් කරගෙන, පොහොර ගහලා, බිත්තර වී අරගෙන කුඹුරට එකතු කරලා -මඩ වැඩ කරලා- අවම වශයෙන් රුපියල් 160,000ක්, රුපියල් 170,000ක් වියදම් කර තිබෙනවා. එතකොට හෙක්ටෙයාරයකට වෙන් කරපු රුපියල් 150,000ක මුදල ප්‍රමාණවත් නැහැ. ඒක තමයි මම විශේෂයෙන් පැහැදිලි කර දෙන්න යන්නේ. හැබැයි, මුදල් විශාල ප්‍රමාණයක් දෙන විධියට ජනාධිපතිතුමා කථා කළා. ජනාධිපතිතුමා හිතෙන හිතෙන විධියට කිව්වා; පුදුම සහගත විධියේ ඉලක්කම් කිව්වා. හැබැයි, මේ ඉලක්කම් කිව්වාට මේ ඉලක්කම් ප්‍රායෝගික නැහැ. ඒ නිසා මම විශේෂයෙන්ම කියා සිටිනවා, ගොවිතැනේ නියැළුණු අපේ වී ගොවියාට, බඩඉරිඟු ගොවියාට, එළවලු ගොවියාට වෙන් කරපු මුදල ප්‍රමාණවත් මදි කියලා. ගොවියා රුපියල් 170,000ක්, රුපියල් 180,000ක් වියදම් කර තිබෙනවා නම් හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක් දීලා හරියන්නේ නැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර කුඹුරු කන්න හතරකින්වත් අපට ගොඩ දමා ගන්න බැහැ. පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තොත්, වැලිවලින් පිරුණු කුඹුරු තිබෙනවා. ඒ වාගේම සම්පූර්ණයෙන්ම ගලට වෙනකල් හෑරුණු කුඹුරු තිබෙනවා. ඒ නිසා මේවා ගැන විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න කියා මම මේ ගරු සභාවට කියා සිටිනවා.

ඊළඟට, රුපියල් 25,000 ලබා දීම සමහරක් තැන්වල ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තොත්, රුපියල් 25,000 ලබා ගන්න සුදුසු නිවාස 10,922ක් මේ වනකොට තිබෙනවා. ඒ 10,922න් මුදල් වෙන් වෙලා තිබෙන්නේ 10,137කට පමණයි. එතකොට නිවාස 785කට මුදල් වෙන් වෙලා නැහැ. ඊයේ දිනය වනකොට මේ 10,137න් නිවාස 6,230කට තමයි මුදල් ලබා දීලා තිබෙන්නේ. මම කියන්නේ මේ මුදල් ඉක්මනින්ම ගෙන්වා ගෙන කඩිනමින් ජනතාවට ලබා දෙන්න කියලායි. මේ පළමුවෙනි වටයේ ලබා දෙන රුපියල් 25,000. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විතරක් මේ රුපියල් 25,000 ලබා දෙන්න ඕනෑ නිවාස තව 3,907ක් තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරලා පළමුවෙනි වටයේ ලබා දෙන රුපියල් 25,000 ලබා දෙන්න.

ඒ වාගේම ජනාධිපතිතුමා ප්‍රකාශ කළා, මේ රුපියල් 25,000ත් එක්ක රුපියල් 50,000ක්, ඒ කියන්නේ රුපියල් 75,000ක් ලබා දෙන්න ඕනෑ කියලා. හැබැයි, අලුතින් තව චක්‍රලේඛයක් නිකුත් වෙලා තිබෙනවා, රුපියල් 50,000ක මුදල දෙන්නේ ගෙවල්වල තිබෙන තත්ත්වය බලලා කියලා. නමුත්, ජනාධිපතිතුමා ප්‍රකාශ කළේ එහෙම නොවෙයි. රුපියල් 75,000ක්ම ලබා දෙන්න කියලා ජනාධිපතිතුමා රටේ ජනතාව අමතලා මාධ්‍යයට ඇවිල්ලා කිව්වා. ඒ නිසා මේවා කියපු විධියට ක්‍රියාත්මක කරන්න. අපි මේ සම්බන්ධව සභාවේ අවධානය යොමු කරන්නේ ජනාධිපතිතුමා කියපු දේවල් ක්‍රියාත්මක කරන්න ඕනෑ නිසායි. එහෙම නැතිව විපක්ෂයෙන් කියන්නේ නැහැ, අවතැන් වෙච්ච ගෙවල්වලට රුපියල් 75,000ක් දෙන්න කියලා. රුපියල් 75,000ක් ලබා දෙන එක හොඳයි. ඊටත් වඩා මුදලක් දෙන්න පුළුවන් නම් හොඳයි. මේ අවතැන් වෙච්ච ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න කටයුතු කරන්න කියන එක තමයි මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි කිරි ගොවීන් ගනිමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තොත්, මී හරක් 2,622ක් නැති වෙලා තිබෙනවා. මී හරක් ගාල් 132ක් තිබිලා තිබෙනවා. එතකොට මේ 132හි ගවයන් 2,622ක් මිය ගිහිල්ලා තිබෙනවා. මේ විධියට විශාල සත්ව ප්‍රමාණයක් මිය ගිහිල්ලා තිබෙනවා. එම නිසා මේ කිරි ගොවියාටත් උපරිම සාධාරණයක් ඉෂ්ට කරන්න කියන එකයි මම කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මිහින්තලය සීප්පුකුලම ගම්මානයේ වනඅලියකු පුළුස්සා ඉතා අමානුෂික ලෙස ඝාතනයට ලක් කර තිබෙනවා. මම යෝජනාවක් කරනවා. මෙම උත්තරීතර සභාවට අපි සත්ව සුබසාධන පනත් කෙටුම්පතක් ගෙනාවා. අපිට එම පනත් කෙටුම්පත සම්මත කර ගන්න වෙනවා. ඒ පනත් කෙටුම්පත සම්මත කර ගත්තේ නැත්නම් මේ වාගේ දේවල් දිගින් දිගටම අපට අහන්න දකින්න සිද්ධ වෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ වාගේම සිද්ධියක් වුණා, කුමන ජාතික උද්‍යානයේත්. කුමන ජාතික උද්‍යානයේ දිවියෙකුට කන්න සුනඛයෙකුව අත අරිනවා. එතැනට ගිය සංචාරකයෝ ඒ දිහා බලාගෙන ඉන්නවා. ඉතින් අපි සියලුදෙනාම එකතුවෙලා මේ සත්ත්ව හිංසන පනත සම්මත කර ගත්තොත් හොඳයි කියන යෝජනාව තමයි මම මේ වෙලාවේ කරන්නේ.

[ගරු කිංස් නෙල්සන් මහතා]

මේ ආපදාවෙන් මේ වනකොට මරණ ගණනාවක් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ වනකොට විශාල පිරිසක් අතුරුදහන් වෙලා තිබෙනවා. අතුරුදහන් වූ අය වෙනුවෙන් කිසිම වන්දියක් ලැබෙන්නේත් නැහැ. යුද්ධයක් නිසා නොවෙයි නේ, ඒ අය අතුරුදහන් වුණේ. යුද්ධයක් වුණා නම් අපට හිතාගන්න පුළුවන්, ඒ අය කොහෙන් හෝ මතුවෙයි කියලා. මෙම ආපදාවේදී අතුරුදහන් වුණු අය නැවත හම්බවෙන්නේ නැහැ. එම නිසා අපි විශ්වාස කරනවා, ඒ අය මිය ගිහිල්ලා කියලා. එම නිසා ඒ අය වෙනුවෙනුත් සාධාරණ වන්දි මුදලක් ලබා දෙන්න කියන ඉල්ලීමත් කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුණ ජයසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.22]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට ඇති වුණු දරුණු ආපදා තත්ත්වයෙන් පස්සේ දැනටමත් රාජ්‍ය තන්ත්‍රයේ සියලුම පාර්ශ්ව ඒ වෙනුවෙන් කටයුතු කරමින් ඉන්නවා. එම හදිසි ආපදා තත්ත්වය සැලවීමත් සමඟම ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත අනුව ජාතික ආපදා කළමනාකරණ ව්‍යුහාත්මක සැලැස්ම ජාතික මට්ටමින් ඉතාම හොඳින් ක්‍රියාත්මක වුණා. මේ ආපදාවෙන් ඇති වුණු බලපෑම ජාතික ආරක්ෂාවටත් විශාල තර්ජනයක් කියන එක හොඳින් අවබෝධ කරගෙන තමයි අපි කටයුතු කළේ.

ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට, ඒ වාගේම ත්‍රිවිධ හමුදාපතිවරුන්ට මෙවැනි ආපදා තත්ත්වයන් කළමනාකරණයට කිරීමට හොඳ දැනුමක් තිබෙනවා. ඒ වාගේම ත්‍රිවිධ හමුදාවට, විශේෂයෙන්ම පොලීසියට එවැනි ආපදා කළමනාකරණය කිරීම සඳහා ඉතාම හොඳ උපායමාර්ගික හැකියාවක් තිබෙනවා. ඒ අනුව තමයි 27වැනි දා ගරු ජනාධිපතිතුමා ජාතික ව්‍යසන කළමනාකරණ සභාව කැඳවා එසැනින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපායමාර්ගික උපදෙස් ඒ ඒ පාර්ශ්ව වෙත ලබා දීලා මේ අවස්ථාවේදී ජීවිත ගණනාවක් ගලවා ගත්තේ. ඒ හැකියාවන් සහ ඒ අත්දැකීම් සම්බන්ධව නිපුණත්වයක් තිබෙන නිසා තමයි ඒ විධියට කටයුතු කරන්න අපට පුළුවන් වුණේ. ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව එකතුවෙලා මේ අවස්ථාවේදී බොහෝ පිරිසකගේ ජීවිත බේරාගෙන ඔවුන්ව සුරක්ෂිත මධ්‍යස්ථානවලට යොමු කළා. ආරක්ෂක හමුදාවේ සහ පොලීසියේ සියලුම සාමාජිකයින් කැපවීමෙන්, ධෛර්යයෙන් සහ උනන්දුවෙන් ඔවුන්ගේ අනුපමේය සේවය මේ අවස්ථාවේදී ලබා දුන්නා. ඒක අපි දැක්කා. සියලුම අමාත්‍යාංශ සමඟ එකතුවෙලා ආපදාවට ලක් වුණු සියලුම දිස්ත්‍රික්ක ආවරණය කරමින් ඔවුන් දැනටත් විශාල මෙහෙවරක් කරනවා. ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය ඔවුන්ගේ ජීවිතවලට ඇති විය හැකි හානි ගැන නොතකා, තම ජීවිත පරිත්‍යාගයෙන් දිවා රෑ නොබලා සහන සේවා කටයුතුවල යෙදෙනවා.

මෙහිදී හමුදාවල දායකත්වය ගැන මම කෙටියෙන් කිව්වොත්, යුද හමුදාවේ පමණක් 45,000කට ආසන්න පිරිසක් ස්ථානගත කරලා තිබුණා. මේ වෙලාවේත් යුද හමුදාවේ නිලධාරින් සහ සෙසු නිලයන්වල 4,000ක පමණ පිරිසක් මේ වෙනුවෙන් කටයුතු කරනවා. ඒ වාගේම ආපදා අවස්ථාවේත් නාවික හමුදාවේ 15,000කට ආසන්න පිරිසක් කැප වුණා වාගේම, දැනටත් නාවික හමුදාවේ 600ක පමණ පිරිසක් සේවය කරමින් ඉන්නවා. ආපදාව අවස්ථාවේ ගුවන් හමුදාවේ 500කට කිට්ටු පිරිසක්, පීඩාවට පත් වුණු 14,000කට ආසන්න පිරිසකගේ අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කරලා තිබෙනවා. මේ අවස්ථාවේදීත් අපි ගුවන් හමුදාවේ 2,400ක පමණ පිරිසක් ස්ථානගත කරලා තිබෙනවා.

Hon. Presiding Member, we have lived through floods, survived landslides, storms, cyclones and droughts before, but we have not learnt lessons from those. Sri Lanka was once a nation protected by nature, by thick forests, stable hills, deep-rooted vegetations, natural drainage systems, wetlands and waterways that carried excess rainwater safely to the rivers and the sea. We have destroyed all; we have weakened every natural defence the Island had against disasters. That has been due to negligence over the years. Environmental laws are applied only against selective crowds or not at all. Leaderships changed, but priorities never changed with the lessons learnt. So, this will be a national turning point. අපේ රජය, එහෙම නැත්නම් අපේ ආණ්ඩුව රාජ්‍ය නිලධාරින් එක්ක එකතුවෙලා මේ ව්‍යසනයෙන් රට ගොඩ ගැනීම සඳහා විශාල මෙහෙවරක්, කටයුත්තක් කරගෙන යනවා.

ඒ වාගේම අපි මේ සඳහා කොච්චර සූදානමකින් සිටියාද කියන එකත් මම විශේෂයෙන් කියන්නට ඕනෑ. අපි නොවැම්බර් 5වැනි දා යාපනය, මඩකලපුව සහ කළුතර ප්‍රදේශවල සුනාමි පෙර දැනුම් දීමේ අභ්‍යාසයක් කළා. පෙර සූදානම් වීමේ පෙරහුරුවක් පවා කළා. විශේෂයෙන්ම සුරක්ෂිත මධ්‍යස්ථාන මොනවාද, හදිසි අවස්ථාවකදී භාවිත කිරීම සඳහා හඳුනාගෙන තිබෙන මාර්ග මොනවාද කියලා මහජනතාව දැනුවත් කරන්න අපි නොවැම්බර් 4වැනි දා විශේෂ මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වූවා. විශේෂයෙන්ම අපි ඒ සම්බන්ධයෙන් සූදානම් වෙලා සිටියා.

Also, I must mention, Sir, the commitment of our employees working abroad. They did fund collections from their own earnings. Some of them have collected money from their routine restaurants, businesses and also donated their salaries. What a commitment! That shows their affection and love for their own countrymates. So, I must mention here their commitment. They all have got together in this effort. That shows our resilience and their affection towards the country.

I also must mention about the leadership of the Hon. President as the Commander-in-Chief in this national crisis, in the devastating national calamity of this volume and degree. We have received our higher education in the military, and we believe that a leader, in a crisis, faces huge challenges and makes decisions at critical and crucial hours. So, what a leadership that has been exhibited by the Hon. President to save the lives of the people of this country! Have you seen a national leader like this previously, giving strategic directives without rest, being highly involved from the first minute onwards when he got the message about this national calamity that was about to come and in the operations room we have established at the Army Headquarters under the Army

Commander? So, the Tri-forces have full confidence in the exemplary leadership that has been exhibited by him as a national leader. We must bow to him for his strategic direction.

Sir, I must also mention about the India-Pakistan involvement in this. Though, they have disparities or differences - they were not in good terms because they have fought many wars in the history - they have left aside all bad memories and have come together to save the people in Sri Lanka. We must appreciate India and Pakistan for their involvement and approach in this time of need.

Also, I must mention how foreign dignitaries appreciated our resilience, especially what the UN Resident Coordinator said about our resilience and togetherness.

ආපදා කළමනාකරණ පද්ධතිය ජාතික මට්ටමින් විධිමත් කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකසන්න අපි තීරණය කර තිබෙනවා. ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ මාසයේ 16වැනි දා රැස් වුණු ජාතික ආපදා කළමනාකරණ සභාව මේ සම්බන්ධ ආයතන, ඒ ඒ අමාත්‍යාංශ, ස්වේච්ඡා සංවිධාන ඒකාබද්ධ වෙලා පොදු අණ දීමේ සහ සම්බන්ධීකරණ ව්‍යුහයක් යටතේ කටයුතු කරන්නත් සැලසුම් කර තිබෙනවා. ඒ වාගේම ජාතික භෞතික අවශ්‍යතා, කරුණු, ඒ පද්ධති සියල්ලම සැලකිල්ලට ගෙන ඒකාබද්ධ වැඩ පිළිවෙළක් සකස් කරන්නත් කටයුතු කරනවා. විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, බහුපාර්ශ්වික ප්‍රවේශයක් තුළින් වතු ප්‍රදේශවල වාගේම කඳුකරයේ නාය යෑම් අවදානම අවම කිරීම සඳහාත් විශේෂ වැඩ පිළිවෙළක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න වාගේම මේ ඒකාබද්ධ ක්‍රමවේදය තුළට එය ගෙන ඒම සඳහා කටයුතු කරන්නත් සභාවේ එකඟතාව අපි ලබා ගත් බව. ශ්‍රී ලංකාවේ මධ්‍යම අධි සංවේදී කලාප - central fragile areas - කියලා නම් කරලා, කළමනාකරණ සැලැස්මක් සකස් කරන්නත් අපි කටයුතු කරනවා.

ඒ වාගේම ජාතික ආපදා කළමනාකරණ ඒකාබද්ධ යන්ත්‍රණයක් සැකසීම වෙනුවෙන් ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සංශෝධනය කරන්න අපි කැපවීමක් පත් කළා. එමෙන්ම ව්‍යසන කළමනාකරණය සහ මෙහෙයවීමේ යන්ත්‍රණය සඳහා කෘෂිකර්ම, වාරිමාර්ග, මහාමාර්ග, පශු සම්පත්, නිවාස ඇතුළු විෂයයන්වලට අදාළ සියලු ආයතන එකතු කරලා විධිමත් වැඩ පිළිවෙළක් උපාය මාර්ගික මට්ටමින් සකස් කරලා, ජාතික ආපදා තත්ත්වයන්ගෙන් සිදු වන බලපෑම අඩු කර ගන්න ඉදිරියේදී අපි විශේෂයෙන් කටයුතු කරනවා. මේ අවස්ථාවේදී පීඩාවට පත් වුණු අපේ ජනතාව වෙනුවෙන් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විශේෂ රාජකාරියක්, කටයුත්තක් කළා. ඒ කාරණයත් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

අපේ ත්‍රිවිධ හමුදාවට, පොලීසියට, විශේෂ කාර්ය බලකායට සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට විශේෂ හැකියාවක් තිබෙනවා, මෙවැනි ආපදා අවස්ථාවලදී දක්ෂ ලෙස කටයුතු කරන්න. අපේ රටේ දිස්ත්‍රික්ක 25න්, 22ක්ම මේ ආපදාවේ බලපෑමට ලක් වුණා. නමුත්, ඔවුන් එක ප්‍රදේශයක්වත් අත්හැරියේ නැහැ. ත්‍රිවිධ හමුදාව ගත්තාම, විශේෂයෙන් නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ විශේෂ බලකායන් වාගේම පොලීසියේ විශේෂ කාර්ය බලකාය රාත්‍රියේ යන්න බැරි, මහ ගංවතුර තිබෙන ස්ථානවලට, ගංවතුර ගලන අවස්ථාවල පවා ගිහිල්ලා පීඩාවට පත් වුණු අපේ ජනතාව බේරා ගැනීම වෙනුවෙන් කළ මෙහෙවර අපි අගය කළ යුතුයි. මෙහිදී නාවික හමුදාවේ සෙබළු කීප දෙනෙක් අවාසනාවන්ත ලෙස මිය ගියා, උතුරේ වලෙයි ප්‍රදේශයේ මෝය කට පුළුල් කරන්න ගිහිල්ලා. ඒ වාගේම මේ ආපදා තත්ත්වය හේතුවෙන් අපේ ගුවන් නියමුවෙකුත් අපට නැති වුණා. ජනාධිපතිතුමා ඇතුළු අපි ඔවුන් වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මා කියන්න ඕනෑ, කවුරු මොනවා කිව්වත් අපි මේ ආපදා තත්ත්වයට මුහුණ දෙන්න ඉතා හොඳ සූදානමකිනුත් සිටි බව. ඒ වාගේම ඉදිරියේදී ඇති විය හැකි තවත් මෙවැනි ආපදාවන්ට ශක්තිමත්ව මුහුණ දීමට අවශ්‍ය යන්ත්‍රණය උපාය මාර්ගිකව සකසන්න අපි සැලසුම් කර තිබෙනවාය කියන කාරණයත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව, 2025 දෙසැම්බර් 19වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற் கிணங்க, 2025 டிசம்பர் 19, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 9.30 a.m. on Friday, 19th December, 2025, pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.